# 13 ශ්‍රේණිය

# ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

## ගුරු මාර්ගෝපදේශය

(2018 වසරේ සිට ක්‍රියාත්මක වේ.)





ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**ජාතික අධ්‍යාපන ආයතනය**

මහරගම, ශ්‍රී ලංකාව

**Web**| www.nie.lk **Email**| info@nie.lk

# ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

## ගුරු මාර්ගෝපදේශය

## (Teachers' Guide - Grade 13, Christian Civilization)

## 13 ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)


ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපෑල : info@nie.lk

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය

13 ශ්‍රේණිය

ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2018

C ජාතික අධ්‍යාපන ආයතනය

ISBN: ......................

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපෑල : info@nie.lk

මුද්‍රණය :
මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශවයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරතවීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමීව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද ආයතන සභාවේ ද රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත් දායකයින් හා වෙනත් පාර්ශවයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කරගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර,**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දැන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**ආචාර්ය මාඹුල්ගොඩ සුමනරතන හිමි**
**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** :
- ගරු ගාමිණී පෙරේරා පියතුමා
  සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
- ශාස්ත්‍රපති ගරු එස්. අන්‍ද්‍රයාස් ඒ. ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා
  සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය** :

ආචාර්ය ගරු ජෙරාඩ් රොසයිරෝ නි.ම.නි. පියතුමා
කථිකාචාර්ය දේවධර්ම නිකේතනය,
කොළඹ 08.

ශාස්ත්‍රපති ඒ.ආර්.එම්.ආර්.ඉමල්ඩා මිය, නියෝජ්‍ය විදුහල්පති,
සාන්ත ආනා බාලිකා මහා විද්‍යාලය,
වන්කාලේ, මන්නාරම.

ශාස්ත්‍රපති ෆ්‍රැන්සිස්කා රාජයෝගිනී මෙණෙවිය, ගුරු සේවය,
සියලු සාන්තුවරයන්ගේ බාලිකා විද්‍යාලය,
කොළඹ 08.

අයි.එන්.ජේ.එස්. ක්රූ මිය, ගුරු සේවය,
සාන්ත ආනා බාලිකා මහා විද්‍යාලය,
වන්කාලේ, මන්නාරම.

ගරු ජේ. රමේෂ් නි.ම.නි. පියතුමා
''තොඩර්වහම්'' යාපනය.

ටී.අයි.රංගනායගම් මහතා, ගුරු සේවය,
සාන්ත අන්තෝනි බාලිකා මහා විද්‍යාලය,
කොළඹ 03.

සුනීතා වෙනාසියුස් මිය, ගුරු සේවය,
සාන්ත ජේම්ස් බාලිකා මහා විද්‍යාලය,
යාපනය.

එම්. සුරේන්දිනී මිය, ගුරු සේවය,
සාන්ත ජෝශප් ජාතික පාසල, ත්‍රිකුණාමලය.

**කතෝලික උපදේශක මණ්ඩලය**

- අතිඋතුම් දේවධර්මාචාර්ය මැක්ස්වෙල් සිල්වා රදගුරු හිමිපාණෝ
  සභාපති, අධ්‍යාපන ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම

- අතිඋතුම් දේවධර්මාචාර්ය ජෝශප් පොන්නයියා රදගුරු හිමිපාණෝ
  උපසභාපති, අධ්‍යාපන ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම

- අතිගරු අයිවන් පෙරේරා නාහිමිපාණෝ,
  කතෝලික පාසල් පිළිබඳ ජාතික අධ්‍යක්ෂ, අගරදගුරු මැඳුර බොරැල්ල

- මහාචාර්ය ගරු ඥාණමුත්තු හෙක්ටර් පිලේන්ද්‍රන් පියතුමා, අංශ ප්‍රධාන, බටහිර සම්භාව්‍ය
  සංස්කෘතික හා ක්‍රිස්තියානි හා ඉස්ලාමීය සංස්කෘතික අංශය, යාපනය විශ්වවිද්‍යාලය

- මහාචාර්ය ෂර්ලි ලාල් විජේසිංහ,
  ක්‍රිස්තියානි සංස්කෘතිය අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

- ගරු ග්‍රෙගරි එල්. ප්‍රනාන්දු පියතුමා,
  සහකාර අධ්‍යක්ෂ, ආගමික අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය.

- ගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා,
  ජාතික අධ්‍යක්ෂ, බයිබල් හා ධර්මෝපදේශ අපෝස්තලික සේවා

- ආචාර්ය ජයලත් බලගල්ල පියතුමා (ඩොමිනිකන් නිකාය) මීරිගම

- ගරු එබනේෂර් ජෝශප් දේවගැතිතුමා,
  මහලේකම්, ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය, කොළඹ 07.

- ශාස්ත්‍රපති ගරු ක්‍රිස්ටෝපර් බාල්රාජ් දේවගැතිතුමා,
  විදුහල්පති, සාන්ත තෝමස් විදුහල,බණ්ඩාරවෙල.

**භාෂා සංස්කරණය**

- ශ්‍රීනාත් ගනේවත්ත මැතිතුමා.

**පරිගණක වදන් සැකසුම**

- ඒ. නියෝමි මහත්මිය.

**විවිධ සහාය : කාර්යාලයීය කටයුතු**

- එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය, ජාතික අධ්‍යාපන ආයතනය.
- ඩයස් අමරසිංහ මහතා, ජාතික අධ්‍යාපන ආයතනය.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

කතෝලික ධර්මයට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගනිමින් පාසල් අධ්‍යාපනය හරහා එම නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්තාව සලසමින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් හිස පුරවා ගෙන දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමර්ථ්‍ය ලබා ගැනීම පමණක් නොසෑහේ. දැනුම පමණක් ලබා දෙන අධ්‍යාපන ක්‍රමයක් සාර්ථක අධ්‍යාපන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකි ය. අධ්‍යාපනය මඟින් ආවේදන නොවැරදීම තීව්‍ර කර, කුසලතා අනිවාර්යයෙන් ම ඔපමට්ටම් කළ යුතු ය. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදිටනින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශයට අනුරූප ව ලියා ඇති අතර පෙළ පොත මෙම ගුරු මාර්ගෝපදේශයට හා විෂය නිර්දේශයට අනුව ලියවීමට නියමිත ය. එබැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙම සීමාවන් නොඉක්මවා කටයුතු සංවිධානය කර ගැනීමට වගබලා ගත යුතු ය. එහි දී :

- පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දෙමින් එය හොඳින් සිදු කරන්න.
- පාඩමට ප්‍රවේශවීමට හා පාඩම සංවර්ධනය සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් පරිශීලනය කරන්න.
- සුදුසු පරිදි කණ්ඩායම් කර කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට උනන්දු වන්න.
- මෙහි දක්වා ඇති ඉගෙනුම් පලවලින් සිසුන්ගේ ජීවිත පොහොණි කරලීමට කටයුතු කරන්න.
- සිසුන්ගේ විශ්වාසය වර්ධනය කිරීමට කටයුතු කරන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකි ය. එහෙත් නිපුණතාව, නිපුණතා මට්ටම, ඉගෙනුම් පල හා විෂය අන්තර්ගතයෙන් බැහැර නොවිය යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී කතෝලික ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය තෙක් තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරිපෝෂණය ලබා දිය යුතු ය. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයීම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස් කර ගන්න. ඇගයීම් සිදු කිරීමේ දී ලකුණු ලබා දෙන නිර්ණායක පිළිබඳ ව සිසුන් පෙරාතු ව දැනුම්වත් කරන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේ ම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කිරීමට යෝජිත ය. ඒ සඳහා උපදෙස් විදුහල්පති මඟින් ද, විෂය භාර ගුරුභවතා පන්ති කවවල දී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

**ව්‍යාපෘති නායක (කතෝලික ධර්මය)**
**ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

| පටුන | පිටුව |
| --- | --- |
| අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | ix |
| ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1-146 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

# හැඳින්වීම

ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය නමැති මෙම විෂයමාලාවෙහි ක්‍රිස්තියානි සංස්කෘතිය, ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය, එහි බිහි වීම, වර්ධනය හා භාවිතය පිළිබඳ කරුණු අඩංගු වී ඇත. ඉපැරණි ශිෂ්ටාචාරයන්හි බිහි වීමට මුල් වූ ජුදා ශිෂ්ටාචාරය, දේව විශ්වාසය තම මූලික පදනම කරගෙන කාලයාගේ ඇවෑමෙන් බටහිර ශිෂ්ටාචාරයන්ගේ බලපෑමත් සමඟ ම, ස්වාධීන වූ ගුණාංග සහිත ව වර්ධන විය. ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ජුදා ශිෂ්ටාචාරය පදනම් කරගනිමින් බිහි වූවකි. ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට ක්‍රිස්තුන් වහන්සේ ගේ ජීවිතය, ඔවුන් වහන්සේ ගේ ඉගැන්වීම් ආදිය පදනම් වී ඇත. මෙම පදනම යටතේ ඔවුන් වහන්සේ ගේ මරණය හා උත්ථානය සම්බන්ධ ව ශ්‍රාවකයන් සතු වූ විශ්වාස පිළිබඳ චින්තන, ඉගැන්වීම් හා ජීවිත පැවැත්ම ආදිය ස්තම්භ ලෙස පැවතිණි.

ඓතිහාසික ගමන් මගෙහි ක්‍රිස්තියානිය, ග්‍රීක-රෝම පාලන සීමාවන්හි පැතිර වර්ධනය වන විට එම සංස්කෘති හා බැඳිණි. ඒවායේ බොහෝ ගුණාංග තමන් සතු කර ගනිමින් වර්ධනය විය. ක්‍රිස්තියානි ප්‍රතිපත්ති මඟින් බිහි වූ චින්තනයන්, ආගමික ප්‍රතිසංස්කරණ චින්තනයන් ආදිය සමඟ සංකලනය වී බහුවිධ ස්වභාවයන්ගෙන් යුක්ත ව වර්ධනය විය. තව දුරටත් පුනරුද සමයේ නවීන චින්තනයන්ගේ බලපෑම් සමඟ කිතුනු කලාව මඟින් මූර්ති, චිත්‍ර හා සාහිත්‍ය වශයෙන් විවිධ සංස්කෘතික සම්පත් විශ්වයට දායාද කොට ඇත. අධ්‍යාපනය, මිනිස් සමාජ යහපත, සමාජ ඒකත්වය, සමාජ සංහිඳියාව හා සාමය ආදිය කෙරෙහි දායකත්වය දක්වන අතර, බහු ආගමික පරිසරයක් තුළ සංයමයෙන් යුතු ව අන්‍යෝන්‍ය සබඳතාවක් සහිත ව ක්‍රියාත්මක වෙමින් පවතී.

මෙවන් විවෘත ස්වභාවයකින් යුක්ත ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය, උසස් පෙළ පන්තිවල සිසුනට පහසුවෙන් උගෙන, දැනුමෙන් පෝෂණය වී, ඉගෙනීමේ පලය නෙළා ගත හැකි අයුරින් නිපුණතා මට්ටම් දසයක් සහිත විෂය මාලාවක් ලෙස මෙ මඟින් සකසා ඉදිරිපත් කර ඇත. සංස්කෘතියේ හා ශිෂ්ටාචාරයේ ස්වභාවයන්, ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට පදනම් වූ ශිෂ්ටාචාර, ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත පැවැත්ම, ඉගැන්වීම්, අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම්, මුල් කිතුනුවන්ගේ ජීවිත ක්‍රමය ආදිය පිළිබඳ ව මුල් නිපුණතා මට්ටම් පහ මඟින් විස්තර කෙරේ. එය 12 ශ්‍රේණියේ දී උගත හැකි ය.

අනෙකුත් නිපුණතා මට්ටම් පහ මඟින් ම ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ වර්ධනයට දායක වූ පෙර- අපර දිග තාපස නිකායයන්, ක්‍රිස්තියානි ප්‍රතිපත්ති සහිත චින්තකයන්, මධ්‍යම යුගයේ දී ක්‍රිස්තියානි සභාව ලද අඳුරු යුගයේ අත්දැකීම්, ක්‍රිස්තියානියේ පුනරුදයට මුල් පුරෝගාමී වූවන්, ක්‍රිස්තියානි අධ්‍යාපනය, කලාව ආදියට දායකත්වය දැක්වූ කිතුනු චින්තකයන්, ආසියානු රටවල කිතු දහම පැතිර යාම, වර්තමාන පරිසරය තුළ කිතුනු සභා ඒකත්වය, බහු ආගමික සංවාදයක අවශ්‍යතාව හා සමාජයේ උන්නතියට කිතුනු ආයතනවල දායකත්වය පිළිබඳ කරුණු 13 ශ්‍රේණියේ දී උගත හැකි ය.

මේවා ඉගෙනීම මඟින් සිසුවා තම කිතුනු ජීවිතයට අර්ථයක් ලබාදීම සඳහා තමා ජීවත් වන පරිසරය ගොඩනගයි. එසේත් නොමැති නම් ගොඩනැඟීමට දායකත්වය දක්වනු ඇතැයි බලාපොරොත්තු වේ.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතු ය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මඟින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන්හි හා ක්‍රියාවලීන්හි තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය මඟින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම මඟින් ජාතිය ගොඩනැඟීම සහ ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.
2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.
3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුම්වත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.
4. පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පතට සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.
5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වග වීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.
6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය මඟින් මානව සම්පත් සංවර්ධනය කිරීම.
7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.
8. අන්තර්ජාතික ප්‍රජාව අතර ගෞරවාන්විත ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වු ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය මගින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

1. **සන්නිවේදන නිපුණතා**

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   **සාක්ෂරතාව** සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   **සංඛ්‍යා පිළිබඳ දැනුම** භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   **රූපක භාවිතය** රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   **තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන්හි දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයන්
   - චිත්තවේගී බුද්ධිය

3. **පරිසරයට අදාළ නිපුණතා**

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   **සමාජ පරිසරය** ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   **ජෛව පරිසරය** සජීව ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   **භෞතික පරිසරය** අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම ආදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

**4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසර ජීවනෝපාය ක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

**5. ආගමයට සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකුල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයන් උකහා ගැනීම හා ස්වීයකරණය.

**6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් මඟින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

**7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන් හට ශක්තිය ලබා දීම.

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සඳහා යෝජනා ඇතුළත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණ.

## විෂයයට අදාළ නිපුණතා

1.0 ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ගොඩනැඟීමට පදනම් වූ ශිෂ්ටාචාරය අවබෝධ කරගෙන යහපත් දිවි පැවැත්මක් සඳහා අවශ්‍ය පසුබිම සකසා ගනියි.

2.0 පලස්තීනයේ භූගෝලීය ඉතිහාසයේ පසුබිම වටහා ගෙන තම ජීවිතය සකසා ගනියි

3.0 ක්‍රිස්තුන් වහන්සේගේ සමයේ වූ සංස්කෘතික පසුබිම පදනම් කරගෙන නව ගිවිසුම තුළ තම ජීවිත පැවැත්ම සකසා ගනියි.

4.0 ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ පදනම ක්‍රිස්තුන් වහන්සේ බව පිළිගෙන තම ජීවිතය හැඩගස්වා ගනියි.

5.0 ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භයත්, ධර්මදූත කාර්යය සඳහා පාවුලු තුමාගේ දායකත්වයත් හඳුනා ගෙන ශුද්ධ වූ සභාවේ වර්ධනයට සහය දක්වයි.

6.0 මුල් යුගයේ ශුද්ධ වූ සභාව මුහුණ දුන් අභියෝග හඳුනාගෙන ශුද්ධ වූ සභාවට දායකත්වය ලබාදුන් චින්තකයන් හා තාපස ජීවිත ක්‍රම අනුගමනය කරමින් ජීවත් වීමට උනන්දු වෙයි.

7.0 බටහිර යුරෝපීය රටවල කිතු දහම පැතිරුණු ආකාරය දැනගෙන ශුද්ධ වූ සභාවේ වර්ධනයට දායක වෙයි

8.0 සමාජ සංවර්ධනය සඳහා ක්‍රිස්තියානි චින්තනය, අධ්‍යාපනය හා කලාව ලබාදුන් දායකත්වය දැන ගෙන කිතුනු වගකීම් ඉටු කරයි.

9.0 ආසියාතික රටවල කිතු දහම් ව්‍යාප්තියේ ඉතිහාසය ඉගෙනීම මඟින් සමාජීය, සංස්කෘතික හා ආගමික උන්නතිය සඳහා තම දිවි කැප කරයි.

10.0 නව ශිෂ්ටාචාරයක් බිහි කිරීමේ කිතුනු සේවාවට සහභාගි වෙයි.

විෂය නිර්දේශය
12 වන ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය ගොඩනැඟීමට පදනම් වූ ශිෂ්ටාචාරය අවබෝධ කරගෙන යහපත් දිවි පැවැත්මක් සඳහා අවශ්‍ය පසුබිම සකසා ගනියි. | 1.1 සංස්කෘතියේ හා ශිෂ්ටාචාරයේ ඇති ගුණාංග අවබෝධ කර ගනියි. | • සමස්ත විෂය හැඳින්වීම<br>• ශිෂ්ටාචාරය පිළිබඳ නිර්වචන<br>• සංස්කෘතිය පිළිබඳ නිර්වචන<br>• ශිෂ්ටාචාරය හා සංස්කෘතිය අතර ඇති සමානකම් හා අසමානකම් | • ශිෂ්ටාචාරය හා සංස්කෘතිය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• ගංගා නිම්න ආශ්‍රිත ව ශිෂ්ටාචාර ගොඩනැගුණු ආකාරය පැහැදිලි කරයි<br>• ශිෂ්ටාචාරය හා සංස්කෘතිය අතර ඇති සමානකම් හා අසමානකම් වෙන් කර දක්වයි.<br>• තම සංස්කෘතික වටිනාකම් ආරක්ෂා කර ගනියි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 10 |
| | 1.2 ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට පදනම් වන සංස්කෘතීන්ට හා ශිෂ්ටාචාරයන්ට ගරු කරයි. | • ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට පදනම් වූ ශිෂ්ටාචාර පිළිබඳ හැඳින්වීම<br>• ජුදා ශිෂ්ටාචාරයේ ආරම්භය<br>- මෙසපොතේමියානු ශිෂ්ටාචාරය (යුප්‍රටීස්, ටයිග්‍රීස් නිම්න)<br>- මිසර ශිෂ්ටාචාරය (නයිල් නිම්න) | • ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට පදනම් වූ සංස්කෘතීන් හා ශිෂ්ටාචාරයන් පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය බිහි වීමෙහි ලා පෙරදිග ශිෂ්ටාචාරයන් හි දායකත්වයක් වූ බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• පෙරදිග සංස්කෘතීන්හි ගුණාංග හඳුනා ගෙන ඒවාට ගරු කිරීමට පුරුදු වෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 36 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.3 ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට පදනම් වන බටහිර ශිෂ්ටාචාරයන්ට ගරු කරයි. | • ග්‍රීක - රෝම ශිෂ්ටාචාරය<br>- ග්‍රීක ශිෂ්ටාචාරය<br>- රෝම ශිෂ්ටාචාරය | • ග්‍රීක - රෝම ශිෂ්ටාචාරය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ වර්ධනයට බටහිර ශිෂ්ටාචාරයන් දායකත්වය ලැබී ඇති බැව් පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ග්‍රීක - රෝම ශිෂ්ටාචාරවල සංස්කෘතික ගුණාංග චරිතායනය කර ගනියි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 14 |
| 2.0 පලස්තීනයේ භූගෝලීය පසුබිම හා ඊශ්‍රායෙලයේ ඉතිහාසය ඇසුරින් ජීවිත වටිනාකම් ගොඩ නිගා ගනියි. | 2.1 පලස්තීනයේ භූගෝලීය පසුබිම වටහා ගනියි. | • පලස්තීනයේ භූගෝලීය පසුබිම<br>• වෙරළ තීරය (මධ්‍ය ධරණී)<br>• බටහිර කඳු හා ගිලුනු නිම්න<br>• නැගෙනහිර කඳු හා කාන්තාර<br>• ප්‍රධාන භූමි ප්‍රදේශ හා නගර | • පලස්තීනයේ භූගෝලීය පසුබිම පිළිබඳ කරුණු රැස් කරයි.<br>• ජුදා - ක්‍රිස්තියානි ඉතිහාසයේ ගැලවීමදායක සිදුවීම් රාශියක් පලස්තීනය හා බැඳී ඇති බැව් පිළි ගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ලංකාවේ පොදු වන්දනා ස්ථානයන්හි ශුද්ධත්වය රැකෙන ආකාරයට කටයුතු කරයි.<br>• දේවස්ථානවල ශුද්ධත්වය රැකීමට ජනතාව හා එක් ව කටයුතු කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 2.2 ජුදා ඓතිහාසික පසුබිම හඳුනා ගෙන නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි. | • පුරාණ ඉශ්‍රායෙල් ඉතිහාසය<br>• මිසරයේ වහල් බව<br>• නික්මයාම සහ ගිවිසුම<br>• වීරවරුන්ගේ (ජනනායකයින්) සමය<br>• රජ සමය<br>• දෙකඩ වූ ඉශ්‍රායෙල් රාජ්‍යය<br>• බැබිලෝනියානු විප්‍රවාසය<br>• නැවත දේශයට පැමිණීම<br>- ජුදා ආගමික, සමාජීය හා සංස්කෘතික පුනරුදය<br>• පර්සියානු පාලනය (එස්රා, නෙහෙමියා)<br>• ග්‍රීක පාලනය<br>• රෝම පාලනය | • ජුදා ඉතිහාසය පිළිබඳ කරුණු රැස් කරයි.<br>• ඉශ්‍රායෙල් ඉතිහාසයෙහි ලා දේව අනාවරණය සිදු වී ඇති බැව් පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• එදිනෙදා ජීවිත සිදුවීම් මඟින් දෙවියන් වහන්සේ අත්දකියි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 40 |
| 3.0 ක්‍රිස්තුන් වහන්සේගේ සමයේ වූ සංස්කෘතික පසුබිම හා නව ගිවිසුම ඇසුරින් අනුව තම ජීවිත පැවැත්ම සකසා ගනියි. | 3.1ක්‍රි.ව. පළමු වන සියවසේ පලස්තීනයේ දේශපාලන පසුබිම වටහා ගෙන නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි. | • රෝමයේ රාජ්‍ය පාලනය<br>• අධිරාජ්‍යයා<br>• ආණ්ඩුකාරවරු<br>• යුවරජවරු<br>• අයකැමිවරු<br>• හේවායෝ<br>• උත්තම පූජකවරු | • ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ පලස්තීනයේ දේශපාලන පසුබිම පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• කිතු දහම බිහි වීමට මෙම කරුණු පදනම් වූ බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• නීති ගරුක ජීවිතයක් ගත කරයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 3.2 ක්‍රි.ව. පළමු වන සියවසේ පලස්තීනයේ සමාජ පසුබිම හඳුනා ගෙන සමාජයේ සිටින සියල්ලන්ට ගරු කරමින් ජීවත් වීමට උගනියි. | • පලස්තීන ජුදායෝ<br>  • ඉහල<br>  • මධ්‍යම<br>  • (පහළ<br>    • දිළින්දෝ<br>    • වහල්ලු<br>    • කාන්තාවෝ<br>    • සමාරිතානුවෝ<br>• විදේශගත ජුදාවරු (Diaspora Jews)<br>• අන්‍ය ජාතිකයෝ | • පලස්තීනයේ වූ සමාජ පසුබිම පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• ජුදා සමාජ පරිසියේ විසූ ජනතාවට ක්‍රිස්තුන් වහන්සේ විශේෂාකාරයෙන් කැප වූ බව ගරු කළ බව පිළිගනියි.<br>• ජුදා සමාජයේ එක් එක් කණ්ඩායම් පිළිබඳ නිර්මාණයක් ඉදිරිපත් කරයි.<br>• සමාජයේ වෙසෙන පහත් මට්ටමේ ජනතාවට ආදරය කරයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 12 |
| | 3.3 ක්‍රි.ව පළමුවන සියවසේ පලස්තීනයේ සමාජ පසුබිම හඳුනා ගෙන ආගමික ස්ථානවලට හා ආගමික නායකයන්ට ගරු කරයි. | • ආගමික ආයතන<br>  • ජෙරුසලම් දේව මාළිගාය<br>  • ජුදා මන්ත්‍රණ සභාව<br>  • ධර්මශාලා<br>• ජුදා ආගමික කණ්ඩායම්<br>  • සද්දුසිවරු<br>  • පරිසිවරු<br>  • ධර්මධරයෝ<br>  • එසේනිවරු<br>  • සෙලොට්වරු | • ක්‍රිස්තුන් වහන්සේ පලස්තීනයේ විසූ සමයේ ආගමික පසුබිම පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• ජෙරුසලමේ දේව මාලිගය ශුද්ධ වූ ස්ථානයක් ලෙස ජුදාවරුන් විසින් සලකන ලද බැව් පිළිගනියි.<br>• ජුදා ආගමික ස්ථාන හා කණ්ඩායම් පිළිබඳ නිර්මාණාත්මක කරුණු ඉදිරිපත් කරයි.<br>• ආගමික ස්ථානවල ශුද්ධත්වය රැකෙන ක්‍රියාකාරකම්වල නිරත වෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සහයෝගයෙන් කටයුතු කරයි. | 18 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 3.4 මුල් සියවසේ ජුදා සංස්කෘතික සම්ප්‍රදායයන් හදාරා එම සංස්කෘතික සම්ප්‍රදායයන්ගේ වටිනාකම් ජීවිතයට අදාල කරගනියි. | • භාෂාව<br>• සමාජ සිරිත් විරිත්<br>• ආගමික චාරිත්‍ර වාරිත්‍ර<br>• ආගමික උත්සව | • ක්‍රිස්තුන් වහන්සේගේ කාලයේ ජුදා සංස්කෘතිය හා ආගමික සම්ප්‍රදායයන් පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• ජුදා ආගමික හා සමාජීය සිරිත් විරිත් ක්‍රිස්තුන් වහන්සේ පිළිපදින ලද බැව් පිළිගනියි.<br>• ජුදා ආගමික උත්සව පිළිබඳ කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• දේව කැමැත්තට අනුව ක්‍රියා කිරීමට පුරුදු පුහුණු වෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 20 |
| 4.0 ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ පදනම ක්‍රිස්තුන් වහන්සේ බව පිළිගෙන තම ජීවිතය හැඩගස්වා ගනියි. | 4.1 ක්‍රිස්තුන් වහන්සේ ගේ ජීවිකයෙන් පිළිබිඹු වූ වටිනාකම් තම ජීවිතයට උකහා ගනියි. | • ක්‍රිස්තුන් වහන්සේ ගේ ක්‍රියා (ලූක් 4/16-19)<br>  • ක්‍රිස්තුන් වහන්සේ හා සමාරිතානුවරයා<br>  • ක්‍රිස්තුන් වහන්සේ හා අයබදු අය කරන්නා<br>  • ක්‍රිස්තුන් වහන්සේ හා පව්කාරයෝ<br>• ශ්‍රාවකත්වය පිළිබඳ ඉගැන්වීම් (මාක් 8/31, 9/33-35, 10/45)<br>• පාද ධෝවනය (ජොහාන් 13/1-16) | • ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ පදනම වන ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• ක්‍රිස්තුන් වහන්සේ ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ පදනම බව පිළිගනියි.<br>• ක්‍රිස්තුන් වහන්සේගේ අනන්‍යතාව සහ සේවාව පිළිබඳ කරුණු විස්තර කරයි.<br>• ක්‍රිස්තුන් උත්ථානයේ හරය ජීවත් කරයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 4.2 ක්‍රිස්තුන් වහන්සේගේ දේව රාජ්‍යය පිළිබඳ ඉගැන්වීම් පිළිපදියි. | • ක්‍රිස්තුන් වහන්සේගේ නව සමාජ දැක්ම<br>  • කන්ද උඩ දේශනාව (මතෙව් 5-7)<br>  • දේව රාජ්‍ය පිළිබඳ ප්‍රකාශනය (මතෙව් 13)<br>• දේව රාජ්‍යයේ සලකුණු වන ප්‍රාතිහාර්ය<br>  • අශුද්ධාත්මයන් පලවාහැරීම (මාක් 5/1-20)<br>  • පූප වැඩි කිරීම (මාක් 6/30-44)<br>  • සුව කිරීම (ශතාධිපතියාගේ සේවකයා) (ලූක් 7/1-10)<br>  • මළවුන් උත්ථාන කිරීම, වැන්දඹු ස්ත්‍රියකගේ පුතා (ලූක් 7/11-17) | • දේවරාජ්‍යය පිළිබඳ පහදා දෙන කන්ද උඩ දේශනාව, උපමා හා ප්‍රාතිහාර්යයන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>• තත්කාලීන සමාජ රටාව තුළ ක්‍රිස්තුන් වහන්සේගේ සුවිශේෂත්වය පිළිගනියි.<br>• කන්ද උඩ දේශනාව, උපමා හා ප්‍රාතිහාර්යයන් පිළිබඳ නිර්මාණයක් ඉදිරිපත් කරයි.<br>• දේවරාජ්‍යයේ ගුණාංග අනුව ජීවත් වීමට උත්සාහ දරයි.<br>• සතුරන් මිතුරන් බවට පත් කර ගනියි. | 36 |
| | 4.3 ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය මඟින් උදා කරන ලද ගැලවීම අත්දකියි.ග | • ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය<br>• දුක් විඳීම පිළිබඳ පෙර දැනුම් දීම හා හේතුව (මාක් 8/31-38)<br>• දුක් විඳීම හා මරණය (ජොහාන් 18-19)<br>• උත්ථානය (ජොහාන් 20) | • පාස්කු අභිරහස පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය මඟින් ලද නව පිබිදීම පිළිගනියි.<br>• ක්‍රිස්තුන් වහන්සේගේ දුක්විඳීම, මරණය හා උත්ථානය පිළිබඳ කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ශුභාරංචිය එදිනෙදා ජීවිතයේ දී උපයෝගී කර ගනියි.<br>• කණ්ඩායමේ සහයෝගයෙන් ක්‍රියාකාරකම්වල යෙදෙයි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| 5.0<br>ක්‍රිස්තියානි ධර්මයේ ආරම්භයත්, ධර්මදූත කාර්යය සඳහා පාවුලු තුමාගේ දායකත්වයත් හඳුනා ගෙන, ශුද්ධ වූ සභාවේ ගැලවීමදායක හරයන් ජීවිතයට අදාල කරගනියි. | 5.1<br>මුල් ක්‍රිස්තියානීන්ගේ ජීවන ක්‍රමය දැනගෙන ඒ අනුව ජීවත් වීමට උත්සාහ කරයි. | • ශුද්ධාත්මාගමනය හා මුල් කිතුනු සභාවේ ආරම්භය (ක්‍රිය 2/1-41)<br>• මුල් කිතුනු සභාවේ සාමූහික ජීවිතය<br>  • යාච්ඤාව<br>  • පූජ කැඩීම<br>  • අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම්වලට සවන් දීම<br>  • බෙදාගැනීමේ ජීවිතය (ක්‍රියා 2/42-47, 4/32-37 1 කොරිඃ 11/17-32) | • කිතුනු දහමේ මුල් ඉතිහාසය පිළිබඳ කරුණු රැස් කරයි.<br>• ශුද්ධාත්මාගමනය සමග නව කිතුනු ජීවිත පැවැත්ම ආරම්භ වූ බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ශුද්ධ වූ සභාවේ උන්නතියට දායක වෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වලට උනන්දුවෙන් සහභාගි වෙයි. | 14 |
| | 5.2<br>කිතුදහම සියල්ලන් වෙතට ගෙනයාමට ඇප කැප වූ පාවුලු තුමා මෙන් කැප වී කටයුතු කරයි. | • පාවුලුතුමාගේ කැඳවීම, විජාතීන්ගේ අපෝස්තුලුවරයා (ක්‍රියා 9/1-20)<br>• පාවුලුතුමා ධර්මදූත කාර්යය සඳහා යොදගත් ක්‍රමවේද<br>  • ධර්මදූත ගමන් (3)<br>    1. ක්‍රියා 13/14-14/28<br>    2. ක්‍රියා 15/36-18/22<br>    3. ක්‍රියා 18/23-21/20 | • ශුද්ධ වූ පාවුලු තුමාගේ ධර්මදූත කාර්යය පිළිබඳ තොරතුරු රැස්කරයි.<br>• ශුද්ධ වූ පාවුලු තුමා විජාතීන්ගේ අපෝස්තුලුවරයා බව පිළිගනියි.<br>• පාවුලුතුමාගේ ඉගැන්වීම් ක්‍රමානුකූලව ඉදිරිපත් කරයි.<br>• පාවුලුතුමා ධර්මදූත කාර්යය සඳහා යොදාගත් ක්‍රමවේද, අනුගමනය කරයි.<br>• සුබාරංචිය ප්‍රකාශ කිරීමේ සේවාවේ නියැළෙන අය හා එක් ව නව සමාජයක් ගොඩ නගයි. | 36 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | | • පාවුලු ලිපි<br>පාවුලුතුමාගේ ලිපි පිළිබඳ හැඳින්වීම<br>- දේව වරප්‍රසාද (රෝම 2/12-19, 7/7-20, ගලාති 3/15-29)<br>- ක්‍රිස්තුන් වහන්සේගේ නායකත්වය හා බැහැපත්කම (කොලොස්සි 1/15-20, එපීස 1/3-10, පිලිප්පි 2/5-11)<br>- ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය හා නැවත පැමිණීම (1 තෙසලෝනික 15/35-58, 1 තෙසලෝනික 4/13-5/11)<br>1. කිතුනු පවුල් ජීවිතය (1 කොරින්ති 7/1-16, එපීස 5/22-31, 6/1-4, ගලාති 3/28)<br>2. කිතුනු ඒකත්වය (1කොරින්ති 12/12-31, එපීස 2/11-18, 4/1-6)<br>3. සහෝදර ප්‍රේමය (1 කොරින්ති 8/9-13, 13/3-8/2 කොරින්ති 8/9 පිලෙමොන් 1/8-21)<br>• ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ දිවි ගෙවීම | | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.3 ශුද්ධ වූ පාවුලුතුමාගේ ජීවිතාදර්ශය අනුගමනය කර තම කිතුනු කැඳවීමට ප්‍රතිචාර දක්වයි. | • පාවුලුතුමා මුහුණ දුන් අභියෝග (2 කොරින්ති 11/22-33 ක්‍රියා 16/16-28)<br>• ශුද්ධ වූ පාවුලුතුමාගේ ප්‍රාණ පරිත්‍යාගිවරය | • ධර්මදූත කාර්යවල දී ශුද්ධ වූ පාවුලුතුමා මුහුණ දුන් අභියෝග පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• සුබාරංචිය ප්‍රකාශ කිරීමේ සේවාවල නියැළෙන විට අභියෝගවලට මුහුණ දිය යුතු බව පිළිගනියි.<br>• රැස් කරගත් කරුණු පෙළ ගස්වයි.<br>• අභියෝගවලට මුහුණ දී අපෝස්තලික සේවාවන් කිරීමට ඉදිරිපත් වෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී සහයෝගයෙන් කටයුතු කරයි. | 10 |
| 6. මුල් යුගයේ ශුද්ධ වූ සභාව මුහුණ දුන් අභියෝග හඳුනාගෙන ශුද්ධ වූ සභාවේ වර්ධනයට දායකත්වය ලබාදුන් චින්තකයින් හා තාපස ජීවිත ක්‍රම අනුගමනය කරමින් ජීවත් වීමට උනන්දු වෙයි. | 6.1 මුල් සියවස් පහ තුළ ශුද්ධ වූ සභාව මුහුණ දුන් අභියෝග හා ඒවායේ ප්‍රතිවිපාක තම ජීවිතයට ආදර්ශයක් කර ගනියි. | • ජුදා පීඩනය<br>පීඩනවලට හේතු සහ එහි ප්‍රතිවිපාක<br>• රෝම පීඩනය<br>පීඩනය සඳහා හේතු සහ එහි ප්‍රතිවිපාක<br>• මිලාන් ආඥාව පනත හා කිතු දහමේ නිදහස<br>• ක්‍රිස්තියානි දහමේ විශ්වීයභාවය | • මුල් කාලයේ කිතු දහමට එල්ල වූ පීඩන පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• අපගේ විශ්වාසයට පටහැණි අභියෝගවලට මුහුණ දිය යුතු බව පිළිගනියි.<br>• රැස්කරගත් තොරතුරු නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.<br>• විශ්වාසයට පටහැණි ව එල්ල වන අභියෝග ජයගනියි.<br>• ශුද්ධ වූ සභාවේ වර්ධනයට මීසම් පවුල හා එක් වී ක්‍රියා කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 6.2 මුල් යුගයේ කිතුනු සභාවල ගොඩනැගුණු ප්‍රතිපත්තිමය චින්තනයන් හා සංස්කෘතික ගුණාංග හඳුනා ගනියි. | • ග්‍රීක- රෝම ශිෂ්ටාචාරයේ බලපෑම ඔස්සේ ගොඩනැගුණු කිතුනු චින්තනය<br>• කිතුනු දේව ධාර්මික විද්‍යා පීඨ<br>  • ඇලෙක්සැන්ඩ්‍රියාව<br>  • අන්තියෝකිය<br>• වේදභේද හා මන්ත්‍රණ සභා<br>  • ඒරියන් වේදභේදය - නිසියානු මන්ත්‍රණ සභාව<br>  • පෙලාජියානු වේදභේදය - කාතේජ් මන්ත්‍රණ සභාව<br>  • නෙස්ටෝරියානු වේදභේදය - එපීස මන්ත්‍රණ සභාව<br>  • යුතිකේය වේදභේදය - කැල්සිදෝනියානු මන්ත්‍රණ සභාව<br>• මුල් යුගයේ කිතුනු චින්තකයන් සහ ඔවුන්ගේ දායකත්වය, ශුද්ධ වූ ජස්ටින්තුමා, ශුද්ධ වූ ඉරේනියස්තුමා | • මුල් යුගයේ කිතුනු සභාවේ දැකිය හැකි වූ ග්‍රීක-රෝම සංස්කෘතික ගුණාංග පෙළ ගස්වයි.<br>• ක්‍රිස්තියානිය තුළ යහපත් සංස්කෘතික ගුණාංග සමන්විත වන බැව් පිළිගනියි.<br>• රැස් කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• යහපත් සංස්කෘතික ගුණාංගවලට ගරු කරමින් ජීවත් වීමට උගනියි.<br>• ශුද්ධ වූ සභාවේ නවෝදයට සහය වෙයි. | 26 |
| | 6.3 පෙර - අපරදිග තාපස නිකායයන් බිහිවීම හා ඒවායේ දායකත්වය වටහා ගෙන ක්‍රියා කරයි. | • තාපස නිකායයන් බිහි වීම<br>  • වනවාසී තාපසයෝ<br>• පෙරදිග තාපස නිකායයන් බිහි වීම හා වර්ධනය (ශුද්ධ වූ බැසිල්තුමා)<br>• අපරදිග තාපස නිකායයන් බිහි වීම හා වර්ධනය (ශුද්ධ වූ අතනාසියස් තුමා, ශුද්ධ වූ බෙනඩික් තුමා) | • තාපස නිකායයන් බිහි වීම පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• පැවිදි ජීවිතයක් ගත කරන අයට ගරු කළ යුතු බව පිළිගනියි.<br>• ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• පැවිදි ජීවිත අනුගමනය කරමින් ජීවත් වෙයි.<br>• පැවිද්දන්ගේ ධර්මදූත කාර්යයට සහය වෙයි. | 14 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 බටහිර යුරෝපීය රටවල කිතු දහම පැතිරුණු ආකාරය ඇසුරින් ශුද්ධ වූ සභාවේ සේවාවනට සම්බන්ධ වෙයි. | 7.1 මධ්‍යතන යුගයේ කිතු දහම පැතිරයාම හා එහි ප්‍රතඵල මඟින් සිදු වූ වෙනස්කම් හඳුනාගෙන නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි. | • රෝම අධිරාජ්‍යයේ වැටීම හා කොන්ස්තන්තිනෝපලයේ උදාවීම<br>• යුරෝපීය ගෝත්‍ර කිතුනු දහම වැලඳ ගැනීම<br>  • බෙනදිකාන තාපසයන්ගේ දායකත්වය<br>  • ශුද්ධවූ බොනිපස්තුමාගේ විශිෂ්ට දායකත්වය<br>• යුරෝපීය ගෝත්‍ර නාගරිකකරණය<br>  • අධ්‍යාපන සේවය<br>  • කය වෙහෙසා වැඩ කිරීම | • යුරෝපීය ගෝත්‍රකයන්ගේ චිත්තාවර්තනය පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• බෙනදිකාන තාපසයන් විසින් යුරෝපීය ගෝත්‍ර නාගරීකරණය කිරීම සිදු කළ බැව් පිළිගනියි.<br>• බෙනදිකාන තාපසයන්ගේ සේවා පෙළ ගස්වයි.<br>• තාපස නිකායයන් මඟින් ඉටු කරන සේවාවන් ආදර්ශයක් කර ගනියි.<br>• තාපසයන්ගේ සේවාවන්ට සහය වෙයි. | 20 |
| | 7.2 මධ්‍යතන යුගයේ අඳුරු කාල වකවානුවේ කිතුනු ජීවිත පැවැත්මේ වෙනසක් ඇති කිරීමට යාචක නිකායයන්ගේ දායකත්වය වටහා ගෙන ක්‍රියා කරයි. | • අඳුරු යුගය පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක්<br>• සභාව දෙකඩ වීම හා එහි ප්‍රතිඵල, පෙරදිග-අපරදිග සභා<br>• කුරුස යුද්ධය<br>• යාචක නිකායයන් බිහි වීම<br>  - දායකත්වය - පසුබිම<br>  • වැල්දෙන්සියාන<br>  • ෆ්රැන්සිස්කාන<br>  • දොමිනිකාන | • මධ්‍යතන යුගයේ කිතුනු සභාව බෙදී යාමට හේතු වූ කරුණු ගොනු කරයි.<br>• ශුද්ධ වූ සභාව තුළ පුනර්ජීවනයක් ඇති කිරීමේ අරමුණින් යාචක නිකායයන් බිහි වූ බව පිළිගනියි<br>• රැස් කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ශුද්ධ වූ සභාවේ නවෝදය ඇති කිරීමට වෙහෙසෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී උනන්දුවෙන් සහයෝගය දක්වයි. | 16 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 7.3 කිතු දහමේ ප්‍රතිසංස්කරණයට හේතු වූ කරුණු හා එහි ප්‍රතිඵල පිළිබඳ ව දැන ස්ථිර විශ්වාසයකින් ජීවත් වෙයි. | • ප්‍රතිසංස්කරණයට සඳහා බලපෑ ආගමික, සමාජීය, දේශපාලන, ආර්ථික හා දේව ධාර්මික හේතු සාධක<br>• ප්‍රතිසංස්කරණයට බීජය වැපුරූ කිතුනු චින්තකයෝ<br>  • මාටින් ලූතර්<br>  • ස්විංග්ලි<br>  • ජෝන් කැල්වින්<br>  • තෝමස් මුන්ට්සර්<br>• ඇංග්ලිකාන, මෙතොදිස්ත හා බැප්තිස්ට් සභා<br>• කතෝලික සභාවේ ප්‍රතිසංස්කරණය<br>  • ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව<br>• ප්‍රතිසංස්කරණයට දායක වූ නිකායන් හා එම නිකායන්ගේ සේවය<br>  • ජේසු නිකාය<br>  • වින්සෙන්තියානු නිකාය<br>  • කාර්මෙල් නිකාය<br>  • කැපුචින් නිකාය | • සභාවේ නවෝදය සඳහා බලපෑ ආගමික, සමාජීය, දේශපාලන, ආර්ථික කරුණු පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>• ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව මගින් කතෝලික සභාවේ ප්‍රතිසංස්කරණයක් ඇති වූ බව පිළිගනියි.<br>• රැස් කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ශුද්ධ වූ සභාවේ ඉගැන්වීම් පිළිපදිමින් ජීවත් වෙයි.<br>• ශුද්ධ වූ සභාවේ ක්‍රියාකාරකම්වලට සහය වෙයි. | 40 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 8.0 සමාජ සංවර්ධනය සඳහා ක්‍රිස්තියානි චින්තනය, අධ්‍යාපනය හා කලාව ලබාදුන් දායකත්වය දැන ගෙන, කිතුනු වගකීම් ඉටු කරයි | 8.1 ක්‍රිස්තියානි සභාව මඟින් අධ්‍යාපනය සඳහා ඉටු කරන ලද සේවාව හඳුනා ගෙන, තම දැනුම වර්ධනය කර ගනිමින් සමාජ සංවර්ධනයට කැප වෙයි. | • අධ්‍යාපනයේ උන්නතිය අරබයා කිතුනු දායකත්වය<br>  • මිසම් පාසල්<br>  • කැත්‍රිඩ්‍රල් පාසල්<br>  • විශ්ව විද්‍යාල (බොලඤ්ඤා, ආසන දෙව්මැදුරු ආශ්‍රිත පාසල්) පැරීසිය, කේම්බ්‍රිජ් සහ සලමන්කා)<br>• විද්‍යාවේ දියුණුවට කිතුනුවන්ගේ දායකත්වය<br>  • තෙයියා ද ෂාඩැන්<br>  • ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්<br>  • ශ්‍රීමත් අයිසැක් නිව්ටන්<br>  • ඇල්බට් අයින්ස්ටයින්<br>  • ඇලෙක්සැන්ඩර් ෆෙලෙමින් | • මධ්‍යතන යුගයේ අධ්‍යාපනයේ උන්නතිය අරබයා කිතුනු දායකත්වයපිළිබඳ කරුණු රැස් කරයි.<br>• අධ්‍යාපනයේ උන්නතියට කිතුනුවන් සේවය කළ බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• නූගත් අයට ඉගැන්වීමට ඉදිරිපත් වෙයි.<br>• සමාජ සංවර්ධනය සඳහා අන් අය හා එක් ව ක්‍රියා කරයි. | 14 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 8.2 නව චින්තනයට මඟ පෑදූ කිතුනු චින්තකයන් හඳුනා ගනියි. | • ශුද්ධ වූ අගොස්තීනු තුමාගේ ජීවිතය හා එතුමන්ගේ ඉගැන්වීම<br>• තෝමස් ඇක්වයිනාස් තුමාගේ ජීවිතය හා එතුමන්ගේ ඉගැන්වීම | • ශුද්ධවූ සභාවේ නව චින්තනයට මඟ පෑදූ කිතුනු චින්තකයන් පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• ශුද්ධ වූ අගොස්තීනු තුමා හා තෝමස් ඇක්වයිනාස් තුමා නව චින්තනයක උදාවට මඟ පෑදූ බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ශුද්ධ වූ සභාවේ නව චින්තනයේ වෙනස ම සහය දක්වයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ක්‍රියාශීලී ව කටයුතු කරයි. | 08 |
| | 8.3 කලාවේ උන්නතිය සඳහා කිතුනු දායකත්වය හඳුනා ගෙන නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි. | • කිතුනු සාහිත්‍ය ග්‍රන්ථ<br>• කිතුනු සංගීතය<br>• කිතුනු ගොඩනැඟිලි කලාව<br>• කිතුනු මූර්ති කලාව<br>• කිතුනු චිත්‍ර කලාව | • කිතුනු සාහිත්‍යය මඟින් ගොඩනැගුණු නව චින්තනය රටා ගොනු කරයි.<br>• කලාවේ උන්නතිය සඳහා කිතුනු දායකත්වයක් වූ බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• කලාවේ උන්නතිය සඳහා තම නිර්මාණාත්මක දායකත්වය ලබා දෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ක්‍රියාශීලී ව කටයුතු කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 ආසියාතික රටවල කිතුදහමේ ව්‍යාප්තියේ ඉතිහාසය ඉගෙනීම තුළින් සමාජීය, සංස්කෘතික හා ආගමික උන්නතිය සඳහා තම දිවි කැප කරයි. | 9.1 ආසියාතික රටවල කිතුදහමේ ආරම්භය පිළිබඳ ඉතිහාසය අවබෝධ කර ගනිමින් නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි. | කිතුනු ධර්මදූතවරුන්ගේ සේවාව<br>• ඉන්දියාව - සාන්ත තෝමස් තුමා<br>• චීනය - මතේඕ රිචී පියතුමා<br>• පිලිපීනය - ස්පාඤ්ඤයේ ධර්මදූතවරු<br>• ජපානය - සාන්ත සේවියර් ධර්මදූතවරු<br>• ශ්‍රී ලංකාව<br>  • පෘතුගීසීන් පැමිණීමට පෙර කිතුනුවන් ජීවත් වූ බවට වන ලිඛිත සාක්ෂ්‍ය<br>  • කැණීම් හා සොයගැනිම් | • ආසියාතික රටවල කිතුදහමේ ව්‍යාප්තිය පිළිබඳ කරුණු රැස් කරයි.<br>• ආරම්භක යුගයේ දී ම ආසියාතික රටවල කිතුදහම් ව්‍යාප්ත වූ බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• සුබාරංචියේ අන් අය වෙත රැගෙන යයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ක්‍රියාශීලී ව කටයුතු කරයි. | 12 |
| | 9.2යුරෝපීයයන්ගේ පැමිණීමත් සමඟ ම ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ව්‍යාප්තියේ ඉතිහාසය දැනගෙන ශුද්ධ වූ සභාවේ වර්ධනයට දායක වෙයි. | පෘතුගීසි සමයේ ශුද්ධ වූ සභාව<br>• පෘතුගීසීන්ගේ පැමිණීම<br>• පෘතුගීසි සමයේ ධර්මදූතවරු<br>• මන්නාරමේ ප්‍රාණ පරිත්‍යාගීහු<br>• අධ්‍යාපන සේවාව<br>• කලාවට දැක් වූ දායකත්වය | • පෘතුගීසි සමයේ ශ්‍රී ලංකාව තුළ කතෝලික දහම ව්‍යාප්ත වූ ආකාරය පිළිබඳ කරුණු රැස් කරයි.<br>• ඕලන්ද සමයේ කතෝලික සභාව වර්ධනය කළේ ශුද්ධවූ ජුසේවාස් තුමන් බව පිළිගනියි.<br>• ගොනුකරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ශ්‍රී ලංකාවේ ශුද්ධ වූ සභාවේ වර්ධනයට දායක වෙයි.<br>• කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ක්‍රියාශීලී ව කටයුතු කරයි. | 34 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 9.3 ශ්‍රී ලාංකේය සමාජයේ උන්නතිය සඳහා අවශ්‍ය දෑ හඳුනාගෙන තම වගකීම් ඉටුකරයි. | • අධ්‍යාපන සේවයේ සංවර්ධනය<br>• කිතුනු අධ්‍යාපනඥයෝ (රදගුරුහිමිවරුන් වන අතිගරු බොන්ජීන් හිමිපාණෝ (නිමනි), අතිගරු එඩ්මන් පීරිස් හිමිපාණෝ (නිමනි), අතිගරු පීටර් පිල්ලෙ පියතුමා, අතිගරු නල්ලූර් ස්වාමි (නි.ම.නි.), ඥාණප්‍රගාසර් පියතුමා (නි.ම.නි.), ගරු මයිකල් රොද්‍රිගු පියතුමා (නි.ම.නි.), ගරු මේරි බැස්ටියන් පියතුමා, ගරු එච්. එස්. දාවිත් පියතුමා, ගරු එස්. ජී. පෙරේරා පියතුමා, විලී වික්‍රමසිංහ මහතා, ආර්. එස්. ඩී. සේරම් මහතා)<br>• පාසල් රජයට පවරා ගැනීමේ ප්‍රතිඵල<br>• ශ්‍රී ලංකේය සමාජය තුළ සුභසාධන සේවා<br>• ආරෝග්‍යශාලා සේවාව (දේව මාතාවන්ගේ ෆ්‍රැන්සිස්කාන පැවිදි සොහොයුරියෝ, සිරිකුරුසයේ පැවිදි සොහොයුරියෝ, ග්‍රීන් ආරෝග්‍ය ශාලාව)<br>• මානව අයිතිවාසිකම් පිළිබඳ දායකත්වය (ලියෝ නානායක්කාර රදගුරුතුමා, (සා.බෙ.නි.) ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා) | • යටත් විජිත සමයේ සිට අද දක්වා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන තත්ත්වය පිළිබඳ කරුණු රැස් කරයි.<br>• අධ්‍යාපනයේ උන්නතිය මඟින් ශ්‍රී ලාංකේය සමාජය ලබාගත් ප්‍රයෝජන අගය කරයි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• ශුභසාධන සේවාවල නියැළෙයි.<br>• තම හැකියා සමාජ උන්නතිය සඳහා යොදවයි. | 26 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.0 නව ශිෂ්ටාචාරයක් බිහි කිරීමේ කිතුනු සේවාවට සහභාගි වෙයි. | 10.1 ශුද්ධ වූ සභාවේ සමාජ සංවර්ධනය පිළිබඳ ඉගැන්වීම් හදාරා නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි. | • ශුද්ධ වූ සභාවේ සමාජීය ඉගැන්වීම් පිළිබඳ හැඳින්වීම<br>• දෙවන වතිකාන සභා ප්‍රකාශන - වර්තමාන ලෝකයේ ශුද්ධ වූ සභාව,<br>• මිනිස් වටිනාකම්<br>• පවුල් දිවිය<br>• සංස්කෘතිය<br>• සාමය හා සහජීවනය<br>• ආසියානු රදගුරු සම්මේලනයේ ආරම්භය හා සමාජීය අරමුණු (FABC) | • ශුද්ධ වූ සභාවේ සමාජීය සංවර්ධනය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• ආසියානු රදගුරු සම්මේලනයේ සමාජීය චින්තනය පිළිගනියි.<br>• පවුලේ එකිනෙකාගේ යුතුකම් හා වගකීම්, සමාජයේ එකිනෙකාගේ යුතුකම් හා වගකීම් පිළිබඳ ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• මිනිස් වටිනාකම් පිළිබඳ සභා ඉගැන්වීම් තම ජීවිතයට අදාල කර ගනියි.<br>• මිනිස්කම සුරකින ක්‍රියාවල අන් අය හා එක් ව කටයුතු කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 10.2 කිතුනු ආයතනවල සමාජ ඉගැන්වීම් හා මඟපෙන්වීම් හදාරා නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල නියැළෙයි. | • ජගත් කිතුනු සභා සම්මේලනයේ ආරම්භය- සමාජීය අරමුණු (WCC)<br>• ආසියානු ක්‍රිස්තියානි සම්මේලනයේ ආරම්භය - සමාජීය අරමුණු (CCA)<br>• දේශීය කිතුනු සභාවන්හි සම්මේලනයේ ආරම්භය - සමාජීය අරමුණු (NCC) | • කිතුනු සභා සම්මේලනයේ ආරම්භය හා සමාජීය අරමුණු පිළිබඳ කරුණු රැස් කරයි.<br>• කිතුනු සභා සම්මේලනයයේ සමාජ සංවර්ධනය සඳහා ක්‍රියා කරන බව පිළිගනියි.<br>• ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>• කිතුනු සභා සම්මේලනයේ සමාජීය අදහස් ආදර්ශ කර ගනිමින් ජීවත් වීමට උත්සාහ දරයි.<br>• අන් අය හා සහයෝගයෙන් ක්‍රියා කරයි. | 14 |
| | 10.3 විවිධ කිතුනු සභා අතර (Ecumenism) සාමාජිකත්වය මෙන් ම විවිධ ආගම් අතර සංවාදය ප්‍රගුණ කරයි.<br>(Inter – Religious Dialogue) | • කිතුනු සභා එකමුතු ව හා අන්තර් ආගමික සංවාදය<br>- ජගත් කිතුනු සභාවේ (WCC) පිළිබඳ ඉගැන්වීම්<br>- දෙවන ජගත් මන්ත්‍රණ සභාවේ වතිකාන සඳහා වන ඉගැන්වීම් හා වැයම්<br>• අන්තර් ආගමික සංවාදයේ වැදගත්කම<br>- දෙවන ජගත් වතිකාන මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම්<br>- ආසියානු රදගුරු සම්මේලනයේ ඉගැන්වීම් | • කිතුනු සභාවන්, මෙන් ම විවිධ ආගමික බැතිමතුන් අතර සුහදතාව ඇති කිරීමේ මාර්ගය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>• කිතුනු සභා සහ වෙනත් ආගමික බැතිමතුන් අතර සුහදතාවෙන් ජීවත් විය යුතු බව පිළිගනියි.<br>• කිතුනු එකමුතුව ඇති කළ හැකි ආකාරය නිර්මාණයකින් ඉදිරිපත් කරයි.<br>• කිතුනු සභා හා වෙනත් ආගමික බැතිමතුන් අතර සමගිය නැංවීමට කටයුතු කරයි.<br>• අන්‍යාගමිකයන්ගේ යහපත් ක්‍රියාවලට සහයෝගය දක්වයි. | 16 |

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | 6.0 | : | **මුල් යුගයේ ශුද්ධ වූ සභාව මුහුණ දුන් අභියෝග හඳුනාගෙන ශුද්ධ වූ සභාවේ වර්ධනයට දායකත්වය ලබාදුන් චින්තකයන් හා තාපස ජීවිත ක්‍රම අනුගමනය කරමින් ජීවත් වීමට උනන්දු වෙයි.** |
| **නිපුණතා මට්ටම** | 6.1 | : | මුල් සියවස් පහ තුළ ශුද්ධ වූ සභාව මුහුණ දුන් අභියෝග හා ඒවායේ ප්‍රතිවිපාක තම ජීවිතයට ආදර්ශයක් කර ගනියි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | | : | 20 |

**ඉගෙනුම් පල**

- මුල් කාලයේ කිතු දහමට එල්ල වූ පීඩන පිළිබඳ තොරතුරු රැස් කරයි.
- අපගේ විශ්වාසයට පටහැණි අභියෝගවලට මුහුණ දිය යුතු බව පිළිගනියි.
- රැස් කරගත් තොරතුරු නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.
- විශ්වාසයට පටහැණි ව එල්ල වන අභියෝග ජය ගනියි.
- ශුද්ධ වූ සභාවේ වර්ධනයට මීසම් පවුල හා එක් වී ක්‍රියා කරයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-

### 6.1.1.1. - ජුදා පීඩනය

- කිතු දහමට තම මුල් ශත වර්ෂ තුන තුළ විවිධ අභියෝගයන්ට මුහුණ දීමට සිදු විය.
- මෙම කාලය තුළ වර්ධනය වූ ආකාරයට ශුද්ධ වූ සභාව වෙනත් කිසි ම කාලයක වර්ධනය නොවී ය.
- ශුද්ධ වූ සභාවේ මුල් ශතවර්ෂ වීර ඉතිහාසයකට හිමිකම් කියන කාලය යැයි පවසනුයේ එබැවිනි.
- ශුද්ධ වූ සභාවට විටෙක ඊට බාහිර ව එල්ල වූ පීඩන විය, ඒවා නම්, මුලින් ම ජුදා පීඩනය හා පසු ව රෝම පීඩනය වේ.

**ජුදා පීඩනයට පාදක වූ හේතු**

ජුදයන් කිතුනුවන් ප්‍රතික්ෂේප කරමින් ඔවුනට පීඩා කිරීම ජුදා පීඩනය යි.

- ජුදා ජනතාව දාවිත් රජතුමන් මෙන් බලවන්ත අධිරාජ්‍යවරයකු බලාපොරොත්තුවෙන් සිටිය හ. එම රජතුමා තමන්ට දේශපාලන නිදහස ලබා දෙන ලෞකික රජකු ලෙස සිටී යැයි ඔවුහු බලාපොරොත්තු වූ හ.
- ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම් හා ක්‍රියාකාරකම් ඔවුන්ගේ බලාපොරොත්තුවලට පටහැණි විය. දිළිඳු වඩුවකුගේ පුතකු ලෙස හැදුණු වැඩුණු උපත ලැබූ ක්‍රිස්තුන් වහන්සේ මෙසියස් ලෙස පිළිගැනීම ඔවූහු ප්‍රතික්ෂේප කළ හ.
- සද්දුසිවරු, පරිසිවරු හා නායක පූජකයෝ කිතුනුවන්ගේ වර්ධනය නිසා තමන් සතු බලය නැති වී තම තනතුරු අහිමි වේ යැයි බිය වූ හ.
- විවිධ ආක්‍රමණවලට, විශේෂයෙන් රෝමවරුන්ගේ පාලනයට යටත් වීමට ප්‍රධාන හේතුව කිතුනුවන් මෙසියස් ලෙස ක්‍රිස්තුන් වහන්සේට පිළිගත් පාපය යැයි චෝදනා කළ හ.

**ජුදා පීඩනයේ ප්‍රතිඵල :-**

- ජෙරුසලමේ සැඟ ව සිටි කිතුනුවෝ විසිර ගොස්, ගිය සෑම තැනක ම දේව වචනය ප්‍රකාශ කළ හ.

- පාවුලු තුමා තම සිත් හැරීමෙන් පසු, කිතු දහමට කළ සේවාව නිසා කිතු දහම වර්ධනය විය.

- සමහර ජුදයෝ තම සිත් හැරීම හේතු කොට ගෙන කිතු දහම වැලඳ ගත් හ.

- සභාව මුහුණ දුන් පීඩන සභාව වඩාත් වර්ධනය වීමට ත්, ශක්තිමත් වීමට ත් හේතු විය.

## 6.1.2 රෝම පීඩනය

- ජුදා පීඩනයෙන් අනතුරු ව කිතු දහම රෝම අධිරාජයන් යටතේ පීඩනයට ලක් විය.
- රෝමවරුන් විසින් නව දහම වැලඳගත් පිරිසට විරුද්ධ ව සිදු කරන ලද පීඩන රෝම පීඩනය නම් වේ.

- මෙය ත්‍රිවිධාකාරය.
  1) ප්‍රතිපත්ති පීඩනය
  2) අවස්ථානුකූල පීඩනය
  3) රාජ්‍ය පීඩනය

- මේවා පළමු ශතවර්ෂ තුනේ දී තුළ සිදු විය.

- රෝම පීඩන දහයකි. මේවා අතුරින් අවසාන පීඩානය ඉතා ම කෲර විය.

- පීඩන යුගය ප්‍රාණපරිත්‍යාගීන්ගේ යුගය යැයි හඳුන්වති.

### 1. ප්‍රතිපත්ති පීඩාව

- කිතුනුවන් සමාජ විරෝධින් යැයි රෝමවරු තීරණය කළහ.

- කිතුනුවන්ගේ ක්‍රියාකලාපය අයුක්ති සහගත යැයි සැලකූ රාජ්‍ය නිලධාරීන් ඒවා විසඳීමට මැදිහත් විය.

- මෙපමණ කලක් රෝමයේ පැවති ආගමික සහජීවනය විනාශ වී අධිරාජ්‍යයේ පැවති ආගමික ප්‍රතිපත්තිවලට අභියෝග එල්ල විය. එවැනි පසුබිමක් තුළ කිතුනුවන් ලෙස ජීවත් වීම පවා වරදක් යැයි සලකා ඔවුන්ට පීඩා කළ හ.

### 2. අවස්ථානුකූල පීඩා

- ට්‍රාජන් අධිරාජ්‍ය සමයේ රෝමවරුන් විසින් කිතුනුවන්ට විරුද්ධ ව චෝදනා නගමින් ඔවුන් ව අධිකරණය හමුවට ගෙන එන ලදී. පසු ව අධිරාජ්‍යයා විසින් කිතුනුවන්ගෙන් මේ පිළිබඳ ව ප්‍රශන් කර කිතු දහම ප්‍රතික්ෂේප කරන ලෙස අණ කළ අතර එසේ කිතු දහම ප්‍රතික්ෂේප කළ පිරිස ඉන් මුදා හැර ප්‍රතික්ෂේප නොකළ පිරිසට මරණ දඬුවම නියම කරන ලදී.

- එබැවින් මේ සමයේ කිතුනුවන් අධිරාජ්‍යයාගේ යටතේ සිටිය හ.

- රෝමවරුන් කිතුනුවන්ට විරුද්ධ ව එක් එක් ස්ථානවල ඇති කළ නොසන්සුන්තාව ය හේතු කොට ගෙන
  ඇති වූ අවහිරතාව ය අවස්ථානුකූල පීඩනයක් ලෙස හැඳින්විණි.

### 3. රාජ්‍ය පීඩා

- රෝමයේ කිතුනුවන්ගේ ගණන දිනෙන් දින වැඩි වීම නිසා, රෝම රාජ්‍ය ආගමට මෙන්ම රෝම අධිරාජ්‍යයාට ද බලපෑම් එල්ල විය හැකි යැයි බිය වී, ක්‍රිස්තියානිය පැතිරීම වළක්වමින්. කිතුනුවන්ට විරුද්ධ ව පොදු නීතියක් පනවන ලදි. මේ කාල සීමාව තුළ කිතුනුවෝ බහුල ලෙස සිරගත වීම්වලට ද ලක් වූ හ.

### රෝම පීඩා ඇති වීමට හේතුව

- කිතුනුවන් තම එක ම දෙවියන් වහන්සේ හැර රෝම දෙවිවරුන් වන්දනාමාන කිරීම ප්‍රතික්ෂේප කිරීම.

- කිතුනුවන් අන්‍ය දෙවිවරුන්ට වන්දනාමාන කිරීම පාපයක් කොට සැලකූ හෙයින් ප්‍රතිමා නෙළන්නන් හා පූජා පවත්වන පූජකවරුන් තම විරුද්ධවාදීන් කිතුනුවන්ට ලෙස සැලකීම.

- කිතුනුවන් ඔවුන්ගේ වැඳුම් පිදුම් රාත්‍රි කාලයේ රහසිගත ව එක් ව නිවෙස්වල, භූගත සොහොන් හා ගුහාවන්හි පැවැත් වූ හෙයින්, ඔවුන් අසභ්‍ය ලෙස හැසිරීම සඳහා මෙලෙස එක් වන බව පවසමින් චෝදනා කළ හ. කිතුනුවන් ක්‍රිස්තුන් වහන්සේ ගේ ශරීරය හා රුධිරය වන්දනාවට (පූප කැඩීම) සහභාගි වීම පිළිබඳ ව රෝමවරුන් ගේ බොරු චෝදනාවක් එල්ල විය.

- ලෝකයේ සිදු වන විනාශයන්ට හේතුව කිතුනුවන් බව පැවැසූහ.

- රෝම අධිරාජ්‍යයා මෙන් නොව වඩා දේව රාජ්‍යය සදාතනය යන කිතුනු විශ්වාසය රෝමවරුනට පිළිගත නොහැකි වීම.

- කිතුනුවන් රෝම දෙවිවරුන්ට හා රෝම අධිරාජ්‍යයාට වන්දනාමාන කිරීම ප්‍රතික්ෂේප කළ නිසා ඔවුන් අධිරාජ්‍යයාගේ හා අධිරාජ්‍යයේ මෙන් ම මිනිස් සංහතියේම විරෝධීන් බවට චෝදනා එල්ල කළහ.

- රෝමවරුන්ගේ සංස්කෘතියට, ශිෂ්ටාචාරයට හා අධිරාජ්‍යයට කිතුනුවන් එරෙහි වන්නන් ලෙස සලකා ඔවුන් ප්‍රතික්ෂේප කළහ.

- ජුදා දහම අතහැර ක්‍රිස්තියානිය වැලඳ ගත් ජුදා කිතුනුවන් පිළිගත නොහැකි ජුදයන් රෝමවරුන්ගේ කෝපය තව දුරටත් වර්ධනය කර කිතුනුවන් හා රෝමවරුන් අතර සැකය, ප්‍රතික්ෂේප කිරීම, විරෝධය, දිනෙන් දින වර්ධනය කිරීම නිසා පීඩනය තවත් උග්‍ර විය.

රෝම පීඩා

| | වර්ෂය | රජවරු | පීඩා කිරීමට හේතුව | ප්‍රාණ පරිත්‍යාගීන් | පීඩා කළ ආකාරය |
|---|---|---|---|---|---|
| 1 | ක්‍රි.ව 64- 65 | නීරෝ අධිරාජයා | රෝම නගරය ගිනිබත් කර, එය නැරඹීමට ඔහු තුළ වූ ආශාව ඉටු කරගත් නීරෝ අධිරාජයා එම චෝදනාව කිතුනුවන් මත පැටවීම. | • බොහෝ කිතුනුවෝ<br>• පේදුරු තුමා කුරුසපත් කර මරනු ලැබී ය.<br>• පාවුලු තුමා හිස ගසා මරනු ලැබී ය. | • කැලෑ සතුන්ගේ හම් පොරවා සුනඛයින්ට ආහාර ලෙස දැමීම.<br>• ශරීරවලට ගෙන්දගම් තවරා රාත්‍රි කාලයේ ගිනිකූඩුනු ලෙස භාවිත කිරීම.<br>• කිතුනු කාන්තාවන් සිරගත කර මෘගයන්ට ආහාර ලෙස දැමීම. |
| 2 | ක්‍රි.ව 95- 96 | දොමීෂියන් අධිරාජයා | අධිරාජයා තමන් දෙවියන් බවට ප්‍රකාශ කර තමන්ට සියලු දෙනා වන්දනාමාන කළ යුතු බවට නියෝග කළේය.එසේ වන්දනාමාන නොකළ අයට පීඩා කළේ ය. | • ශුද්ධවූ අන්ද්‍රේ තුමන් x හැඩැති කුරිසියක ඇණ ගසා මරනු ලැබීය.<br>• ශුද්ධ වූ තිමෝති | • මරනු ලැබීම.<br>• රටින් පිටුවහල් කරනු ලැබීම..<br>• කිතුනුවන් හිස ගසා මරනු ලැබීම.. |
| 3 | ක්‍රි.ව 106- 117 | ට්‍රාජන් අධිරාජයා | • කිතුනුවන් මත්පැන් පානය කර සැණකෙළි පවත්වන බව පවසමින් ඔවුන්ට පීඩා කළ හ.<br>• කිතුනුවන්ගේ වන්දනා ක්‍රම පිළිබඳ ව වැරදි ලෙස අවබෝධ කර චෝදනා කළහ. | • ශුද්ධවූ සිමියොන්<br>• අන්තියෝගයේ රදගුරු වූ ඉග්නේෂියස් තුමා (මෙතුමා දෙවිඳුන් වැළඳ ගත් තැනැත්තා " දෙවිඳුන් දරන්නා" යන විරුදාවලිය ලැබුවේ ය. | • සතුනට දඩයමක් ලෙස. |
| 4 | ක්‍රි.ව 161- 180 | මාර්කුස් අවුරේලියස් අධිරාජ්‍යයා | • කිතුනුවෝ සතුටින් ජීවත් විය යුතු අය නොවෙත් ද? ඔවුන් තම දහම වෙනුවෙන් තම ජීවිතය පරිත්‍යාග කළ යුත්තේ මන්ද? මෙය ඔවුන්ගේ හිතුවක්කාරකම යැයි පවසා ඔවුන් රටින් පිටුවහල් කළ හ. | • සත්‍යයේ ආරක්ෂකයානන් වන ශු.ජස්ටින් තුමා.<br>• සංගීතයේ ආරක්ෂිකාව වන ශුද්ධ වූ සිසිලියා තුමිය<br>• ශුද්ධ වූ බෝටිනුස්<br>• ශුද්ධ වූ පිලර්දීන්<br>• ශුද්ධ වූ සිම්බෝරියන් | • රටින් පිටුවහල් කිරීම. දඬුවම් කරනු ලැබීම.<br>• හිස ගසා මරනු ලැබීම. |
| 5 | ක්‍රි.ව 202- 211 | සෙවාරුස් අධිරාජයා | • ජනතාව කිතු දහම හෝ ජුදා දහම හෝ වැලඳ ගැනීම නීතියට පටහැනි නීති විරෝධි ක්‍රියාවක් විය. කිසිවකු චර්මච්ඡේදනය කිරීම, බෞතිස්ම ස්නාපනය කිරීම වළක්වන ලදි.<br>• පොදු ආරක්ෂාව පිණිස කිතුනුවන්ට පීඩා කළහ. | • සත්‍යයේ ආරක්ෂකයානන් වන ශු. ඉරනේයුස් හා ෆෙලිසිටා තුමිය හා පර්පෙතුවා තුමිය | • වරදකරුවන් සොයා ගොස් දඬුවම් කිරීම. මරණ දඬුවම නියම කිරීම. |
| 6 | ක්‍රි.ව 235- 238 | මැක්ෂිමිලියන් ට්‍රාෂියන් අධිරාජයා | • ශුද්ධ වූ සභාව පැතිරයාම නවතාලීමට එහි සැකැස්ම හා බලය විනාශ කිරීමේ මාර්ගය ශුද්ධෝත්තම පියතුමන්, රදගුරුවරුන් හා පූජකවරුන් අත් අඩංගුවට ගෙන පීඩාවට පත් කිරීම බව විශ්වාස කළේ ය. | • ශු. පොන්සියස් ශුද්ධොත්තම පියතුමන්, අන්ද්‍රයස් | • කිතුනුවන් අත් අඩංගුවට ගෙන සිරගත කිරීම.<br>• රටින් පිටුවහල් කරනු ලැබ මරණ දඬුවම නියම කිරීම.<br>• කිතුනු සංඝ හා ආයතන ගිනිබත් කිරීම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 7 | ක්‍රි.ව 249- 251 | දීසියස් අධිරාජයා | • කිතු දහම විනාශ කිරීමට පෙරමුණ ගති. රෝම අධිරාජ්‍යයාට දේව ආශීර්වාදය පතා රෝම දෙවිවරුන්ට පුද පූජා පවත්වන ලෙස සියලු ම රෝම ප්‍රජාවට බලකරනු ලැබී ය. ප්‍රතික්ෂේප කළ අයට පීඩා කළේ ය. | • ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශු. ඩයෝසියස් ශුද්ධෝත්තම පියතුමා. • ශුද්ධවූ පපියාස් ඔරිජන් විශ්වාසයේ ආරක්ෂකයා | • වස්තුව කොල්ල කෑම. |
| 8 | ක්‍රි.ව 257- 260 | වැලේරියන් අධිරාජ්‍යයා | • වැලේරියන්ගේ ඉල්ලීම පරිදි නියෝග දෙකක් පනවන ලදි. 1. පූජකවරුන් ප්‍රතිමාවලට පූජා පැවැත්විය යුතුය. 2. පූජකවරුනට හා කිතුනුවන්ට දැඩි ලෙස පීඩා කළ යුතු ය. | • දෙවන සික්ස්ටස් ශුද්ධෝත්තම පියතුමා ඇතුළු තේවාචාරීවරු 06 දෙනෙක් • ශුද්ධවූ ලෝරන්ස් තුමා • විශ්වාසයේ ආරක්ෂකයාණන් වන ශුද්ධ වූ සිප්‍රියන් තුමා | • රටින් පිටුවහල් කරනු ලැබීම. • මරණ දඬුවම නියම කිරීම. • හිස ගසා මරනු ලැබීම. • ගිනිබත් කිරීම. |
| 9 | ක්‍රි.ව 274- 275 | අවුරේලියස් අධිරාජයා | • කිතුනුවන්ට විරුද්ධ ව විවිධ නීති පනවන ලදි. • කිතුනුවෝ පොදු ආරක්ෂාව යන පදනමින් පීඩාවට පත් කරනු ලැබූ හ. | • ශු. පෙලික්ස් ශුද්ධෝත්තම පියතුමා • ශුද්ධ වූ ඩෙනිස් • ශුද්ධ වූ කෝනොස් | • මරනු ලැබූ හ. |
| 10 | ක්‍රි.ව 303- 305 | ඩයක්ලේෂියස් අධිරාජ්‍යයා | • රෝමයේ පැවැති මිථ්‍යා දෘෂ්ටික වන්දනාවලට කිතුනුවන් සහභාගි විය යුතු බවට නියෝගයක් පනවන ලදි. | • ශු. සෙබස්තියන් තුමා • ශුද්ධ වූ තාර්සියුස් තුමා • ශුද්ධ වූ කොස්ටාස් තුමා • ශුද්ධ වූ ඩේමියන්තුමා • ශුද්ධ වූ පෙලියස් තුමා | • යකඩ ඇඳක ගැට ගසා වෙඩි තබනු ලැබීම. • ශරීරය අඬුවකින් තුවාල කරනු ලැබීම. • කැටකුම්භවල තැන්පත් කරනු ලැබීම. |

**රෝම පීඩනයේ ප්‍රතිඵල**

**යහපත් ප්‍රතිඵල**

- කිතුනුවන්ගේ විශ්වාසය වඩාත් තහවුරු විය.
- කිතුනුවෝ පරිත්‍යාගශීලී හා පරාර්ථකාමී ජීවිත පැවැත්මකට යොමු වූ හ.
- ප්‍රාණ පරිත්‍යාගි භාවය මඟින් කිතුනුවන් ලබා දුන් සාක්ෂ්‍ය විශ්වාසයේ සත්‍යතාවන්හි උතුම් බව හා බලවන්ත භාවය ප්‍රකාශ කළේ ය.
- ප්‍රාණ පරිත්‍යාගීන්ගේ රුධිරය ශුද්ධ වූ සභාවේ බීජය බවට පත් වී එය වර්ධනය වීමට හේතු විය.

**අයහපත් ප්‍රතිඵල**

- කිතුනුවන් පීඩාවට පත් කර ඔවුන්ගේ ජීවිත විනාශ කිරීම.
- ඔවුන් රටින් පිටුවහල් කරනු ලැබීම.
- ඔවුන් සතු වස්තු සම්පත් විනාශ කිරීම හා ඒවා මංකොල්ල කෑම.
- කිතුනුවන් ඔවුන් ජීවත් වූ ප්‍රදේශ අතහැර පලා යෑම.
- කිතුනුවන්ගේ වන්දනා ස්ථාන කඩා බිඳ දැමීම.

### 6.1.3 මිලාන් ආඥාව සහ ආමිගක නිදහස

- කිතුනුවන්ට පීඩා කිරීම කිසිදු ප්‍රයෝජනයක් නොමැති බව වටහාගත් ගැරලියස් අධිරාජ්‍යයා විසින් ක්‍රි.ව.311 දී කිතුනුවන් පීඩාවට පත් නොකළ යුතු යැයි නියෝගයක් පනවන ලදි. මෙය නම්‍යශීලී ශාසනය යැයි හඳුන්වන ලදි.

- ක්‍රි.ව. 312 දී විශේෂ සිදුවීමක් සිදු විය. යුවරජු වූ මාක්සෙන්සියුෂ් සම්පූර්ණ අධිරාජ්‍යයට ම රජ වීමේ ආශාවෙන් බටහිර අධිරාජ්‍යය පාලනය කළ කොන්ස්තන්තීනු රජ ට විරුද්ධ ව යුද්ධ ප්‍රකාශ කළේ ය. එය දැනගත් කොන්ස්තන්තීනු රජ 2500ක් පමණ යුද්ධභටයන් සමග ඇල්බස් කඳු පන්තිය පසු කර ඉතාලියට ගියේ ය.

- ඔහු රෝමයට ළඟා වූ විට අහසේ ආලෝකවත් කුරුසියක් ද එය වටා "මෙම සංකේතය ලබාගෙන නුඹ ජය ලබයි" යැයි ලියා ඇති බව ද මෙම දර්ශනයේ අර්ථය වටහාගත නොහැකි වූ කොන්ස්තන්තීනු අධිරාජ්‍යයාට එදින රාත්‍රියේ ක්‍රිස්තුන් වහන්සේ සිහිනෙන් දර්ශනය වී යුද්ධභටයන්ගේ පලිහයේ ඇති රාජාලියාගේ සංකේතය වෙනුවට කුරුසියේ සංකේතය උපයෝගී කර ගන්නා ලෙස පැවසූ හ.

- කොන්ස්තන්තීනු අධිරාජයා එයට එකඟ වී තම යුද්ධභටයන්ගේ පලිහයේ කුරුසියේ සංකේතය යොදා යුද්ධ කළෝ ය. මාක්සෙස්සියස් ද දහස් ගණනින් ඔහුගේ යුද්ධ භටයන් ද කොන්ස්තන්තීනු හමුදාව හා යුද වැදීමට නොහැකි ව බේරී දිව ගිය අවස්ථාවේ දී සියලු දෙනා ටයිබර් ගඟේ ගිලී මිය ගියෝ ය.

- මෙම ආශ්චර්යවත් ජයග්‍රහණය රෝම අධිරාජ්‍ය පුරා තැති ගැනීමත් ඇති කළේ ය. මෙම ජයග්‍රහණය දෙවියන් වහන්සේ ගේ බලය විදහා දැක්වීමක් ලෙස සැලකි ණි.

- රෝමයේ කිතුනුවන්ගේ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබූ කොන්ස්තන්තීනු රජතුමා ස්ථාපනය කළ නව ප්‍රතිමාවේ අතේ කුරුසයක් තැබී ය. එහි පාමුල "කුරුසියේ සංකේතය මඟින් දුෂ්ටයන්ගේ බැම්වලින් මම ඔබේ නගරය මුදා ගතිමි" යැයි කෙටී ය.

- ජයග්‍රහණය ලැබූ අධිරාජ්‍යයා රෝමයේ සියලු දෙනා විසින් පිළිගන්නා ලදි.

- කොන්ස්තන්තීනු අධිරාජයා, අධිරාජයයේ ඉහළ කොටස පාලනය කළේ ය. මෙතුමා අධිරාජයයේ පහළ කොටස පාලනය කළ ලිසිනියුස් අධිරාජයා සමඟ මිලාන් නගරයේ සමුළුවක් පවත්වා, සාකච්ඡා කර ඉතිහාසගත මිලාන් ආඥාව ප්‍රකාශයට පත් කළේ ය.

### මිලාන් ආඥාව මඟින් කිතු දහමට උදා වූ යහපත

- මෙම ආඥාව මඟින් කිතුනුවන්ට ආගමික නිදහස ලැබිණි.

- පැවිද්දන්, පූජකවරුන් බදු ගෙවිය යුතු නැති බවත්, පරිත්‍යාගයන් වස්තු දානයන් දේවස්ථානය විසින් ලබා ගත හැකි බවත්, ඉරු දිනවල වැටුප් ලබන කිසි රැකියාවක් නොකළ යුතු බවත්, ඒ දින පොදු නිවාඩු දවසක් ලෙසත් ප්‍රකාශ කරන ලදි.

- වැරදිකරුවන් කුරුසපත් කිරීම අවලංගු කරන ලදි.

- රදගුරුවන්ගේ බලය පිළිගන්නා ලදි.

- බලයෙන් ලබාගත් වස්තුව කිතුනුවන්ට නැවත ලබා දෙන ලදි.

- බෙලහීන, අංගවිකල දරුවන් මැරීම තහනම් කරන ලදි.
- වහල් වෙළඳාම වහලුන් පීඩාවට පත් කිරීම ආදිය තහනම් කරන ලදි.
- ණය ගැතියන් පීඩාවට පත් නොවන ආකාරයට මිලාන් ආඥාවෙන් ආරක්ෂාව ලබා දෙන ලදි.
- ක්‍රි.ව. 380 දී තියඩෝසියස් අධිරාජයාගේ කාලයේ කිතු දහම රාජ්‍ය ආගම ලෙස ප්‍රකාශයට පත් කරන ලදි.

**මිලාන් ආඥාව මඟින් කිතු දහමට වූ අයහපත**

- සභාව තුළ ලෞකිකත්වය වැඩි වීම.
- ප්‍රාණ පරිත්‍යාගී වීම නැති වී යාම.
- විශ්වාසය හීන වීම.
- අධිරාජවරුන්ගෙන් සමහර තම බලය වැරදි ආකාරයට යොමු කර ශු. සභාවේ පාලනයටත් සභා සංසවලටත් බලපෑම් ඇති කිරීම.
- මිථ්‍යා ඉගැන්වීම්වලට හා මිථ්‍යා ප්‍රතිපත්ති දරන අයට සහය දීම.
- ශුද්ධ වූ සභාවේ නායකයාණන් වන ශුද්ධෝත්තම පියාණන්ට අයත් ස්ථානය හා ගෞරවය ලබා දීම ප්‍රතික්ෂේප කිරීම.
- රදගුරුවරුන් හා ශුද්ධ වූ සභාවේ නායකයන් තනතුරුවලින් පහ කර රටින් පිටුවහල් කර නුසුදුසු අය එම තනතුරුවලට පත් කිරීම.

**කිතු දහමේ විශ්වීය බව**

- ශුද්ධාත්ම මඟ පෙන්වීම මඟින් ශුද්ධ වූ පේදුරු තුමා ශතාධිපතියකු වූ කොරනේලියස්ට සහ ඔහුගේ පවුලේ සාමාජිකයින්ට ප්‍රසාද ස්නාපනය දීම, විජාතිකයන් බොහෝ දෙනෙකු බෞතිස්මය ලබා ශුද්ධ වූ සභාවට එකතු වීමට හේතු විය.
- ජෙරුසලම් මන්ත්‍රණ සභාව කිතු දහම විශ්වීය ධර්මයක් ලෙස ප්‍රසිද්ධියේ පිළිගති. එබැවින් කිතු දහම සියලු ජාතීන් අතර ම ප්‍රචලිත විය.
- මුල් යුගයේ කිතුනු විශ්වාසය තුළ ග්‍රීක දර්ශනවාදයේ බලපෑම දැකිය හැකි විය.

**යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්**

1. ආරම්භ සියවසේ දී ශු. සභාවට විරුද්ධ වූ ජුදා - රෝම පීඩනයන් පිළිබඳ ව සාකච්ඡා කිරීම.
2. රෝම පීඩනය මාතෘකාව යටතේ රචනාවක් ලිවීම.

**නිපුණතාව 6.0 : මුල් යුගයේ ශුද්ධ වූ සභාව මුහුණ දුන් අභියෝග හඳුනාගෙන ශුද්ධ වූ සභාවේ වර්ධනයට දායකත්වය ලබාදුන් චින්තකයන් හා තාපස ජීවිත ක්‍රම අනුගමනය කරමින් ජීවත් වීමට උනන්දු වෙයි.**

**නිපුණතා මට්ටම 6.2 :** මුල් යුගයේ කිතුනු සභාවල ගොඩනැගුණු ප්‍රතිපත්තීය චින්තනයන් හා සංස්කෘතික ගුණාංග හඳුනා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව:** 26

**ඉගෙනුම් පල**

- මුල් යුගයේ කිතුනු සභාවේ දක්නට ඇති වූ ග්‍රීක-රෝම සංස්කෘතික ගුණාංග පෙළගස්වයි.
- ක්‍රිස්තියානිය තුළ යහපත් සංස්කෘතික ගුණාංග සමන්විත වන බැව් පිළිගනියි.
- රැස් කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- යහපත් සංස්කෘතික ගුණාංගවලට ගරු කරමින් ජීවත් වීමට උගනියි.
- ශුද්ධ වූ සභාවේ නවෝදයට සහය වෙයි.

## 6.2.1. නව චින්තනයක් බිහි වීම

- කිතු දහම ජුදා ආගමේ ශාඛාවක් ලෙස ත් මුලදී තේරුම් ගත්ත ද ඉතා ඉක්මනින් ස්වාධීන ආගමයක් ලෙස වර්ධනය වී අන්‍ය ජාතිකයන් අතර පැතිර ගියේ ය.

- ජුදා ආගමික සමාජීය චින්තනයන් මඟින් බිහි වූ කිතු දහම අන්‍ය ජාතිකයින් අතර ප්‍රචලිත වීමත් සමඟ ඔවුන්ගේ පසුබිමෙහි ලා වර්ධනය වීමේ අවශ්‍යතාවය ඇති විය.

- විශේෂයෙන් ග්‍රීක දාර්ශනික චින්තනය හා ග්‍රීක සාහිත්‍යය තුළ වූ අදහස් ද යොදා ගනිමින් අන්‍ය ජාතික කිතුනුවන්ට කිතුනු ආගමික ප්‍රතිපත්ති පහදා දීමට කිතු දහමේ නව චින්තනයක් බිහිවන්නට විණි.

**ග්‍රීක - රෝම ශිෂ්ටාචාරයේ බලපෑම.**

- පලස්තීනය විවිධ කාල වකවනුවල අන්‍ය ජාතික අධිරාජයන්ගේ පාලනයට නතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ අන්‍ය ජාතික සංස්කෘතීන්හි හා ශිෂ්ටාචාරයන්ගේ බලපෑමට ලක් විය. ඒවා අතුරින් ග්‍රීක රෝම ශිෂ්ටාචාරය විශේෂ තැනක් උසුලයි.
- මහා ඇලෙක්සැන්ඩර් රජ සමයේ පලස්තීනය ග්‍රීක පාලනය යටතේ විය.
- මහා ඇලෙක්සැන්ඩර් රජතුමා තමන් අත්පත් කර ගත් රටවල ග්‍රීක භාෂාව, සංස්කෘතිය, දර්ශනය පැතිරවීමට ද ක්‍රියා කළේ ය.
- ක්‍රි.පූ පළමු වන ශත වර්ෂයේ රෝමය අධිරාජ්‍යයක් ලෙස වර්ධනය වූ අතර ක්‍රි. පූ. 63 දී පලස්තීනය අත්පත් කර ගත්තේ ය.
- රෝමය විසින් අත්පත් කර ගන්නා ලද රටවල ග්‍රීක භාෂාව, සංස්කෘතිය, ශිෂ්ටාචාරය සුරක්ෂිත ව රැකගන්නා ලදි. මන්ද යත් ග්‍රීක භාෂාව, දර්ශනය, සාහිත්‍යය විශ්වීය පිළිගැනීමකට භාජනය වී තිබීම යි. එබැවින් රෝම ශිෂ්ටාචාරය, ග්‍රීක -රෝම ශිෂ්ටාචාරය ලෙස ප්‍රකට විය.
- මෙම පසුබිම මත කිතු දහම ද ග්‍රීක - රෝම ශිෂ්ටාචාරයේ බලපෑමට නතු විය.

## ග්‍රීක ශිෂ්ටාචාරයේ බලපෑම

- ග්‍රීකයන් පලස්තීනය අත්පත් කර ගෙන පාලනය කළ කාලයේ ශුද්ධ බයිබලයේ පුරාණ ගිවිසුම ග්‍රීක බසට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාව ඇති විය. ග්‍රීක බසට පරිවර්තනය කරන ලද පුරාණ ගිවිසුමේ ග්‍රන්ථ 'සෙප්ටුවාජින්ත' යැයි හඳුන්වනු ලැබී ය. මෙම පරිවර්තනය ධර්ම දූතවරුන් ද මුල් කිතුනුවන් විසින් ද තම වේද ග්‍රන්ථය ලෙස භාවිත කරන ලදි. නව ගිවිසුමේ ග්‍රන්ථ සියල්ල ග්‍රීක බසින් ලියැවිණි.

- ශුද්ධ වූ සභාවේ ආරම්භක සමයේ රෝම අධිරාජ්‍යයෙහි ස්ටොයික්, නොස්ටික්, ප්ලෙටොනිසම් වැනි ප්‍රධාන ග්‍රීක දර්ශන තුනක් විය. මෙවන් දාර්ශනික චින්තනයන් පිළිබඳ ව දැන සිටි අන්‍ය ජාතිකයෝ පළමු වන ශත වර්ෂයේ අවසානයේ පැවති ශුද්ධ වූ සභාවට එක් වූ හ. තව ද එසේ එක් වූවන්ට කිතු දහමේ සත්‍යය පහදා දීමට ඉහත දාර්ශනික චින්තන හා වචන ප්‍රයෝජනවත් විය.

- උදාහරණයක් ලෙස ශු.ජොහාන් තුමා ක්‍රිස්තුන් වහන්සේව 'වචනය' ලෙස අන්‍ය ජාතිකයන්ට හඳුන්වා දුන්නේ ය. එනම් ආරම්භයේ දී දෙවියන් වහන්සේ සමඟ ලෝකය මැවීමේ කාර්යයේ නියැළුණු වචනය ජේසු ක්‍රිස්තුන් වහන්සේ ලෙස මාංස ගත වූ බව එතුමා පවසයි.

- එපමණක් නොව නොස්ටික් අදහස්වලට ගැළපෙන ආකාරයේ ද්වි ලෝකය පිළිබඳ අදහස් ද ජොහාන් තුමා ගේ සුවිශේෂයේ පුරා විහිදී යයි. උදා :- ආලෝකය-අන්ධකාරය, ආත්මය-ශරීරය, ජීවිතය-මරණය, සත්‍යය-අසත්‍යය, සුරලොව-මනු ලබා, ලොව ඉහළ සිට පහළට.

- තව ද ක්‍රිස්තුන් වහන්සේ "සැබෑ ආලෝකය", "සැබෑ ආහාරය", "සැබෑ මිදිවැල" යැයි හඳුන්වා එතුමා සත්‍ය ලෝකය අපට ප්‍රකාශ කිරීමට හැකි තැනැත්තා බව පෙන්වා දෙයි.

- ශුද්ධ වූ පාවුලු තුමාගේ දේශනවල දී ද සන්දේශවල ද ග්‍රීක බලපෑම දැකිය හැකි ය. ශුද්ධ වූ පාවුලු තුමා ගේ දෙවන ධර්මදූත ගමනේ දී ඇතැන්ස් නගර ජනතාවට දේශනා කිරීමට එපිකුවම්, ස්ටොයික් ආදි චින්තනයන් භාවිත කර ඇති අතර ග්‍රීක සාහිත්‍යධරයකු වන ඇටේඩසන් ගේ "අපි ඔහුගේ දරුවෝ ය" යන වදන් පෙළ භාවිතා කර ඇත.

- ශුද්ධ වූ පාවුලු තුමා ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම මරණය හා උත්ථානය යන පාස්කු අභිරහසේ ප්‍රතිඵල පැහැදිලි කරන විට ග්‍රීක සංස්කෘතියෙන් ගැලවීම, සමගි වීම, ප්‍රතිකාර කිරීම, වැනි සංකල්ප උපයෝගී කර ගනියි.

- තව ද ග්‍රීක දේශපාලන වචන, ග්‍රීක ක්‍රීඩා ආදියේ දී භාවිත කරන වචන ද නීති වෘත්තිය තුළ භාවිත වන වචන ද වහල් ව්‍යාපාර තුළ භාවිත වන වචන ද, හෘද සාක්ෂ්‍ය, ස්වාභාවික වැනි දාර්ශනික වාංමාලාවක් ද භාවිත කළේ ය.

## රෝම ශිෂ්ටාචාරයේ බලපෑම

- ක්‍රි.පූ. 63 දී රෝම වරුන් පලස්තීනය අත්පත් කරගත් පසු පලස්තීනය ක්‍රි.පූ. 476 තෙක් රෝම අධිරාජ්‍යයේ පාලනය යටතේ පැවතිණි. ක්‍රිස්තුන් වහන්සේ ඉපදුණේ ද, උන් වහන්සේ හැදී වැඩුණේ ද, ශු.සභාව ආරම්භ වූයේ ද මෙම කාල වකවානුවේ දී ය. රෝමානු භාෂාව ගොඩනැඟිලි කලාව, ධූරාවලිය හා සාම්ප්‍රදායික වන්දනාව ආදිය කිතු දහමට බලපෑම් කර ඇත.

- රෝම අධිරාජ්‍යය පැවති සමයේ ලතින් භාෂාව රාජ්‍ය භාෂාව හා පරිපාලන භාෂාව විය. එබැවින් ශුද්ධ බයිබලය ලතින් භාෂාවට පරිවර්තනය කිරීමේ අවශ්‍යතාව ය මතු විය. ඒ අනුව දමස්කස් ශුද්ධෝත්තම පියතුමාගේ ඉල්ලීම පරිදි ශුද්ධ වූ ජෙරොම් තුමා ශුද්ධ බයිබලය ලතින් භාෂාවට පරිවර්තනය කළේ ය. මෙය 'වල්ගේට්' බයිබලය යැයි හඳුන්වන ලදි. වල්ගේට් යන්න 'පොදු බව' හා 'බැහැපත්කම' යන අර්ථය ගෙන දෙයි.

- රෝමවරු ගොඩනැගිලි කලාව තුළ විශිෂ්ටයෝ වූහ. ඔවුන්ගේ ගොඩනැගිලි කලා ක්‍රමය "බැසිලිකා" ක්‍රමය නම් වේ. මෙම ක්‍රමය අනුව ක්‍රි.ව. 4 වන සියවසේ සිට කිතුනු දේවස්ථාන ගොඩනගන ලදී. තව ද දේවස්ථානය සැරසීම සඳහා මූර්ති කලාව හා චිත්‍ර කලාව යොදා ගන්නා ලදි.

- රෝම පාලනය, දේශපාලනය හා සමාජය, ධූරාවලීන්ගෙන් යුක්ත විය. ධූරාවලි ත්‍රිකෝණාකාර වූ අතර ජනතාව, වහල් මට්ටමේ වූහ. අධිරාජ්‍යයේ නියෝජිතයන් ලෙස රජු, යුවරජු, ආණ්ඩුකාර, කොමසාරිස්, වශයෙන් විවිධ තනතුරු ලබා දෙන ලදි.

- සමාජීය වශයෙන් රෝමවරු පාර්ශව දෙකක් වූහ. ඔවුහු පැට්‍රීෂියන් (Patrician) ෆ්ලෙබියන් (Flabian) යැයි හඳුන්වනු ලැබූහ. 10%ක ප්‍රතිශතයක් වූ පැට්‍රීෂියන්වරු රාජ්‍ය පාලන බලය සතු වූවෝ වූහ.

- මෙම අධිකාර සැකැස්මේ බලපෑම ශුද්ධ වූ සභාවේ සැකැස්ම තුළ ද දැකිය හැකි විය. ශුද්ධ වූ සභාව තුළ ද පැවිද්දන් ගිහියන් යන දෙපාර්ශ්වයක් වර්ධනය විය. ශුද්ධ වූ සභාවේ ඉතා උසස් බලධාරියා ශුද්ධෝත්තම පියතුමා වන අතර ප්‍රධාන (වැදගත්) නගර පාලනය කිරීම බලය අගරදගුරුවරුනට අයත් විය. අනෙකුත් නගරවලට රදගුරුවරු ද මීසම්වලට පියවරු, තේවාචාරීවරු හා පැවිද්දෝ වූ හ.

- කිතුනු ජනවන්දනාව තුළ සාම්ප්‍රදායික රෝමානු ජනවන්දනා සම්ප්‍රදායය දැකිය හැකිය. කිතුනු දේවස්ථානවල රෝම ගොඩනැගිලි කලාව දැකිය හැකිය. ජනවන්දනාව සඳහා රෝමය තුළ භාවිතා කරන ලද්දේ ලතින් භාෂාව යි. රෝමවරුතම දෙවිවරුනට ත්, වීරවරුන්ට ත්, රජවරුන්ට ත් මංගල්‍ය පැවැත්වූ ආකාරයට කිතුනුවෝ ද තම විශ්වාසය ප්‍රකාශ කිරීම සඳහා මංගල්‍ය පැවැත්වූ හ. රෝමවරු දෙසැම්බර් 25 වන දා සූර්ය දෙවිඳුන්ගේ මංගල්‍යය සැමරූ හ. ක්‍රි.ව. 366 සිට එම දිනය කිතු උපතේ මංගල්‍යය ලෙස සමරනු ලැබේ. රෝම රාජ්‍යය ශ්‍රේෂ්ඨාධිකරණය ඇඳුම් පැළඳුම් කිතුනු ජනවන්දනාවේ දී භාවිත කළ අතර රෝම රජවරුන්ට හා සෙන්පතිවරුන්ට දණ නමා ගෞරව කිරීමේ ක්‍රමයක් අනුගමනය කරමින් වන්දනා කිරීමට පටන් ගත් හ.

## කිතුනු විද්‍යා පීඨ

- සුවිශාල විද්‍යා පීඨ ජුදා ආගමික, සමාජීය හා සංස්කෘතික පසුබිමේ බිහි වූ නව චින්තනයන් වර්ධනය වීමට මුල් කාලයේ වූ කිතුනු ධර්මශාලා දායකත්වයක් දක්වයි. ඇලෙක්සැන්ඩ්‍රියාවේ ගුරුකුලය හා අන්තියෝකයේ ගුරුකුලය මෙහි දී උදාහරණයක් ලෙස සඳහන් කළ හැකි ය.

- දෙවන සියවසේ කිතු දහම වැලැඳගත් ජස්ටින් ට්‍රාෂියන් වැනි චින්තකයෝ අධ්‍යාපන පීඨ ආරම්භ කර කුඩා කණ්ඩායම් ලෙස කිතුනු විශ්වාසය අවබෝධ කර ගැනීමට අවශ්‍ය මූලික අඩිතාලම දැමූ හ. මේවා පෞද්ගලික උත්සහය මඟින් ගොඩනගා ගත් අධ්‍යාපන පීඨ වේ.

- නොස්ටික්වාදීහු හා අනෙකුත් චින්තකයෝ කුඩා ප්‍රමාණයේ එවැනි අධ්‍යාපන පීඨ තුළ මිථ්‍යා මත ඉගැන්වූ හ. මෙම ප්‍රශ්නයට විසඳුමක් ලෙස රාජගුරු ප්‍රසාදිවරු අධ්‍යාපන පීඨ සියල්ල එක් කර තම පරිපාලනය යටතට ගෙන ඒවා කිතු දහම වැලැඳ ගැනීමට කැමැත්ත දක්වන්නට දහම් දැනුම ලබා දෙන ආයතන බවට පත් කළ හ.

- එයට අවශ්‍ය පරිසරය හා ශ්‍රමය රෝමයේ හෝ වෙනත් පෙරදිග රටවල හෝ නොවීය. ඒ වෙනුවට ඒවා ග්‍රීක අපරදිග රටවලින් ලැබිණි. විද්‍යාවේ සම්ප්‍රදායයන් ආගමික දාර්ශනික විෂයයන් කෙරෙහි ද කැමැත්තක් හා උනන්දුවක් දක්වන උගත් උසස් පන්තියකට අයත් ඊජිප්තුවේ අගනගර වූ ඇලෙක්සැන්ඩ්‍රියාව ත් ග්‍රීක ලෝකයේ ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස පවතින සිරියාව ත් අන්තියෝකයත් කිතුනු විද්‍යා පීඨ සැකැස්මට අනුකූල වන ස්ථාන ලෙස පිහිටුවන ලදි.

## ඇලෙක්සැන්ඩ්‍රියාවේ විද්‍යා පීඨ

- දෙවන සියවස දී ඇලෙක්සැන්ඩ්‍රියාවේ විද්‍යා පීඨයක් පිහිටුවන ලදී.
- අන්තියෝකයේ පූජකයකු වන ලූසියස් නැමැත්තා මෙම විද්‍යා පීඨය ආරම්භ කළේය යන්න ශුද්ධ වූ සභාවේ පාරම්පරික අදහස යි. මෙතුමා අන්තියෝකයේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ අනුමතිය සහිත ව මෙම අධ්‍යාපන පීඨය ආරම්භ කළේය. මෙතුමා හෙබ්‍රෙව් ශුද්ධ බයිබලයේ සහය ඇති ව ග්‍රීක ශුද්ධ බයිබලය වන සෙප්ටුවාජින්ත පිටපත නැවත මුද්‍රණය කළේ ය.

## අන්තියෝකයේ විද්‍යා පීඨ මූලීක ලක්ෂණ

- මෙම අධ්‍යාපන පීඨය තුළ ක්‍රිස්තුන් වහන්සේගේ මනුෂ්‍ය ස්වභාවයට වැදගත්කම දෙන ලදි.
- දේවධර්මය පහදා දීමට ඇරිස්ටෝටල්ගේ දර්ශනය උපයෝගී කරගන්නා ලදි.
- ශුද්ධ බයිබලය තේරුම් කර දීමට "වචනයෙන් වචනය" පහදා දීමේ ක්‍රමය භාවිත කළ හ. (ඍජු අර්ථය)
- දේව ධර්මය තුළ ශු. ත්‍රිත්වය, ක්‍රිස්තුන් වහන්සේගේ දේවත්වය හා මනුෂ්‍යත්වය ආදියට වැදගත්කමක් දුන් හ.
- තාර්සිස්හි තියඩෝර් මොප්සුවෙස්ටියාහි එව්සේබියස් ජෙරුසලමේ සිරිල් වැනි අය මෙම අධ්‍යාපන පීඨය තුළින් බිහි වූ විශිෂ්ට දේවධාර්මික චින්තකයෝ ය.
- මෙම අධ්‍යාපන පීඨයේ ඒරියස් නැමැත්තා "වචනය" ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේට වඩා පහත් තැනැත්තෙකි යැයි පවසා ඒරියන් මිථ්‍යාවට මඟ පෑදුවේය.

## මුල් කිතුනු චින්තකයෝ සහ ඔවුන්ගේ දායකත්වය

- කවර ශිෂ්ටාචාරයක වුව ද දියුණුව සඳහා ප්‍රගතිශීලී ක්‍රියාකරකම්වලට චින්තනය මහත් දායකත්වයක් දක්වයි. උදාහරණයක් ලෙස ග්‍රීක චින්තකයන් බොහෝ දෙනෙකු ග්‍රීක ශීෂ්ටාචාරයේ වර්ධනයට දායකත්වය දක්වා ඇත.
- කිතුනු චින්තනයේ ආරම්භය ලෙස නව ගිවිසුම දැක්විය හැකි ය. ශුද්ධ වූ පාවුලු තුමා, ශුද්ධ වු ජොහාන් තුමා, විශිෂ්ට කිතුනු චින්තකයෝ වූහ. මොවුන්ගේ ගැඹුරු දේවධාර්මික චින්තන, ලේඛන සියල්ල දේව ධාර්මික චින්තනයන් ගොඩනැගීමට ඉවහල් විණි.
- උදාහරණයක් ලෙස ශු.ජොහාන් තුමා සුවිශේෂය ලියූ කාලයේ කිතුදහම වැළඳගත් අන්‍ය ජාතිකයින් බොහෝ දෙනෙක් වූ හ. එබැවින් ඔවුනට පැහැදිලි කළ හැකි ආකාරයට සුවිශේෂය ලිවීමේ අවශ්‍යතාව මතු විය.
- එබැවින් ක්‍රිස්තුන් වහන්සේ "වචනය" "ආලෝකය" වැනි ග්‍රීක දාර්ශනික වචන හා අදහස් උපයෝගී කරගෙන හඳුන්වා දුන් ද්වි ලෝක වැනි සංකල්ප උපයෝගී කර ගනිමින් සත්‍යයේ ආහාරය සැබෑ මිදිවැල ලෙස ක්‍රිස්තුන් වහන්සේ හඳුන්වා, සත්‍යය ම වූ ක්‍රිස්තුන් වහන්සේ සත්‍යය ලෝකයට අපට ප්‍රකාශ කිරීමට හැකි පුද්ගලයා යැයි පෙන්වා දුන්නේ ය.
- ශු. පාවුලු තුමා තම ලේඛනවල ද ධර්ම දේශනාවල ද ග්‍රීක දාර්ශනික චින්තනය වචන හා සංකල්ප භාවිත කළේ ය.
- එතුමා ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විඳීම මරණය උත්ථානය යන පාස්කු සිද්ධිය පැහැදිලි කරන විට ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලබාගත් "මනස්ථාපනය" , "පශ්චාත්තාපික ක්‍රියා" වැනි වදන් භාවිත කරයි.
- ජෙරුසලමේ දී ආරම්භ කරන ලද ශුද්ධ වූ සභාව ඉතා ශීඝ්‍රයෙන් රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය පාලනයට නතු වූ ප්‍රදේශවලට පැතිර යාම හේතු කොට ගෙන කිතුනුවෝ රෝමවරුන් විසින් පීඩාවට පත් කරන ලද හ. මෙම පීඩන සමයේ දැනුම හා කථන හැකියාවන් පූර්ණ වූ කිතුනු චින්තකයන් දෙවියන් වහන්සේ ස්වකීය කාර්යය සඳහා උපයෝගී කොට ගත් හ.

- මොවුහු පීඩිත කිතුනුවන් උදෙසා මැදිහත් වූහ.
- විශ්වාසයකින් යුක්ත ව කිතුනු වේද සත්‍යතාව ය වටහා ගැනීමට කිතුනුවන් ඉවසන හා දරාගැනීමේ හැකියාව ඇත්තන් ලෙස ප්‍රකාශ කළ හ.
- රෝම විද්වතුන් කිතුනුවන් විශ්වාස කළ අභිරහසට විරුද්ධ ව දැන්වීම් පත්‍රිකා කුඩා ග්‍රන්ථ සම්පාදනය කර ප්‍රකාශයට පත් කර කිතුනුවන්ට විරුද්ධ ව බොරු ප්‍රචාර කළ හ.
- ඔවුන්ගේ බොරු ප්‍රචාරයන්ට අදාළ ප්‍රතිචාර ලබා දෙන ආකාරයට කිතුනු ලේඛකයෝ විශ්වාසයේ සත්‍යතාවන් ගෙනහැර දක්වා සාධාරණීය කර, ස්ථාපනය කර බොහෝ ග්‍රන්ථ ලියූ හ. මිථ්‍යා මත වලට විරුද්ධ ව ක්‍රිස්තියානි විශ්වාසයේ සත්‍යතා ඉගැන්වීම් නිවැරදි ව පැහැදිලි කර ස්ථාපනය කළ හ.
- මොවුහු විශ්වාසයේ සත්‍යතාවල සාධාරණත්වය පවසා සුරක්ෂිත කර ආරක්ෂා කළ නිසා "විශ්වාසයේ ආරක්ෂකයන්" යැයි හඳුන්වනු ලැබූ හ. මොවුන් අතුරින් ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලෙමන්ට් ඔරිගන් ජස්ටින් ටර්ටුලියන් යන අය විශේෂිත පුද්ගලයෝ ය.

## ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්ලේමන්ට් තුමා (ක්‍රි.ව. 150-216)

- කිතු දහම වැලඳගත් ක්ලෙමන්ට් තුමා තම උගත්කමේ හැකියාව හා උපදෙස් අනුව එය සුරක්ෂිත කළේය.
- ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරු කුලයට අයත් මෙතුමා "ග්‍රීකයින්ට උපදෙස්" "කිතු දහමේ හඳුන්වාදීම" "ආත්මික ජීවිතයේ රහස" වැනි වැදගත් ග්‍රන්ථ තුනක් සම්පාදනය කළේ ය.
- බහුදේව වන්දනා ක්‍රමය වැරදි බව ගෙන හැර දක්වා ක්‍රිස්තියානිය සියලු ම ආගම් අතුරින් උසස් යැයි තහවුරු කර ජනතාවට ක්‍රිස්තියානි විශ්වාසයට මඟ පෙන්වූයේ ය.
- කිතුනු අධ්‍යාත්මය හා ඥානවන්ත ජීවිතය හඳුන්වා දී යහපත් කිතුනුවා "සත්‍යයේ බුද්ධිමතා" යැයි ප්‍රකාශ කළේ ය.

## ඔරිගන් තුමා (ක්‍රි.ව. 185-254)

- ඇලෙක්සැන්ඩ්‍රියාවේ උපත ලද ඔරිගන් ඇලෙක්සැන්ඩ්‍රියානු ගුරුකුලය හා සම්බන්ධ වූවෙකි.
- "යකඩ මිනිසා" යැයි හඳුන්වනු ලබන මොහු ශුද්ධ බයිබලය, දේව ධර්මය හා ප්‍රඥාවේ ජීවිතය වැනි විෂයයන් පිළිබඳ ව ග්‍රන්ථ 800කට වඩා සම්පාදනය කළ කිතුනු විද්වතකු බවට පත් විය.
- අධිරාජ්‍යයකු වූ සෙබ්දිමුස් සෙවාරුස්ගේ පීඩන සමයේ දී කිතුනුවන් සිරගෙදර දී හමු වී ඔවුන් සමඟ ශ්‍රේෂ්ඨාධිකරණයට ගොස් ඔවුන් ධෛර්යවත් කර උනන්දු කළේ ය.
- කිතු දහම වැලඳගත් නවකයන් ධෛර්යවත් කිරීම සඳහා අන්‍යාගමිකයන්ට තර්ක ඉදිරිපත් කර පරාජය කළේ ය.
- මෙතුමා ලියූ ග්‍රන්ථ අතුරින් "ක්‍රිස්තු වේද ආධාරකය" "කිතුනු විශ්වාසය" "පේළි හයක ශුද්ධ බයිබලය" ආදිය වැදගත් ග්‍රන්ථ වේ.
- "ක්‍රිස්තු වේද ආධාරකය" (සෙල්සස් නමැති මිථ්‍යා මතධාරියාගේ ග්‍රන්ථවලට විරුද්ධව ලියන ලද) කිතුනුවන් සඳහා වන ආධාරක ග්‍රන්ථයකි.
- "කිතුනු විශ්වාසය" යන ග්‍රන්ථය විශේෂයෙන් කිතුනු විශ්වාසයේ සත්‍යතාවන් පැහැදිලි කරන දේව ධාර්මික අත් පොතකි. මෙහි දෙවියන් වහන්සේ, විශ්වය, මිනිස් නිදහස, දේව ප්‍රකාශනය ආදිය පිළිබඳ ගැඹුරු අදහස් ගැබ් වේ.
- "පේළි හයක ශුද්ධ බයිබලය" යන ග්‍රන්ථය ශුද්ධ බයිබලයේ පරිවර්තන හය සමාන්තර ජේද හයකින් පිළිවෙළින් ලියා ඇත. මෙම ග්‍රන්ථය ශුද්ධ බයිබලය පිළිබඳ පර්යේෂණය සඳහා ද ඉතා උපකාරී වේ. ශුද්ධ බයිබලය පැහැදිලි කිරීම සඳහා වචනාර්ථ ක්‍රමය මනෝවිද්‍යාත්මක ක්‍රමය හා ආධ්‍යාත්මික ක්‍රමය ආදි විධිමත් ක්‍රම තුනක් මෙම ග්‍රන්ථයේ පැහැදිලි කර ඇත.

**ජස්ටින් තුමා (ක්‍රි.ව. 100-165)**

- ග්‍රීක පසුබිමේ ගොඩනැගුණු ස්ටොයික් චින්තනයන් ප්ලේටෝ ඇරිස්ටෝටල් වැනි අයගේ දාර්ශනික අදහස් ද දැන සිටි මෙතුමා වසර ගණනාවක් මුළුල්ලේ සත්‍ය ගවේෂණයේ යෙදී අවසානයේ ක්‍රිස්තු ධර්මය වැලඳ ගත්තේය.

- මිනිසාගේ ගැලවීම සඳහා සැබෑ සත්‍යය කිතු දහම තුළ ඇති බව ප්‍රකාශ කළේ ය. විශිෂ්ට ග්‍රීක දාර්ශනිකයකු වූ ජස්ටින් තුමා රෝමයේ ප්‍රසිද්ධ කිතුනු දාර්ශනික විදුහලක් ආරම්භ කළේ ය. කිතු දහමට විරුද්ධව පවසන ලද අදහස් ප්‍රතික්ෂේප කර කිතුනුවන්ට විරුද්ධ ව පෙන්වන ලද වෙනස්කම් හෙළා දැක කිතුනුවන්ගේ විශ්වාසයේ ජීවිත ක්‍රමය නිවැරදි ය යන්න තාර්කික ව ඔප්පු කරමින් බොහෝ ග්‍රන්ථ ලියා "විශිෂ්ට කිතුනු ලේඛක" යන විරුදාවලිය ලැබී ය.

- ඇන්ටෝනියස් පියුස් මාර්කස් අවුරේලියස් වැනි අධිරාජයන් මුල් කොට ගෙන "අපොලොජියා" රෝමයේ සෙනෙට් සභාවට ලියන ලද ලියවිල්ලක් වූ අතර, ජුදා ජාතියට විරුද්ධ ව ලියන ලද "ත්‍රිපෝ සමඟ සංවාදය" යන්න මෙතුමන් විසින් ලියන ලද වැදගත් ග්‍රන්ථ අතර වේ.

- ඇන්ටෝනියස් පියුස් මාර්කස් අවුරේලියස් යන අධිරාජ්‍යවරුනට ලියන ලද අපොලොජියා නමැති ග්‍රන්ථය කිතුනුවන් සඳහා වන ආරක්ෂක ග්‍රන්ථය වේ. මෙම ග්‍රන්ථයේ රෝමයේ දාර්ශනික අදහස් චින්තනය ආදිය උපයෝගී කරගෙන බහු දේව වන්දනාවට විරුද්ධ ව කිතු දහමේ ඒකදේවවාදි වන්දනාව තහවුරු කරයි.

- අපොලොජියා නමැති ග්‍රන්ථයේ කොටස් දෙකක් ඇත. පළමු කොටස මඟින් කිතු දහම, එහි වටිනාකම් හා කිතුනු ජනතාවගේ යහපත්කම විශ්වාසය ආදිය පිළිබඳ ව පැවසේ. කිතුනුවෝ දේව විශ්වාසය නොමැති ජනතාවක් හෝ කලබල ඇති කරන්නෝ හෝ නොවෙත් ඔවුන් සමාජය තුළ වටිනාකමක් ඇති අධිරාජ්‍යයේ යහපත පතා නිතර ක්‍රියා කරන්නන් යන්න තහවුරු කෙරේ.

- දෙවන කොටස්වල ජනවන්දනාව හා වරප්‍රසාද පිළිබඳ ව ලියැවී ඇත. අවසාන වශයෙන් රෝම බලධාරීන් කිතුනුවන්ට පීඩා කිරීමට පෙර ඔවුන් කෙරෙහි වන චෝදනා පිළිබඳ හොඳින් අධ්‍යයනය කළ යුතු යැයි ද අයුක්ති සහගත ආකාරයට ඔවුන්ට පීඩා කිරීම නවතාවලිය යුතු යැයි ද උපදෙස් දී ඇත.

- රෝමයේ සෙනට් සභාවට ලියන ලද සිද්ධියක් මුල් කරගෙන තිදෙනෙකු තමන් කිතුනුවන් යැයි පැවසීම නිසා හිස ගසා මරන ලද පසුබිමක ලියා ඇත. එවන් අයුක්ති සහගත ක්‍රියා හෙළා දැක ඒවාට දැඩි දඬුවම් දීම නවතා දැමිය යුතු බවට උපදෙස් දී ඇත. කිතුනුවන් උසස් අන්දමින් ජීවත් වීම පිළිබඳ ව අඥානයන් විසින් අසන ලද ප්‍රශ්නවලට ද පිළිතුරු සපයා ඇත. උසස් ජීවිතය යනු මිනිසාගේ කැමැත්ත ඉටු කර ගැනීම නොවේ. පීඩන සමය දේව කැමැත්ත අනුව භාග්‍යවන්ත ය. එය කිතු දහමට සාක්ෂ්‍ය දැරීම සඳහා දෙන ලද අවස්ථාවක් යැයි සලකා කිතු දහම උසස් යැයි පෙන්වා දී ඇත.

- "ට්‍රෙෆෝ සමඟ සංවාදය" යන ග්‍රන්ථය ශු. ජස්ටින් තුමා ජුදා රබ්බිවරයකු හා සමඟ කළ සංවාදයකි. මෙය ජුදා ජාතියට විරුද්ධව ලියන ලද පළමු ග්‍රන්ථය යි. මෙහි දී ජස්ටින් තුමා ජුදා ආගමයේ සමහර වැරදි අදහස් ගෙනහැර දක්වා ක්‍රිස්තුන් වහන්සේ බලාපොරොත්තු වූ මෙසියස් බවත්, එතුමන්ගේ පැමිණීම සමඟ පුරාණ මොසෙස් තුමන්ගේ නීතිය එක්තරා නිශ්චිත කාල පරිච්ඡේදයකට පමණක් වලංගු වූවක් බවත් පෙන්වා දෙයි. එහෙත් ක්‍රිස්තුන් වහන්සේ විසින් දෙන ලද නීතිය සදාතන ය. එය සියල්ලන්ට ම පොදු ය. ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි විශ්වාසය තබන පිරිස දෙවියන් වහන්සේ විසින් තෝරා ගන්නා ලද ඉශ්‍රායෙල් ජනතාව යැයි පැහැදිලි කෙරේ.

- ජස්ටින් තුමාගේ ග්‍රන්ථවල කිතුනු චින්තනයේ ඇති වූ ප්‍රධාන වර්ධනයක් දැක්විය හැකි විය. පීඩා සමයේ කිතුනුවන් වෙනුවෙන් පවසන ලද කිතුනු සත්‍යතා නිසාත් අවුරේලියස්ගේ පාලන සමයේ රෝම දෙවිවරුන්ට පුද පූජා කිරීම ප්‍රතික්ෂේප කළ නිසාත් අත් අඩංගුවට ගෙන ක්‍රි.ව. 165 දී හිස ගසා මරනු ලැබී ය.

## ටර්ටුලියන්තුමා (ක්‍රි.ව. 160 -240)

- උතුරු අප්‍රිකාවේ කාර්තේජ් නමැති ස්ථානයේ උපත ලැබූ ටර්ටුලියන් ග්‍රීක ලතින් භාෂාවෙන් ප්‍රවීණතාව ලබා වසර ගණනාවක් රෝමයේ නීතිඥයකු ලෙස සේවය කළේ ය.
- ක්‍රි.ව. 195 කිතු දහම වැලඳගත් මොහු පූජක තුමකු ලෙස ආලේප කරනු ලැබී ය. එම කාලයේ උතුරු අප්‍රිකාවේ කිතුනුවන්ට එරෙහි ව සිදු වූ පීඩන වලදී කිතුනුවන් කෲර ලෙස වදහිංසා කරනු දුටුයේ ය.
- එඩිතර විනය ගරුක පුද්ගලයකු වූ ඔහු කිතුනුවන් ආරක්ෂා කිරීමත් ඔවුන් ව උනන්දු කරවීම සඳහාත් බොහෝ ග්‍රන්ථ සම්පාදනය කළේ ය. කිතුනුවන්ට වදහිංසා කර මරා දැමීම හෙළා දැක්කේ ය.
- ප්‍රථමයෙන් ලතින් භාෂාවෙන් කිතුනු ග්‍රන්ථ ලිවීම හේතු කොට ගෙන "දේව ධාර්මික ලතින් භාෂාවේ පියා" යන විරුදාවලිය එතුමාට හිමි විය.

## ඉරේනියස් තුමා (ක්‍රි.ව. 135-202)

- ශුද්ධ වූ ඉරේනියස් ක්‍රි.ව. 135 දී තුර්කියේ සිමිර්නා ප්‍රදේශයේ කිතුනු පවුලක උපත ලැබීය. තරුණ වියේ දී සිමිර්නා නගරයේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ හා ශු.ජොහාන් තුමාගේ ශ්‍රාවකයකු වූ ශු. පොලිකාප් පිළිබඳ ව දැන එතුමාගේ ගෝලයෙක් විය. පසු ව පූජකවරය ලැබ ප්‍රංශයේ ලයන්ස් නගරයේ සේවය කිරීමට යවනු ලැබී ය.

- ක්‍රි.ව.177 ලයන්ස් නගරයේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ ලෙස අභිෂේක කරනු ලැබ වසර 25ක් සේවය කළේ ය. විශිෂ්ට දැනුමක් හා බුද්ධියක් ඇති ඉරේනියස් තුමා බොහෝ දෙනෙකුගේ සිත් හරවා ප්‍රංශයේ ආරම්භ කරන ලද සභාව නැවත ගොඩනැඟී ය.

- ශුද්ධ බයිබලයත්, ග්‍රීක භාෂාවත්, දර්ශනයත් හොඳින් උගත් ඔහු දාර්ශනික චින්තනය මඟින් දේව ධාර්මික කරුණු පැහැදිලි කළේ ය.

- ඉරේනියස් තුමා විසින් කිතු දහමට විරුද්ධ ව ඉදිරිපත් කරන ලද වේද භේදයන්ට එරෙහි විවිධ ග්‍රන්ථ ලිවී ය. ඔහු ලියූ ග්‍රන්ථ අතුරින් "භේද ප්‍රතික්ෂේප කිරීම" යන ග්‍රන්ථය ප්‍රධාන තැනක් ගනී. කොටස් 5කින් යුත් මෙම ග්‍රන්ථය ග්‍රීක භාෂාවෙන් නොස්ටික්වාදීන්ට විරුද්ධ ව ලියන ලද්දකි.

- එතුමා නොස්ටික්වාදය හෙළා දැක එහි මූලික කරුණු අසත්‍ය බව තහවුරු කරයි. කිතුනු විශ්වාසයේ සත්‍යතාවන් අපෝස්තුලුවරුන්ගේ ලේඛනවල ඇති බව වටහා දෙමින් ශුද්ධ බයිබල සම්ප්‍රදායයන් පිළිබඳ කිතුනු ඉගැන්වීම් පිළිබඳ ඉදිරිපත් කරයි.

- ඉරේනියස් තුමා ලියූ ග්‍රන්ථ අතුරින් "අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම් තහවුරු කිරීම" යන ග්‍රන්ථය ද වැදගත් වේ. එම නිසා මෙතුමා පළමු කිතුනු දහම් අධ්‍යාපනයේ ග්‍රන්ථ කර්තෘ යැයි සලකනු ලැබේ. ක්‍රි.ව. 203 දී සෙබ්දිමුස් සයිරුස් අධිරාජ්‍යයාගේ පීඩන සමයේ මෙතුමා ප්‍රාණ පරිත්‍යාගී විය.

- මෙලෙස කිතුනු ඉගැන්වීම්වලට පටහැණි ව හතර වන හා පස් වන ශතවර්ෂවල දී අසත්‍ය ඉගැන්වීම් ඉදිරිපත් විය. ඒ පිළිබඳ ව සොයා බලා කිතුනු ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා මන්ත්‍රණ සභා පිහිටුවන ලදී.

- ඒරියන් වේදභේදය පිළිබඳ ව සොයා බැලීමට නිසියානු මන්ත්‍රණ සභාවත් නෙස්ටෝරියානු වේදභේදය පිළිබඳ සොයා බැලීමට එපීස මන්ත්‍රණ සභාව ත් යුතිකේය වේද භේදය පිළිබඳ සොයා බැලීමට කැල්සිඩෝන් මන්ත්‍රණ සභාව ත් මැසදෝනිය වේදභේදය පිළිබඳ සොයා බැලීමට කොන්ස්තන්තීනෝපල් මන්ත්‍රණ සභාව ත් පිහිටුවන ලදි.

- මන්ත්‍රණ සභා රැස් කළයුත්තේ ශුද්ධෝත්තම පියවරුන් විසිනි. ශුද්ධෝත්තම පියතුම හෝ එතුමන්ගේ නියෝජිතයන්ගෙන් මෙම මන්ත්‍රණ සභා නායකත්වය දරයි. මන්ත්‍රණ සභාවේ දී ගනු ලබන තීරණ ශුද්ධෝත්තම පියතුමන් විසින් පිළිගත යුතු ය.

**වේදභේද හා මන්ත්‍රණ සභා**

- ක්‍රිස්තියානි විශ්වාසයට හා ඉගැන්වීමට පටහැණි ඉගැන්වීම් වේදභේද නම් වේ.

- ශු. සභාවේ ආරම්භයේ සිට කිතුනු විශ්වාසයන්ට පටහැණි වන සුලු මිථ්‍යා ඇති විය. (මැවීම පිළිබඳ වේදභේදය, (ඇලෙක්සැන්ඩ්‍රියාවේ සයිනීෂියස් - ක්‍රි.ව. 260) හදා වඩා ගැනීම (Adopted) පිළිබඳ වේදභේදය, (අන්තියෝකයේ රදගුරු පාවුලු තුමා) මැනිකි වාදය හා ඩොනාමියස් වාදය අදිය සඳහන් කළ හැක.) මේවා මගින් කිතුනු ප්‍රතිපත්තිවලට හෝ ඉගැන්වීම්වලට හෝ එතරම් බලපෑම් ඇති නොවී ය.

- එහෙත් 4 වන 5 වන සියවස්වල බිහි වූ වේද භේද කිතුනු විශ්වාසයේ සත්‍යතාවලට බෙහෙවින් බලපෑවේ ය. උදාහරණ ඒරියන් වාදය, නෙස්ටොරියන් වාදය, යුතිකේය වාදය, මැසදෝනිය වාදය, ආදිය සඳහන් කළ හැකි ය.

- පාරම්පරික කිතුනු ඉගැන්වීම තුළ ත්‍රිත්වික දෙවියන් වහන්සේගේ දෙවන තැනැත් වහන්සේ වන පුත්‍රයාණන් වහන්සේගේ මාංස ගත වීම ක්‍රිස්තුන් වහන්සේ සැබෑ දෙවියන් වහන්සේ හා සැබෑ මනුෂ්‍යයාණන් යන අභිරහස තහවුරු කළේ ය. මෙම අභිරහසට විරුද්ධ ව හතර වන සියවසේ බොහෝ වේදභේදික ඉගැන්වීම් ඉදිරිපත් විය.

- මෙහි දී ශුද්ධාත්මයාණන් දෙවියන් වහන්සේ යැයි ගෙනහැර දක්වා "පියාණන්ගේ ද පුත්‍රයාණන්ගේ ද නික්මෙන සමිඳාණන් ද ජීවණ දායකයාණන් වූ ශුද්ධාත්මයාණන් ද කෙරෙහි විශ්වාස කරමි. මොහු පියාණන් හා පුත්‍රයාණන් සමඟ එක ම වන්දනාවත් මහිමයත් ලබන සේක. දිවැසිවරුන් මගින් කථා කළ සේක" යන වදන් නිසියානු විශ්වාසයේ සත්‍යතා සමඟ එක් කරන ලදි

.• වර්තමානයේ ජනවන්දනාව තුළ භාවිත වන විශ්වාස ලක්ෂණය නිසියානු හා කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභා තීරණ පදනම් කරගෙන ගොඩනඟන ලද්දකි.

**ඒරියන්වාදය - නිසියානු මන්ත්‍රණ සභාව**

- ඒරියන්වාදය අන්තියෝකයේ ගුරුකුලය මගින් බිහි විය. එහි නියමුවා වන ඒරියස්, "වචනය දෙවියන් වහන්සේට වඩා පහත් ය" යන වැරදි මතය ඉදිරිපත් කළේ ය.

- මොහු ග්‍රීක දර්ශනවාදයේ සහය ඇති ව "වචනය දෙවියන් වහන්සේට වඩා පහත් ය" යන අදහස පැහැදිලි කර ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ නොවන බව පැවසී ය.

- තව ද ක්‍රිස්තුන් වහන්සේ සැබෑ වූ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ වෙත් නම් පුත්‍රයාණන් නොමැති කාලයක් තිබීය යුතුය. එබැවින් පුත්‍රයාණෝ පියාණන්ට සමාන නොවති. එකම තැනැන්වහන්සේ හෝ සදාතන තැනැන් වහන්සේ හෝ නොවන බව ඉගැන්වී ය.

- ඒරියන් වාදය පිළිබඳ ව සොයා බැලීමට ක්‍රි.ව. 325 දී "නිසියා" නම් ස්ථානයේ මන්ත්‍රණ සභාවක් රැස් කරන ලදි. ගොර්ඩෝවා රදගුරු වූ ගෝසියසින් ගේ නායකත්වය යටතේ රැස් වූ මන්ත්‍රණ සභාවට රදගුරුවරු 318 දෙනෙක් සහභාගි වූ හ.

- මන්ත්‍රණ සභාවේ දී ඒරියන්වාදය හෙළා දැක ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ බවත් පියාණන් වහන්සේට සමාන වන බවත් සදාතන වන බවත් එක ම තැනැන් වහන්සේ වන බවත් තහවුරු කර ඒවා විශ්වාසයේ සත්‍යතාවන් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. ඒ සමඟ ම ඒරියස්ව සභාවෙන් නෙරපනු ලැබී ය.

- ඒරියන් වාදයට විරුද්ධ ව හඬ නැගුවන් අතර තේවාචාරීවරයකු වූ අතනාසියස් ප්‍රධාන තැනක් උසුලයි.

**නෙස්ටෝරියානු වාදය - එපීස මන්ත්‍රණ සභාව**

- කොන්ස්තන්තිනෝපලයේ නෙස්ටොරියස් නමැත්තා ක්‍රිස්තුන් වහන්සේ දේවත්වය හා මනුෂ්‍යත්වය ඇති ව සිටින බවත්, ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ නොවන බවත් පැවසී ය. ඒ සමඟ ම මනුෂ්‍යයකු වූ උන් වහන්සේ මෙලොවට බිහි කළ මෑණියන් දේව මෑණියන් යැයි පැවසිය නොහැකි ය යන වැරදි ඉගැන්වීම ද ඉදිරිපත් කළේ ය.

- නෙස්ටෝරියානු වේද භේදය පිළිබඳ සොයා බැලීමට වර්ෂ 431 දී මන්ත්‍රණ සභාවක් රැස් කරන ලදි. මෙම මන්ත්‍රණ සභාවට නායකත්වය දෙන ලද්දේ රදගුරු ඇලෙක්සැන්ඩ්‍රියාවේ සිරිල් තුමා ය.

- මන්ත්‍රණ සභාවේ දී නෙස්ටොරියස්ගේ වේද භේදය හෙළා දැක ඔහු ශු. සභාවෙන් නෙරපා දැමූ අතර පාරම්පරික ක්‍රිස්තියානි ඉගැන්වීම් තහවුරු කරන ලදි.

- එනම් ක්‍රිස්තුන් වහන්සේ එක් පුද්ගලයකු බවත් උන් වහන්සේ තුළ දේවත්වය හා මනුෂ්‍යත්වය යන ස්වභාවයක් දෙක ම ඇති බවත් පැවසූ අතර මරිය තුමී දේව මව යන්න තහවුරු කරන ලදි.

**යුතිකේය වාදය - කැල්සිඩොන් මන්ත්‍රණ සභාව**

- කොන්ස්තන්තිනෝපලයේ ඇති තාපසරාමයක අධිපති ලෙස කටයුතු කළ යුතිකස් සිරිල් රදගුරුවරයාගේ ශිෂ්‍යයෙක් විය.

- පසු කාලීන ව ක්‍රිස්තුන් වහන්සේ එක් පුද්ගලයකු පමණක් වන බවත් ඒක ස්වභාවයකට හිමිකම් කියන බවත් එනම් ඔවුන් වහන්සේගේ මනුෂ්‍ය ස්වභාවය දේව ස්වභාවයෙන් සැඟවී ඇති බවත් ඉගැන්වී ය.

- ක්‍රි.ව. 451 දී කැල්සිඩොන්හි රැස් වූ මන්ත්‍රණ සභාව යුතිකස්ට අවවාද කළ අතර දෙවියන් වහන්සේ එක ම පුත්‍රයාණන් වන ක්‍රිස්තුන් වහන්සේ තුළ දේවත්වය හා මනුෂ්‍යත්වය යන ස්වභාව දෙක ම ඇති බවත් ගෙනහැර දැක්වී ය.

**මැසදෝනිය වාදය - කොන්ස්තන්තිනෝපලයේ මන්ත්‍රණ සභාව**

- මැසදෝනිය වේද භේදය ඒරියන් වේද භේදයේ විකාශනයක් යැයි පැවසිය හැකි ය . කොන්ස්තන්තිනෝපලයේ රදගුරු වූ මැසදෝනියුස් නමැත්තා පුත්‍රයාණන් දෙවියන් නොවන බවත් ශුද්ධාත්මයාණන් ද දෙවියන් නොවන බවත් ඉගැන්වී ය.

- මෙම වේදභේදයට පිළිතුරු දීම සඳහා ක්‍රි.ව. 381 දී කොන්ස්තන්තිනෝපලයේ මෙම මන්ත්‍රණ සභාව රැස් කරන ලදි.

**වේදභේදවල ප්‍රතිඵල :-**

- වේද භේද කිතුනු දහම් සත්‍යතා බෙලහීන කිරීම වෙනුවට එහි අභ්‍යන්තර වර්ධනයට හා දේව ධාර්මික වර්ධනයට සහයක් විය.

- කිතුනු විශ්වාසයන් එකිනෙක ගැඹුරින් අධ්‍යනය කර පැහැදිලි විස්තරයක් කිරීමට අවස්ථාව ලැබිණි.

- මන්ත්‍රණ සභාව සඳහා රැස් වූ සියලු ම රදගුරුවරුන්ට දැනුමත්, අත්දැකීමත් මෙන් ම අදහසුත් බෙදා ගැනීමේ අවස්ථාවන් සැලසිණි.

- වේද භේද මඟින් කිතුනුවන්ගේ විශ්වාස තහවුරු කොට දහම් දැනුම වැඩි කර ගැනීමට සහය විය.

- ශුද්ධ බයිබලය ගැඹුරින් අධ්‍යයනය කිරීමට කිතුනුවෝ පොලඹවන ලද හ.

- කිතුනු විශ්වාසයේ සත්‍යතා ගොඩනැඟීමට මඟ පෑදිණි.

- ක්‍රිස්තියානි ඒකත්වයට මන්ත්‍රණ සභාවේ ඉගැන්වීම් සහය වුණි.

**යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්**

1. ක්‍රිස්තු නව චින්තනයන් බිහි වීමට හේතු වූ ග්‍රීක රෝම ශිෂ්ටාචාරය ගැන සාකච්ඡා කිරීම.
2. ඇලෙක්සැන්ඩ්‍රියානු සහ අන්තියෝකියේ විද්‍යා පීඨවල විශිෂ්ට ගුණාංගයන් ලැයිස්තුගත කරන්න.

**නිපුණතාව 6.0 : මුල් යුගයේ ශුද්ධ වූ සභාව මුහුණ දුන් අභියෝග හඳුනාගෙන ශුද්ධ වූ සභාවේ වර්ධනයට දායකත්වය ලබාදුන් චින්තකයන් හා තාපස ජීවිත ක්‍රම අනුගමනය කරමින් ජීවත් වීමට උනන්දු වෙයි.**

**නිපුණතා මට්ටම 6.3 :** පෙර - අපරදිග තාපස නිකායයන් බිහි වීම හා ඒවායේ දායකත්වය වටහා ගෙන ක්‍රියා කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාවඃ 14**

**ඉගෙනුම් පල**

- තාපස නිකායයන් බිහි වීම පිළිබඳ කරුණු ගොනු කරයි.
- පැවිදි ජීවිතයක් ගත කරන අයට ගරු කළ යුතු බව පිළිගනියි.
- ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- පැවිදි ජීවිත අනුගමනය කරමින් ජීවත් වෙයි.
- පැවිද්දන්ගේ ධර්මදූත කාර්යයට සහය වෙයි.

**විෂය අන්තර්ගතය :**

- කිතුනු තාපස ක්‍රමයේ බිහි වීම. පෙරදිග තාපස ජීවිතයේ ආරම්භය හා වර්ධනය
- වනගත තාපසයන් හෙවත් කාන්තාරයේ පියවරු
  (ශු. බැසිල් තුමා, ශු. පක්කොමියුස් තුමා)
- අපරදිග තාපස නිකායයන්හි බිහිවීම හා වර්ධනය
  (ශු. අතනාසියුස් තුමා, ශු.බෙනඩික්ට් තුමා)

**කිතුනු තාපස දිවියේ ආරම්භය**

- ක්‍රිස්තුන් වහන්සේ හා අපෝස්තුළුවරුන් දේශනය අසා මුල් කාලයේදී පිරිමි සහ ස්ත්‍රී යන දෙපක්ෂයේම එක්වරුශීලය රකිමින් ද, යාච්ඤාව තුළ නිරත ව සිටි මොවුන් ව 'තබ්බෝවරු' නමින් හඳුන්වනු ලැබීය.

- 3 වන හා 4 වන ශත වර්ෂවල අධිරාජ්‍යයන්හි ආගමික පීඩන, වේද භේද ඉගැන්වීම්, බහු දේව වන්දනා, රූප වන්දනාව, යුරෝපීය පුරාණ ජනපදවල ජනතාවගේ ආක්‍රමණය යහපත් ජීවිත පැවැත්මේ.ඇති වූ වෙනස්කම් හේතු කොටගෙන කලබලකාරී පරිසරයක් ගොඩනැගුණි

- ලෞකිකත්වයට මුල් තැන දෙමින් ජීවත්වන පරිසරයක කිතුනුවන්ගේ ආධ්‍යාත්මික දිවිය බෙලහීන විය. එවන් සමයක තම පවුල් තුළ ජීවත් වෙමින් ශුද්ධවන්ත කිතුනු දිවියක් ගත කිරීම අපහසු බව වටහා ගත් කිතුනුවෝ ලෞකික ජීවිතය අතහැර තම ආත්මික ජීවිතය පෝෂණය කර ගැනීම සඳහා (තම පවුල්, ගේදොර, නගර ආදිය අතහැර ) ඊජිප්තුව, සිරියාව වැනි රටවල පිහිටි වනාන්තර හා කාන්තාර කරා ගිය හ.

- එහි දී ඔවුහු කුඩා පැල්පත්වල හා කූඩාරම් වල ද ගල්ගුහාවල ද වාසය කරමින් කිසිවෙකුත් සමඟ කිසිදු සබඳතාවකින් තොර ව තනි ව ජීවත් වූ හ.

- මෙලෙස වනගත ව ජීවත් වූ "වනගත තාපසයන් හෙවත් කාන්තාරයේ පියවරුන්" යැයි හඳුන්වනු ලැබූහ.

- තාපස දිවියේ වර්ධනය තුළ විවිධ පියවරන් දැකිය හැකි විය. ඒවා නම් තම්බෝවරු හා වනවාසී පැවිද්දන් වීම.

- ක්‍රිස්තුන් වහන්සේ පාළුකරයේ නිරාහාර ව ගත කිරීම ත්, ස්නාවක ජොහාන් තුමා කාන්තාරයේ ගත කළ ජීවිතය ත් දිවැසිවර එලියාගේ ජීවිත පැවැත්ම ත් එකල තාපසයෝ තම ජීවිතයට ආදර්ශයක් කර ගත් හ.

- ස්නාවක ජොහාන් තුමාගේ කාන්තාරයේ ජීවිතය (මතෙව් 3: 1-4) තපස් දිවිය සඳහා ආදර්ශයක් විය.

- මුල් කාලයේ තනි ව දිවිගෙවූ තාපසයෝ පසු ව කීකරුකම දිළිඳුකම හා ව්‍රතශුද්ධිය යන වේදහාර පිළිපැද්ද හ. එය නීතියක් ලෙස නොව ක්‍රිස්තුන් වහන්සේ මුළු හදවතින් ම අනුගමනය කිරීමේ කැමැත්තෙන් කරන ලද්දකි.

- වනවාසී පියවරුන්ගෙන් තිබ්ස්නි පාවුලු තුමා ඊජිප්තුවේ අන්තෝනි තුමා ආදීහු ප්‍රධාන තැනක් උසුලති.

- ශුද්ධ වූ සභාවේ සම්ප්‍රදායයට අනුව තිබ්ස්නි පාවුලු තුමා පළමු තාපසයා ලෙස පිළිගැනේ. ශ්‍රේෂ්ඨ බුද්ධිමතකු හා ධනවතකු වූ ඔහු එකල සිදු වූ පීඩාවන් නිසා තම සියලු වස්තු සම්පත් විකුණා දිළිඳුන්ට පරිත්‍යාග කර දේව සංරක්ෂණය තුළ විශ්වාසයෙන් යුතු ව රතු මුහුද අසල වනයකට ගොස් මියයන තෙක් එනම් වසර 90ක් ගුහාවක ජීවත් විය. ඔහු මියයන විට වයස අවුරුදු 113 ක් බව කියවේ.

- තේබ්ස් හි පාවුලු තුමන්ගේ ගෝලයකු වන ඊජිප්තුවේ අන්තෝනී තුමා තාපස දිවියේ නිර්මාතෘවරයා ලෙස සැලකේ. වයස අවුරුදු 18 දී අනාථයකු වූ මොහු තාපස දිවිය ඇලුම් කළ නිසා තම වස්තුව විකුණා දිළිඳුන්ට දී වසර ගණනාවක් පාළු සොහොනක ශුද්ධ බයිබලය කියවමින් දෑතේ කර්මාන්තවල නියැළෙමින් ජීවත් විය. මෙතුමා වනවාසීන්ගේ ආත්මික ජීවිතයට හා සාමුහක ජීවිතයට විශාල අත්වැලක් විය.

**පෙරදිග තාපස නිකායයන් හි බිහි වීම හා ඒවායේ වර්ධනය**

**ශු. පක්කොමියුස් තුමා**

- වනගත තාපසයන් අතර නව වෙනසක් ඇති විය. එනම් තනි තනි ව ජීවත් වූවන් සාමුහික ජීවිත රටාවට යොමු වීම යි.

- ක්‍රි.ව 320 තෙක් යුද්ධ භටයකු ව සිටි පක්කොමියුස්' තාපසයන්ගේ සාමූහික ජීවිත ක්‍රමය ආරම්භ කළේය.

- දේව සැලැස්ම ගැඹුරින් අත් දුටු ශු. පක්කොමියුස් තුමා සාමූහික ව තාපස ජීවිත පැවැත්ම ආරම්භය කළේ ඊජිප්තුවේ තේබ්ස් හි ය.

- තාපසයන්ට විනය මාලාවක් සකස් කර, ශුද්ධ බයිබලය කියවීම, ධ්‍යානය, සමාව දීම, යාච්ඤාවේ ජීවිතය ආදිය ට ඔවුහු යොමු කරන ලද හ.

- ඊජිප්තුවේ වනාන්තරයේ ජීවත් වූ වනවාසී තාපසයන් සියලු දෙනා එක් කොට නයිල් ගඟ අසබඩ තාපසාරාම අටක් ගොඩනගා ඔවුන් ට තාපස සමූහ ලෙස ජීවත් වීමට ඉඩ සලසන ලදි.

- තම සොහොයුරියගේ ඉල්ලීම පරිදි කාන්තාවන් සඳහා ද තාපසරාමයක් ආරම්භ කරන ලදි. මෙය කාන්තාවන් සඳහා ආශ්‍රමික ජීවිතයේ ආරම්භය වේ.

- පළමු ව ඊජිප්තුවේ ශුද්ධ වූ අන්තෝනිතුමා, පක්කොමියුස් ක්‍රමයේ තාපස ජීවිතය, ඊජිප්තුවේ ශුද්ධ වූ හිලේරියුස් මඟින් සිරියාවටත් පසු ව සුළු ආසියාවටත්, මෙසපොතේමියා, ග්‍රීසිය හා පලස්තීනය වැනි අපර දිග රටවල ට පැතිර යාමට සලස්වන ලදි.

## ශු. බැසිල් තුමා

- කපදෝසියානු පියවරුන්ගේ කෙනෙකු වන ශුද්ධ වූ බැසිල් තුමා ක්‍රි.ව. 339 සෙසරියා නගරයේ උපත ලද්දෙකි.
- මිනිසකු මුළුමනින් ම පූර්ණත්වය කරා ගෙනයා හැක්කේ සමාජය තුළ බව වටහා ගත් ශු. බැසිල් තුමා තාපස ජීවිතය අගය කළේ ය.
- මෙතුමා පෙරදිග රටවල තාපස ජීවිත සඳහා විනය මාලාවක් සකස් කළේ ය.
- එතුමා කපදෝසියාවේ අයිරිස් ගඟ අද්දර බොන්රස් නම් ස්ථානයේ තාපසාරාමයක් ඇරඹී ය.
- ශුද්ධ බයිබලය පිළිබඳ ව ඉගෙනීමට ත්, තාපසයන්ගේ සාමූහික ජීවිතයට සහය විය හැකි ආකාරයේ ස්වයං රැකියාවල නිරත වීමට ත් සහය දෙන ලදි.
- තාපසයන් ගණන ක්‍රමයෙන් වැඩි වන වීට ඔවුහු කුඩා තාපස කණ්ඩායම් වශයෙන් බෙදා වෙන් කරන ලදහ.
- තාපස ජීවිතයට මඟ පෙන්විය හැකි විනය මාලාවත් සකස් කළේය. සුළු නීති 35කින් හා ප්‍රධාන නීති 313කින් යුක්ත ය.
- දේශනා කිරීමෙහි ද ජනතාවගේ සිත් මනස්ථාපනය සඳහා යොමු කිරීමේ කාර්යයෙහි ද නියැළුණු මෙතුමා සභාව ස්ථාපනය කිරීමේ කාර්යයෙහි ද නිරත වූයේ ය.
- ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳ ව හා ශු. සභාව පිළිබඳ ව ගැඹුරින් අධ්‍යනය කළ මෙතුමා ශුද්ධාත්ම වරප්‍රසාද සේවාව සඳහා යොමු කළ යුතු බව අවධාරණය කළේ ය.
- කීකරුකමින් යුතු ව යහපත් ලෙස ජීවත් වන තාපසයකු කිතුනුවන්ට ආදර්ශයක් විය යුතු ය යන්න ශු. බැසිල් තුමාගේ අදහස විය.
- "මැවීමේ දිනය", "ශුද්ධාත්මයාණෝ " "ඊරියන් වේදභේදිකයා" එතුමා ලියූ ප්‍රධාන ග්‍රන්ථ වේ.
- මෙතුමාගේ මංගල්‍යය ජනවාරි 02 වන දින සමරනු ලබයි.

## අපරදිග තාපස නිකායය :-

- පෙරදිග අරඹන ලද තාපස ජීවිතය ඊජිප්තුවේ අන්තෝනි මුනිඳුන්ගේ ශ්‍රාවකයකු වන ශු. අතනාසියුස් තුමන් මඟින් අපරදිගට පැතිර ගියේ ය.
- අපරදිග රටවල තාපස ජීවිතය හඳුන්වා දුන් අය අතුරින් ශු. බෙනඩික්ට් තුමා එංගලන්තයේ කැන්ටබරියේ අගොස්තීනු තුමා, කැසියස්තුමා යන අය වැදගත් වෙති.

## ශු.බෙනඩික්ට් තුමා

- ක්‍රි.ව. 480 ඉතාලියේ නූර්සියාවේ ප්‍රභූ පවුලක උපත ලැබූ මෙතුමා රෝමයේ අධ්‍යාපන ලැබීය. එවකට පැවති අපචාරික ජීවිතය දැක කලකිරුණු මෙතුමා 16 වන වියේ දී අපෙස්නිහි ඇති ගුහාවක වනවාසී තාපස දිවිය ඇරඹීය.

- මොහු තාපස දිවිය සඳහා විනය මාලාවක් සකස් කළේය.

- ශු. බෙනඩික්ට් තුමා විසින් සකස් කරන ලද විනය නීති මාලාව පරිච්ඡේද 73ක් වේ. එහි ක්‍රිස්තුන් වහන්සේ කේන්ද්‍ර කරගත් ජීවිතයක් මෙලොව ජීවත් වීමට අවශ්‍ය ආධ්‍යාත්මික උපදෙස් ද තාපස නිකායය විශිෂ්ට ලෙස පවත්වාගෙන යාම පිළිබඳ පරිපාලන උපදෙස් ද අඩංගු ය.

- රෝමයේ සිට සැතපුම් 40ක් පමණ ඈතින් ඇති සුබියාතෝ ස්ථානයේ තාපස සමූහ 12ක් ගොඩනගා ඒවායේ පොදු පරිපාලකයා ලෙස ක්‍රියා කළේ ය. කැසිනෝ කන්දේ ඇති එතුමාගේ තාපසාරාමය ලොව ප්‍රසිද්ධ විය.

- එතුමාගේ පැවිදි පන්තියේ තාපසයෝ යාච්ඤාවෙන් ශුද්ධ බයිබලය ඉගෙන ගනිමින් ද දෑතේ කර්මාන්තවල යෙදෙමින් ද කාලය ගත කළ හ. "යාච්ඤාව හා වැඩ කිරීම " ඔවුන්ගේ ආදර්ශ පාඨය විය.

### ශු.අතනාසියුස් තුමා

- මෙතුමා ඊජිප්තුවේ ඇලෙක්සැන්ඩ්‍රියාවේ ක්‍රි.ව. 296 දී උපත ලැබී ය. අලෙක්සැන්ඩ්‍රියාවේ රදගුරුතුමන් වන අලෙක්සැන්ඩර් යටතේ ප්‍රථමයෙන් තේවාචාරිවරයකු ලෙස ද පසුව ලේකම් ලෙස ද සේවය කළේ ය. එතුමා තේවාචාරිවරයකු ලෙස සිටි සමයේ ඒරියන් වේදභේදයට එරෙහි වී ශු.සභාවේ සාම්ප්‍රදායික ඉගැන්වීම් තහවුරු කළේ දක්ෂ දේවධර්මචාර්යවරයෙකු ලෙස ය.

- ඊජිප්තුවේ ශු. අන්තෝනි තුමන් සමඟ එක් ව ඒරියන් වාදයට විරුද්ධ ව කිතුනු සාම්ප්‍රදායික ප්‍රතිපත්තිවලට සහය දෙමින් විවිධ ග්‍රන්ථ සම්පාදනය කළේ ය.

- මේවා අතුරින් කොන්ස්තන්තීනු අධිරාජ්‍යයට ලියා යැවූ "දේව වචනය" "මාංශ ගත වීම", "කොන්ස්තන්තීනුට උපදෙස්" ඒරියන් වාදයට විරුද්ධ සංවාද "ආගමික පැහැදිලි කිරීම්" "ඒරියන්වරුන්ගේ" ඉතිහාසය වැදගත් තැනක් උසුලයි.

- එතුමා ශු. සභාවේ විශ්වාසයේ ටැඹක් ලෙස ද කිතුනු ජීවිතයේ කේන්ද්‍රය ලෙස ද ක්‍රිස්තියානි සත්‍යතාවන්හි ආලෝකයේ කුලුනක් ද ලෙස පිළිගනු ලැබී ය.

### යුරෝපයට ඇති කළ බලපෑම්

- වනගත තාපසයන් මඟින් අරඹන ලද තාපස ජීවිත ක්‍රමය කිතුනුවන්ට ලබා දුන් නව දැක්ම, පෙර අපර දිග කිතු දහමේ පුනරුදයන් ඇති වීමට සහය විය. ප්‍රථමයෙන් තාපස ජීවිතය මඟින් කිතු දහමේ පරිශුද්ධත්වය ආරක්ෂා විය. ශුද්ධ ජීවිතයකට කැඳවන ලද කිතුනුවන්ට තාපස ජීවිත ආදර්ශයක් ද, අභියෝගයක් ද මඟපෙන්වීමක් ද විය. කෙසේ හෝ ජීවත් වීම, ජීවිතයේ අරුත සොයා යා යුතු බව කිතුනුවන්ට පෙන්වා දෙන ලදි.

- ගෝත්‍රික ජනතාව ශිෂ්ටසම්පන්න කිරීමෙහි ද ජීවිත වෙනස් කිරීමෙහි ද පුරෝගාමී ව කටයුතු කළ හ. ආත්මාර්ථකාමී නොවී පරාර්ථකාමී ව කටයුතු කිරීමෙහි අගය පෙන්වා දෙන ලදි.

- දිළිඳුන්ට ආහාර ලබා දී දුක් විඳින්නන්ට සහය වූ හ. පාසල් ගොඩනගා ඒ මඟින් සිසුනට අධ්‍යාපනය ලබා දුන් හ. රෝහල්වල රෝගීන්ට සාත්තු කරමින් අසරණයන්ට පිහිට වූ හ. අනාථ මඩම් හා වැඩිහිටි නිවාස තනා සරණක් නොමැති අයට සරණ වූ හ. ශු. බයිබලය පිළිබඳ ගවේෂණයේ ද ගැඹුරින් අධ්‍යයනය කිරීමේ ද ඉගැන්වීමෙහි ද නියැළී ජනතාවට සුපුවත ගෙන ගිය හ.

- යුරෝපයේ ගෝත්‍රික ජනතාවගේ ජීවිත වෙනස් කොට ඔවුන් යහමඟට ගැනීමේ ක්‍රියාකාරකම්වල යෙදී මහත් සේවයක් කළ හ. විදේශ රටවලට ධර්මදූත සේවයේ නියැළී සුපුවත දේශනා කිරීමෙහි ද පෙරමුණ ගත් හ.

- ප්‍රාණ පරිත්‍යාගී ජීවිත පැවැත්මට වඩා වෙනස් ජීවිත ක්‍රමයක් හඳුන්වා දුන් තාපස ජීවිත ක්‍රමයක් සභාව තුළ නව ප්‍රබෝධයක් ඇති කළේ ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. ඇම්. ඇස්. ජේ. තංගසාමි, **ශුද්ධ වූ සභා ඉතිහාසය,** නංසිල් මුද්‍රණාලය, නාගර්කෝවිල්.

2. FR. P.C. Thomas, **A Compact History of the Popes**, Panta , Bompay, India.

3. පිලිප්ස් යේසුදාසන්, **මුහුන්** , අමල උදයම්, උප්පුවේලි, තිරුමලෙෙ, 2010.

4. පිලිප්ස් යේසුදාසන්, **බීජයක් ව්‍යාප්ත වීම** , අමල උදයම්, උප්පුවේලි, තිරුමලෙෙ, 2010.

5. ජී. පිලේන්දිරන්, **ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය**, නල්ලායන් මධ්‍යස්ථානය, තිරුන්ලවේලි 2008.

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | 7.0 | : | **බටහිර යුරෝපීය රටවල කිතු දහම පැතිරුණු ආකාරය ඇසුරින් ශුද්ධ වූ සභාවේ සේවාවන්ට සමන්විත වෙයි.** |
| **නිපුණතා මට්ටම** | 7.1 | : | මධ්‍යතන යුගයේ කිතු දහම පැතිරයාම හා එහි ප්‍රතිඵල මඟින් සිදු වූ වෙනස්කම් හඳුනාගෙන නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | | : | 20 |

**ඉගෙනුම් පල**

- යුරෝපීය ගෝත්‍රකයන්ගේ චිත්තාවර්තනය පිළිබඳ තොරතුරු රැස් කරයි.
- බෙනදිකාන තාපසයන් විසින් යුරෝපීය ගෝත්‍ර නාගරීකරණය කිරීම සිදු කළ බැව් පිළිගනියි.
- බෙනදිකාන තාපසයන්ගේ සේවා පෙළ ගස්වයි.
- තාපස නිකායයන් මඟින් ඉටු කරන සේවාවන් ආදර්ශයක් කර ගනියි.
- තාපසයන්ගේ සේවාවන්ට සහය වෙයි.

## විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-

## 7.1.1 මධ්‍යයතන යුගයට පෙර යුගයේ සභාවේ වර්ධනය හා පසුබෑමට හේතු

## (ශත වර්ෂ 5 - 8 තෙක්)

- මිලාන් ආඥා පනත සමග (313) ශු. සභාව නිදහස ලබා සිටිය ත් එකල වූ භේදභේද, යුරෝපීය ගෝත්‍රිකයන්ගේ ආක්‍රමණය ආදිය නිසා ශු. සභාවේ වර්ධනය පසුබෑමට ලක් විය. එහෙත් පස් වන හය වන සියවස්වල විශිෂ්ට ධර්මදූතවරයකුගේ නොපසුබට උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස ශු. සභාව යුරෝපා රටවල පැතිර ගියේ ය.

- මෙම කාලයේ ශු. සභාව ප්‍රංශය, ජර්මනිය, එංගලන්තය, ස්විට්සර්ලන්තය, අයර්ලන්තය වැනි විවිධ රටවල පැතිර යෑම පිළිබඳ අවධානය යොමු කළ යුතුය.

**පස් වන ශත වර්ෂය**

- මධ්‍යතන යුගයේ ශු. සභාව යුරෝපයේ බොහෝ රටවල පැතිර ගිය අතර එහි විවිධ සිදු වීම් හා වෙනස් වීම් විය.

- පස් වන සියවසේ රෝම අධිරාජ්‍යයේ පාලන ක්‍රියාකාරකම් දේශපාලන වශයෙන් නැඟෙනහිර බටහිර වශයෙන් දෙකොටසකට බෙදිණි.

- අධිරාජ්‍යයේ නැඟෙනහිර කොටසේ ග්‍රීක් බස, කලාව, සංස්කෘතිය ආදියට වැදගත්කමක් දෙන ලදි, බටහිර කොටසෙහි ලතින් භාෂාව, කලාව සහ සංස්කෘතියට ප්‍රධාන තැනක් ලැබිණි.

- බටහිර යුරෝපයේ ජීවත් වූ ආදී ජනතාව සමූහයක් ලෙස සටන් කිරීමෙන් රෝම අධිරාජ්‍යය පහතට වැටි එහි කේන්ද්‍ර ස්ථානයට ද පෙරදිගට යොමු විය.

- කොන්ස්තන්තිනෝපලයේ අධිරාජ්‍යයා කොන්ස්තන්තිනෝපලය සිය අගනුවර කර ගති. කොන්ස්තන්තිනෝපලයේ අගරදගුරුවරු දේශපාලන බලය අධික ලෙස ඇත්තෝ වූ හ.

- මෙවන් නිදහස් ක්‍රම පෙරදිග රටවල විවිධ වේද භේද ඇති වීමට තුඩු දිනි. එහෙත් ඒවාට මුහුණ දීමට ශු. සභාව විසින් රැස් කරන ලද මන්ත්‍රණ සභා, දේවධාර්මික සංකල්ප හා ඉගැන්වීම් ආදිය නිසා විශාල දියුණුවක් ඇති විය.

**හය වන සියවස**

- එම කාල වකවානුවේ අධිරාජ්‍යයෙහි නැගෙනහිර කොටසෙහි විශිෂ්ට ධර්ම දූතයින් ලෙස ද, ක්‍රිස්තියානි විශ්වාසයේ උපදේශකයන් ලෙස ද නැගෙනහිර සංස්කෘතිය වර්තමානයේ පෙරගමන්කරු ලෙස ද ක්‍රියා කරමින් ශිෂ්ටාචාරාත්මක ජීවන ක්‍රමය හඳුන්වා දුන් හ.

- මහා ග්‍රෙගරි ශුද්ධෝත්තම පියාණන් එංගලන්තයේ ධර්මදූතවරයා යන විරුදාවලිය ලැබී ය. මෙතුමා මේලියන් තාපාසාරාමයේ ප්‍රධාන පැවිදිවරයා වූ අගෝස්තීනු හා පැවිද්දන් 40 දෙනෙකු එංගලන්තයේ දහම ඉගැන්වීමට යැවී ය.

- ශුද්ධෝත්තම පිය නියෝගය පරිදි අගෝස්තීනු තුමා රදගුරුවරයකු ලෙස අභිෂේක කරනු ලැබී ය.

- පසුව ඔවුන් ඉංග්‍රීසි ඇල පසුකර දානෙඩ් නැමැති දූපතට ගිය හ. එම කාලයේ කෙන්ට් ප්‍රදේශයේ එතල්බර්ට් නැමැති රජ, පාලනය කළෝය.

- ඔහුගේ බිරිය බර්දා උනන්දුවෙන් කටයුතු කළ ක්‍රිස්තියානි කාන්තාවකි. එබැවින් එතල්බර්ට් රජු ඔවුන් පිළිගෙන තම රටේ කිතු දහම ප්‍රචාරය කිරීමට ඔවුන්ට අනුමැතිය ලබා දුන්නේය. එපමණක් නොව ඔවුන්ට අවශ්‍ය සියලු ම උදවු ද ලබා දෙන ලද හ.

- ෆැන්ටබරි නගරයට එපිටින් වූ ශු. මාටින් තුමාගේ දේවස්ථානය ඔවුන්ට ලබා දෙන ලදී. වර්ෂ 597 මංගල්‍ය දින එතල්බර්ට් රජු බෞතීස්ම ලැබී ය. ඔහු අනුගමනය කරමින් බොහෝ දෙනෙක් බෞතීස්මය ලැබූ හ.

- මහා ග්‍රෙගරිතුමා විසින් අගෝස්තීනු තුමා එංගලන්තයේ රදගුරු ලෙස පත් කර ඒ සමඟ තවත් බොහෝ පැවිද්දෝ එංගලන්තයේ සේවය කිරීම සඳහා යවන ලද හ.

- පැට්‍රික්තුමා අයර්ලන්තයට ගොස් ක්‍රිස්තියානි ජීවිත ක්‍රමය දියුණු කළේ ය. එතුමා අයර්ලන්ත වැසියන් ගේ සිත් හැරවූ හෙයින් "අයර්ලන්තයේ ධර්මදූතවරයා" ලෙස හඳුන්වනු ලැබී ය.

- මෙතුමා සෙලස්ටික් ශුද්ධෝත්තම පියාණන්ගේ අනුමතිය ඇති ව ජේර්මානුසාල් රදගුරුවරයා විසින් අභිෂේක කරනු ලැබී ය. පසු ව අයර්ලන්තයේ ධර්මදූත සේවය සඳහා යවනු ලැබ ඇලස්ගර් නගරයේ මහා බලසම්පන්න නායකයකු වූ දිස්සූ නැමැත්තාගේ සිත හැරවීමට ද සමත් විය.

- සාබාල් දේවස්ථානය ගොඩනැගී ය. මියාද් නම් ස්ථානයේ අයර්ලන්ත රජුගේ නෑදෑයකු වන සේනාට බෞතීස්මය ලබා දුන්නේ ය. තම කොටුව අසල ශාන්ත පැට්‍රික් දේවස්ථානය ගොඩනැගී ය.

- ශු. සභාව කඩිනමින් අයර්ලන්තය පුරා පැතිර යාමට ස්වදේශීය පූජකවරුන්ගේ අවශ්‍යතාව හැඳිනගත් මෙතුමා සුදුසුකම් සහිත වූවන් තෝරා පූජක පුහුණුව සඳහා අක්සේරාවට යැවී ය. එතුමාගේ ඉගැන්වීම් සහ නොපසුබට උත්සාහය නිසා ශු. සභාවට අයර්ලන්තයෙන් බොහෝ පැවිද්දෝ හා පූජකවරුන් ලැබුණ හ.

- එතුමා ස්වර්ගස්ථ වන විට අයර්ලන්තය විශිෂ්ට ගණයේ කතෝලික රටක් ව තිබූ බව සඳහන් කළ යුතුය.

- මෙම කාලය තුළ ධර්මය ඉගැන්වීමේ වුවමනාව ඇති ව සිය ගණනින් පැවිද්දෝ අයර්ලන්තයට පිටත් වූ හ. මොවුන් අතුරින් "ස්කොට්ලන්තයේ ධර්මදූතවරයා" යැයි හඳුන්වනු ලැබූ කොලම්බස්තුමා ද කෙනෙකි.

- කොලොම්බස්තුමා බොහෝ තාපසාරාම ගොඩනැගිමෙහි ලා පුරෝගාමී විය. මෙම තාපසාරාම අතුරින් විශිෂ්ට ගණයේ තාපසාරාමයක් වූයේ ඩෙරි තාපසාරාම ය.

- තම 42 වන වියේ එංගලන්තයේ උතුරු ප්‍රදේශයේ අඥානයන් ලෙස ජීවත් වූ බිග්සු වරුන්ගේ සිත හැරවීමට අයර්ලන්තයෙන් පිටත් වීය. බිග්සු වරුන්ගේ රජ ස්කොට්ලන්තයේ බටහිර මුහුදු තීරයේ සිට අයෝනා දූපතේ සේවයට අනුමතිය ලබා දුන්නේ ය.

- රටේ විවිධ ප්‍රදේශවල කොලොම්බස් තුමන්ගේ පවුල යන නමින් මෙතුමා තාපසාරාම එකමුතුවක් ගොඩනගා විවිධ ස්ථානවල තාපසාරාම ගොඩනැගී ය.

- ඉන්වර්නස් නැමැති ස්ථානයේ සේවය කළ බිග්සු රජ බිරුට් නැමැත්තාගේ රාජ්‍ය සභාවට ගොස් රජු වටා සිට ඩුරුයිට්ස් නැමැති අතිවිශිෂ්ට පූජකයන් සමග තරග කර තම ශුද්ධවන්ත ජීවිතය මඟින්ද ශක්තිය මඟින් ද විවිධ පුදුම ක්‍රියා මඟින් ද ජයග්‍රහණය ලබා බේරුම් හා බොහෝ ජනතාව ආගම වැලඳ ගන්නා ලෙසට කටයුතු කළේ ය. එතුමා ස්වර්ගස්ථ වන විට උතුරු ස්කොට්ලන්තය මුළුමනින් ම ක්‍රිස්තියානි රටක් විය.

- මෙතුමා එංගලන්තය, අයර්ලන්තය, ස්කොට්ලන්තය වැනි රටවල පමණක් නොව ස්පාඤ්ඤය ගොල් ඉතාලි රෝමය වැනි රටවල ද පූජනීයත්වයට පත් වූවෙකි.

**හත් වන සියවස**

- මෙම කාලයේ ශු. සභාව හා අධිරාජ්‍ය අතර විවිධ ගැටුම් ඇති වුව ද පොදුවේ යහපත් සබඳතාවක් පැවතුණි.

- එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රිස්තියානි අධිරාජ්‍යයක් (Christendom) බිහි විය. මේ නිසා බොහෝ යහපත උදා වූ අතර සමහර ගැටුම් ඇති වීම ද සඳහන් කළ යුතුය. (උදා: ශු. සභාවේ නායකයන් පත් කිරීමේ දී අධිරාජ්‍යයාගේ අනවශ්‍ය බලපෑම්)

- මෙම කාලයේ ප්‍රසිද්ධිය ලැබූ බොහෝ ශුද්ධවන්තයෝ හා විද්වත්හු බිහි වූ හ. ක්‍රිස්තියානි කලාවෙහි ද තුළ (සාහිත්‍යයෙහි, ගොඩනැගිලි නිර්මාණ කලාවේ) දේවධර්මයෙහි ද තුළ විවිධ වර්ධන ඇති විය. විවිධ නව තාපස නිකායන් (ක්ලුනි, සිස්ටෂියන්) බිහිවූ අතර පැරණි තාපස නිකායන් ද ප්‍රතිසංස්කරණය කරන ලදී. නව කිතුනුවෝ බොහෝ දෙනෙක් ශු. සභාවට එක් වූ හ.

- ඉස්ලාම් ධර්මය හා එහි යුද්ධය නිසා අධිරාජ්‍ය මහත් විනාශ වීම්වලට හසු විය. මෙය කිතු දහමටත් බලපෑමක් විය. මුස්ලිම්වරු විවිධ රටවල් අත්පත් කර ගනිමින් තම දහම වැලඳ ගැනීමට බල කළ හ. ඒ සමඟ ඔවුන්ගේ යුද්ධ බලය නිසා රෝම අධිරාජ්‍යයේ පෙර දිග කොටස විනාශයට පත් විය.

- විවිධ පෙරදිග රටවල් ඔවුන් විසින් අල්ලා ගනු ලැබී ය. යුරෝපය අත්පත් කර ගැනීමට විවිධාකාරයෙන් උත්සහ කළ නමුදු එය අසාර්ථක විය.

**අට වන ශත වර්ෂය**

- අට වන ශත වර්ෂයේ විවිධ ගෝත්‍රික ජනතාව සත්‍යාගම වැලඳ ගැනීමේ ක්‍රියාවලිය තවත් වර්ධනය විය.

- මෙම කාලයේ ජර්මනියේ ධර්මදූත වරයා යැයි හඳුන්වනු ලැබූ ශු. බෙනදික්තන තාපස නිකායයට අයත් ශුද්ධ වූ බොනිපස් තුමා ගේ නායකත්වය යටතේ ජර්මනියේ ද අනෙකුත් යුරෝපා ද රටවල ශු. සභාව පැතිරිණි. අට වන සියවස අග භාගයේ මුළු යුරෝපය ම ක්‍රිස්තියානි විය.

- මෙතුමා හැම්සයර්හි ඇති නුඩ්සෙලේ තාපසාරාමයට ගොස් තම 30 වන වියේ පූජකවරයකු ලෙස පූජකත්වය ලැබූ අවස්ථාවේ දී එම තාපසාරාමයේ වගකීම ද ඔහුට දෙන ලදි. එහෙත් බ්‍රිසියා රටේ ජනතාවගේ සිත් හැරවීය යුතුය යන මහත් ආශාව නිසා එම රටින් පිටවී බ්‍රිසියා රටේ රජ වූ බෝට්ස්ගේ අනුමතිය ඇති ව ධර්මය ඉගැන්වීමේ කටයුතුවල නියැළුණු අවස්ථාවේ එම දූත කාර්යය මුළුමනින් ම ප්‍රතිඵල දායක නොවූ හෙයින් තම දහම් කේන්ද්‍රය තෝරා ගැනීමටත්, ශුද්ධෝත්තම පියතුමාගේ කැමැත්ත හා ආශීර්වාදය ලබා ගැනීමටත් 718 දී රෝමයට ගියේ ය.

- දෙවන ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමන් විසින් එතුමා ආදරයෙන් පිළිගෙන වින්ෆ්‍රිඩ්වා (බොනිපස්තුමාගේ වෙනත් නමක්) රෝම ශු. සභාව සමඟ පැවැත් වූ ඒකාබද්ධ භාවයේ සංකේතයක් ලෙස බොනිපස්තුමා තුර්කිවරුන් අතරට සේවය සඳහා පිටත් කරන ලදි.

- බ්‍රිසිය රජ වූ රාට්බොඩ් මිය යෑම පිළිබඳ තොරතුරු දැනගත් බොන්ෆස් නැවත හැරී ගොස් සේවය කළ අවස්ථාවේ දී එහි බොහෝ කිතුනු දේවස්ථාන ගොඩනඟන ලදි. බොහෝ ජනයා බ්‍රිසිය සභාවට එක් වූහ.

- පසු ව ඔහු ජර්මනියට ගොස් එපීස නැමැති ජාතිකයන්ට සේවය කර බොහෝ දෙනෙකු ගේ සිත් හැරවී ය. පදවියේ ප්‍රධාන නගරය වූ අමෝනෝබරෝහි තාපසාරාමයක් ගොඩනැඟී ය.

- පසුව සාස්සේනිය රටේ සීමාව කරා ගොස් එහි දී ද සිය ගණනින් ජනතාව කිතු දහමට හැරවීය.

- බොනිපස් තුමාගේ දුෂ්කර ධර්මදූත සේවාව සහ එහි ජයග්‍රහණය පිළිබඳ දැනගත් 2 වන ග්‍රෙගරි ශුද්ධෝත්තම පියාණන් ක්‍රි.ව. 722 දී මෙතුමා රදගුරුවරයකු ලෙස අභිෂේක කළේ ය. නැවත ගොස් සේවය කළ විට අඥානයෝ රැසක් කිතු දහම වැලඳ ගත් හ.

- බ්‍රිඩ්ස්ලාහි වෙනත් දෙවියකුට කැප කර තිබූ ඕස් ගසක් ජනතාව ඉදිරියේ දී ම ඉතා ම ධෛර්යෙන් යුතු ව කපා දමා ක්‍රිස්තියානි දෙවිඳුන් සත්‍යය දෙවිඳුන් බව ජනතාවට අවබෝධ කළේ ය. එය දුටු බොහෝ දෙනෙක් කිතු දහම වැලඳ ගත් හ.

- පසු ව තුර්කියට ගොස් තාපසරාමයක් ගොඩනඟා රදගුරු සේවා ස්ථානය ඇති කළේ ය. 3 වන ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා මෙතුමන් අගරදගුරු ලෙස පත් කර නව රදගුරුවරුන් තෝරා අභිෂේක කිරීමේ බලය ද පැවරුවේය.

- ධර්ම ප්‍රචාර කාර්යයන් බහුල ව පැවති බැවින් තම මවු රටට ලිපි ලිවීමේ දී බොහෝ පැවිදි සොහොයුරෝ හා සොහොයුරියෝ ඔහුට උදවු කළ හ. ඔවුන් අතුරින් කෙනෙකු වන බොන්හාස්ගේ ලේලිය වන ලියෝපා ඉතා උනන්දුවෙන් සේවය කළ නිසා "ජර්මනියේ ධර්මදූතිකාව" යැයි හඳුන්වනු ලැබුවා ය. ඔහුගේ සහය ඇති ව තාපසාරාම තුනක් හා පාසල් ගොඩනැඟී ය.

- පසු ව අගරදගුරු බොනිපස්තුමා ශුද්ධෝත්තම පිය නියෝජිත ලෙස පත්කරනු ලැබ නියුස්ක්‍රියාවේ නව පදවියක් ඇති කර එහි දැකිය හැකි වූ අපිළිවෙළ ඉවත් කර ප්‍රතිසංස්කරණය ඇති කළේ ය. මෙලෙස ප්‍රංශය ජර්මනිය වැනි සභා ජයග්‍රාහී ගමනක් යාමට මඟ සැලසුවේ ශුද්ධ වූ බොනිපස්තුමා ය.

- එකල ශුද්ධෝත්තම පියාණන් හා ප්‍රංශ රජු අතර ගිවිසුමක් ඇති කර ප්‍රංශ රටේ රජු රෝමයේ ශුද්ධෝත්තම පියාණන් විසින් කිරුළු පලඳවා අභිෂේක කිරීම සිරිතක් ව පැවතිණි.

- මහා චාල්ස් රජු ශු. සභාව හා කිතුනු විශ්වාසය ආරක්ෂා කිරීමට ත්, දියුණු කිරීමට ත්, ජනතාවගේ අධ්‍යාපන තත්ත්වය උසස් කිරීමට විවිධ උත්සාහයන් කළ හ.

- මෙම කාල වකවානුව තුළ දී බාහිරින් හා අභ්‍යන්තර ව ඇති වූ බලපෑම් නිසා නැගෙනහිරින් පැමිණි වෛකින්ස් ගෝත්‍රකයන් හා හංගේරියාවේ දකුණු හා නැගෙනහිර දිශාවන් හි සිට පැමිණි මුස්ලිම් ආක්‍රමණිකයන් නිසා ද අධිරාජ්‍යයේ බලය හීන විය.

- මේ නිසා මහා චාල්ස් රජ සමයේ අධිරාජ්‍යයේ පැවති සාමය හා සමගිය ඇද වැටිණි. මෙම බටහිර අධිරාජ්‍යයේ වැටීම බටහිර කිතු දහමේ වැටීමට ද හේතු විය.

## 7.1.2 යුරෝපීය ග්‍රෝතික ජනතාවගේ සිත් හැරවීම.

- පස් වන හය වන සියවස්වල රෝම අධිරාජ්‍යයේ සියලු ම ප්‍රදේශ යුරෝපීය ගෝත්‍රකයින් (ජර්මනියේ ගෝත්‍රවල) ආක්‍රමණයට හා බලපෑම්වලට ලක් විය. රෝම අධිරාජ්‍යට පිටින් ජීවත් වූ ජාතීහු එම කාලයේ යුරෝපා ගෝත්‍රිකයන් නැතහොත් ජර්මනියේ ගෝත්‍රිකයින් යැයි හඳුන්වනු ලැබූ හ.

- මොවුහු පුනරුත්ථාපනය කරනු නොලැබුවත් සාරධර්ම නැති අය ලෙස හිතුවක්කාරයන් ලෙස, තම ගෝත්‍රික දෙවියන්ට පමණක් වන්දනා කරන අය වූ හ. මොවුන්ගේ ජීවිත ක්‍රමය ඉතා පසුගාමී තත්ත්වයක පැවතිණි. මෙම ගෝත්‍රිකයෝ තම දෙවිවරුනට පමණක් වන්දනා කළ සභාවන් වශයෙන් යම් පසුබෑමක සිටි අය වෙති.

- මෙවන් පරිසරයක ශු. සභාවට මෙම ශිෂ්ට සම්පන්න නොවූ ජනතාවගේ සිත හරවා අධ්‍යාපනය ලබාදී යහපත් පුරුදු ඇති කර අනුක්‍රමයෙන් පිළිවෙළකට ජීවත් වන්නන් කිරීමේ අවශ්‍යතා පැවතිණි.

- මෙම තත්ත්වය යටතේ ශු. බෙනිදිකාන නිකායයේ පැවිද්දන් ජර්මානු ජාතිකයන් ශිෂ්ට සම්පන්න ජනතාවක් කිරීම තම අරමුණ කර ගත් හ.

- තාපසාරාම ධර්මදූත සේවයේ කේන්ද්‍රස්ථානය විය.

- යුරෝපා ගෝත්‍රිකයන්ගේ සිත් හැරීම, ආගම් වෙනස් වීම්, කිතුනුවන්ගේ ගණන වැඩි වීම සමඟ බටහිර යුරෝපයේ කිතු දහම පැතිරයාම් බීජය වැපුරිථණි.

### 7.1.2.1. ශු. බෙනඩිකානු නිකායයේ දායකත්වය

- ශු. බෙනදිකානු නිකායයේ පැවිදි ජීවිතය මඟින් කිතු දහමේ අධ්‍යාත්මය, ශුද්ධ බව සුරක්ෂිත කරමින් පෝෂණය විය. ශුද්ධත්වයට කැඳවනු ලැබූ කිතුනුවන්ට පැවිද්දන්ගේ ජීවිත ආදර්ශයක් විය.

- විශේෂයෙන් යුරෝපීය ග්‍රෝතිකයන් සිත් හැරී ශිෂ්ට සම්පන්න කිරීමේ ස්ථිර අදිටනින් සිටිය හ.

- තාපසාරාමවලින් විශිෂ්ට සමාජ සේවයක් ඉටු විය. ඒවායෙහි පැවිද්දෝ ආත්මාර්ථකාමී නොව පරාර්ථකාමී සේවයෙහි යෙදුණ හ. කුසගින්නෙන් සිටින අයට ආහාර ලබාදීම, රෝගීන් වැඩිහිටියන් සුරැකීම, ළමයින්ට ඉගැන්වීම වැනි සේවාවන් කළ හ. ශු. බයිබලය ගැඹුරින් හදාරා ජනතාවට ඉගැන්වූ හ.

- ස්වයං රැකියා කිරීමෙහි ලා ජනතාවට ආදර්ශයක් වී රැකියාවේ උතුම්කමට නව ජීවයක් දුන් හ.

- ශු.බෙනඩික් තුමා ලියූ පැවිදි ජීවිතයට අදාළ ආචාර ධර්ම, දැඩි යැදුම්, උපවාස, එක්වරු ශීලය රැකීම වැනි ක්‍රියා ඉවත් කර ප්‍රමාණවත්, මධ්‍යස්ථ මනුෂ්‍ය ස්වභාවයට උචිත ආධ්‍යාත්මික ජීවිතය දියුණු කළ හැකි ඒවා විය.

- මෙතුමා ලියූ පැවිදි ජීවිතයට අදාළ ආචාර ධර්ම පෙරදිග රටවල පැවිදි ජීවිතයට අදාළ විශිෂ්ට ගණයේ ආචාර ධර්ම ලෙස පිළිගැනිණි.

- ශු. බෙනඩික් තුමා නිකායයේ ආදර්ශය වන කම්කරු සේවය යුරෝපා ශිෂ්ටාචාරයේ දියුණුවට මහත් සේවයක් ඉටු කර ඇත.

- පැවිදි ජීවිත ඉතිහාසයේ පැවිද්දන් සමාජයෙන් වෙන් වී ජීවත් නොවී සමාජය සමඟ එක්වී සමාජයේ උන්නතිය සඳහා ද ජනතාවගේ ආධ්‍යාත්මික දියුණු ව සඳහා ද සේවය කරන ආකාරයට තාපස ක්‍රමයේ වෙනස්වීම් ඇති විය.

- මෙවන් පැවිදි ජීවිතයක සැකැස්මට අනුව පෙරදිග රටේ වෙනස්කම් සහිතව තාපස නිකායය පැවතිණි.

## 7.1.3. යුරෝපා ගෝත්‍රික ජනතාව ශිෂ්ට සම්පන්න වීම.

### 7.1.3.1. අධ්‍යාපන සේවය

- රෝම අධිරාජ්‍යයේ පිරිහීමට ජර්මානු ජාතික කණ්ඩායමේ සහ ගෝත්‍රික ආක්‍රමණිකයෝ එක් හේතුවක් විය. මෙම ගෝත්‍රවල ජනතාව අභිගුණ්ඨිකයන් ලෙස ද ශිෂ්ට සම්පන්න නොවූවන් ලෙස ද ජීවත් වූහ.

- රෝම අධිරාජ්‍යයේ පිරිහීමක් සංක්‍රමණිකයන් සමග නායකත්වයේ වගකීම පිළිගෙන රෝම නගරය බේරාගත් රදගුරුවරුන්, පැවිද්දන් යුරෝපා ගෝත්‍රික ජනතාව ශිෂ්ට සම්පන්න හා යහපත් ජීවිතයකට මඟ පෙන්වීමෙහි මහත් දායකත්වයක් දක්වා ඇත.

- යුරෝපා ග්‍රෝතිකයන්ගේ රජවරු මෙම රදගුරුවරුන්ගේ නායකත්වය පිළිගත් අතර ඔවුන්, තම සාම දූතයන් ලෙස ද උපදේශකවරුන් ලෙස ද පිළිගත්හ.

- මෙම ජනතාවට ශිෂ්ට සම්පන්න ජීවිතයක් පිළිබඳ ඉගැන්වීම, ග්‍රීක, රෝම ශිෂ්ටාචාරයේ යහපත් අංග ගෙනහැර දැක්වීම, ඔවුන් කිතුනුවන් කිරීම ආදිය රදගුරුවරුන්ගේ ප්‍රධාන කාර්යය විය.

- රදගුරුවරුන්ගේ සේවය යටතේ තාපසයෝ ද නායකත්වයක් ගෙන ක්‍රියා කළ හ. මෙහි දී ශු. බෙනඩික්ට් තුමන්ගේ නිකායයේ පැවිද්දන්ගේ සේවය ඉතිහාසඥයන්ගේ මහත් ප්‍රශංසාවට ලක් විය.

- ගෝත්‍රික ජනතාව යහමඟට ගෙන ඒමටත් කිතු දහම ගොඩනැගීමටත් අධ්‍යාපනය ඉතා වැදගත් මාධ්‍යයක් ව පැවතිණි.

- මෙම ජනතාවට අධ්‍යාපනය ලබා දී ශිෂ්ට සම්පන්න කිරීමේ සේවය තාපසවරුන් විසින් සිදු කරන ලදී. තාපසාරාම මඟින් පවත්වාගෙන ගිය පාසල් මඟින් අධ්‍යාපනය ලබා දෙන ලදි.

- ශිෂ්ට සම්පන්න නොවූ ජනතාවගේ තරුණ පිරිසට ලතින් භාෂාව කියවීමටත්, ලිවීමටත් උගන්වන ලදි.

- තාපසයෝ තම කාර්යයන් ඉවසීමෙන් ද කැපවීමෙන් ද, අලසකමින් තොර ව කිරීම නිසා මෙම ජනතාව ශිෂ්ට සම්පන්න කිසිඳු ගැටලුවක් පැන නොනැගිණි. තව ද ග්‍රීක රෝම ශිෂ්ටාචාරවල විවිධ ගුණාංග විනාශ වී යාමේ තත්ත්වයක් ඇති වන්නට ඉඩ නොලැබිණි.

- තාපසාරාමවල පැවැත්වූ පාසල්වල ශු.බයිබලය පැරණි විශිෂ්ට ලතින් ලේඛන, හා ධර්මධාරයන්ගේ ග්‍රන්ථවල අඩංගු දේ උගන්වන ලදි.

- ශු. බෙනඩික්ට් තුමාගේ කැමැත්ත වූයේ තම අනුගාමිකයන් උගතුන් විය යුතු ය යන්න යි. තම තරුණ ජීවිතයේ දී තාපසාරාමවලට එක් වී පැවිදි ජීවිතය ගත කිරීමට සූදානම් වන්නන් සුළු වශයෙන් හෝ තාපසාරාම පාසල්වල උගත යුතු විය.

- මෙම පාසල්වල භාවිත කරන ලද ග්‍රන්ථවල අත්පිටපත් ලබා ගැනීම සඳහා තාපසවරු විශාල දායකත්වයක් ලබා දුන් හ.

- මුද්‍රණ යන්ත්‍ර නොමැති කාලයක තාපසයන් විසින් පොත් අත් පිටපත් කිරීම සිදු කරන ලදි.

- පිටපත් ගැනීමේ කාර්යය ඉතා පරිස්සමින් කළ යුතු විය. වැරදි නොමැති ව කිසිවක් අත් නොහැර අළුතින් කිසිවක් එක් නොකර හෝ ඉතා ක්‍රමවත් ව කළ යුතු කාර්යයක් විය.

- කසියෝඩෝරස් නැමැති තාපස තුමා කුඹුරුවල දුෂ්කර වැඩ කිරීම වෙනුවට පුරාණ සාහිත්‍යයන් පුරාණ පුස්කොළ පොත් පිටපත් කිරීම ආදිය තාපසයන් විසින් කරන ලද බව පැවසී ය.

- මෙම අදහස පිළිගත් ශු. බෙනදිකානු තාපසාරාම ශත වර්ෂ ගණනාවක් පුරා තරගකාරිත්වයක් නොමැති අධ්‍යාපන කේන්ද්‍රයන් ලෙස හා පිටපත් ලබා ගන්නා ආයතන ලෙස පැවතිණි. පසුකාලීන යුරෝපා විශ්ව විද්‍යාලවල බිහිවීමට ශු. බෙනඩිකානු තාපසාරාම ආශ්‍රිත අධ්‍යාපන ආයතන හේතු විය.

### 7.1.3.1. වැඩ කිරීම

- ශු. බෙනඩිකානු නිකායේ තාපසයන් යාච්ඤාව හා වැඩ කිරීම තම තේමාව කොට ගත් හ.
- කය වෙහෙසා වැඩ කිරීම පහත් ක්‍රියාවක් බවත් වහලුන් මෙය කළ යුතු බවත් රෝමවරු සිතූ හ.
- මෙම තත්ත්වය යටතේ වැඩ කිරීම පිළිබඳ මානසිකත්වය ජනතාව අතර ඇති කිරීමත් වැඩ කිරීමේ උතුම්කම පිළිබඳ හැඟීමක් ඇති කිරීමත් තාපසයන් අතින් සිදු විය.
- ශු. බෙනඩික්ට් තුමා තමා සංවිධානය කළ තාපසවරුන් සඳහා වන ආචාර ධර්ම සෑම විටක ම ක්‍රියාත්මක වන ආකාරයේ නීතිරීති ලිවී ය.
- මෙලෙස බෙනඩිකානු නිකයයේ මඟ පෙන්වීම අනුව කය වෙහෙසා වැඩ කිරීම පිළිබඳ උසස් හැඟීමක් පෙරදිග රටවල ඇති කිරීමට හැකි විය.
- යාච්ඤාව හා වැඩ කිරීම බෙනඩිකානු තාපස ජීවිතයේ ආදර්ශ පාඨය විය. ඔවුන්ගේ ක්‍රියාකාරකම් තුළ කය වෙහෙසා වැඩ කිරීම සහ ධර්මදූත කාර්යය සිදු කරන සේවාවන් අඩංගු වී ඇත.
- යුරෝපයේ කෘෂිකර්මය සම්බන්ධයෙන් ශු. බෙනඩික්ට් තුමන්ගේ නිකායයේ තවත් දායකත්වයක් වන්නේ ගෝත්‍රික ජනතාව ගොවියන් බවට පරිවර්තනය වීම ය.
- මෙම ජනතාව තාපසාරාමවලට සමීප ප්‍රදේශවල පදිංචි කරවා තම කෘෂිකාර්මික කටයුතුවලට සහායකයන් ලෙස පත් කර දෙන ලදි.
- තැනින් තැන යන ගෝත්‍රික ජනතාවක් වීමට වඩා ගොවිතැන් කිරීම උසස් ජීවිත තත්ත්වයක් ඇති ජනතාවක් වන බව ඔවුනට පැහැදිලි කර දෙන ලදි.
- තාපසයෝ කැලෑ එළි පෙහෙළි කොට ඒවා විශිෂ්ට ගොවිබිම් ලෙස වෙනස් කළහ. මොවුන් යුරෝපයේ කෘෂිකර්මය දියුණු කළ බව බොහෝ ඉතිහාසඥයන්ගේ අදහසකි.
- කෘෂිකර්මය හැර ඒ හා සමඟ සම්බන්ධ සියලු ම අනෙකුත් කර්මාන්ත ද ගෝත්‍රිකයෝ ඉගැන්වූ හ. වැඩ ඉගැන්වූ හ. මේසන් වැඩ, වඩු වැඩ සමඟ තවත් කුඩා කර්මාන්ත, ලෝහ වැඩ ආදිය ද විය. තාපසාරාම යුරෝපා ගෝත්‍රිකයන්ගේ තාක්ෂණික පාසල විය.
- සියලු ම තාපසයෝ සියලු, රැකියා සම තත්ත්වයකින් සැලකූ හ. මොවුහු සත්ත්ව පාලනය, කිරි දෙවීම, මීමැසි පාලනය, ගොයම් කැපීම, සීසෑම, ගොයම් පෑගීම, කම්මල් වැඩ, විවීම, මිදි යුෂ සැකසීම වැනි වෘත්තීන්හි නිරත වූ හ.
- මෙවන් කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල යෙදුණු මොවුහු තමන් වටා ජීවත් වූ ජනතාවට ආදර්ශයක් වූ හ.
- උසස් අධ්‍යාපනඥයන් ලෙස ජනතාවගේ ගෞරවයට පාත්‍ර වූ තාපසයෝ මෙලෙස කය වෙහෙසා වැඩ කිරීම මහත් ආදර්ශයක් කර ගත් හ.
- ශු. බෙනිදිකාන නිකායයේ තාපසයෝ යුරෝපීය කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල ජයග්‍රාහි ලෙස සහභාගි වූ අතර වෙනත් බෝග වගාව වැනි නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දුන් හ.
- යුරෝපීය ගෝත්‍රිකයන්ට වැඩ කිරීමේ උතුම්කම පිළිබඳ අවබෝධ කර දීම තාපසයන් ලද විජයග්‍රහණයකි.

**යෝජිත ඉගෙනුම් ක්‍රියාකාරකම්**

1. බටහිර යුරෝපා ගෝත්‍රවල බලපෑම පිළිබඳ සාකච්ඡා කරයි.
2. මෙම සාකච්ඡාවේ දී පැන නැඟුණු විෂයයන් මඟින් වාර්තාවක් බඳු ප්‍රකාශයක් නිර්මාණය කරයි.
3. ශිෂ්ට සම්පන්න කිරීමට තාපසවරුන් විසින් දෙන ලද දායකත්වය සොයා වාර්තාවක් ඉදිරිපත් කරයි.
4. ශු. බෙන්දිකාන නිකාය මඟින් ගෙනගිය අධ්‍යාපන සේවය වැඩ කිරීම ආදිය පිළිබඳ සොයා දැනගෙන නිර්මාණයක් ඉදිරිපත් කරයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. ජී. පිලේන්දිරන්, **ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය**, නල්ලායන් මධ්‍යස්ථානය, තිරුනල්වේලි 2008.
2. සේවියර් ඉරුදයරාජ්, **පැවිදි ජීවිතයේ ඉතිහාසය**, අරුට්කඩල්, චෙන්නායි, 2008.
3. ඇම්. ඇස්. ජේ. තංගසාමි, **ශුද්ධ වූ සභා ඉතිහාසය,** නංසිල් මුද්‍රණාලය, නාගර්කෝවිල්.
4. John Laux, **Church History**, The Book and Publishers Illionis, 1989
5. Alfred Lapple, **The Catholic Church**, A Brief History, Munchen, 1982

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | 7.0 | : | **බටහිර යුරෝපීය රටවල කිතු දහම පැතිරුණු ආකාරය දැනගෙන ශුද්ධ වූ සභාවේ වර්ධනයට දායක වෙයි.** |
| **නිපුණතා මට්ටම** | 7.2 | : | මධ්‍යතන යුගයේ කිතුනු සභාව බෙදී යාමට හේතු වූ කරුණු ගොනු කරයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | | : | 16 |

**ඉගෙනුම් පල**

- මධ්‍යතන යුගයේ කිතුනු සභාවේ දෙකඩ වීම් සිදුවීමට හේතු ගොනු කරයි.
- ශුද්ධ වූ සභාව තුළ පුනර්ජීවනයක් ඇති කිරීමේ අරමුණින් යාචක නිකායයන් බිහි වූ බව පිළිගනියි
- රැස් කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ශුද්ධ වූ සභාවේ නවෝදය ඇති කිරීමට වෙහෙසෙයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී උනන්දුවෙන් සහයෝගය දක්වයි.

**විෂය අන්තර්ගතය :**

## 7.2.1. අඳුරු යුගය

- ක්‍රි.ව. 9 වන සියවසේ සිට 11 වන සියවස තෙක් කාලය අඳුරු යුගය ලෙස හඳුන්වනු ලැබේ.
- මෙම කාලයේ ශු. සභාව, කතෝලික සභාව හා රෝම අධිරාජ්‍ය වශයෙන් සමාජ ආයතන දෙකක් මඟින් පාලනය කරන ලදී. මෙම ආයතන දෙකේ තරගය නිසා විවිධ අමනාපකම් හා යුද්ධ ඇති විය.
- මෙම කාලයේ පෙරදිග ශු. සභාව, පාලන වගකීම සඳහා පාලකයන් පත් කිරීම, බදු අය කිරීම, යුද්ධ භටයන් ශක්තිමත් කිරීම, මුදල් හා වස්තුව රැස් කිරීම වැනි දෙයෙහි නිරත විය.
- මෙම පසුබිම යටතේ අපරදිග, පෙරදිග සභාවත් අතර මතගැටුම් වැඩිවී භේදවලට මඟ පෑදිණි.
- ඉස්ලාමීයයන්ගේ පිබිදීම හා ගැටුම් වැඩි වී කුරුස යුද්ධයක් ඇති විය.
- ධර්මදූතවරුන්ගේ කාලයේ සිට ශුද්ධවන්ත ජීවිතය, බෙදා ගැනීමේ ජීවිතය ස්වර්ගස්ථ වූ රදගුරුවරුන් පැවිද්දන්ගේ අහංකාර ජීවිතය, ධන ලෝභිත්වය, ආත්මාර්ථකාමී ජීවිතය ශුද්ධ වූ සභාවේ පාරිශුද්ධත්වයට හා දියුණුවට බාධාවක් ව පැවතිණි. එබැවින් මෙම කාලය ශු. සභාවේ අඳුරු යුගය ලෙස සලකනු ලැබේ.
- ශු. සභාවේ නායකයන්ගේ පත්වීම්වලට රජවරුන්ගේ මැදිහත් වීම නිසා සමහර ප්‍රශ්න මතු විය. ඒවා නම්
    - දහම සම්බන්ධ අධිකාරි බලය රජයට අයත් ද? ශුද්ධෝත්තම පියාණන්ට අයත් ද?
    - ශුද්ධෝත්තම පියවරු ආගමික නායකයෝ ද නැතහොත් රටේ රජවරු ද?
- තව ද ශු. සභාවේ අධිකාරිය, විසින් උසස් තනතුරු මුදලට විකුණන ලදී. මෙසේ මිලදී ගැනීමේ දී සමහර අවස්ථාවල එක ම පදවියකට රදගුරුවරුන් තිදෙනකු නැතහොත් එක රදගුරුවරයකුට පදවි 3ක් ආදි වශයෙන් පැවතිණි. එලෙස රදගුරුවරු තම පදවිවලට එක් දිනක් හෝ නොගොස් පිටතින් සිට එය පාලනය කළ හ එහි ප්‍රතිඵලයක් ලෙස ජනතාවගේ ආගමික ජීවිතය, දහම් දැනුම, යහපත් චර්යාව විනාශ වී ගියේ ය.

- පියතුමන්ට හෝ අනෙකුත් නායකයන්ට හෝ ගැඹුරු ආධ්‍යාත්මික, පාරිශුද්ධ ස්වභාවයක් හෝ අපොස්තලික උනන්දුවක් හෝ නොමැති නිසා ඔවුන්ට අනෙක් අය ව පාලනය කිරීම හෝ වැරදිවලට දඬුවම් දීම හෝ කළ නොහැකි විය.

- පූර්ණ එල විකුණන ලදි.

- ශු. සභාවේ උසස් නිලතල මුදලට විකුණනු ලැබූ නිසා බොහෝ තනතුරු ධනවත් වූ ප්‍රභූවරුන්ට අයත් විය.

- පූජකවරුන්ගෙන් බොහෝ දෙනෙක් ප්‍රමාණවත් ලෙස දෙවිසත්හල් පුහුණුව නොලැබුවෝ ප්‍රමාණවත් දේව ධාර්මික පුහුණුවක් නැති අය ද වූ හ.

- ශු. සභාවේ පුනරුදයක් ඇති වී ශුද්ධෝත්තම පියවරුන්, රදගුරුවරුන්, පූජකවරුන්, පැවිද්දන් ආදීන්ගේ පාරිශුද්ධ ආත්මික ජීවිතය ඇති වේ යැයි විශ්වාසයක් සමහර පැවිදි අය හා ගිහි බුද්ධිමතුන් තුළ ඇති විය.

- ශු. සභාවේ පුනරුදයක් ඇති කළ යුතු යැයි බිහිවූ තාපස නිකායයෝ පවා පැවිදිවරය ජීවිත පැවැත්ම හා විශ්වාසය අතහැර මුදල් එකතු කිරීමෙහි ද දේශපාලන ලාභය සෙවීමෙහි ද යෙදී සිටිය හ.

- සමාජය තුළ ඇති වූ පුනරුදය විවිධ නව අදහස් චින්තන බිහි වීමට හේතු විය. ඒ අනුව අන් අය පවසන අදහස් වෙනස් අය එලෙස ම පිළිගත යුතු නැති බව තමා ම සිතා තීරණයක් ගත යුතු යි යන අදහස මතු විය. එබැවින් ආගමික ප්‍රතිපත්ති ඉගැන්වීම් කෙරෙහි සැක මතු විණි.

- මෙම කාලවකවනුවේ විශ්වාසකයෝ ශු. සභාව කෙරෙහි දැඩි කල කිරීමකට පත් ව සිටිය හ. තම ආගමික නායකයන් කෙරෙහි අවිශ්වාසයෙන් කලකිරීමෙන් සිටිය හ.

- ශු. සභාවේ පැවති විවිධ අඩුපාඩු මඟ හරවා ආගමික පුනරුදයක් ඇති කිරීමට සමහර පූජකවරුන් පැවිද්දන් උත්සාහ කළ ද ඔවුන්ගේ එම උත්සාහය ප්‍රතිඵල දායක නොවිණි.

- ඒ සඳහා රැස් වූ මන්ත්‍රණ සභාවලින් ද ප්‍රතිඵලයක් අත් නොවිණි. මන්දයත් එයට අවශ්‍ය ශුද්ධෝත්තම පියවරුන්ගේ සහය නොලැබීම ය.

### 7.2.2 පෙරදිග හා අපරදිග කිතුනු සභා දෙකඩ වීම සහ ඒවායේ ප්‍රතිඵල

- ශු. සභා ඉතිහාසයේ ක්‍රි.ව. 1054 දී පෙරදිග හා අපරදිග සභාවන් අතර භේද ඇති වී ශු. සභාව පෙරදිග - අපරදිග වශයෙන් දෙකඩ විය.

  එම බෙදීමට

  - කිතුනු සභාවේ නායකත්වය පිළිබඳ අදහස් වල වෙනස්කම
  - විශ්වාසයේ ප්‍රතිපත්ති වැදගත් හේතු විය.

- රෝමයේ ශුද්ධෝත්තම පිය නායකත්වය සම්පූර්ණ ශු. සභාවට පොදු වන බව බටහිර රෝම සභාවන් අදහස් කළ අතර කොන්ස්තන්තිනෝපලයේ සභාපිය සම නායකත්වයක් සතු වන අය බව අපරදිග සභා පාලකයෝ විශ්වාස කළ හ.

- තව ද කොන්ස්තන්තිනෝපලයේ සභා පියවරු නිසියානු විශ්වාස ලක්ෂණයේ ෆීලියෝ කුවේ (Filioque- පුත්‍රයාණන්) මඟින් නැමැති වාං මාලාව එක් කර ගැනීම තවත් හේතුවක් විය.

- ශුද්ධෝත්තමයාණන් පියාණන්ගෙන් හා පුත්‍රයාණන්ගෙන් නික්මෙන ආත්මයාණන් යැයි අතනාසියුස් තුමාගේ අදහස පෙරදිග සභාවෝ පිළිගත් හ.

- ශුද්ධෝත්තමයාණෝ පියාණන්ගෙන් නික්ම පුත්‍රයාණන් මඟින් පැමිණෙන (Prefilium - ප්‍රිෆිලියුම්) යන අදහස අපරදිග සභාවෝ පිළිගත් හ.

- මෙවන් ගැටලු නිසා ශු. සභාවේ විවිධ ප්‍රශ්න හා බෙදීම් ඇති වූ විට 9 වන ලියෝ ශුද්ධෝත්තම පිය සමයේ කොන්ස්තන්තිනෝපලයේ පාත්‍රියක් වෙන් වූ වන මයිකල් සෙලාරියුස් නැමැත්තා දිව්‍ය පූජාව අවස්ථාවේ දී ශුද්ධෝත්තම පියාණන් සමඟ තමන්ට ද සම අයිතිය ඇති බව පැවසී ය. ඒ සමඟ නගරයේ ඇති සියලු ම ලතින් ක්‍රමයේ දේවස්ථාන ද වසා දමන ලදි.

- ශුද්ධෝත්තම පියතුමා තම නියෝජිතයන් දෙදෙනකු ගිවිසුම් සබඳතාවක් ඇති කර ගැනීම සඳහා කොන්ස්තන්තිනෝපලයට යැවී ය. එහෙත් ගිවිසුම සබඳතා උත්සාහය අසාර්ථක වූ හෙයින් සුදතුම් පිය නියෝජිතයෝ 1054 ජූලි 16 වන දින කොන්ස්තන්තිනෝපලයේ පාත්‍රියක් තුමා වූ සෙලාරියුස් තුමා සභාවෙන් නෙරපනු ලැබී ය.

- මෙතැන් පටන් පෙරදිග සභාව අවසාන වශයෙන් රෝම සභාවෙන් බෙදිණි.

ප්‍රතිඵල :

- ශු. සභාව පෙර - අපරදිග ලෙස බෙදුණු හෙයින් කිතුනු සංස්කෘතියේ විවිධ බලපෑම් ඇති විය.

ඒවා නම්

- සන්නිවේදනය සඳහා එක් භාෂා භාවිතය වැඩි විය.
- සංස්කෘතික ඒකාධිකාරිය හඳුන්වාදෙන ලදි. (ග්‍රීක, ලතින් සංස්කෘතිය)
- පෙරදිග හා අපරදිග ක්‍රිස්තියානියේ වෙනස් ඉතිහාසමය පසුබිමක් බිහි විය.
- පෙර,අපරදිග සංස්කෘතික පසුබිමෙහි වෙනස් ජනවන්දනා ක්‍රම දියුණු විය. වෙනත් දේවධාර්මික ප්‍රතිපත්ති බිහි වී දියුණු විය.

## 7.2.3 කුරුස යුද්ධය

- ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය සමග සබඳතා ඇති ශුද්ධ ස්ථාන ජෙරුසලම හා ඒ අවට ඇති නගර තුර්කිවරුන්ගෙන් බේරා ගැනීම සඳහා බටහිර ලෝකයේ කිතුනුවන් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගය කුරුස යුද්ධ නමින් හැඳින්වෙයි.

- කාලිං ඔමර් සහ ඔහුගේ පරම්පරාව ශුද්ධ වූ දේශයේ කිතුනුවන් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය හා බැඳුණා වූ ස්ථාන නැරඹීමට ඉඩ දුන් හ.

- මොවුන් ක්‍රිස්තුන් වහන්සේගේ ශුද්ධ වූ සොහොන සහ අනෙකුත් ශුද්ධ ස්ථාන සුරැකීමේ වගකීම කිතුනුවන්ට ලබා දුන් හ.

- ජෙරුසලම පලස්තීනය වැනි ස්ථානවලට වන්දනා ගමන් යෑම මනස්තාපනයක් සඳහා උචිත කාර්යයක් ලෙස පිළිගත් නිසා යුරෝපා රට වල සිට ශු. දේශයට වන්දනා ගමන් සඳහා බොහෝ වන්දනාකරුවන් පැමිණෙන්නට වූ හ.

- මෙම කාලවකවනුවේ කාල්ප්ගේ රාජ්‍ය පාලනය බිඳ වැටිණි. සෙල්ජුක් තුර්කිවරුන් 1075 දී ජෙරුසලම අත්පත් කර ගත් හ. මොවුහු අරාබිවරු මෙන් කිතුනුවන් ප්‍රතික්ෂේප කර විරෝධය පෙන්වූ හ.

- ජෙරුසලමේ පාත්‍රියක් තුමා (රදගුරුතුමා) සිරගත කර විශාල මුදල් තොගයක් එතුමා වෙනුවෙන් ඇප මුදල් ලෙස ලබාගත් පසු එතුමා නිදහස් කළ හ.

- නිදහස් කරන ලද ජෙරුසලමේ පාත්‍රියක් තුමා පලස්තීනයේ කිතුනුවන්ගේ තත්ත්වය සහ තමන්ට සිදු වූ අවමානය පිළිබඳ විස්තර සහිත ලිපියක් ලියා 2 වන උර්බාන් ශුද්ධෝත්තම පියතුමාට යැවී ය.

- මේ හා සම්බන්ධ ව බිසෙන්තියානු අධිරාජයා වූ ඇරලක්ස් තමන්ට සහය විය යුතු යැයි ශුද්ධෝත්තම පියතුමා කළ ඉල්ලීම නිසා ප්‍රංශයේ මන්ත්‍රණ සභාව කැඳවන ලදි. 2 වන උර්බාන් ශුද්ධෝත්තම පියාණන් කතා කළ අවස්ථාවේ දී බිසෙන්තියානු අධිරාජ්‍යයා මේ සඳහා සහය දෙන බවට පොරොන්දු විය.

- එබැවින් වීර ප්‍රභුවරුන්ගේ නායකත්වය යටතේ යුද්ධ හමුදාව රැස් කරන ලදි. මෙම යුද්ධ හමුදාව තම හදවතේ කුරුසියේ ලකුණ පැලඳ යුද්ධ කළ නිසා මෙය කුරුස යුද්ධය යැයි හඳුන්වනු ලදි.

- ප්‍රංශ රට පුරායමින් දෙවන උර්බාන් ශුද්ධෝත්තම පියතුමා හා පේදුරු නැමැති පැවිද්දා ශුද්ධ සංග්‍රාමයට ජනතාව සූදානම් වීමේ අවැසියාව තහවුරු කළෝ ය.

- මිනීමැරීම, මංකොල්ලය වැනි දුෂ්ට පාපයන් කළ මහා පව්කාරයන්ට මෙම යුද්ධය මඟින් පාපයෙන් පිරිසිදු වීමේ හැකියාව ලැබෙයි යැයි ද, යුද්ධයට සහභාගි වන්නන්ට පූර්ණ ඵලය ලැබෙන බව ද ශුද්ධෝත්තම පියාණෝ පැහැදිලි කළෝ ය.

- එබැවින් ජනතාව මෙම යුද්ධය සඳහා මහා පරිමාණයෙන් එක් වූ හ. මෙම යුද්ධය විවිධ අංශවලින් 11 වන සියවසේ සිට 12 වන සියවස අවසානය තෙක් වසර 176ක් පමණ පැවතිණි.

- කුරුස යුද්ධ 8ක් පැවතිණි. ප්‍රංශයේ යුද්ධ භටයෝ බොහෝ දෙනෙක් මෙම යුද්ධයට සහභාගි වූ හ. මේ නිසා යුරෝපයේ සියලු දෙනා ෆ්‍රැන්කාර් යැයි අපරදිග වැසියන් හැඳින්වූ හ.

මෙලෙස සිදු වූ කුරුස යුද්ධ වනුයේ

| කුරුස යුද්ධය | කාලය | වැදගත් කරුණු |
|---|---|---|
| 1 | ක්‍රි.ව. 1096 - 1099 | • රජු සහභාගි නොවීය<br>• 600000 පමණ යුද භටයෝ වීර ප්‍රභුවරුන්ගේ නායකත්වය යටතේ සහභාගී වූහ.<br>• කුරුස යුද්ධ වීරයෝ ජෙරුසලමේ නායකයාණන් ලෙස ගොඩ්ෆ්‍රි තෝරා ගත් හ.<br>• භක්තිවන්තයන් මෙතුමා ශුද්ධස්ථානය ආරක්ෂා කිරීමේ වගකීම භාර ගත්තේ ය. |
| 2 | ක්‍රි.ව. 1147 - 1149 | • එයුජින් ශුද්ධෝත්තම පියතුමා දෙවන කුරුස යුද්ධයට ඉල්ලීමක් කළේ ය.<br>• ශුද්ධ වූ පෙර්නර්දන් මෙම යුද්ධයට සහය වීමට ජර්මනියේ රජවරුන් වූ 3 වන ගොර්රාට 7වන ලූයිස් රජු ආදීන් සහභාගී වූහ.<br>• යුද්ධ භටයෝ 50, 000ක් පමණ සහභාගි වූහ.<br>• මෙම යුද්ධය මුළුමනින් ම පරාජය විය. |
| 3 | ක්‍රි.ව. 1189 - 1192 | • 8 වන ගෙග්‍රරි ශුද්ධෝත්තම පියතුමා කුරුස යුද්ධ ප්‍රකාශ කළේ ය.<br>• මෙම යුද්ධයට බ්‍රෙඩ්ක් පාර්බරෝසෝ ප්‍රංශ රජ දෙවන පිලිප් එංගලන්තයේ රජ වූ පළමු වන රිචඩ් ආදීහු සහභාගි වූ හ.<br>• ජෙරුසලම අත්පත් කරගැනීමට නොහැකි විය. 1199 දී රිචඩ් සාලඩින් සමග ගිවිසුමක් අස්සන් කරන ලදි.<br>• මේ අනුව වන්දනාකරුවන්ට ශුද්ධ දේශය නැරැඹීමට අනුමතිය ලබා දුන්හ. |

| | | |
|---|---|---|
| 4 | ක්‍රි.ව. 1201 - 1204 | • 3 වන ඉනෝඉනසන්ට් ශුද්ධෝත්තම පියතුමාගේ ඉල්ලීම පරිදි මෙම යුද්ධය දිගට ම පැවතිණි.<br>• ප්ලාන්ඩර්ස් වැව්ෂෙයින් වැනිස් රටේ වැඩියෙන් මෙම යුද්ධයට සහභාගි වූ හ.<br>• 1204 හි කොන්තන්තීනය වැනිස් රටේ වැසියන් විසින් අල්ලා ගන්නා ලදි.<br>• මෙය බිසෙන්තියානු සභාවන් ලතින් සභාවන් අතර එකමුතුකමක් නැති කළේ ය. |
| 5 | ක්‍රි.ව. 1217 - 1221 | • ප්‍රංශය ජර්මනිය වැනි රටවල වීරයෝ මෙම යුද්ධයට සහභාගි වූ හ.<br>• ජෝන් ප්‍රියන් හංගේරි රජ දෙවන ඇන්ඩෲ යන අය විසින් මෙම යුද්ධය මෙහෙයවන ලදි.<br>• නයිල් නදිය අසල ඇති දාවිතා නගරය 1219 දී අත්පත් කරගනු ලැබීය.<br>• මෙය යුද්ධභටයන් ලද ජයග්‍රහණයකි<br>• නයිස් නදියේ ජලය පිටාරා ගැලිමට පටන් ගත් නිසා මෙම යුද්ධය ඇන හිටියේය.<br>• වසර 08ක යුද්ධ විරාම ගිවිසුම සමඟ යුද්ධය අවසන් විය. |

### 7.2.3.1. කුරුස යුද්ධය පරාජයවීමට හේතු

- නිසි පාලනයක් නොමැතිකම.
- තමන්ට ම අනන්‍ය වූ නායකත්වයක් නොමැති වීම.
- කුරුස යුද්ධයට සහභාගි වූවන් අතර නිතර ඇති වූ භේදයන් නිසා ඔවුන් අතර වු අසමඟිය.
- 4 වන කුරුස යුද්ධයේ දී කිතුනු ලෝකය ආරක්ෂා කිරීමට ගියවුන් කොන්ස්තන්තිනෝපලය කොල්ලකෑම.
- අත්පත් කරගත් ප්‍රදේශයේ යුරෝපයෙන් බොහෝ ඈත පිහිටි නිසා අඛණ්ඩ ව ඒවා ආරක්ෂා කිරීමට නොහැකි වීම.
- මෙයට සහභාගි වූ ප්‍රභුවරුන්ගේ අරමුණ ආර්ථික වාසිය වීම.

### 7.2.3.2. කුරුස යුද්ධයේ ප්‍රතිඵල

**යහපත් ප්‍රතිඵල :**

- ජනතාව අතර ගැලවීමේ සිතුවිලිවලට නව ජීවයක් ලැබීම.
- ශුද්ධ වූ සභාවේ සමඟියට රෝමය සත්‍ය වශයෙන් ම ප්‍රධාන කාරණය බව පැහැදිලි වීම.
- ඉස්ලාමියයන් අතර බලය හීන වීම.
- කිතුනු ගෝත්‍ර අතර ඇති වූ ස්වාධීන ගැටුම් නැති වීම.
- ජනතාව එකිනෙකා හැඳිනගෙන ආදරය කිරීමට මඟ පෑදීම.
- වහල් වෙළඳාම අහෝසි වීම.
- බෙලහීනයන්, කොන් කරනු ලැබූවන්, වැන්දඹුවන්, අනාථයන් ආදීන් ආරක්ෂා කිරීම උසස් කාර්යයක් යන අදහස ශුද්ධ වූ සභාව තුළ පැන නැඟීම.
- කරුණාවේ වීරයන්ගේ සභාව, සිරගත වූවන් මිදීමේ සභාව, හමුදා පැවිද්දන්ගේ සභාව ආදිය බිහි වීම.

**අයහපත් ප්‍රතිඵල :**

- ශුද්ධ වූ භූමියට වන්දනා කරුවන් නිදහසේ යාමේ තහනම ඉවත් කිරීමේ අරමුණ ඉටු නොවීම.
- අපරදිග කිතුනුවන්ගේ තත්ත්වය තවත් දුබල වීම.
- කුරුස යුද්ධයේ යෙදුණු අය සැවොම උත්තමයන් නොවීම නිසා ඔවුන් විසින් ශු. සභාවට ත් එහි ක්‍රියාකාරීත්වයට ත් කිරීම.
- යුද්ධයට නායකත්වය දුන් රජවරු ශුද්ධ වූ සභාව ආක්‍රමණය කිරීමේ හේතුවෙන් ආත්මික කරුණුවලදී බලපෑම් කිරීම.
- වේද භේද, දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කිරීම ආදි අදහස් පැතිරයාම ආරම්භ වීම.
- මෙම යුද්ධ කිතුනු ජීවිතවල පසුබෑමක් ඇති කිරීම.
- බොහෝ ජීවිත විනාශ වූ අතර ආර්ථිකය ද කඩා වැටිණි.
- උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේගේ ගුණාංග නැති වී ගිය හ. එනම් ආදරය, දයාව, මනුෂ්‍යත්වය ආදි ය.

## 7.2.4. යාචක නිකාය බිහි වීම : දායකත්වය - පසුබිම

### 7.2.4.1. තාපසාරාමවල පුනරුත්ථාපන සංවිධාන

9 වන 10 වන සියවස්,

- 9 වන 10 වන සියවස්වල ශු. සභාව මුහුණ දුන් බිය වැද්දීම් තාපසාරාමවල ද පැවතිණි.

- තාපසාරාම අධිපතීන් රජවරුන්ට සේවය කරන්නන් ලෙස වෙනස් වී ප්‍රභූවරුන් වීමේ තත්ත්වයක් උදා විය. මේ නිසා තාපසාරාමවල පැවති සංවිධානාත්මක ජීවිතයේ බිඳවැටීම් ඇති විය.

- තාපසවරුන් ලෞකික ජීවිතයක් ගත කිරීමට පටන් ගත්හ. තාපසාරාම රජවරුන්ගේ අතට පත්විය.

- එහෙත් පැවිදි ජීවිතයේ බීජය නොමැරිණි. සමහරු තම පැවිදි ජීවිතයේ අභ්‍යන්තර ජීවය ආරක්ෂා කර තාපසාරාමවල නව ජීවයක් ද ඇති කිරීමට දැඩි ව කැප වී ක්‍රියා කළහ.

- ශුද්ධ වූ බෙන්ඩික්ට්තුමාගේ ආචාර ධර්ම සත්‍ය ලෙස සුරැකිය යුතුයි යන අදිටනින් ක්ලුනි, සිස්ටෂියන් තාපසාරාම පෙරමුණ ගති.

- ආරම්භ යුගයේ දිළිඳුකම, වැඩ කිරීම, යාච්ඤාව, ශුද්ධ බයිබලය කියවීම, අන් අයගේ යහපත උදෙසා වන සේවාවල දී විශ්වාසවන්ත ව සිට පැවිදි ජීවිතයේ වටිනාකම්වලට හා ශුද්ධත්වයට නව ජීවයක් ලබා දෙන ලදි.

- එදිනෙදා ජීවිතයේ දේව වන්දනාවට වැදගත් තැනක් හිමි විය.

- තාපසවරුන්ගේ ජීවිතවල මිනිස් ශ්‍රමය විශේෂයෙන් කුඹුරු වැඩ, වතු වැඩ ප්‍රධාන තැනක් උසුලයි.

- ගොඩනැගිලි කලාව, තාක්ෂණය, ඉංජිනේරු තාක්ෂණය ආදියට ප්‍රධාන තැනක් ලබා දෙන ලදි.

- දේවස්ථානවල හා තාපසාරාමවල නිහඬතාවය පවත්වාගෙන යන ලදි.

- තනි ව ම වස්තුව තබා ගැනීම තහනම් කරන ලදි.

- මෙලෙස ක්ලුනි, සිස්ටෂියන් නිකායයෝ විශිෂ්ට ලෙස ක්‍රියාත්මක වී ශු. සභාවේ ආත්මික පුනරුදය ඇති කිරීමට වෙහෙසුණහ.

**12 වන, 13 වන සියවස්**

- ශු. සභා ඉතිහාසයේ මුල් කාලයේ පැවිද්දන් ලෝකය අතහැර තනිවම දෙවියන් වහන්සේ සමඟ කිට්ටු සබඳතාවක් ඇති ව ජීවත් වීම අරමුණු කර ගනිමින් අවිවාහක ව ජීවත් වූ හ.

- එහෙත් 12, 13 සියවස්වල යුරෝපයේ ඇති වූ ආර්ථික, සමාජ වෙනස්වීම්වලට මුහුණ දීම සඳහා ශු. සභාව තම එඬේරිකා කාර්යය සංවිධානාත්මකව කළ යුතු විය.

- එකල ඇති වූ නාගරීකරණය වාණිජමය සබඳතා නිසා ජනතාව ග්‍රාමයන් අතහැර නගරයට සංක්‍රමණය වූ හ.

- එම කාලවකවනුවේ ශු. සභාව දහම ආත්මික කරුණු ආදියට පරිබාහිර ව ලෞකික කාර්යයන්හි නියැළිණි.

- ශු. සභාවේ නායකයෝ කුරුස යුද්ධ අධිරාජ්‍යය සමඟ ගැටීම වැනි ප්‍රශ්නවලට තම අවධානය යොමු කළ හ.

- තවත් සමහරු වස්තුව සුරැකීමේ ද ඒවායේ ආදායම වැඩි කිරීමේ ද උනන්දුවෙන් වූහ.

- මෙලෙස ලෞකික ඇල්ම වැඩි වීම නිසා ශුද්ධ වූ සභා නායකයන්ගේ ආධ්‍යාත්මික ජීවිතය බිඳ වැටෙන විට කිතුනුවන්ගේ ආත්මික ජීවිතයටත් ධාර්මික ජීවිතයටත් එය ප්‍රබල ලෙස බලපාන්නට විය.

- කැඩීබිඳී ගිය ලෝකයේ ආධ්‍යාත්මික පුනරුදය ඇති කිරීමේ කඩිනම් අවශ්‍යතාවය මතුවිය.

- ක්‍රිස්තුන් වහන්සේගේ ශුද්ධවන්ත දිළිඳු ජීවිත පැවැත්ම, පවතින සමාජය තුළ ඇති කරවීමේ අවශ්‍යතාව.

- ඒ සඳහා නායකත්වය දරන්නන් සමාජය යහමඟ ගන්වා, ශු. සභාව යහමඟ යැවීමේ මඟ සොයා ක්‍රියා කිරීම.

- ක්‍රිස්තුන් වහන්සේගේ දිළිඳුකම අනුව යමින් ලෞකික වස්තූන් කිසිවක් බලාපොරොත්තු නොවී සේවය කිරීම.

- තම එදිනෙදා අවශ්‍යතාව සිඟාකමින් ලබා ගැනීම.

- ලෞකික සතුට අතහැර ආත්මික සතුට තමන් සතු කර ගැනීමේ වැදගත්කම ගෙනහැර දැක්වීම.

- මෙම ආධ්‍යාත්මික පුනරුදය ශු. සභාවෙන් ද ඒ මඟින් සමාජයෙන් ද තිර වශයෙන් ඉදිරියට ගෙනයාමට 13 වන සියවසේ කිතුනු ජනතාව මධ්‍යයෙහි සමහර නායකයෝ මඟ පෙන්වූ හ. ඔවුන් අතුරින් පීටර් වැල්ඩෝ, අසීසියේ ප්‍රැන්සිස් තුමන්, දොමිනික් ද ගුස්මන් වැනි අය වැදගත් තැනක් උසුලයි.

- මොවුහු ලෝකයේ ජීවත් වෙමින් පැවිදි ජීවිතයේ අරමුණ වන ලෝකය ත්‍යාජ කර ජීවත් වීම, දිළිඳුකම, පිරිසිදුකම, යාච්ඤාව, උපවාසය, ස්වත්‍යාජය වැනි ක්‍රිස්තුන් වහන්සේ ඉගැන්වූ වටිනාකම් මල්පල ගැන්වීමට උත්සුක වූ හ.

- තම ජීවිතයෙන් ද, වචනයෙන් ද ජනතාවට උගන්වා සිත් හැරවීම ඔවුන්ගේ අරමුණ විය.

- මොවුන් සියල්ල පොදු වේ තබා ගත් හ.

- ඔවුහු එදිනෙදා අවශ්‍යතාවන් සපුරා ගැනීමට ගෙයින් ගෙට ගොස් සිඟමන් යදිමින් ජනතාව ලබාදෙන, දානය, පිරිමසමින් ජීවත් වූ නිසා යාචක නිකායයන් යැයි හඳුන්වනු ලැබූ හ.

- මෙලෙස බිහිවූ යාචක නිකායයන් අතුරින් පහත සඳහන් නිකායන් වැදගත් තැනක් උසුලයි.
  - වැල්දේසියානු පැවිදි නිකාය
  - ෆ්‍රැන්සිස්කානු පැවිදි නිකාය
  - දොමිනිකානු පැවිදි නිකාය

## 7.2.4.1. වැල්දෙන්සියානුවෝ

### වැල්දෙන්සියානුවෝ ඇති වීමට බලපෑ පසුබිම

- ප්‍රංශයේ ලියෝන්සිල් පීටර් වැල්ඩෝ නැමැත්තා ක්‍රි.ව. 1176 දී මෙම යාචක නිකාය බිහි කළේ ය.
- මෙතුමාගේ අහංකාර ජීවිතය මතෙව් 19 : 21 සුවිශේෂ වදන්වලට ඇහුම්කම් දීම මඟින් වෙනස් විය.
- තමා සතු වූ සියල්ල දිළිඳුන්ට බෙදා දී දිළිඳු ජීවිතයක් ගත කිරීමට පටන් ගත්තේ ය.
- දේව වදනට අනුව තම ආත්මික ජීවිතය ශක්තිමත් කිරීම කෙරෙහි අවධානය යොමු කළේ ය.
- මෙතුමන් අනුගමනය කළ බොහෝ දෙනෙකු මෙතුමන් සමඟ එක්වූ හෙයින් ඔවුහු වැල්දේසියානු නිකාය (ලයන්ස් දිළින්දන්) යන නම සහිත ව ජනතාව මධ්‍යයෙහි සේවය කළ හ.

### මෙම නිකායයේ ජීවිත ක්‍රමය

- මෙම නිකායයේ පැවිද්දන් දිළින්දන් ලෙස ඇඳුම් පැලඳ, ලී සෙරෙප්පු පැලඳ දිළිඳු ජනතාවට දේව වචනය දේශනා කිරීමට දෙදෙනා බැගින් ගිය හ.

- පීටර් වැල්ඩෝගේ දිළිඳුකම,පරිත්‍යාගශීලී පිරිසිදු ජීවිතය, ඔහු ඉදිරියට ගෙන ගිය ධර්ම දේශනා කාර්යය ශුද්ධ වූ සභාවේ ගෞරවයට පාත්‍ර විය.

- (ක්‍රමයෙන් වැල්දේසියානුයෝ ශු. සභාවේ නායකයන්, රදගුරුවරුන්, පූජකවරුන්, ලෞකිකත්වයට වහල් වූ ජීවිතය පිළිබඳ විවේචනය කළ හ.

- 1184 රැස් වූ 3 වන ලතරානු සංගමය විසින් මොවුන්ගේ සේවය ප්‍රශංසාවට ලක් කරන ලදි.

## 7.2.4.2. ෆ්‍රැන්සිස්කානු පැවිදි පන්තිය

### ෆ්‍රැන්සිස්කානු පැවිදි පන්තිය බිහි වීමට හේතු වූ පසුබිම

- ක්‍රි.ව. 1182 දී ඉතාලියේ අසිසි නගරය තම මවුබිම කොටගත් ෆ්‍රැන්සිස්තුමන් විසින් මෙම පැවිදි පන්තිය ආරම්භ කරන ලදී.

- තම තරුණ වියේ දී සුඛෝපභෝගී ජීවිතයක් ගත කළ ෆ්‍රැන්සිස් දිළින්දන්ට උදවු කිරීමට කිසිවිටකත් ප්‍රතික්ෂේප නොකළේ ය.

- මෙම කාලවකවනුවේ දී ඇති වූ යුද්ධ නිසා තම තනතුරු අතහැර යුද්ධයට ගියේ ය.

- සිරගත ව සිට නිදහස් වීමෙන් පසු ව ද නැවත යුද්ධය යන අතරතුර ස්පෙලෝඩෝ නැමැති ස්ථානයේ දී ෆ්‍රැන්සිස්තුමා දුටු සිහිනය එතුමන්ගේ ජීවිත ගමන් වෙනස් කිරීමටත් සාර්ථක කිරීමටත් මඟ පෙන්වීය.

  - විනෝදජනක ජීවිතයෙන් ඉවත් වීම.
  - පාළු ස්ථානවලට ගොස් යැදීම.
  - සුවිශේෂ ඉගැන්වීම්වලට අනුව ජීවත් වීමට උත්සාහ දැරීම.
  - තම වැරදිවලට මනස්තාපනය වීම.
  - තම විනෝදජනක ජීවිතයෙන් දෙමාපියන් හා යහළුවන් ආදීන්ගෙන් වෙන් වීම.
  - දිළිඳුන්ට සේවය කිරීමට හෝ දිළින්ඳකු ලෙස සේවය කිරීමට ඉදිරිපත් වීම.

- එතුමා ජීවත් වූ සුවිශේෂය පදනම් කොටගත් ජීවිතය හා ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිත ක්‍රමය දුටු බොහෝ දෙනෙකු එතුමාගේ ජීවිත ක්‍රමයට කැමැත්තෙන් ඔහු සමඟ එක්වීමේ ප්‍රතිඵලයක් ලෙස ෆ්‍රැන්සිස්කන් පැවිදි පන්තිය ආරම්භ විය.

- මුලින් ම මෙතුමාව අනුගමනය කළ පුද්ගලයා වුයේ බෙන්රාඩ් කුවින්දවාන් නැමැත්තා වෙයි. පසු ව 12 දෙනෙකු තෙක් ප්‍රමාණය වැඩිවිය.

- 1209 දී වර්ෂයේ ෆ්‍රැන්සිස්කන් පැවිදි පන්තිය ආරම්භ කළේ ය.

**ප්‍රැන්සිස්කාන නිකායයේ ජීවිත ක්‍රමය**

- මෙම නිකායය ලොවපුරා පැතිර ගොස් තම ජීවිතය මඟින් ද වචනය මඟින් ද ක්‍රිස්තුන් වහන්සේගේ සුභාරංචිය දේශනා කර ශු. සභාවේ නායකයන්ගේ ජීවිත වල ආත්මික පුනරුදයක් ඇති කළේ ය.

- ඔවුන්ගේ ලෞකික පැවැත්ම, වැරදි, පිළිබඳ අවබෝධ කර ඔවුන් මනස්තාපනයට කැඳවා පව් කමා කිරීමේ අවශ්‍යතාව තහවුරු කළේ ය.

- ධර්ම දේශනා සේවාවේ ද බයිබලය ඉගෙනීමෙහි ද, අධ්‍යාපන සංස්කෘතික ක්ෂේත්‍රයන්හි ද මහත් සේවයක් කළේ ය.

- කාන්තාවන් වෙනුවෙන් දිළිඳු ක්ලාරා නිකායයත් පැවිදි ජීවිතයක් ගත කළ නොහැකි ගිහියන් වෙනුවෙන් උපවාසයේ සොහොයුරියන් යන තුන් වන නිකායයක් ආරම්භ කර ශු. සභාවේ අඳුරු යුගයේ එහි ආධ්‍යාත්මික පුනරුදය සඳහා මෙම නිකායය මහඟු සේවයක් ඉටු කළ බව සඳහන් කළ යුතුය.

## 7.2.4.3. දොමිනිකානු පැවිදි පන්තිය

### දොමිනිකානු පැවිදි පන්තිය බිහි වීමට හේතු වූ

- මෙම පැවිදි පන්තිය ස්පාඤ්ඤ ජාතික දොමිනික් ද ගුස්මන් තුමන් විසින් 1216 දී ආරම්භ කරන ලදී.

- උතුරු ස්පාඤ්ඤ ඔස්බා නගරයේ ආසන දෙව් මන්දිරයේ කුනන්වරයෙකු ලෙස සේවය කරමින් සිටිය දී එහි රදගුරුතුමන් සමඟ දකුණු ප්‍රංශය හරහා ගමන් කරමින් සිටිය දී එහි වැසියන් මුහුණ දී සිටි වේදහේදය එනම් ඇල්බිජෙගිනිසම් වේදහේදය ගැන දැනගන්නට ලැබිණි.

- මෙම වේදහේදය නැති කිරීමේ කාර්යය භාරය සභාව විසින් භාර දී තිබුණේ තාපසවරුන් වෙත ය.

- එහෙත් එය අසාර්ථක වී තිබිණි.

- දොමිනික්තුමන් තම දේශනාවාදි පැවිදි පන්තිය ආරම්භ කළ මෙම වේදහේදය නැති කිරීම සඳහා ය.

**දොමිනිකානු නිකායයේ ජීවිත ක්‍රමය**

- ඇල්බිජෙගිනිසම් වෙදභේදය දේශනා කිරීම මගින් නැති කිරීම මෙම පැවිදි පන්තියේ මූලික කාර්යය වූයේ ය.
- හිස් පතුලින් ගමන් කළ මෙම දේශනවාදි පියවරු ඉතා දිළිඳු ජීවිතයක් ගත කළ හ.
- ගැඹුරු ධ්‍යානය අපෝස්තලික සේවය අධ්‍යාපනය යාච්ඤා සාමූහික ජීවිතය මෙම යාචක පියවරුන්ගේ ජීවිත ක්‍රමය හා ක්‍රියාකාරකම්වලට ඇතුළත් විය.
- දොමිනිකානු තාපසිකාවන් සඳහා දෙවන ජාතියක් ද දොමිනික් තුමන් විසින් ආරම්භ කරන ලදි. දොමිනිකානු පැවිදි සොහොයුරියන් සහ ගිහි දොමිනිකානු ඉන් පැවිදි පන්තියේ තුන්වන කොටසේ සාමාජික සාමාජිකාවෝ වේ.
- දොමිනිකානු නිකායය මගින් වෙනත් දේව ධර්ම ශුසත්‍රඥාන, ශුද්ධෝත්තම පියවරුන් ඇතුළු සභා පාලකයන් හා අධ්‍යාපඥයෝ ආදිය බිහි වී මේ අතර ශුද්ධ වූ මහා ඇල්බට්තුමන් ශු. තෝමස් ඇක්වයිනස්තුමන් විශේෂ තැනක් ගනියි.

**යාචක ජීවිත ක්‍රමය**

- මෙහි පැවිදිවරු තමන්ගේ එදිනෙදා ආහාර වේල හා අනිත් අවශ්‍යතා සිඟමනින් ලබා ගත්හ. මේ නිසා යාචක පැවිදි පන්තියක් ලෙස හැඳින් වේ.
- සභාවේ වේදහාර සහිත ව සාමූහික ජීවිතයක් ගත කරයි.
- ශුභාරංචිය දේශනා කිරීම ප්‍රධාන කාර්යය වන අතර ඉතා මහත් ලෙස දේව ධාර්මය ප්‍රචලිත කිරීමේ හා අධ්‍යාපන සේවාවෙහි යෙදී සිටිති.

**අදාළ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්:**

- අඳුරු යුගයෙහි පෙර අපර දිග කිතුනු සභාවන්හි භේදයන් පිළිබඳව සාකච්ඡා කරයි.
- කුරුස යුද්ධ ඇති වීමට හේතු හා එහි ප්‍රතිඵල ගවේෂණය කර වාර්තාවක් ඉදිරිපත් කරයි.
- ශු. සභාවේ ආධ්‍යාත්මික පුනරුදයට හේතු වූ පැවිදි නිකායයන් හා සේවාවන් පිළිබඳ සාකච්ඡා කරයි.
- "කාලානුරූපී ගැටලුවලට මුහුණ දුන් නායකත්වයේ වගකීම්" යන මැයෙන් ඉහත දී උගත් පැවිදි නිකායයන් පිළිබඳ කරුණු සැලකිල්ලට ගනිමින් නිර්මාණයක් ඉදිරිපත් කරයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. ඇම්. ඇස්. ජේසුදාස් තංගසාමි, ශුද්ධ වූ සභා ඉතිහාසය, නංසිල් මුද්‍රණාලය, නාගර්කෝවිල්.
2. පිල්ප්ස් යේසුදාසන්, **ක්‍රිස්තියානි ජීවිතය**, (නි.ම.නි.), හම්පිටිය.
3. පිල්ප්ස් යේසුදාසන්, **අබ ගස**, අමල උදයම්, උප්පුවෙලි, ත්‍රිකුණාමලය, 2010
4. පිල්ප්ස් යේසුදාසන්, **මුහුන්**, අමල උදයම්, උප්පුවෙලි, ත්‍රිකුණාමලය, 2010
5. පිල්ප්ස් යේසුදාසන්, **බීජයක් ව්‍යාප්ත වීම**, අමල උදයම්, උප්පුවෙලි, ත්‍රිකුණාමලය, 2010
6. Fr. Pc. Thomas, **A Compact History of the Popes**, Panta, Bompay, India.

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | **7.0** | **:** | **බටහිර යුරෝපීය රටවල කිතු දහම පැතිරුණු ආකාරය දැනගෙන ශුද්ධ වූ සභාවේ වර්ධනයට දායක වෙයි.** |
| **නිපුණතා මට්ටම** | **7.3** | **:** | කිතු දහමේ ප්‍රතිසංස්කරණයට හේතු වූ කරුණු හා එහි ප්‍රතිඵල පිළිබඳ ව දැන ස්ථිර විශ්වාසයකින් ජීවත් වෙයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | | **:** | 40 |

**ඉගෙනුම් පල**

- සභාවේ නවෝදය සඳහා බලපෑ ආගමික, සමාජීය, දේශපාලන, ආර්ථික කරුණු පිළිබඳ තොරතුරු රැස් කරයි.
- ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව මඟින් කතෝලික සභාවේ ප්‍රතිසංස්කරණයක් ඇති වූ බව පිළිගනියි.
- රැස් කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ශුද්ධ වූ සභාවේ ඉගැන්වීම් පිළිපදිමින් ජීවත් වෙයි.
- ශුද්ධ වූ සභාවේ ක්‍රියාකාරකම්වලට සහය වෙයි.

## 7.3.1. ක්‍රිස්තියානි පුනරුදය සඳහා හේතු වූ ආගමික, සමාජීයිය, දේශපාලන, ආර්ථික, දේවධාර්මික පසුබිම.

### 7.3.1.1. ක්‍රිස්තියානි පුනරුදය සඳහා වූ ආගමික පසුබිම.

- ක්‍රි. ව.800- 1500 තෙක් වූ කාලය මධ්‍යම යුගය ලෙස හැඳින්වේ. මෙම ශුද්ධ වූ සභාවේ අඳුරු යුගය නම් වේ.

- මෙම යුගය තුළ ශු. සභාවේ ආගමික භේද, සභා භේද, පූජකවරුන්ගේ ගැටලු වැනි ගැටලු බොහෝමයක් මතු වී ශු. සභාවේ පාරිශුද්ධත්වයට හානියක් විය.

- අපෝස්තුලුවරුන්ගේ යුගයේ සිට ශුද්ධවන්ත ජීවිතය, බෙදා ගැනීමේ ජීවිතය, දිළිඳුකම, බැහැපත් දිවිය, විශ්වාසයේ දිවිය ආදිය අමතක කොට ශුද්ධෝත්තම පියවරුන්, කාදිනල්වරුන්, රදගුරුවරුන්, පූජකවරුන්, පැවිද්දන් ආදි විවිධ ස්තරවල අය එක් වී ලෞකික ජීවිතයක් ගත කළ හ. උඩගුකමින් යුත්, ආත්මාර්ථය සොයන, ධනය, වස්තුව, තණ්හාව සහිත අශීලාචාර අපිළිවෙළින් යුත් ජීවිතයක් ගත කළ හ.

- එම කාලය තුළ ක්‍රිස්තියානි ජනතාව ශුද්ධ වූ සභා රෝම අධිරාජ්‍යය යන ආයතන දෙක මඟින් ම පාලන කරනු ලැබූ හ. මෙම ආයතන දෙක අතර බල අරගල, ගැටලු මතු වී විවිධාකාර ගැටුම්වලට හා යුද්ධමය තත්ත්වයන්ට මඟ පෑදිණි.

- ශු. සභාවේ නායකත්වය දේශපාලනයට සහ දේශපාලනමය කටයුතුවලට මැදිහත් වී තම සහය පළ කිරීමට උත්සහ කළ අවස්ථාවේ දී රජවරු, ශුද්ධවූ සභාවේ පාලනයටත්, එහි සේවාවටත්, වගකීම් පත් කිරීමේ ආදියටත් මැදිහත් වී තම බලය පෙන්වීමට උත්සාහ දැරූ හ.

- මධ්‍යතන යුගයේ රාජ්‍ය පාලනයට පාලකයන් පත් කිරීම, රජවරුන් පත් කිරීම, යුද්ධමය කටයුතුවල දී සහභාගි වීම, බදු අය කිරීම, යුද්ධ භටයින් ශක්තිමත් කිරීම, ධනය වස්තුව රැස් කිරීම, දේශපාලන කටයුතු වල නියැළීම වැනි ලෞකික කාර්යවලට වැදගත් කමක් දී කිතුනු විශ්වාසකයන් අතර තම වගකීම් පැහැර හැරියෝ ය.

- තව ද ශු. සභාවේ නායකයන් පත් කිරීමේ දී රජවරුන්ගේ මැදිහත් වීම නිසා ගැටලු මතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස වසර 70ක පමණ කාලයක් (1309- 1377) පාප්වහන්සේලා (Popes) රෝමයෙන් ඈත් ව ආරක්ෂක හේතූන් නිසා ප්‍රංශයේ අවිඤ්ඤෝන්වේ සිටිය යුතු තත්ත්වයක් මතු විය. මෙම වසර 70ක අඥාන ජීවිතය පාප්වහන්සේගේ වසර 70ක බැබිලෝනියානු වහල්කම ලෙස හඳුන්වති.

- වසර 40 ක් (1378-1417) පාප්වහන්සේලා දෙදෙනෙක් එක් කෙනෙක් රෝමයේ ද අනෙක් පාප් වහන්සේ ප්‍රංශයේ ද ශු. සභාව පාලනය කළ හ. එක් අවස්ථාවක දී පාප් වහන්සේලා තිදෙනෙක් පවා සිටිය හ. මෙලෙස පාප් වහන්සේලාගේ නායකත්වය විනාශ විය.

- තව ද ශු. සභාවේ අධිකාරිත්වය උසස් තනතුරු ආදිය මුදලට විකිණීමේ දී මිල දී ගැනීමට ද සිදු විය.

- රදගුරු තනතුරු ලබා ගැනීමට වියදම් කළ මුදල නැවත ලබා ගැනීම සඳහා, රදගුරුවරුන් විසින් ජනතාව මත අධික බදු බරක් පටවන ලදි. පූර්ණ එලය විකුණන ලදි. ශු. සභාව ව්‍යාපාර මධ්‍යස්ථානයක් විය.

- ශු. සභාවේ පුනරුදයක් ඇති වී ශුද්ධෝත්තම පියවරුන් රදගුරුවරුන් පූජකවරුන් පැවිද්දන් පිරිසිදු ආධ්‍යාත්මික ජීවිතයක් ගත කරති යි විශ්වාසකයෝ බලාපොරොත්තු වූ හ.

- එහෙත් ශු. සභාවේ ප්‍රතිසංස්කරණයක් ඇති විය යුතු යැයි ගොඩනැඟුණු තාපස නිකායයෝ ද පැවිදිකම හා විශ්වාසය අතහැර මුදල් එකතු කිරීමෙහි ද දේශපාලන වාසි පැතීමෙහි ද යෙදුණ හ.

- මෙම කාල වකවානුවේ දී විශ්වාසකයෝ ශු. සභාව කෙරෙහි අතෘප්තියෙන් පසු වූහ. තම ආත්මීක නායකයන් පිළිබඳ ව අවිශ්වාස කළ හ.

- එය ප්‍රයෝජනයට ගෙන පාප්වහන්සේගේ නිල බලය, සක්‍රමේන්තු, පූර්ණ එල පිළිබඳ ව සමහරු විවිධ වේද භේද ඉගැන්වූ හ.

- එලෙස ම ශු. සභාව තුළ වූ විවිධ ගැටලු සමථයකට පත් කර, ආත්මීක පුනරුදයක් ඇති කිරීමට යන බව පවසමින් පූජකවරු හා පැවිද්දෝ කිහිප දෙනෙක් පෙරමුණ ගත් හ. එහෙත් ඔවුන් ගේ මෙම උත්සාහ ප්‍රතිඵලදායක නොවී ය.

## 7.3.1.2. ශු. සභාවේ පුනරුදයට හේතු වූ සමාජ, දේශපාලන හා ආර්ථික පසුබිම.

- 15 වන සියවසේ යුරෝපයේ සමාජ, දේශපාලන, ආර්ථික, දේව ධාර්මික වැනි අංශවල ඇති වූ වෙනස් වීම් ශු. සභා ජීවිතය තුළ ද විවිධ වෙනස් වීම් හා ගැටලු මතු කළේය.

- මධ්‍යතන යුගයේ 1490-1600 තෙක් වූ කාල වකවානුවේ ජනතාවගේ භූගෝලීය අදහස් තුළ විශාල වෙනස්කම් ඇති විය.

- ආරම්භක යුගයේ ලෝකයේ ශිෂ්ටාචාරයන් ගංගා නිම්න ආශ්‍රිත ව පැවතිණි. එහෙත් මධ්‍යතන යුගයේ ක්‍රිස්ටෝප්ර් කොලම්බස්, වස්කෝද ගාමා යන පුද්ගලයන් විසින් කරන ලද නව සොයා ගැනීම් නිසා ශිෂ්ටාචාර මුහුදු වෙරළ ආශ්‍රිත ව බිහි විය.

- ඉතාලියේ කතෝලික ධීවරයකු වූ කොලොම්බස් 1492 දී මුහුදු මාර්ගයේ ගමන් කර ඇමරිකාව හා තවත් විවිධ නව රටවල් සොයා ගත්තේය. පෘතුගීසි කතෝලික ධීවරයකු වූ වස්කෝද ගාමා 1498 දී ඉන්දියාවට නව මුහුදු මාර්ගයක් සොයා ගත්තේ ය. ඔහු මඟින් ඉන්දියාවට කිතු දහම ගෙන යන ලදි.

- රටවල් අතර වූ ව්‍යාපාරයන් දියුණු වී ආර්ථිකය දියුණු විය. ඒවා ජනතාවගේ ආගමික චින්තනයන් හි ශිෂ්ටාචාරය ද වෙනස් වීම් ඇති කිරීමට හේතු විය.

- 15 වන සියවසේ දේශපාලන ප්‍රතිපත්තිවල ද වෙනස්කම් ඇති විය.

- ම්ලේච්ඡයන්ගේ ආක්‍රමණය හා යුද්ධ ප්‍රකාශ නිසා රෝම අධිරාජ්‍යය විනාශ වී විවිධ රටවලට බෙදිණි.

- ශු. සභාව ධර්ම දූතයන් ද පැවිද්දන් ද එම රටවලට පිටත් කර යවා ම්ලේච්ඡයන් යහමගට ගෙන සිත් හරවා කිතුනුවන් කොට එම රටවල් කිතුනු රටවල් ලෙස ඒකාබද්ධ කොට ශුද්ධෝත්තම පියතුමන්ගේ බලය යටතට ගෙන එකමුතු ව ජීවත් වීමට සැලැස්වීය.

- මධ්‍යතන යුගයේ ජනතාව මධ්‍යයෙහි ජාතික හැඟීමක් ඇති විය. ලෝක දේශපාලන යන අදහස නැති වී ජාතික දේශපාලනය යන අදහස පැතිරයාමට පටන් ගැනිණි.

- එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රිස්තියානි රටවල් අතර තරගකාරීත්වය ඊර්ෂියාව, සණ්ඩු දබර, අධික විය.

- රටේ නායකයන් තම රටේ ආගමික කටයුතුවල ද පාලනයෙහි ද මැදිහත් වී තම රටේ ශු. සභාව තමන්ට පාලනය කර තම පාලනය යටතේ තබා ගැනීමට වෙහෙස වූ බැවින් ශු. සභාවේ රාජ්‍යයන් අතරේ ගැටුම් ඇති විය.

- ශුද්ධෝත්තම පියවරුන්ට කිතුනු සභාව බේරා ගැනීම සඳහා තම රටේ රජවරුන් සමඟ ගිවිසුමක් ඇති කර ගැනීමේ අවශ්‍යතාව මතු විය.

- මේවා මඟින් යුරෝපීය රටවල නිදහසේ ප්‍රොතෙස්තන්ත සභා බිහිවීමට මඟ පෑදිණි.

- යුරෝපයේ ආර්ථිකය භූමි අයිතිය හා කෘෂිකර්මය පදනම් කරගත්තක් විය.

- මධ්‍යතන යුගයේ ආර්ථිකය භූමි අයිතිය හා කෘෂිකර්මය පදනම් කරගත්තක් විය.

- නව රටවල් සොයාගත් නිසා ව්‍යාපාරවලට උචිත නව නගර බිහි විය. ඒවා මඟින් නව මූලධනය යුරෝපයට ලැබිණි. රටවල් අතර ව්‍යාපාර හා වාණිජ කටයුතු ඉතා ශීඝ්‍රයෙන් වර්ධනය විය.

- මධ්‍යතන යුගයේ පහත් මට්ටමක උපත ලැබූ කෙනෙකුට තම සමාජ තත්ත්වය උසස් කර ගැනීමට තම දැඩි කැපවීම මඟින් ලබා ගන්නා උපයා ගැනීම යොදා ගත හැකි විය.

- මධ්‍යතන යුගයේ ඉතාලිය, බටහිර යුරෝපය ආදියෙහි ඇති වූ දාර්ශනික වෙනස්කම් හා ප්‍රතිසංස්කරණවාදී ප්‍රතිපත්ති නිසා සාහිත්‍යය මූර්ති, චිත්‍ර, සංගීත, නාට්‍ය වැනි කලා දියුණු විය.

- මෙම පුරාතන සංස්කෘතියේ හා ශිෂ්ටාචාරයේ පුනරුදය මඟින් විවිධ නව අදහස් හා චින්තනයන් බිහි විය. ජාතික හැඟීමක් ඇති වීමටත් සාමාන්‍ය දැනුම වර්ධනයටත් මඟ පෑදිණි.

- ජනතාව හෙබ්‍රව් ග්‍රීක හා ලතින් වැනි පැරණි භාෂා ඉගෙනීමට උත්සුක වූ පැරණි සාහිත්‍යය සහ සිද්ධාන්ත සහිත ග්‍රන්ථ වැඩි වශයෙන් කියැවූහ. ඒවායේ දැකිය හැකි වූ ලෞකිකත්වය නිසා ඒවා කෙරෙහි ඇදී ගියෝ ය.

- ප්‍රතිසංස්කරණ යුගයේ මිනිසා ස්වයං ව ම එක් එක් සමාජයේ සේවාවෙහි වටිනාකමට ගරු කළේ ය. මෙම හේතු නිසා ප්‍රතිසංස්කරණවාදී ප්‍රතිපත්ති මඟින් මිනිසා හා දෙවියන් වහන්සේ අතර ඍජු සබඳතාවක් ගොඩනගා ගත හැකියි යන අදහස පිළිගන්නා ලදි.

- ඉතාලියේ ඇති වූ දාර්ශනික ප්‍රතිසංස්කරණයෙහි තුළ ආගමික නොවන අදහස් දැකිය හැකි විය. යුරෝපයේ උතුරු ප්‍රදේශයේ එම අදහස් පැතිරුණු හෙයින් ආගමික සත්‍යතාවන් සෙවීමට උත්සාහ කළ බුද්ධිමතුනට ඉතාලියේ ආගමික නොවන අදහස් උපයෝගී කර ගත හැකි විය. ශු. බයිබලයේ ජනතාවගේ ස්වයං විශ්වාසයේ අත්තිවාරම ලෙස පිළිගැනීමට එය අවස්ථාවක් විය.

- දේව ධර්මයට අනුව මධ්‍යතන යුගයේ ශු. සභාව තුළ සමගියක් දැකිය හැකි විය. කතෝලික සභාව විසින් පිළි ගන්නා ලදඅදහස් ප්‍රතික්ෂේප කිරීමට ජනතාවට නොහැකි විය.

- එහෙත් පශ්චාත් මධ්‍යතන යුගයේ දී එම තත්ත්වය වෙනස් විය. වෙනස් වීම්වලට උචිත ක්‍රම බිහි විය.

- 16 වන සියවසේ අලුතින් බිහි වූ ආගමික (ප්‍රොතෙස්තන්ත) සභා එම රටේ ජනතාවගේ රජය සතු විය. උදා: එංගලන්ත සභාව එංගලන්ත රජයේ කොටසක් ලෙස ද ලුතරානු සභාව ජර්මානු රජයේ කොටසක් ලෙස ද පැවතිණි.

- මෙකල කතෝලික සභාවේ අධිකාරීත්වය වෙනුවට ශු. බයිබලයේ ඉගැන්වීම්වලට මුල් තැන ලැබිණි. ශු. බයිබලයේ ඉගෙනීමට පූර්ණ නිදහස හිමි විය.

## 7.3.2. ප්‍රතිසංස්කරණ බීජය වැපුරූ චින්තකයෝ

### 7.3.2.1. මාටින් ලූතර් (1483 - 1546) ගේ ප්‍රතිසංස්කරණය

- ලෝක දේශපාලන, සමාජීය හා ආර්ථික අංශයෙහි ශීඝ්‍ර දියුණුව ඇති වෙන කාල සීමාවක රෝම කතෝලික ශු.සභාවේ වෙනසක් ඇති කිරීමට හේතු වූ පුද්ගලයෙකි මාටින් ලූතර්.

- ඔහුගේ බලගතු අදහස් බොහෝ සභාවන් වෙනස් කිරීමට හේතු විය.

- මාටින් ලූතර් ක්‍රි.ව. 1483 දී එයිසලේබන නම් ග්‍රාමයේ උපත ලැබීය. තම අධ්‍යාපනය එයිසලේබන යේ ආරම්භ කළ ලූතර් ක්‍රි.ව. 1501 දී ඒර්බට් විශ්ව විද්‍යාලයට ඇතුළත් වී ශාස්ත්‍රවේ දී උපාධිය ලබා ගත්තේය.

- පසුව අගෝස්තීනු නිකායයට බැඳී වසර 2කට පසු පූජාත්වරය ලැබීය. විටන්බර්ග් විශ්ව විද්‍යාලයේ දේව ධර්ම ආචාර්ය උපාධිය ලැබූ අතර දේව ධාර්මික ඉගැන්වීම තව දුරටත් කරගෙන යන ලදි. මෙම කාලවකවනුවේ දී මොහුගේ අදහස් ප්‍රකාශ කරන ලදි.

- රෝම කතෝලික සභාවේ නායකයා වූ සුදු පියාණන්ගේ අධිකාරී බලය පිළිබඳ ව විමර්ශනය කළ ලූතර් සභාවට විරුද්ධ වූ ප්‍රකාශ ඉදිරිපත් කරන ලදි.

- සුදු පියාණන්ගේ නායකත්වය ප්‍රතික්ෂේප කළ ලූතර් සුදු පියාණන්, රදගුරු හෝ පූජකවරුන්ට ශු. සභාව තුළ කිසිදු බලයක් නොමැති බවද, රටේ නායකයින් සභාවේ නායකයන් බව ප්‍රකාශ කරන ලදි.

- ගැලවීම සඳහා ඇදහිල්ල හා විශ්වාසය පමණක් සෑහේ යන්න ඉගෙන්වීම කළ ලූතර් පූර්ණ එල මගින් හෝ වෙනත් ධර්ම ක්‍රියා කිරීම මගින් කිසිදු ඵලක් නොමැති බව ප්‍රකාශ කිරීම.

- දේව ධර්මය ඉගැන්වීම සහ පැහැදිලි කිරීම් සඳහා ශු. බයිබලය පමණක් ප්‍රමාණවත් බව ප්‍රකාශ කර සම්ප්‍රදායික බව ප්‍රතික්ෂේප කරන ලදී

- කතෝලික සභාව විසින් සක්‍රමේන්තු සත පිළිබඳ ප්‍රකාශයට විරුද්ධ වූ ලූතර් බෞතිස්මය හා දිව්‍ය සත්ප්‍රසාද යන ප්‍රසාද නිධාන දෙක පමණක් ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර තිබෙන බව ප්‍රකාශ කරන ලදි.

- මරණින් පසු ස්වර්ගය හෝ නිරය විනා ශුද්ධිකාග්නි ස්ථානයක් වැනි තැනක් හෝ තත්ත්වයක් නොමැත යනුවෙන් ප්‍රකාශ කිරීම සහ මරිය තුමිය, සාන්තුවරයන් කෙරෙහි ඇති භක්තිය ද ප්‍රතික්ෂේප කිරීම.

මේ අනුව ශු.සභාවට විරුද්ධ ව චෝදනාත්මක වගන්ති 95ක් ලූතර් විසින් ප්‍රකාශ කරන ලදි. මේ පිළිබඳ විමර්ශනය කළ සභාව එම ඉගැන්වීම් ප්‍රතික්ෂේප කර ලූතර්ගේ වැරදි ඉගැන්වීම් හෙළා දකින ලෙසට ඉල්ලා සිටියේ ය. අවසාන ප්‍රතිඵලය වූයේ 1521 දී ඔහු ව සභාවෙන් නෙරපා දමන ලදී.

### 7.3.2.2. ස්විංග්ලි (1484-1531) ගේ ප්‍රතිසංස්කරණය

- උල්රිච් ස්විංග්ලි ස්විට්සර්ලන්තයේ ඇති විල්ඩොස් නම් ගමේ ගොවි පවුලක 1484 ජනවාරි 01 වන දින උපත ලැබීය.
- ස්විංග්ලි තම ප්‍රාථමික අධ්‍යාපනය ඔහුගේ මාමාවූ බර්තොලමේයූ නම් පූජකයා යටතේ වෙස්සල් නම් ස්ථානයේ දී ලැබී ය. පසුව තම අධ්‍යාපනය බාසේල්හි දී ලැබී ය. විනිශ්චකාරයකු වූ ග්‍රෙගරි යටතේ ලතින් භාෂාව හැදැරී ය.
- 1506 දී බාසේල් විශ්වවිද්‍යාලයයෙන් ශාස්ත්‍රපති උපාධිය ලැබී ය. සුළු වශයෙන් දේව ධර්මය හදාරා පසුව 1506 සැප්තැම්බර් 29 වන දින පූජාත්වරය ලැබී ය. ක්ලාරුස් නමැති මීසමේ වසර 10ක් සේවය කළේ ය.
- පසුව ස්විට්සර්ලන්තයේ යුද්ධ භටයන්ගේ ආත්මික පියතුමන් ලෙස සේවය කළේ ය.
- ප්‍රතිසංස්කරණවාදී චින්තකයකු වූ ඔහු ලූතර්ගේ ලේඛන ඉතා කැමැත්තෙන් කියවී ය. කාලයාගේ ඇවෑමෙන් භේදික ආගම පිළිබඳ ඉගැන්වීමට පටන් ගත්තේය. අනුක්‍රමයෙන් ස්විට්සර්ලන්තයේ භේදික ආගම් සංගමයේ නායකයා විය.
- ප්‍රථමයෙන් 1516 දී දේව මෑණියන්ට හා වන්දනා ගමනට විරුද්ධ ව දේශනා කරන්නට පටන් ගත්තේ ය. එහෙත් ජනතාව එය නොපිළිගෙන ඔහුව මීසමෙන් එළවා දැමූ හ.
- 1522 දී චතාරික සමයේ කිතුනුවන් උපවාස කිරීම පිළිබඳ ව දොස් නැඟී ය.
- විශ්වාසයේ එක ම නීතිය ශුද්ධ බයිබලය යැයි ද ජන්ම පාපය මිනිසාගේ ස්ව කැමැත්ත විනාශ කර, ඔහු ව වැරදි මඟට යොමු කිරීමට මඟ පාදන බවත් පැවසී ය.
- ශුද්ධ බයිබලයේ බලය තහවුරු කළ ඔහු, කාලයාගේ ඇවෑමෙන් ශුද්ධ බයිබලය මඟින් තහවුරු කළ නොහැකි ආගමික ප්‍රතිපත්ති ප්‍රතික්ෂේප කළේය.
- පැවිදි පොරොන්දු, පූජකවරුන්ගේ බ්‍රහ්ම චර්යාව ශුද්ධවන්තයන්ගේ මැදහත්කම, ශුද්ධකාගිනිස්ථානය යන ශු. සභාවේ ඉගැන්වීම්වලට විරුද්ධ විය.
- තමන් මෙන් අනෙකුත් පූජකවරුන් ද ලෞකික ආශාවන් නිසා පීඩා විඳින බව පැවසූ ඔහු ඇනා රෙයින්ගාඩ් නමැති වැන්දඹුව විවාහ කර ගෙන, රදගුරුවරුන් තම පූජකවරුන් විවාහ වීම වළක්වාලිය යුතු නොවන බව පැවසීය.
- කිසිදු සක්‍රමේන්තුවක් වරප්‍රසාද ලබා නොදෙන බවත් ඒවා සලකුණු පමණක් වන බව ත් දේශනා කළේ ය.
- දිව්‍ය සත්ප්‍රසාදය තුළ ක්‍රිස්තුන් වහන්සේ නැති බවත් එය ක්‍රිස්තුන් වහන්සේගේ මරණය සිහි කිරීමේ සංකේතයක් පමණක් බවත් පවසමින් වාද කළේ ය.

- ශු. සභාවේ නායකයන්ගේ ලෞකික සුඛෝපභෝගී ජීවිතය පිළිබඳ ව විවේචනය කළේ ය.

- විවිධ දේවස්ථානවලට ගොස් පුදසුන හා ප්‍රතිමා කඩා බිඳ දමා ශුද්ධ වූ පින්තූර ඉරා දිව්‍ය භෝජනය සඳහා මේසයක් පමණක් තැබී ය.

- දිව්‍ය පූජාව වෙනුවට ශුද්ධ බයිබලය කේන්ද්‍ර කරගත්, සරල ව පැවැත්විය හැකි දිව්‍ය සත්ප්‍රසාද මෙහෙයක් හඳුන්වා දුන්නේ ය.

- දේවස්ථානය තුළ සංගීත භාණ්ඩ භාවිතය තහනම් කරන ලදි.

- කතෝලික පළාත් වූ ස්වී, ඌරි, ඇන්ඩවොල්ටන්, ලූසරන් ආදි පළාත් එක් වී හමුදාවක් රැස් කර කාපල් නම් ස්ථානයේ 1531 දී මෙම භේදකාරී ආගමික උන්මාදය බිඳ හෙළන ලදි. එහි දී 1531 ඔක්තෝබර් 11 වන දින ස්විංග්ලි මරනු ලැබී ය.

### 7.3.2.3. කැල්වින් (1509-1564) ගේ ප්‍රතිසංස්කරණය

- ලූතර්ගේ ආගම අන්තර්ජාතික ආගමක් ලෙස ප්‍රචාරය කර, එයට දහම් දැනුම හා රාජ්‍ය පාලන ක්‍රමයක් සකසා දුන් පුද්ගලයා කැල්වින් විය.

- ජෝන් කැල්වින් ප්‍රංශ රටේ නෝයන් නගරයේ 1509 ජූලි 10 වන දින උපත ලැබීය. ඔහුගේ පියා ජෙරාඩ් ගෝවින් (ලතින් භාෂාවෙන් කැල්වින්) විය. ඔහු නොතාරිස්වරයෙකි. මව ජෑන් ලෙබ්රේන් වූවා ය.

- ඔවුහු මධ්‍යම පන්තියේ පවුලක් වූහ. ශු. සභාවේ ආධාර ඇති ව පැරිසියේ තිබූ දෙව් සත්හලකට ඇතුලත් වී පූජකවරයකු වීමේ අදිටනින් දේව ධර්මය ඉගෙන ගත්තේ ය. එහෙත් පසු ව තම සිත වෙනස් කර ගනිමින් බෝර්ජේ විශ්වවිද්‍යාලයයට ඇතුළත් වී භාෂාව, නීති අධ්‍යාපනය ආදිය උගත්තේ ය.

- ලූතර්ගේ ඉගැන්වීම්වලට ආකර්ශණය වූ කැල්වින් ඒවා ප්‍රචාරය කිරීමට පෙරමුණ ගෙන කටයුතු කළේ ය.

- කැල්වින් " ක්‍රිස්තියානි ආගමික ප්‍රතිපත්ති" (The Institutes of the Christian Religion) නමැති ග්‍රන්ථය ලතින් භාෂාවෙන් ලියා ප්‍රකාශයට පත් කළේ ය. එය ප්‍රොතෙස්තන්ත ඉගැන්වීම්වල අත්පොතක් විය.

- මෙම ග්‍රන්ථය මැවුම්කරුවාණන් වන දෙවියන් වහන්සේ, ක්‍රිස්තුන් වහන්සේ තුළින් දෙවියන් වහන්සේ ලබාදෙන ගැලවීම, ශුද්ධාත්මයාණෝ, ශු. සභාව යනුවෙන් පරිච්ඡේද 04 න් සමන්විත ය.

- තව ද ආදම් ගේ වැටීම නිසා මිනිසා තම නිදහස් කැමැත්ත (Free will) නැති කර ගත්තේ ය. ඔහු දෙවියන් වහන්සේගේ වහලෙක් විය. ඔහුට මින් පසු කිසිදු යහපතක් කළ නොහැකි යැයි ඉගැන්වීය.

- ජෙනීවා නගරය ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයේ කේන්ද්‍රස්ථානය කළ යුතු ය යන්න ඔහුගේ අරමුණ ය.

- කතෝලික සභාවේ දිව්‍ය පූජා වන්දනා ක්‍රමයේ සැකැස්ම පිළිපැද්ද නමුත් අනවශ්‍ය සිරිත් විරිත් සම්ප්‍රදායයන් ඉවත් කර ඉතා සරල වන්දනාවක් සකස් කළේ ය. ශු. බයිබලයේ සත්‍යතා ඉගැන්විය හැකි දැනුමක් ඇති පූජකවරුන් ද ඒවා පැහැදිලි කරගත හැකි ගිහියන් ද බිහි කිරීමේ අරමුණින් එය සැකසී ය.

- වසර 20ක් පමණ කැල්වින් එහි ආණ්ඩුකාරවරයා ලෙස ද දේව ධර්මය උගන්වන ගුරුවරයා ලෙස ද සිට දහම් අධ්‍යාපනයට වැදගත් තැනක් දී දේශනා කිරීමෙහි ද, නීතිය පාලනය සම්බන්ධ උපදෙස් ලබා දීමෙහි ද මුළුමනින් ම යෙදී සිටියේ ය.

- ක්‍රිස්තුන් වහන්සේගේ අන්තිම රාත්‍රි භෝජනය, ශුද්ධ බයිබලීය ග්‍රන්ථ, ශු. සභාව, ක්‍රිස්තුවේද, සක්‍රමේන්තු ආදියෙහි දි ලූතර්ගේ අදහසට පටහැණි අදහස් දැරී ය.

- ශු. බයිබලයේ බෞතීස්මය හා දිව්‍ය සත්ප්‍රසාදය යන සක්‍රමේන්තු දෙක පමණක් ඇත. ශු. සභාවේ දේව ප්‍රසාද නිධාන මන්ත්‍ර ගුරුකම්, යන්ත්‍ර මන්ත්‍ර ලෙස භාවිත කරන බවට චෝදනා කළේය.

- කැල්වින්ගේ දහම ප්‍රංශය, නෙදර්ලන්තය විශේෂයෙන් ස්කොට්ලන්තය වැනි රටවල පැතිර ගියේ ය.

- කැල්වින් ආගමිකයෝ තම සභාව ස්ථාපනය කළ ප්‍රදේශවලින් කතෝලික සභාව විනාශ කිරීමට උත්සාහ දැරූ හ. බොහෝ කිතුනු දේවස්ථාන අත්පත් කරගනිමින් පුදසුන හා ප්‍රතිමා විනාශ කර සංගීත භාණ්ඩ ඉවත් කර සංගීතයක් නොමැති ව දීර්ඝ යැදුම් පවසමින් ගීතිකා ගායනා කළ හ.

- පැවිද්දන් තම කන්‍යාරාමවලින් පිටත් කරනු ලැබූ හ. රදගුරු නිවෙස් මංකොල්ලකෑමට ලක් විය.

- අවසානයේ කැල්වින් දරුණු රෝගයකින් පෙළී, 1564 මැයි 27 වන දින මිය ගියේ ය.

## 7.3.2.4. තෝමස් මූන්ට්සර් (1488- 1525) ගේ ප්‍රතිසංස්කරණය

- තෝමස් මූන්ට්සර් ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණයේ ආරම්භ යුගයේ දී එනම් 1488 වර්ෂයේ දී පමණ ජර්මනියේ හාස් කඳු ප්‍රදේශයේ ඇති සරෝල්බර්ග් නමැති කුඩා ග්‍රාමයේ උපත ලැබී ය.

- ආරම්භයේ දි ලිප්සිග් විශ්වවිද්‍යාලයයේ ද පසු ව බ්‍රිරාස්බට් විශ්වවිද්‍යාලයයේ ද ඉගෙනුම ලබා ග්‍රීක, හෙබ්‍රෙව්, ලතින් භාෂාවන්හි විශාරදයෙක් විය.

- පසු ව ජර්මනියේ පූජකවරයකු ලෙස සේවය කළේ ය.

- මාටින් ලූතර් තම ප්‍රතිපත්ති 95 විටන්බර්ග් දේවස්ථාන දොරේ අලවන කාලයේ (1517-10-31) ඔහු එහි සිටියේ ය. ලූතර් ගේ අදහස් ඔහුගේ දේව ධාර්මික ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යමින් ලූතර්ට වඩා දැඩි ප්‍රතිංස්කරණවාදියෙක් විය.

- මොහු ළමා බෞතීස්මය නොපිළිගත්තේ ය. ක්‍රිස්තුන් වහන්සේ "විශ්වාස කරන අයට බෞතිස්මය ලබාදෙන්න" යැයි පවසා ඇත.

- මුන්ට්සර් ළමා බෞතීස්මය ප්‍රතික්ෂේප කළේය. ඔහුගේ ප්‍රතිපත්ති අනුගමනය කළ අය "ඇනබැප්තිස්ත" (Anabaptists) යැයි හඳුන්වනු ලැබූහ.

- ඔහු ශු. සභාවේ නායකයන්ට විරුද්ධ ව "බ්‍රෙස ප්‍රතිපත්තිය" යන ග්‍රන්ථය ජර්මන්, ලතින් භාෂාවලින් ලියා ප්‍රකාශයට පත් කළේ ය.

- "ජර්මන් වන්දනාව" යන ජර්මන් සභාවට අදාළ වන්දනා ග්‍රන්ථය ලිය ප්‍රකාශ කළේ ය. තනියෙන් පවත්වන දිව්‍ය පූජාව වළක්වන ලදි. පාපෝච්චාරණයක් නොමැති ව, ආකාර දෙකකින් දිව්‍ය සත්ප්‍රසාදය ලබා දෙන ලදි.

- දේවස්ථානවල ප්‍රතිමා, පින්තූර විනාශ කරන ලදි. දිව්‍ය සත්ප්‍රසාදය ජර්මන් භාෂාවෙන් පවත්වන ලදි.

- "ශුද්ධ බයිබලය හා සිදුවන එළිදරව්ව " යන අදහස තුළ දේව වචනයෙහි තුළ ජීවයක් ඇති බවත් එළිදරව්ව දිගට ම සිදු වන බවත් මූන්ට්සර් විශ්වාස කළේ ය.

- මූන්ට්සර් සක්‍රමේන්තු සලකුණු පමණක් වන බවත් දිව්‍ය සත්ප්‍රසාදයේ ක්‍රිස්තුන් වහන්සේගේ වැඩ සිටීමත් නොමැති බවත් එය ක්‍රිස්තුන් වහන්සේගේ පරිත්‍යාගී පූජාවේ සංකේතයක් පමණක් බවත් පැවසුවේ ය.

- මූන්ට්සර් දේව මාතාවන් තම වේද ග්‍රන්ථයේ දී ඉතා උසස් ස්ථානයක තැබී ය. ඇය ගෝත්‍රික මාතාව යැයි ද නායක පූජකයාණන් යැයි ද රැජිණ යැයි ද හැඳින්වීය.

- එතුමිය ක්‍රිස්තුන් වහන්සේගේ උපතට පෙර ද උපතේ දී ද උපතට පසු ද කන්‍යාවක් ව සිටියාය යැයි වාද කළේ ය.

- කන්‍යා මරියා තම බැහැපත් ජීවිතය මගින් සාතන්ට විරුද්ධ සටනින් ජයග්‍රහණය ලබා අඳුර හා ආලෝකය ත් දෙවියන් වහන්සේ හා මිනිසාත් අතර මැදහත්කාරිනියක ලෙස දේශනා කළේ ය.

- මරියතුමිගේ ගීති යන වචනවලට අනුව, ස්ත්‍රීන්ගේ නිදහස වෙනුවෙන් හඬ නැඟී ය.

- "රජවරුන්ට දේශනා" යන තම ඉගැන්වීමෙහි, දානියෙල් ග්‍රන්ථයේ දෙවන පරිච්ඡේදය කේන්ද්‍ර කර ගනිමින් රජුගේ සිහිනය පහදන නව දානියෙල් ලෙස තමා ඉදිරිපත් කරයි.

- ජර්මනියේ මූල්හෝම්සන් නගර සභාව විසුරුවා හැර, දේව නීතිය, ශු. බයිබලය පදනම් කර ගත් " නිරන්තර පාලන සභාව" ගොඩනැගිය යුතු යැයි වාද කළේ ය.

- කතෝලික සභාවේ ද, ලූතර්ගේ ද විරුද්ධත්වයට ඒ ඒ අවස්ථාවල ලබා ගත් තෝමස් මුන්ට්සර් අවසානයේ රජවරුන්ගේ ද ප්‍රභූවරුන්ගේ ද විරුද්ධත්වයට ලක් විය.

- අවසානයේ 1525 මැයි 27 වන දින හිසගසා මරන ලදි. ඔහුගේ කපන ලද ශරීරය අනෙක් අයට පාඩමක් ලෙස සියල්ලන්ට බලනු පිණිස, ප්‍රදර්ශනය කර තැබීය. එහෙත් මිය යාමට පෙර මූන්ට්සර් තම භේදය අත හැර දිව්‍ය පූජාව පිළිගෙන ශු. සභාව සමඟ එක් වී මිය ගියේ ය.

## 7.3.3. ඇංග්ලිකන්, මෙතෝදිස්ත,බැප්ටිස්ට් සභා

### 7.3.3.1. ඇංග්ලිකන් සභාව

- 15 වන සියවසේ යුරෝපයේ ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණය සිදු වූ අවධියේ එංගලන්තයේ ප්‍රතිසංස්කරණයක් සිදු විය.

- ලූතර්ගේ ඉගැන්වීම් එංගලන්තය පුරා පැතිරීමට පටන් ගැනිණි. කැල්වින් සභිකයෝ ද එංගලන්තයේ ප්‍රතිසංස්කරණයක් ඇති කිරීමට උත්සහ කළහ. නමුත් ඔවුන්ට ස්කොට්ලන්තය, පෝලන්තය වැනි රටවල ලැබුණු පිළිගැනීම හා සහය එංගලන්තයේ දී නොලැබිණි.

- එංගලන්ත රජු වූ 8 වන හෙන්රි රජතුමාත්, ජනතාවත් රෝම සභාවේ දේශනාවන්ට හා පාලනයට ඉතා විශ්වාසවන්ත ව සිටිය හ. ප්‍රතිසංස්කරණවාදීන්ගේ සිතෙහි පැවැති සැක හා ප්‍රශ්න ඔවුන්ගේ සිත්වල පැන නොනැගිණි.

- හෙන්රි රජු කතෝලික දහම තුළ දැඩි කැපවීමක් ඇත්තෙක් විය. වේදභේදකයන්ට විරුද්ධ ව සිටියේ ය.

- ශු.සභාවේ සක්‍රමේන්තු හත ප්‍රතික්ෂේප කර, ලූතර් විරුද්ධ ව, "සක්‍රමේන්තු හතේ ස්වභාවය" යන ලිපිය ලිවී ය. 1521 දී "විශ්වාසය ආරක්ෂා කරන්නන්" යන තනතුරුද ලබා දෙන ලදි.

- එහෙත් 1534 දී ශුද්ධෝත්තම පිය අධිකාරය ප්‍රතික්ෂේප කර රෝම ශු. සභාව සමඟ වූ යහපත් සබඳතාව කඩා බිඳ, ස්වයං ව ක්‍රියාත්මක වන ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණ සභාවක් ලෙස වෙනස් විය.

- මෙම වැටීම කාලයේ සාතන්ගේ ක්‍රියාවක් විය. මෙම ගැටලුවේ ප්‍රධාන හේතුව වූයේ ඈන් පොලින් නමැති කාන්තාවකි. අනෙකුත් රටවල ප්‍රතිසංස්කරණය වුයේ තවත් ආගමික සංවිධානයක් ඇති කිරීම ය. එහෙත් එංගලන්තය තුළ එම ප්‍රතිසංස්කරණයට අකැමැති වූ එයට මුළුමනින් ම විරුද්ධ වූ රජු විසින් එය දේශපාලන හේතුවක් කර ගන්නා ලදි.

- 2 වන ජූලියස් ශුද්ධෝත්තම පියතුමා තම වැඩිමහල් සොහොයුරාගේ බිරිය වූ කැතරින් විවාහ කර ගැනීමට ලබා දුන් අණ වලංගු නොවන බව පවසා, දික්කසාදය, ඉල්ලා රෝමයේ ශුද්ධෝත්තම පිය වූ 7 වන ක්ලෙමන්ට් තුමාට අයදුම් කළේ ය.

- හෙන්රි රජුගේ හා කැතරින්ගේ දික්කසාදයට ශුද්ධෝත්තම පියතුමා හෝ ශු. සභා පාලකයෝ එකඟ නොවූ හ.

- ක්රේන්මරින්ගේ උපදෙස් පරිදි ඔක්ස්පර්ඩ්, කේම්බ්‍රිජ් සහ ප්‍රංශ ඉතාලි විශ්වවිද්‍යාලයවලට රජු විසින් අල්ලස් දී "හෙන්රි කැතරින් විවාහ කර ගැනීම වලංගු නොවේ. මෙම සක්‍රමේන්තුවේ තත්ත්වය සැකයට තුඩු දෙයි" යනුවෙන් වාර්තාවක් දක්වන ලදි.

- එලෙස ම හෙන්රි රජු 1531 දී පූජකවරුන්ගේ සමුළුවක් රැස් කර එහි "ක්‍රිස්තියානි නීතිවලට අනුමතිය ලබා දීම සඳහා එංගලන්ත රජු ශු. සභාවේ නායකයා" යැයි තීරණය කළේ ය.

- තව ද 1532 දී පාර්ලිමේන්තුව රැස් කරන ලදුව, එංගලන්තය විසින් වාර්ෂිකව ශුද්ධෝත්තම පියාණන්ට ලබාදෙන මුදල නවත්වන ලදි.

- ශු. සභාවේ නීති එංගලන්ත සභාවේ ක්‍රියාත්මක නොකරන බවට ද තීරණය කරන ලදි.

- 7 වන ශුද්ධෝත්තම පියතුමන් 1534 මාර්තු 23 වන දින තම දැඩි තීරණය දන්වා "හෙන්රි රජ කැතරින් විවාහ කර ගැනීම, නෛතික ස්ථිර විවාහයක් වේ. කිසි දු හේතුවක් මත දික්කසාදය ලබා දිය නොහැකි." යැයි ප්‍රකාශ කළේ ය.

- එබැවින් හෙන්රි රජු 1534 දී පාර්ලිමේන්තුව රැස් කර " රජු ද, ඔහුගේ පරම්පරාව ද එංගලන්ත සභාවේ නායකයන්" යන නීතිය සම්පාදනය කළේ ය.

- 1535 දී viii වන හෙන්රි රජු තමා ඉංග්‍රීසි සභාවේ නායකයාණන් බව ප්‍රකාශ කළේ ය. ඒ සමඟ ම වන්දනා ග්‍රන්ථ සියල්ලන් ම ශුද්ධෝත්තම පිය නාමය ඉවත් කළේ ය.

- රෝමය සමඟ වූ සබඳතා මුළුමනින් ම ඉවත් කරන ලදි. 1536 පාර්ලිමේන්තුව විසින් "තාපසාරාම බිඳහෙළීමේ නීතිය" සම්පාදනය කරන ලදී. ඒ අනුව තාපසාරාම සියල්ල (376) වසා දමා දහස් ගණනින් පැවිද්දෝ, පැවිදිවරියෝ පිටමං කරනු ලැබූ හ.

- හෙන්රි රජුගේ සිත් හැරෙයි යන විශ්වාසයෙන් පසු වූ තුන් වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා, රැවටුණු බව දැන 1538 දී ඔහු ව ආගමෙන් ඉවත් කළේය.

- හෙන්රි රජු තමා භේදිකයකු (Schismatic) යන්න පිළිගත්ත ද අවසානය තෙක් කිතුනු ආගමික පාරම්පරික ප්‍රතිපත්තිවලට විශ්වාසපක්ෂ ව සිටියේ ය. එයට සාක්ෂ්‍ය වශයෙන් 1539 දී "ප්‍රතිපත්ති හයක්" යන නීතිය ප්‍රකාශයට පත් කළේ ය. ඒ අනුව දිව්‍ය සත්ප්‍රසාදයේ ක්‍රිස්තුන් වහන්සේගේ සත්‍ය වැඩ සිටීම, පූපය හෝ මිදි රස ආකාරයෙන් දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගැනීම පූජකවරුන්ගේ හා පැවිද්දන්ගේ බ්‍රහ්ම චර්යාව පැවිදි වේද පොරොන්දු ශුද්ධකාගිනිස්ථානය, පෞද්ගලික ව දිව්‍ය පූජාව පැවැත්වීම, පශ්චත්තාපයේ, බෞතීස්මය, දිව්‍ය සත්ප්‍රසාදය යන සක්‍රමේන්තු, අපෝස්තලික, නිසියානු, අතනාසියස් විශ්වාසය ලක්‍ෂණයඃ විශ්වාසයෙන් ද, පාප ප්‍රකාශයෙන් ද, පව් කමාවඃ විශ්වාසයෙන් ද, යහපත් ක්‍රියා මගින් ද, විනිශ්චයකරුවන් වීම ආදිය පිළි ගැනේ.

- අවසානයේ හෙන්රි රජ අසනීප වී 1547 ජනවාරි 28 වන දින මිය ගියේය.

### 7.3.3.2. මෙතෝදිස්ත සභාව

- ජෝන් වෙස්ලි ඇංග්ලිකානු සභා පූජකවරයකු එතුමා එංගලන්තයේ ලන්ඩන්සෙයර් නමැති ස්ථානයේ 1703 ජුනි මස 28 වන දින උපත ලැබී ය.

- 1729 දී ඔක්ස්ෆර්ඩ් පැමිණි අවස්ථාවේ දී එහි ඔහුගේ සොහොයුරු චාල්ස් වෙස්ලි තරුණ සංවිධානයක් ඇති කර පවත්වාගෙන යන අයුරු දිටි ය. විශ්වවිද්‍යාලයයේ සිසුන්ගෙන් සමන්විත වූ එම සංවිධානය තුළ නීති රීතිවලට ගරු කර, භක්තිවන්ත ජීවිතයක් ගත කිරීමට තීරණයක් ගෙන තිබුණි. එම සංවිධානයට බැඳී එතුමන්ට පසු ව එහි නායකයා වූයේ ය.

- දිනපතා ධ්‍යානයට වේලාව කැප කළ යුතු ය. එකට එක් වී ග්‍රීක භාෂාවෙන් ඇති නව ගිවිසුම කියවා මෙනෙහි කළ යුතු ය. සතියකට තෙවරක් හෝ සිවුවරක් හෝ ග්‍රීක, ලතින්, සාහිත්‍යයන් උගත යුතු ය. ඉරුදිනවල ආගමික ග්‍රන්ථ සාහිත්‍යයක් උගත යුතුය. ඉරුදිනවල ආගමික ග්‍රන්ථ සොයා බලා විවාද කළ යුතු යැයි නිසා තම විවේක කාලයේ දී සිරගත වූවන් බැහැදැකීම, ඔවුන්ගේ ජීවිත තත්ත්වයන් උසස් කිරීම, ඔවුනට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීම, කුඩා ළමයි රැස් කර ඉගැන්වීම වැනි සේවාවන් කළේ ය.

- එලෙස ඔවුන් අන් අයට ආදර්ශයක් වන ලෙස ජීවත් වූ හෙයින් එම කාණ්ඩයම "මෙතොදිස්තවරු" යැයි හඳුන්වනු ලැබූ හ.

- විශිෂ්ට උපදේශකයකු ද, දේව ධර්මාචාර්යවරයෙක් ද වූ වෙස්ලි, වීදි දේශනා හා එළිමහන් දේශනාවල ද නිරත වෙමින් තම කණ්ඩායම එංගලන්තයේ ධර්මදූත කණ්ඩායමක් ලෙස වෙනස් කළේ ය.

- මොහු ප්‍රථමයෙන් වහලුන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ව කථා කළ කෙනෙකු බව සඳහන් කළ යුතු ය.

- ජනතාව ස්වභාවයෙන්ම පාපය නිසා මැරුණ හ. එහි ප්‍රතිඵලයක් ලෙස දේව කෝපයේ දරුවන් වී සිටිති. මොහු විශ්වාසය ඇතුළාන්ත බාහිර, ශුද්ධත්වය ඇති කරවන බව දේශනා කළේ ය.

- වෙස්ලි සමඟ සිටි දේශනාකරුවන්ට පූජාත්වරය දීම ඇංග්ලිකානු සභාව ප්‍රතික්ෂේප කළ නිසා මෙතෝදිස්ත සභාව ඇංග්ලිකානු සභාවෙන් වෙන් වී තනි සභාවක් ලෙස ගොඩනගන ලදි.

- ඇංග්ලිකානු යාච්ඤා පොත හා ආගමික ප්‍රතිපත්ති වෙනස් කර ලියා, එය හඳුන්වා දුන්නේ ය. මෙලෙස මෙතොදිස්ත සභාව ස්ව සභාවක් ලෙස ක්‍රියාත්මක වීමට ආරම්භ විය.

- මෙතොදිස්ත සභිකයින් එංගලන්තයට හා ඇමරිකාවට ඉමහත් සේවයක් කළේ ය.

- "පාරිශුද්ධවන්තයන්" යැයි හඳුන්වනු ලැබූ, ඔවුන්ගේ ප්‍රශංසාව සැම තැනක ම ප්‍රචාරය විය. සභාවේ පරිපාලනයේ, පාලනයෙහි ජනතාව සහභාගිත්වය නිසා, සභාව ඉතා සීඝ්‍රයෙන් වර්ධනය විය.

- ඇංග්ලිකන් සභාවෙන් මෙතොදිස්ත සභාවට එක් වූවන් පහත් සභිකය (Low Church) යැයි ද, රෝමානු කතෝලික සභා සම්ප්‍රදායයන් අනුගමනය කළ අනෙකුත් අය උසස් සභිකයන් (High Church) යැයි ද හඳුන්වනු ලබති.

- මෙතොදිස්ත සභිකයෝ එංගලන්තයේ ද ඇමරිකාවේ ද අනෙකුත් ස්ථානවල ද සමාජ ප්‍රතිසංස්කරණ ඇති කළ හ.

- ළමයි ක්‍රිස්තුන් වහන්සේගේ මාර්ගයේ හදාවඩා ගැනීමත්, දහම් ජීවිතයක් දේශනා කිරීමත් සඳහා, අවධානය යොමු කරන ලදි.

- රොබට් රෙයික්ස් නමැත්තා විවිධ (බාධක, විරෝධතා) මධ්‍යයෙහි 1780 දි නිවාඩු දින පාසල් ඇති කළේ ය.

- ඔවුන්ගේ දායකත්වය නිසා කිතුනු සාහිත්‍යය ජීවය ලබා දළු ලන ලැබීය. Religious Tract Society ලන්ඩනයේ ආරම්භ කරන ලදි. 1804 බ්‍රිතාන්‍ය අන්තර්ජාතික බයිබලීය සංගමය (British and Foreign Bible society) ඇති කරන ලදි. 1812 දී American Tract society ආරම්භ කරන ලදි. ඒ සමඟ නව මිෂනාරි (ධර්මදූත සේවා) සංගම් බිහි විය. ඒවා අතුරින් පහත සඳහන් සංගම් සඳහන් කළ හැකිය.

| | |
|---|---|
| බැප්ටිස්ට් මිශනාරි සංගමය | (1792) |
| ලන්ඩන් මිශනාරි සංගමය | (1795) |
| සභා මිශනාරි සංගමය | (1799) |
| එංගලන්ත වෙස්ලියන් මිශනාරි සංගමය | (1813) |
| ඇමරිකානු මිශනාරි සංගමය | (1819) |
| ඇමරිකානු බැප්ටිස්ට් මිශනාරි සංගමය | (1824) |
| ස්කොට්ලන්ත සභාවේ මිශනාරි සංගමය | (1825) |

### 7.3.3.3. බැප්ටිස්ට් සභාව

- බැප්ටිස්ට් සභාවේ සහයක ස්ථාපකයා වූයේ විලියම් කේරිය. ඔහු එංගලන්තයේ පෝලස්බරි නම් ග්‍රාමයේ 1761 අගෝස්තු 17 වනදා උපත ලැබී ය.

- ඔහුගේ දෙමවුපියන් වන එඩ්මන්ඩ් කේරියු එලිසබෙත් යන අය වීමේ රැකියාවේ නියතු පවුලකට අය වූවෝ ය. විලියම් ඔවුන්ගේ දරුවන් පස්දෙනා අතුරින් පළමු වැන්නා ය.

- කාලයාගේ ඇවෑමෙන් 1783 ඔක්තෝබර් 05 වන දින බෞතීස්මය ලබා බැප්ටිස්ට් සභාවට එක් විය.

- 1785 දී වුල් රන් නමැති ග්‍රාමීය පාසැලේ ගුරුවරයකු ලෙස පත්වීම ලැබී ය. 1789 දී ලෙයිසෙස්ටර් බැප්ටිස්ට් දේවස්ථානයේ පූර්ණ කාලීන දේශකයෙක් විය. එහි සිටි කාලයේ ලෝකය පුරා ක්‍රිස්තුන් වහන්සේගේ සුභාරංචිය දේශනා කිරීමෙහිලා දැඩි උනන්දුවක් දැක්වීය.

- 1792 දී "අන්‍ය ජාතිකයන් සිත් හැරවීම පිළිබඳ කිතුනුවන්ගේ වගකීම පිළිබඳ ගවේෂණය" යන ග්‍රන්ථයේ ආකාරයෙන් තම ධර්මදූත සේවාව පිළිබඳ අදහස් ප්‍රකාශ කළේ ය. එම ග්‍රන්ථයේ කොටස් 5 ක් තිබිණි.

  1) දේව ධාර්මික පදනමින් ධර්ම ප්‍රචාරක සේවය නිවැරදි කිරීම (මතෙව් 8:18-20)

  2) ශු. සභාවේ ධර්ම ප්‍රචාරක සේවාවේ ඉතිහාසය

  3) ලෝකයේ රටවල ජනගහනය හා ආගම් පිළිබඳ සංගණනය

  4) ධර්මදූතවරයන් එවීමට විරුද්ධ ව සිදුවන වාදවලට පිළිතුරු

  5) බැප්ටිස්ට් ධර්මදූත සභාව ඇති කිරීම හා එහි ස්ථාපනය

- පසු ව ඒවායේ පදනමින් යෙසායා 54:2-3 වගන්තිය උපයෝගී කරගෙන ධර්මදූත සේවයට සහය දී "අමරණීය දේශනය" යැයි හඳුන්වනු දහම් දෙසුම දෙසී ය.

- "දෙවියන් වහන්සේගෙන් මහඟු කාර්යයන් බලාපොරොත්තු වන්න. දෙවියන් වහන්සේ වෙනුවෙන් උදාර කාර්යයන් පිළිබඳ උනන්දු වන්න" යන ඔහුගේ තේමාව ඉතා ප්‍රචලිත විය.

- 1792 ඔක්තෝබර් මාසයේ දෙවියන් වහන්සේ ව හඳුනා නොගත් අය මධ්‍යයෙහි සුභාරංචියේ සේවය කරන සංගමයක් ස්ථාපනය කරන ලදි. එම සංගමය "බැප්ටිස්ට් මිශනාරී (ධර්මදූත) සංගමය" යැයි හඳුන්වනු ලැබී ය. එම සංගමයේ සහායක ස්ථාවකයා ලෙස විලියම් කේරි, ජෝන් රෙලෙන්ඩ්, ජෝන් සුට්කිලිට් යන අය සේවය කළ හ.

- විලියම් කේරි, ඔහුගේ බිරිය වැඩිමහල් පුතු වූ ෆීලික්ස්, බාල පුතු වූ තොමස්, ඔහුගේ බිරිය, දියණිය සමඟ 1793 අප්‍රේල් මාසයේ නැව් මගින් ඉන්දියාවට පිටත් විය.

- බෙංගාල භාෂාව හොඳින් ඉගෙන ගෙන නව ගිවිසුම පරිවර්තනය කළේ ය. එලෙස ම ඔහුගේ ධර්මදූත කණ්ඩායම වෙනුවෙන් ප්‍රතිපත්ති, ආදායම් මාර්ග, ස්වදේශ ජනතාව සේවය සඳහා පුහුණු කිරීම ආදිය පිළිබඳ ව සැලසුම් කළේ ය.

- 1800 දී එක් වූ මුද්‍රණ වෘත්තිකයකු වූ ජුලියට් වාඩ්, ගුරුවරයකු වූ ජෝෂුවා මාර්ෂන් වැනි අය සමඟ එක් වී පාසලක් ආරම්භ කර තමන්ට හා තම සේවාවට අවශ්‍ය ආදායම සොයා ගත්තේ ය.

- තව ද මුද්‍රණාලයයක් ද ඇති කළෝ ය. ඉන්දියානු භාෂා ඉගෙන ගෙන ශු. බයිබලය එම භාෂාවලට පරිවර්තනය කළේ ය.

- කේරි නමැත්තාගේ කාලයේ දී ඔවුහු ඉන්දියානු භාෂා 44කින් ශු. බයිබලය පරිවර්තනය කර මුද්‍රණය කළ හ.

- ස්වදේශ සේවකයන් පුහුණු කිරීමටත්, විද්‍යාව කලාව වැනි අංශවලින් සියල්ලන්ට ම අධ්‍යාපනය ලබා දීමටත් 1818 දී සෙරම්බූර් විද්‍යාලය ආරම්භ කළ හ.

- බැප්ටිස්ට් ධර්මදූතයන්ගේ ප්‍රමාණය වැඩි වෙත් ම, ප්‍රශ්න හා භේද ද වර්ධනය වීමට පටන් ගැනිණි.

- අවසානයේ විලියම් කේරි, තමන් ස්ථාපනය කළ සභාවෙන් වෙන් වී ගොස් තම අවසාන කාලය තනිව ම ගෙවී ය. 1834 ජුනි 9 වන දින මිය ගියේ ය. එතුමන්ට පසු බැප්ටිස්ට් සභාව විවිධ කොටස්වලට බෙදිණි.

### 7.3.4. කතෝලික සභාවේ ප්‍රතිසංස්කරණ

- ප්‍රොතෙස්තන්ත අරගලය නිසා තම මවු සභාවෙන් විශාල ප්‍රමාණයකින් පූජකවරුන්, පැවිද්දන්, පැවිදිවරියන් ජනතාව බෙදී ගිය හෙයින් කතෝලික සභාව ඉමහත් බලපෑමකට ලක් විය.

- එබැවින් ශු. සභාවේ නායකයෝ, ශු. සභාවේ අභ්‍යන්තර ප්‍රතිසංස්කරණයක් අනිවාර්යයෙන් සිදු විය යුතු බව වටහාගත් හ.

- ශු. සභාවේ නායකයන් පමණක් නොව, බොහෝ භක්තිවන්ත කතෝලික ගැහැනු පිරිමි දෙපාර්ශ්වය ම ශු. සභාව මුළුමනින් ම ප්‍රතිසංස්කරණය කළ යුතු බව කාලයෙන් කාලයට ප්‍රකාශ කළ හ.

- කිතු දහම නොව, කිතුනු ජනතාව එනම් සභාවේ නායකත්වය හා විශ්වාසකයන් ප්‍රතිසංස්කරණය විය යුතු ය යන මතයෙහි ඔවුහු දැඩිව එල්බ සිටිය හ.

- 13 වන ශතවර්ෂයේ ශු. සභාව තුළ විවිධ පැවිදි නිකාවිශේෂයෙන් ෆ්‍රැන්සිස්කානු, දොමිනිකානු, අගෝස්තීනු නිකාය වැනි දයාවේ නිකායවල් බිහි වී ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියෙහි නිරත විය.

- 16 වන සියවසේ දීයෙන් හි ශු. කජිතාන් ඉතාලියේ ගිහියන් හා පූජකවරුන් එක් කර "දේවත්වයෙන් යුතු ආදරයේ සංගමය" යන සභාව ආරම්භ කර, තම ආත්මික කැපවීම සඳහා ද අන් අයගේ යහපත සඳහා ද ක්‍රියා කළ හ.

- ශු. ඉග්නේෂියස් ලොයලා කතෝලික සභාව අභ්‍යන්තර ව ප්‍රතිසංස්කරණය කිරීමටත්, ප්‍රතිසංස්කරණවාදී සභාවන්ගේ ඉගැන්වීම් යටතේ එක් කිරීමටත් ජේසු නිකාය ආරම්භ කර, පූර්ණ උත්සාහයකින් ක්‍රියා කළේ ය.

- එහෙත් ප්‍රොතෙස්තන්ත අරගලය නිසා සිදු වූ බලපෑම ඉතා අධික ය.

- එබැවින් ශු. සභාව එය හොඳින් විසඳීම සඳහා බොහෝ රදගුරුවරුන්, තාපස නිකායයන් හි නායකයන්ගේ සහය පතා ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව රැස් කළේ ය.

### 7.3.4.1. ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව (1545-1563)

- ප්‍රොතෙස්තන්ත අරගලය නිසා ඇති වූ බලපෑම් සමථයකට පත් කිරීමට ශු. සභාව ගත් උත්සාහය, කතෝලික ප්‍රතිසංස්කරණය (Catholic Reformation) නැතහොත් Counter Reformation යැයි හඳුන්වති.

- ඒ අතුරින් රැස් කරන ලද ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව වැදගත් වේ.

- 3 වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා සියලු බාධක අබිබවා, 1545 දෙසැම්බර් 13 වන දින උතුරු ඉතාලියේ සිට ත්‍රිදෙන්තීනු යන නගරයේ රදගුරුවරුන් 30 දෙනෙකු සමඟ ශු. සභාවේ ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව ආරම්භ කළේ ය.

- 4 වන පියුස් ශුද්ධෝත්තම පියාණෝ මෙම මන්ත්‍රණ සභාව නැවත රැස් කිරීමේ අවශ්‍යතාව අවබෝධ කරගෙන, තම රාජතාන්ත්‍රික හැකියාවන් උපයෝගී කර ගනිමින්, එම රැස්වීම් මාලාවට නායකත්වය දරමින් මඟ පෙන්වා 1563 දී මන්ත්‍රණ සභාව උචිත අවසානයක් කරා ගෙන ආහ.

### 7.3.4.2. ත්‍රීදෙන්තීනු මන්ත්‍රණ සභාවේ තීරණ

- ත්‍රීදෙන්තීනු මන්ත්‍රණ සභාවේ අවසාන තීරණ අතර ශු. සභාවේ සියලු ම ආගමික ප්‍රතිපත්ති ඇතුළත් නොවී ය.

- ප්‍රොතෙස්තන්ත්‍ර භේදකයන් විසින් ගැටලුවක් කොටගන්නා ලද ප්‍රතිපත්ති සඳහා ශු. සභාවේ පැහැදිලි ස්ථිර පිළිතුරු ඇතුළත් විය.

- ශු. සභාවේ විශ්වාසයේ සත්‍යතා ඍජු ව පැහැදිලි කරන ලදි. ඒවා පරිච්ඡේද (Chapters) යැයි හැඳින්වේ.

- ප්‍රොතෙස්තන්ත වේදභේදවලට අදාළ ආකාරයට කෙටියෙන් දක්වා ඇත. ඒවා නීති (Canons) යැයි හඳුන්වනු ලැබේ.

### ක්‍රිස්තියානි දහම් ප්‍රතිපත්ති

1 ශු. බයිබලය හා සම්ප්‍රදාය යන දෙක ම දහම් සත්‍යතාවන්ගේ උල්පත් ය. මේ දෙක ම විශ්වාසකයන් පිළිගත යුතු ය. පැරණි, නව ගිවිසුම්වල සියලු ම ග්‍රන්ථ දේවානුභාවයෙන් ලියන ලද ඒවා ය. මන්ද යත් ඒවායේ කර්තෘ දෙවියන් වහන්සේ ය. ශු. වගන්ති දෙවියන් වහන්සේගෙන් නික්මුණු ඒවා ය. එබැවින් ඒවායේ අර්ථය පැහැදිලි කිරීමේ අයිතිය ශු. සභාවට පමණක් හිමි වේ. දේශනා කිරීමේ බලය ද උගන්වන ශු. සභාවට පමණක් ක්‍රිස්තුන් වහන්සේ විසින් ලබා දෙනු ලැබ ඇත. වල්ගේට් නමැති ලතින් ශු. බයිබලය ශු. සභාවේ අනුමතිය ලද බයිබලය විය.

2 විශ්වාසය මඟින් පමණක් කෙනෙකු යහපත් පුද්ගලයකු වනු ඇතැයි යන ලූතර්ගේ මුඛ්‍ය ප්‍රතිපත්තියට විරුද්ධ ව මිනිසා ජන්ම පාපයෙන් මුළුමනින් ම විනාශ වී ඇතැයි යන්න ශු. සභාව විසින් නොපිළිගන්නා ලදී. මිනිසාගේ ගැලවීම විශ්වාසයෙන් පමණක් නොවේ. දැක්ම හා ආදරය මඟින් ද ඇති වේ. තවද ආදරය පොදු යහපත් ක්‍රියා මඟින් එළිදැක්විය යුතු ය. යහපත් ක්‍රියාවන්හි අවශ්‍යතාව ය තහවුරු කෙරේ.

3 ශු. පේදුරු තුමා ද එතුමාට පසු ව පැමිණෙන ශුද්ධෝත්තම පියවරු ද ශු. සභාවේ නායකත්වය දරති. ශුද්ධෝත්තම පියතුමා නොවරදින සුලු භාවයේ වරම ලද්දකි.

4 ප්‍රසාද නිධාන 7ම ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපනය කරන ලද ඒවා ය විවාහය සක්‍රමේන්තුවකි. විවාහ සබඳතාව කිසි දිනෙක බිඳිය නොහැකි එකකි. රහසිගත විවාහ නොපිළිගැනේ.

5 ශු. සභාවේ ධූරාවලි ස්වභාවය (Hierarchic Nature) පිළිබඳ තහවුරු කර ඇත. පූජාත්වරය දෙවියන් වහන්සේ විසින් ඇති කරන ලද්දකි.

6 දිව්‍ය සත්ප්‍රසාදයේ දී පූපය හා මිදි රස ක්‍රිස්තුන් වහන්සේ ගේ ශ්‍රී ශරීරය හා රුධිරය බවට හැරේ. දිව්‍ය සත්ප්‍රසාදය භෝජනයක් පමණක් නොව එය සැබෑ පූජාවකි. දිව්‍ය පූජාවේ සිරිත් විරිත් ප්‍රතිසංස්කරණය කිරීමට කණ්ඩායමක් පත් කරන ලදි.

**පූජකවර ජීවිතයේ ප්‍රතිසංස්කරණය**

1 ශු. සභාවේ කාදිනල් කණ්ඩායමට මුළු විශ්ව සභා සාමාජිකයන් තනතුරු දැරිය යුතු ය.

2 රදගුරුවරුන් තම පදවිවල සිට දහම ඉගැන්විය යුතු ය. රදගුරුවරයා තම පදවිය සමග විවාහ ගිවිස ගනියි. එබැවින් එක් පදවියකට වඩා එතුමන් බාර ගත යුතු නොවේ. රදගුරුවරු තම පදවිවල ඇති මීසම් බැහැදැකිය යුතු ය. පදවි රැස්වීම් නිසි අයුන් රැස් කළ යුතුය.

3 පූජකවරුන් තම මීසමේ ජනතාව කිතුනු දහම් ප්‍රතිපත්ති තුළ පුහුණු කළ යුතු ය.

4 දෙව්සත්හල් සැම පදවියක ම ස්ථාපනය කළ යුතු වේ.

5 පැවිදි නිකායන් නව සාමාජිකයින් බඳවා ගන්නා විට හා නව නායකත්වය තෝරා ගන්නා විට ද වේදහාර ක්‍රියාත්මක කරන විට ද දැඩි නෛතික රාමුවක් තුළ අනුසාර කළ යුතු ය.

6 ශු. සභාවේ පූර්ණ පල ලබාදීමේ ප්‍රචාරණ දේශනා කරන ආකාරය ඉවත් කරන ලදි.

- 1564, 4 වන පියුස් ශුද්ධෝත්තම පියතුමන් විසින් තිදෙන්තීනු සංගමය හා එහි තීරණ සියල්ල "බෙනඩික්තුස් ඩෙයුස්" යන ප්‍රකාශනයෙන් පිළිගන්නා ලදි.

- 1566 පස් වන පියුස් ශුද්ධෝත්තම පියාණන් විසින් "ත්‍රිදෙන්තීනු සංගමයේ ඥානෝපදේශය" යන ග්‍රන්ථය ධර්ම ප්‍රචාරකයන් වෙනුවෙන් ප්‍රකාශයට පත් කරන ලදී.

- ඒ මගින් ධර්මෝපදේශය තුළ ඒකත්වයක් ඇති විය. කතෝලික ආගමික ප්‍රතිපත්ති හා ප්‍රොතෙස්තන්ත ආගමික ප්‍රතිපත්ති අතර වෙනස්කම් විරුද්ධතා පැහැදිලි ව වෙන් කර දක්වා ඇත.

- දුර්වලතා පැවතිය ද ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාව කතෝලික සභාවේ ප්‍රතිසංස්කරණයෙහිලා ප්‍රධාන අංගයක් විය.

## 7.3.5. ප්‍රතිසංස්කරණය සඳහා සහය වූ පැවිදි නිකායයන් හි දායකත්වය.

### 7.3.5.1. ජේසු නිකායය

- ස්පාඤ්ඤයේ කුලවත් පවුලක 1491 දී ශු. ලොයලා ඉග්නේෂියස් උපත ලැබී ය.

- ප්‍රංශ ජාතිකයන් සමඟ බම්බලූනා නමැති ස්ථානයේ සිදු වූ යුද්ධ නිසා තුවාල ලබා ඇඳෙහි සිටි අවස්ථාවේ දේව වරප්‍රසාද තමා ආක්‍රමණය කර ගන්නා බව දැනගන්නේ ය. ඥානවන්ත ජීවිත පිළිබඳ ග්‍රන්ථ කියෙව්වේ ය.

- ජාකොබුස් දේ ඔරාජිනේ සම්පාදනය කළ "ශුද්ධවන්තයන්ගේ ජීවිතය" යන ග්‍රන්ථය ද සාක්සනී රටේ ලුඩොල්බු සම්පාදනය කළ "ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය" යන ග්‍රන්ථය ද ඉග්නේෂියස් තුමාගේ 'ආත්මික ජීවිතය' පොහොණි කිරීමට මඟ පෙන්වීමක් විය.

- බාසිලෝනාවට බටහිරින් ඇති මොන්සේරා නමැති නගරයේ බෙනදිකානු තාපසරාමයට ගොස්, පව් කමාව ලබා, තම වස්ත්‍ර දිළින්දන්ට ලබා දී දිළිඳුකම, ව්‍රත ශුද්ධිය යන වේදභාරයෙන් ගෙන, තම ආයුධ මරිමවගේ පාමුල තබා තමන් ක්‍රිස්තුන් වහන්සේට කැප කළේ ය.

- පසු ව ඉග්නේෂියස්තුමා එහි සිට මන්සේරා නම් ස්ථානයට ගොස් උපවාස කර, ආහාර වෙනුවෙන් සිඟමන් යැද, යාච්ඤාවේ නිරත ව ලෙඩුන්ට උපස්ථාන කළේ ය.

- මන්සේරාවේ දි තමා ලද ආධ්‍යාත්මික අත්දැකීම් අභ්‍යාස වශයෙන් ගොනු කළේ ය. ඉන් පසු එම ස්ථානයෙන් පිටත් ව ඉස්ලාමීයයන් සිත් හැරවීම පිණිස ශු. දේශයට ගියේ ය.

- පැරිස් විශ්ව විද්‍යාලයයෙන් තම ශාස්ත්‍රපති උපාධිය ලබාගත් ඉග්නේෂීයස්තුමා තම සහායකයන් සමඟ ශු. දේශයට ගොස්, දෙවියන් වහන්සේ සමඟ ඉතා කිට්ටු සබඳතාවක් ඇති ව සිටීමටත් එම රටේ ජනතාවට දේව වචනය කියාදීමට ත් කැමති විය.

- ලා ස්ටෝරා නම් ස්ථානයේ ඉග්නේෂියස් තුමා දුටු දර්ශනයෙන් රෝමයේ දෙවියන් වහනසේ තමන්ට සහය වෙතැයි තහවුරු කර ගනිමින් රෝමයට ගොස් ශුද්ධෝත්තම පියාණන් හමුවී ය. 1539 දී ශුද්ධෝත්තම පියාණන්ගේ වාචික අනුමතිය ඔහුට ලැබිණි. ඊළඟ වසරේ දී එනම් 1540 දී ලිඛිත අනුමතිය ලැබි ය. ඒ සමඟ ම 1540 දී ජේසු නිකායය ස්ථාපනය කරන ලදී.

- කීකරුකම, දිළිදුකම, ව්‍රත ශුද්ධිය යන වේද භාර පිළිගෙන තමන් කැප කළ අය තම ආත්මික යහපත වෙනුවෙන් දහම් ප්‍රචාරයට මඟ පෙන්වන්නන් ලෙස ද ශුද්ධෝත්තම පියාණන්ට කීකරු වන්නන් ලෙස ද තව දුරටත් වේද භාර ගත්තෝ ය.

- කුරුස පත් වූ ක්‍රිස්තුන් වහන්සේ ඉතා සමීප ව අනුගමනය කිරීමත්, දෙවියන් වහන්සේගේ උතුම් මහිමාන්විත සේවය සඳහා තමන් කැප වීමත් ජේසු නිකායකයන්ගේ අරමුණ වේ.

- ශුද්ධෝත්තම පියාණන්ට මුළුමනින් ම කීකරුවීම නිසා මෙම අරමුණ ඉටු වේ. මන්ද යත් ශුද්ධෝත්තම පියතුමා, ක්‍රිස්තුන් වහන්සේගේ නියෝජිතයකු ලෙස සිටින නිසා ය. එතුමා ශුද්ධ වූ සභාවේ යහපත කෙරෙහි අවධානය යොමු කර ඇති බව ඉග්නේෂියස් තුමාගේ විශ්වාසය විය.

- මෙම නිකායයට එක් වූවන්ට ආධ්‍යාත්මික පුහුණුව, දේව ධර්මය, දර්ශනය ආදිය වැදගත් කරුණු බවට පත් කරන ලදි.

- විශ්වවිද්‍යාලයීය උපාධිධාරීන් වූ ආරම්භක සාමාජිකයන්ගේ මූලික අධ්‍යාපන සුදුසුකම අනිවාර්ය කරන ලදි.

- ඔවුහු ළමයින්ටත්, නූගතුන්ටත් දහම් දැනුම ලබා දුන් හ.

- ප්‍රතිසංස්කරණ සහා වර්ධනය වූ කාලයේ කතෝලික සභාවේ පුනරුදය තරුණ ජේසු නිකායික සාමාජිකයින් විසින් ඇති කරන ලදි.

- පීටර් කැනීෂියස් නම් ඕලන්ද (1521-1597) ජේසු නිකායික පූජකවරයා විදුහල් ආරම්භ කර කතෝලික දහම වර්ධනය කලේ ය. මෙතුමාගේ ධර්මෝපදේශ ග්‍රන්ථය ත්‍රිදෙන්තීනු සභාවේ ඉමහත් පිළිගැනීමකට පාත්‍ර විය.

- ජේසු නිකායික පියවරු ධර්මදූතික ගමන් යමින් විවිධ රටවල කතෝලික සභාවන් බිහි කළ හ. ප්‍රතිසංස්කරණ දහම් ප්‍රතිපත්තිවලින් බෙතෝමියාව, ටොරාවියාව, පෝලන්තය වැනි රටවල් ජේසු නිකායික පියවරුන් විසින් ගලවා ගන්නා ලදි.

### 7.3.5.2 වින්සෙන්තියානු සභාව

- 1626 දී ශුද්ධ වූ වින්සෙන්ති පාවුලු තුමන් විසින් පදවි පූජකවරුන් සඳහා වින්සෙන්තියානු සභාව ආරම්භ කරන ලදි.

- ඔවුහු කීකරුකම, දිළිඳුකම, ව්‍රතශුද්ධිය යන වේදහාර ලබා දුන් හ. එහෙත් ඔවුහු පැවිද්දෝ නොවෙති. පදවි පූජක වරුය.

- 17 වන සියවසේ මුල් කාලයේ පදවි පූජක වරුන් ගේ ජීවිතවල අස්ථිරතාවන් ද, පසුගාමී තත්ත්වයන් ද දැකිය හැකි විය.

- ප්‍රතිසංස්කරණය ඇතිවීමට මාර්ග දෙකක් දැනගත හැකි විය. ඉන් එකක් වූයේ තාපස නිකාය සංවිධානය අනුගමනය කරමින් ආදර්ශ පූජකවරුන් බිහි කිරීමයි. අනෙක ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභා ප්‍රකාශ අනුගමනය කර පූජකවරුන් බිහි කිරීමේ වගකීම තාපස නිකායයට භාරදීම ආදිය යි.

- ඒ අනුව පියෙර් ඩි බෙරුලේ නම් වූ පූජකයා 1611 දී ආදර්ශ පූජකවරුන්ගේ සංවිධානයක් (Oratories) ආරම්භ කළේ ය.

- එඬේරික කාර්යයෙහි නිරත වූ මෙම පදවියේ පූජක වරු අනෙකුත් පූජක වරුන්ට ආදර්ශයක් වූ හ. ක්‍රිස්තුන් වහන්සේගේ දහම් වැඩසටහන් පිළිබඳ මෙනෙහි කරන ආකාරය උගන්වා ක්‍රිස්තුන් වහන්සේගේ මනුෂ්‍ය ස්වභාව, ආත්මික ජීවිතය හා එක් කර ගැනීමට සහය විය.

- ක්‍රිස්තුන් වහන්සේගේ මනුෂ්‍ය භාවය හා දිව්‍ය සත්ප්‍රසාදය කේන්ද්‍ර කොටගත් ජීවිතයක් සඳහා ස්වයං ප්‍රතික්ෂේප කිරීම් හා යාච්ඤාවේ වැදගත් කම තහවුරු කළේ ය.

- 1626 දී ශුද්ධවූ වින්සෙන්ති පාවුලු තුමා පදවි පූජක කණ්ඩායමක් (Congregation Of The Priests Of The Missions) ආරම්භ කළේ ය. දකුණු ප්‍රංශයේ ඇති දුප්පත් ග්‍රාමයන් හි සේවය කිරීම මෙම කණ්ඩායමේ අරමුණ විය.

- ශුද්ධවූ වින්සෙන්ට් තුමා පැරීසියේ සිටි අවස්ථාවේ දී, ප්‍රජාව ක්‍රිස්තියානි ආගමික ප්‍රතිපත්ති පිළිබඳ නොදැනුම්වත්ව සිටීම, දේව භක්තිය නොමැති තත්ත්වය කෙරෙහි අවධානය යොමු කළේ ය. එබැවින් මෙතුමා ජේසු නිකායයේ පූජකවරුන් හා එක්වී, අසල තිබූ ග්‍රාමවලට ගෙයින් ගෙට ගොස් පවුල් බැහැ දැක, ධර්මෝපදේශය දේශනා කිරීමට පටන් ගත්තේ ය.

- 1626 සැප්තැම්බර් 4 වන දින මෙම කණ්ඩායම"ධර්මෝපදේශක පූජකවරුන්ගේ සභාව" යන නමින් ස්ථාපනය කරන ලදි. එම සභිකයෝ වින්සෙන්තියානුවන් යැයි ද හඳුන්වනු ලැබූ හ. පැරිස් නගර අගරදගුරු තුමා එම සභාවට අනුමතිය ලබා දුන්නේ ය. ප්‍රංශයේ 13 වන ලුවිස් රජු ප්‍රංශ රටේ සේවය කිරීමට ඔවුනට අනුමතිය දුන්නේ ය.

- ඔවුහු කණ්ඩායමක් ලෙස ජීවත් වී දිළිඳු ගැමියන් වෙනුවෙන් තමන් කැප කර ජීවත් වන බව ප්‍රකාශ කළ හ.

- 19 වන සියවස වන විට ධර්මෝපදේශක පූජක සභාව වැදගත් සභාවක් ලෙස වර්ධනය විය. කතෝලික දහම උගන්වා ජනතාව යහමඟට ගෙන ඒමත්, දහම් ප්‍රතිපත්තිවලට පිළිතුරු දීමත් ඔවුන්ගේ සේවය විය.

### 7.3.5.3 කාර්මෙල් සභාව

- කාර්මෙල් සභාවේ ඉතිහාසය 12 වන සියවසේ පලස්තීනයේ ආරම්භය විය. පලස්තීනයේ ඇති කාර්මෙල් කන්දේ තනි ව ම ජීවත් වූ බොහෝ පැවිද්දෝ (Hermits) සිටිය හ. ජෙරුසලමේ ආදි පියවරුන්ට දැහැමි ජීවිත ක්‍රමයක් ලබා දෙන ලදි. එහි පිළිවෙළවල් 16 ක් විය.

- ඔවුහු ගැඹුරු ධ්‍යානයකට සමවැදෙන්නෝ වූ හ. ඔවුහු දැඩි උපවාස රකින්නෝ ය. තාපසාරාම ශ්‍රේෂ්ඨාධිපතිතුමන්ට සියල්ලෙහි දී ම කීකරු වන්නා හ. තනි කාමරයක ජීවත් වෙති. එහෙත් යාම යැදුම සඳහා එක් වෙති. නිහඬ යැදුම් ජීවිතයක් ගත කරති. දිළිඳු කමින් ජීවත් වී තම ආහාර වෙනුවෙන් සේවය කරති. තම එදිනෙදා ආහාරයේ දී මාංස අනුභව නොකරති.

- සාරසේන පලස්තීනයට පහර දුන් අවස්ථාවේ දී කාර්මෙල් කන්දේ ජීවත් වූ තාපසයෝ දකුණු බටහිර යුරෝපා ප්‍රදේශවලට විසිර ගිය හ.

- ආරම්භක යුගයේ පලස්තීනයේ ගත කළ දැඩි තපස් ජීවිතය යුරෝපයේ ගත කිරීම අසීරු විය. එබැවින් සයිමන් ස්ටොක් පැවිද්දන්ගේ දැඩි තපස් ක්‍රියාකාරකම් අඩු කළේ ය.

- පාදයට සරල පාවහන් පැළඳීම, මාංස අනුභව කිරීම වැනි වෙනස්කම් කළේ ය. එහෙත් උපවාස කිරීම එක්වී යාම යැදුම කිරීම ආදිය එලෙස ම පැවතිණි.

- සයිමන්, කේම්බ්‍රිජ්, ඔක්ස්ෆර්ඩ්, පැරිස් වැනි විශ්වවිද්‍යාලය පිහිටි නගරවල තම තාපසාරාම ස්ථාපනය කළේ ය. එලෙස අයර්ලන්තයේ, ස්කොට්ලන්තයේ, තාපසාරාම ආරම්භ කරන ලදි.

- ශුද්ධවූ සභාව තුළ ඇති වූ අධ්‍යාත්මික කැලැඹුම කාර්මෙල් සභිකයන්ට බලපෑමක් විය. එබැවින් කාර්මෙල් පැවිදි නිකාය තුළ ද ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය විය.

- කාර්මෙල් නිකායේ එක් එක් ස්ථානවල විවිධ ප්‍රතිසංස්කරණ සිදු වුව ද, එහි පූර්ණ ප්‍රතිසංස්කරණයක් ශුද්ධ වූ අවිලාහී තෙරේසා මවුතුමිය විසින් කරන ලදි.

- කාර්මෙල් සභාවේ පැවිදිවරියක වූ අවිලාහී තෙරේසා තුමිය තම වසර විසි පහක පැවිදි ජීවිත අත්දැකීම සමග කාන්තාවන් සඳහා වූ කාර්මෙල් සභාවේ ප්‍රතිසංස්කරණ ආරම්භ කළා ය. ඇයට සහය වීමට පිරිමි කාර්මෙල් සභාවට අයත් ශුද්ධ වූ කුරුස ජොහාන් සිටියේ ය.

- " පූර්ණ දිවියකට මඟ " (The Way Of Perfection), " ඇතුළාන්ත මාළිගාව " (Interior Castle) නම් ආධ්‍යාත්මික ග්‍රන්ථ ලියුවා ය. කාර්මෙල් සභාවේ ආරම්භක යුගයේ තපස් ජීවිතයත් ගැඹුරු ධ්‍යානමය ජීවිතයත් නැවත ගෙන ඒම සඳහා ඇය දැරූ උත්සහයත් මල් පල ගැන්විණි.

- පරිත්‍යාගශීලින්ගේ දායකත්වය ඇති ව 1561 දී නව තාපසාරාමයක් තනවා එහි තම ප්‍රතිසංස්කරණවාදී සේවය ආරම්භ කළා ය. ශුද්ධවූ ජුසේ තාපසාරාමය යැයි එය නම් කළා ය. ශුද්ධෝත්තම පිය අනුමතිය ද ලැබිණි.

- එම තාපසාරාමය තුළ පූර්ණ නිශ්ශබ්දතාව ආරක්ෂා කරන ලදි. දැඩි දිළිඳු කමක් විය. ආදායම් සඳහා ස්ථිර මාර්ගයක් නොවිණි. පැවිදිවරියන්ගේ වස්ත්‍ර එක්තරා දැඩි ලොම් වර්ගයකින් මසන ලදි. පයට පාවහන් ලනු නොලැබේ. එහෙත් මිරිවැඩි සඟලක් පැලැඳිය හ. පාවහන් නොදැමූ බැවින් ඔවුහු පාවහන් අත්හළ කාර්මෙල් සභිකයින් (Discalced Carmelites) යැයි හඳුන්වනු ලැබූහ.

- දිනපතා එළවළු ආහාරයට ගත් හ. මෙවැනි දැඩි ජීවිතයක් නිසා පැවිද්දෝ අධ්‍යාත්මික වර්ධනයක් දුටුවෝ ය.

- ඔහුද විවිධ ආධ්‍යාත්මික ග්‍රන්ථ ලිවීය. ඒවා නම් "කාර්මෙල් සභාවේ නැඟුම" (The AccentOf MountCarmel) "අඳුරු රාත්‍රිය" (The DarkNight) "ආධ්‍යාත්මික ගීතය" (The SpiritualCanticle) " ප්‍රේමයේ නොනිමෙන ගිනිදළු" (The LivingFlame Of Love) ආදිය වේ.

- මෙතුමා හා මෙතුමන්ගේ ආත්මීය ජීවිතයේ ග්‍රන්ථ බොහෝ දෙනෙකුගේ ජීවිතවලට සහයක් විය.

- යාච්ඤාමය ජීවිතය, ගැඹුරු ධ්‍යානමය යැදුම් (ConyemplativePrayer) ආදිය අත්දැකීමක් කිරීම පිළිබඳ නිර්මාණ ඉතා ප්‍රයෝජනවත් විය.

- ආත්මික ජීවිතයේ දේව සබඳතාව අත්දැකීමට බැහැපත්කම අත්‍යවශ්‍යය යන උපදෙස බොහෝ දෙනෙකු පිළිගත් සත්‍යයක් වේ. මේවාට උදාහරණ ලෙස ජේසුතුමාගේ කුඩාමල තෙරේසා මව්තුමිය, ශුද්ධවූ ඊඩිත් ස්ට්‍රෙයින් වැනි කාර්මෙල් නිකායේ පැවිදිවරියන් ගත හැකිය.

- ශුද්ධ වූ අවිලාහී තෙරේසා තුමියට සහය වූ ශුද්ධවූ කුරුසයේ ජොහාන් ද, එතුමිය අනුගමනය කරමින් එතුමියගේ සහය ඇති ව පිරිමි කාර්මෙල් සභාවේ පැවිද්දන් තුළ ප්‍රතිසංස්කරණයක් ඇති කළේ ය.

## 7.3.5.4 කැපුචින් සභාව

- 16 වන සියවසේ ඉතාලියේ බිහිවූ තාපස කණ්ඩායම් අතුරින් කැපුචින් පැවිදි නිකායය වැදගත් තැනක් ගනියි.

- මෙය ෆ්‍රැන්සිස්කානු පැවිදි නිකායයෙන් බිහි විය. 13 වන සියවසේ දී අසීසියේ ශුද්ධ වූ ෆ්‍රැන්සිස් තුමන් විසින් ආරම්භ කරන ලද පැවිදි ජීවිත ක්‍රමයත්, නීති රීතීත්, කාලයත් සමඟ ලිහිල් වීමට පටන් ගැනිණි. පෙර ෆ්‍රැන්සිස්කන්වරුන්ගේ ජීවිත ක්‍රමය වූයේ, ෆ්‍රැන්සිස් තුමා ජීවත් වූ කාලයේ ජීවන ක්‍රමයට වඩා වෙනස් ලෙස දැකිය හැකි විය.

- එබැවින් 1520 දී අසීසියේ ශුද්ධ වූ ෆ්‍රැන්සිස්තුමන්ගේ නීති රීති ඉතා දැඩි ලෙස අනුගමනය කළ යුතු යැයි, ආරම්භක යුගයේ සුවිශේෂ උපදෙස් ජීවත ක්‍රමය නැවත තහවුරු කිරීම සඳහා, තනි තත්ත්වය, තපස් වැනි කරුණු නැවත ස්ථාපනය කළ යුතු යැයි ෆ්‍රැන්සිස්කානු නිකායයේ සාමාජිකයෝ සමහරෙක් තීරණය කළ හ.

- මොවුන් නායකත්වය දැරුවේ මතෙඩ් සෙරබීනි ඩී පාශ්ලි නමැත්තා ය. මෙතුමාගේ ප්‍රතිසංස්කරණ කාර්යය ඇරඹීම සදහා 7 වන ක්ලෙමන්ට් ශුද්ධෝත්තම පියතුමා වාචික අනුමතිය ලබා දුන්නේ ය.

- 3 වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා 1536 දී කැපුචින් සභාව අධිකාරත්වයෙන් යුතුව පිළිගත්තේ ය.

- මතෙඩ් තුමන්ටත් ඔහුගේ සහායකයන් කමල්ඩෝලීස් පැවිද්දන්ටත් සහය දුන් හ. පසු ව එයට කෘතගුණ දැක්වීමක් වශයෙන් මතේඕ සහ ඔහුගේ සහයකයන් ලෙස ම කැපුචින් යැයි හඳුන්වනු ලැබූ හිස් පලඳනාවක් පැලඳ රැවුළ ද වවා ගත් හ.

- එම හිස් පලඳනාව නිසා කැපුචින් යන නාමය මෙම සභාවට දෙන ලදි.

- 1528 දී vii වන ක්ලෙමන්ට් ශුද්ධෝත්තම පියාණෝ ඔවුනට කුමන ස්ථානයකට වුවද ගොස් දිළිඳුන්ට දහම් දෙසීමේ අනුමතිය ලබා දුන්නේ ය.

- රෝගීන් සුරැකීමෙන් හා දැඩි වෙහෙස මහන්සියෙන් ලද ආදායමෙන් දිවි ගෙවූ හ.

- ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණවාදීන්ට විරුද්ධ ව දේශනා කළ හ.

- දිළිඳු සරල ජීවිතයක් ගත කළ හ. සාමාන්‍ය ජනතාවගේ මට්ටමින් අවබෝධ කරගත හැකි ආකාරයට දේශනා කළ හ.

- 1529 දී කැපුචින් නිකායයේ පළමු පොදු රැස්වීම පැවැත්විණි. එහි දී නිකායයේ නීතිරීති පිළිබඳ තීරණ ගන්නා ලදි. ඒකත්වයේ ජීවිතය අත්හරින ලදි.

- එහෙත් ජීවිතය ඉතා දැඩි, සරල, දරිද්‍රතාවෙන් යුතු එකක් විය යුතු යැයි තීරණය කරන ලදි.

- තාපසාරාම (කන්‍යාරාම) හෝ නිකාය හෝ කිසිවක් අයිති කරගත යුතු නැත. සියලු ම අවශ්‍යතා සිඟමන් යදිමින් ඉටු කරගත යුතු ය. හැම තාපසාරාමයක් ම අට දෙනෙකුගෙන් සමන්විත කුඩා කණ්ඩායමක් විය යුතු ය. යාම යැදුම හා දෙපැයක තනි යැදුමක් තිබිය යුතුය.

- පිටස්තර සේවය ලෙස දිළිඳුන්ට ධර්මෝපදේශය ලබාදීමත් ආත්මික සේවාවන්හි යෙදීමත් පිළිගන්නා ලදි. ඒ සමඟ ඔවුහු විවිධ ධර්මදූත ගමන් ගිය හ.

- ඔවුන් ගිය සෑම තැනක දී ම දිළිඳුන්ට උදවු කිරීම, රෝගීන්ට උපස්ථාන කිරීම, සාමාන්‍ය ජනතාව හා සරල ජීවිතයක් ගත කිරීම නිසා ජනතාව ඔවුන් කෙරෙහි පැහැදුණ හ.

- 1538 දී කාන්තාවන් සඳහා කැපුචින් තාපසාරාමයක් අරඹන ලදි. එය ස්ථාපනය කළේ මරියා ලොරොන්සෝ ලොංගෝ සොහොයුරිය යි. 16 වන සියවස අවසානයේ කැපුචින් පැවිද්දෝ යුරෝපයේ සියලු රටවල පැතිර ගොස් ඉමහත් සේවයක් කළෝ ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. FR. P.C. Thomas, **A Compact History of the Popes**, Panta , Bombay, India.
2. ඇම්. ඇස්. ජේ. තංගසාමි, **ශුද්ධ වූ සභා ඉතිහාසය,** නංසිල් මුද්‍රණාලය, නාගර්කෝවිල්.
3. පිලිප්ස් යේසුදාසන්, **ක්‍රිස්තු ජීවිතය**, නි.ම.නි. දෙව්සත්හළ, හම්පිටිය.
4. පිලිප්ස් යේසුදාසන්, **අබගස** , අමල උදයම්, උප්පුවේලි, ත්‍රිකුණාමලය, 2010.

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | 8.0 | : | **සමාජ සංවර්ධනය සඳහා ක්‍රිස්තියානි චින්තනය, අධ්‍යාපනය හා කලාව ලබාදුන් දායකත්වය දැන ගෙන, කිතුනු වගකීම් ඉටු කරයි.** |
| **නිපුණතා මට්ටම** | 8.1 | : | ක්‍රිස්තියානි සභාව මඟින් අධ්‍යාපනය සඳහා ඉටු කරන ලදි සේවාව හඳුනාගෙන, තම දැනුම වර්ධනය කර ගනිමින් සමාජ සංවර්ධනයට කැප වෙයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | | : | 14 |

**ඉගෙනුම් පල**

- මධ්‍යතන යුගයේ අධ්‍යාපනයේ උන්නතිය අරබයා කිතුනු දායකත්වය පිළිබඳ කරුණු රැස් කරයි.
- අධ්‍යාපනයේ උන්නතියට කිතුනුවන් සේවය කළ බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- අධ්‍යාපනය අවශ්‍ය අයට එසේ කිරීමට ඉදිරිපත් වෙයි.
- සමාජ සංවර්ධනය සඳහා අන් අය හා එක් ව ක්‍රියා කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට මඟපෙන්වීමක් :-**

## 8.1.1 . අධ්‍යාපනයේ උන්නතිය සඳහා කිතු දහමේ දායකත්වය :

- කුමන ජන කණ්ඩායමක හෝ ජාතියක හෝ ශිෂ්ටාචාරයේ හෝ දියුණුවට ඔවුන්ගේ අධ්‍යාපනය ප්‍රධාන දායකත්වයක් දක්වයි.
- කිතු දහමේ අරම්භයේ දී කිතුනු දහම් ප්‍රතිපත්ති අපොස්තුලුවරුන් විසින් දේශනා කරනු ලැබ පැහැදිලි කරන ලදි.
- සභා පියවරු කිතුනු දහම් ප්‍රතිපත්ති තව දුරටත් පැහැදිලි කර විශ්වාසය ගැඹුරින් අත් දැකීමට සැලැස්වූ හ.
- පසුව තාපසාරාම මඟින් ශක්තිමත් කරනු ලැබ ඇලක්සැන්ඩ්‍රියානු හා අන්තියෝකියානු දේව ධාර්මික චින්තන පීඨවල ඉගැන්වීම් ඉදිරිපත් කිරීම මඟින් සභාවේ සත්‍ය දේව ධාර්මික අදහස ඉදිරිපත් කරන ලදි.
- ශු.සභා ඉතිහාසය තුළ වාදභේද ඇතිවන විට දේවධාර්මික චින්තකයන් දේව ධාර්මික ප්‍රතිපත්ති ඉගැන්වීම නිසා අධ්‍යාපන කටයුතු වර්ධනය විය.
- ක්‍රි.ව. 5 වන 6 වන සියවස්වල රෝම අධිරාජ්‍යය යුරෝපා ගෝත්‍රිකයන්ගේ යුදමය කටයුතු නිසා විනාශයට පත් විය. මේ නිසා යුරෝපය ඇතුළු රටවල අධ්‍යාපන කටයුතුවලට බලපෑම් සිදුවීමට ශුද්ධ වූ සභාව පමණක් ම ස්ථාවර ව තිබිණි.
- ශු.සභාව යුරෝපා ගෝත්‍රිකයන් යහමඟට ගෙන ඒමේ අරමුණින් ඔවුන්ට අධ්‍යාපනය ලබාදී විශිෂ්ට යහපත් වටිනාකම් වර්ධනය කර ඔවුන් ශිෂ්ට සම්පන්න කිරීමේ උත්සාහයේ යෙදිණ. විශේෂයෙන් බෙනඩික්ටාන තාපස නිකායයට අයත් වූවෝ මෙම කාර්යයෙහි නියැළී යුරෝපා ශිෂ්ටාචාරයට මඟ පෑදූහ.
- මොවුහු හා අනෙකුත් තාපස නිකායයන් ද එක් වී යුරෝපයේ විවිධ රටවල් කරා ගොස් අධ්‍යාපන ආයතන ගොඩනඟා අධ්‍යාපනයට සේවය කළ හ.

උදාහරණ :- ජර්මනිය - ශු. බොනිෆස්
අයර්ලන්තය - ශු. බ්‍රිජට් - ශු. කොලොම්බස්
එංගලන්තය - ශු. කැන්ටබරි අගෝස්තිනු
ස්කොට්ලන්තය - ශු. කොලොම්බස්
ප්‍රංශය - ශු. කොලොම්බස්
උතුරු දේශය, ඩෙන්මාර්ක්, ස්වීඩන්, ස්කැන්ඩිනේවි - ශු. අනස්කා

- ඉහත සඳහන් ස්ථානවල දේවස්ථානවලට හා තාපසාරාමවලට අයත් පාසල් ගොඩනගා අධ්‍යාපන ක්‍රියාකාරකම් ඉදිරියට ගෙන ගිය හ. මෙම අධ්‍යාපන ආයතන පසු කාලීනව විශිෂ්ට මීසම් පාසල් ලෙස ද විශ්වවිද්‍යාලය ලෙස ද වර්ධනය විය.

- එබැවින් විශිෂ්ට ශිෂ්ටාචාරයක් ඇති කිරීම, පාලන සැලැස්ම ආරක්ෂා කිරීම, අක්ෂර දැනුම වර්ධනය කිරීම. ප්‍රාථමික අධ්‍යාපන ක්‍රමය මීසමේ තාපසරාමවල ඇති කිරීම, පුරාණ ග්‍රීක රෝම සාහිත්‍ය දැනුම වර්ධනය කිරීම. දාර්ශනික චින්තනයන් පැහැදිලි කිරීම. නීතිය, වෛද්‍ය විද්‍යාව පිළිබඳ කරුණු පැහැදිලි කිරීම වැනි ක්‍රියාකාරකම් සියල්ලේ ම ප්‍රධාන සාධකය තාපසවරු වූහ .

  - තව ද භාෂාව, සාහිත්‍යය, මිනුම්, ජ්‍යොතිෂ, සංගීතය මූර්ති කලාව, චිත්‍ර කලාව, ස්වයං රැකියා ක්‍රම, දේශපාලනය,පරිපාලනය වැනි අංශ දියුණු වීමටත් කිතුනු අධ්‍යාපනඥයෝ හේතු වූ හ. තව ද පිටපත් කිරීමේ කලාව වැනි ඒවායේ ද පුහුණු කිරීම් ද කළ අතර පුස්තකාල ගොඩනැගීම, ඒවා නඩත්තු කිරීම ආදී ක්‍රියාකාරකම්වලට කිතුනුවෝ දායක වූ හ .

## 8.1.1. (අ) මීසම් පාසල්

- දරුවකු යහමඟට ගෙන වටිනාකම් කියා දී යහපත් ලෙස දැනුමෙන් පෝෂණය කර හදා වඩා ගැනීම දෙමාපියන්ගේ වගකීම වේ. සෑම සමාජයකට ම අවශ්‍ය ගුණාංගවලින් හෙබි දරුවකු බිහි කිරීමේ කාර්යයට උරදෙන මුල් ම ආයතනය පාසල වේ.

- කිතුනු පවුල්වල දරුවකුට ක්‍රිස්තියානිය මඟින් ලබා ගත් විශ්වාසය අදාළ ආකාරයට වර්ධනය කර දැන ගැනීමටත්, එතුමන්ට වන්දනා කිරීමටත් තමන්ට පසු ව සිටින අයට ආදරය කර ජීවත් වීමටත් අවශ්‍ය පුහුණුව පවුලෙන් ලබාගත හැකිය. ඊළඟ පියවරේ දී තම විශ්වාසයේ ජීවිතය ගැඹුරු කර ජීවත් වන වන ආකාරය ශු. සභාවේ ආධාරය ඇති ව ලබාගත යුතු තත්ත්වයේ වේ. ශු. සභාවේ මෙවන් ක්‍රියාකාරකම් තාපස නිකායයන් විසින් ඉදිරියට ගෙන යන ලදි. විශේෂයෙන් බෙනදිකානු තාපසයෝ තම සේවය ආරම්භ කළ සේවා ස්ථානවල මීසම් පාසල් ගොඩනගා සේවය කළහ.

- ක්‍රි.ව. 529 ෆ්‍රැන්සිස් වෛසොන් (vaisson ) නමැති ස්ථානයේ රැස් කරන ලද මන්ත්‍රණ සභාවේ ගත් තීරණ අනුව ක්‍රි.ව. 538 දී කසියෝඩරස් නමැත්තා විවියර්ස්හි තිබුණු තාපසරාමයක් මීසම් පාසලක් බවට පත් කර, ඉගැන්වීම් කටයුතු ඉදිරියට ගෙන ගියේ ය .

- මෙම මීසම් පාසල්වල මීසම් පාලක පියවරු වගකීම දැරූහ. මෙවන් මීසම් පාසල්වල කිතුනු ජීවිතවලට, ජන වන්දනාව පිළිබඳ ව පුහුණුව ලබා දෙන ලදි. තව ද සංගීත අධ්‍යයනයට ද ප්‍රධාන තැනක් දෙන ලදි. මෙම අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලැබූ සිසුන්ගෙන් පූජක සිසුන් තෝරා ගත යුතු යැයි තීරණය කරන ලදි.

- ක්‍රි.ව. 8 වන සියවසේ දී චාල්මෙන් අධිරාජ්‍යයාගේ කාලයේ, (මහා චාර්ලස් )යුරෝපා රටවල සිට මහා විද්වතුන් හා අධ්‍යාපනඥයන් ද තම මාලිගාව වෙත කැඳවා කලා දර්ශන මණ්ඩපය ඇති කළේ ය. මොවුන් අතුරින් අල්කුවින් හා ඒයින් කාමු යන තාපසයෝ දෙදෙනා ප්‍රධාන ය. මේ දෙදෙනාගේ ම උපදෙස් අනුව මීසම් පාසල්වල තත්ත්වය උසස් වූ අතර කාලයත් සමඟ සමහර මීසම් පාසල් (කැතීඩ්‍රල්) ආසන දෙව් මැඳුර ආශ්‍රිත පාසල් බවට උසස් කරන ලදි.

### 8.1.1(ආ) කැතිඩ්‍රල් පාසල් (ආසන දේව මන්දිර ආශ්‍රිත පාසල්)

- චාල්මේන් රජුගේ නියෝගය පරිදි ක්‍රි.ව.800 දී පමණ ප්‍රාථමික අධ්‍යාපන ක්‍රමයේ ඇති වූ දියුණුවට වෛකිං (Viking) වරුන්ගේ කටයුතුවල බලපෑම් එල්ල වුව ද නගරබද ප්‍රදේශවල අධ්‍යාපන ආයතන ගොඩනැගී අධ්‍යාපනය දියුණු විය.

- මීසම් පාසල්වල අධ්‍යාපනය ලැබූ පූජක සිසුන්ගේ උසස් අධ්‍යාපන කටයුතුවලට නගරබද පාසල්වල අවස්ථාවක් ලැබිණි. මෙලෙස දියුණු වූ නගරවල ගොඩනැගී තිබූ කැතීඩ්‍රල් පාසල් යුරෝපා අධ්‍යාපනයේ මූලස්ථානය විය.

- අධිරාජ චාල්මේන්ගේ නියෝගය පරිදි සියලු රදගුරුවරු තම ආසන දෙව්මැදුර අසල කැතීඩ්‍රල් පාසලක් ආරම්භ කර, අධ්‍යාපනය කටයුතුවල යෙදුණහ. මේ සඳහා ශුද්ධෝත්තම පිය සහය ද ලැබිණි. දිළින්දෝ, ධනවත්තු මුදල් නොගෙවා අධ්‍යාපනය ලබන අවස්ථා ලද හ.

- ආරම්භයේ දී කැතීඩ්‍රල් පාසල් පූජකවරුන්ට අවශ්‍ය මූලික පුහුණුව ලබාදීම අරමුණු කරගෙන තිබිණ. ඒ අනුව ශු. සභාවේ නීති, යාච්ඤා, දේව ධර්මය, දර්ශනය, ලතින්, ග්‍රීක සාහිත්‍යයන් වැනි විෂය මාලාවන් ගොඩ නැගු හ.

- එහෙත් ක්‍රි.ව. 1100 දී ආගමික ආයතනවල ද, ලෝකයේ රටවල ද, රාජ්‍යවල ද ඇති වූ සංවර්ධනයට අනුව ඉහත පාඩම් මාලාවල අඩුපාඩු හැඳිනගෙන, වැඩිදුරටත් රාජ්‍ය නීතිය, වෛද්‍ය සේවය, ලතින් භාෂාව, සාහිත්‍යය ව්‍යාකරණ, දේශපාලනය, ආර්ථිකය වැනි විෂය මාලා ද විෂය නිර්දේශයට ඇතුළත් කරන ලදි.

- මේ නිසා ධනවත්තු, ප්‍රභුවරු සහ රජ දරුවෝ සමාජ පිළිගැනීම පතා මෙම අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලැබීමට කැමැත්තෙන් එක් වූ හ. එබැවින් ඒ සඳහා වන ගුරුවරුන්, පැවිදිවරු, පූජකවරු නොවූ හ. කාලයාගේ ඇවෑමෙන් මෙවන් අධ්‍යාපනය පමණක් ම අරමුණු කොට ගත් බොහෝ පාසල් නගරවල බිහි විය.

- මේ නිසා ඇති වූ ප්‍රති විපාක :

  මේ දක්වා ආගමික ආයතන හා රජයට පමණක් අයිතිව තිබූ අධ්‍යාපන ක්ෂේත්‍ර ප්‍රබල ව පොදු ආයතන බවට පත් විය. දේශපාලන විද්‍යාව , ආර්ථික විද්‍යාව, වාණිජ්‍ය, වෛද්‍ය විද්‍යාව වැනි විෂයයන් ඉගැන්වීම ආරම්භ විය.

  එක් එක් ප්‍රදේශීය භාෂාවලිනුත් (ස්ව භාෂා )අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව උදා විය. මෙය තව දුරටත් දැනුම් ක්ෂේත්‍රයේ වර්ධනයට හේතු විය.

  නිදහස් චින්තනය වැඩි වී ගිහියන්ට අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව ද උදා විය.

### 8.1.1. (ඉ) විශ්වවිද්‍යාලය

- යුරෝපා ඉතිහාසයේ 12 වන සියවසේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඇති වූ සංවර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස යුරෝපා විශ්වවිද්‍යාල බිහි විය.

- ඉංග්‍රීසියෙන් "University" යැයි අප භාවිත කරන වචනය ලතින් භාෂාවේ "Uiversitas" යන වදනෙන් බිඳී ආවෙකි. එහි අර්ථය වන්නේ "Corporation" නැතහොත් "Guild" යැයි පැවසෙන සංගමයක් නැතහොත් සමූහ ව්‍යාපාරයක් යන්න යි.

- සාමානයෙන් කැතීඩ්‍රල් පාසල්වලින් ලබාදිය නොහැකි වූ උසස් අධ්‍යාපනයේ උසස් දේශනා ලබාදෙන ආයතන ලෙස මේවා දැක්විය හැකිය. මෙම ආයතනවල ලතින් සාහිත්‍ය, මිනුම් විද්‍යා, අංක ගණිතය, යාන්ත්‍රික ගණිතය, සංගීතය, නක්ෂත්‍රය, දර්ශනය, දේව ධර්ම නීතිය (දේශපාලන සහ සභා ) වෛද්‍ය වැනි පීඨ දැකිය හැකි විය.

- 12 වන ශත වර්ෂය අවසානයේ සලෙර්නො හා බොලොඤ්ඤා නගර සිසුන් නීතියට අනුව තමන් එක් විය යුතු ය යන අදහසින් වෘත්තීය සංගම් ඇති කර ක්‍රියා කළ හ. මෙලෙස පැරිස් ගුරුවරු ද සියලු බලයන් තම සතු කර ගනිමින් ක්‍රියා කළ හ.

- මෙලෙස යුරෝපයේ ඉපැරණි අධ්‍යාපන ආයතන ලෙස ස්පාඤ්ඤයේ ටොලිඩෝ, හෝර්ඩෝවා වැනි නගරවල ස්ථාපනය කරන ලද පාසල් හා ඉතාලිය සෙලෙර්නෝ බොලොඤ්ඤ විශ්වවිද්‍යාලයය හා පැරිස් අධ්‍යාපන ආයතනය, ආදි විශිෂ්ට ගණයේ විශ්වවිද්‍යාල ලෙස දැකිය හැකි විය.

1. **බොලොඤ්ඤ විශ්වවිද්‍යාලයය (ඉතාලිය - 1088)**

- ඉතිහාසඥයන්ට අනුව ක්‍රි.ව. 1088 දී මෙම ආයතනය ආරම්භ වීමත් සමග බටහිර යුරෝපා රටවල පළමු විශ්ව විද්‍යාලයය ලෙස හැඳින්විණි.

- 1364 දී දේව ධර්මය ත්, 15 වන සියවසේ ග්‍රීක හා හේබ්‍රව් භාෂාත් උගන්වන ලදී. 16වන සියවසේ දී ස්වාභාවික විද්‍යාව උගන්වන ලදි.

- දර්ශනවාදියකු "Pietro Pompanazzi" වන ස්වාභාවික නිතිය ඉගෙනීමට අනුබල දුන්නේ ය (හොඳ, නරක, ගුණාංග, සාමාන්‍ය දැනුමෙන් ලබාගැනීම ) මෙය දර්ශනයටත්, දේව ධාර්මික සම්ප්‍රදායයටත් බාධාවක් ව පැවතිණි.

- 18වන සියවසේ මෙය හඳුන්වා දීමත් සමඟ විද්‍යාව හා තාක්‍ෂණ දියුණුවට හේතු වූ කරුණු මෙම විශ්වවිද්‍යාලයය තුළින් හඳුන්වා දෙන ලදි.

- රෝම සහා නීති, ක්‍රිස්තු නිකායයේ ක්‍රියාකාරකම්, සමාජ සේවාවන් ආදියට මුල් තැන දුන් මෙම විශ්වවිද්‍යාලයය දේව ධර්මය පිළිබඳ ඉගැන්වීමට එතරම් උනන්දුවක් නොදැක්වූ හ.

2. **පැරිස් විශ්වවිද්‍යාලයය - (ප්‍රංශය 1160-1170 )**

- ඇල්ප්ස් කන්දට උතුරින් ඉපැරණි ප්‍රංශයේ බොහෝ කාලයක් ප්‍රධාන මුල් ම විශ්වවිද්‍යාලය ලෙස පැවතිණි. නොට්රේ ඩැම් (Notre Dame) ආසන දෙව්මැඳුරට අයත් බොහෝ කැතීඩ්‍රල් පාසල් එක් කර 11 වන සියවසේ මෙහි ගොඩනගන ලද සංගමය මෙම විශ්වවිද්‍යාලයය වේ.

- ආරම්භයේ දී "ගුරු-විද්වතුන්ගේ සංගමය" යැයි හඳුන්වනු ලැබී ය.

- ක්‍රි.ව. 1160-1170 අතර මැද කාලයේ පැරිස් නගර රදගුරුතුමා මෙය විශ්වවිද්‍යාලයයක් බවට ප්‍රකාශයට පත් කළේ ය. මෙම විශ්වවිද්‍යාලයය පීඨ හතරකින් යුක්ත වේ. දේව ධර්ම පීඨය, වෛද්‍ය පීඨය, නීති පීඨය, හා කලා පීඨය යනු යි.

- ක්‍රි.ව. 1257 දී ප්‍රංශ ජාතික රොබට් ඩී සෝර්බෝන් (Robert De Sorbonne) නමැත්තා "දේව ධර්මය ඉගෙන ගන්නා දිළිඳු සිසුන්ගේ සංගමය" (The Community of the Needy, Theology Students) යන නමින් පාසලක් ගොඩ නැඟීය. 14 වන සියවසේ සෝර්බෝන් යන නමින් මෙම විද්‍යාලයය හඳුන්වන ලදි.

- (දහම් ප්‍රතිපත්ති ) විශ්වාසය (Dogma) සහ සභා නිතිය (Conon Law) යන ක්ෂේත්‍ර ඉගැන්වීම මෙහි විශේෂ තැනක් උසුලයි. මෙම විද්‍යාලයයේ පරිපාලකයෝ පැරිස් ඇකඩමිය විසින් පත් කරනු ලැබූ හ.

- මෙම විශ්ව විද්‍යාලයයේ බොහෝ රටවලින් පැමිණි ප්‍රසිද්ධ ගුරුවරු ඉගැන්වීමේ කාර්යයේ නියැළුණ හ.

| | | |
|---|---|---|
| උදා :- පීටර් | - | ඉතාලිය |
| ඇලෙක්සැන්ඩර් | - | එංගලන්තය |
| බොනවෙන්ජර්, වික්ටර් ඇල්බට් | - | ජර්මනිය |
| තෝමස් ඇක්වයිනාස් | - | ඉතාලිය |
| ජෝන්ඩනස් | - | අයර්ලන්තය |
| රිචඩ් | - | ස්කොට්ලන්තය |

**3. කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයය**

ක්‍රි.ව. 1209 දී ඔක්ස්ෆර්ඩ් නගරයේ මහ ජනතාව හා විශ්වවිද්‍යාලයීය සිසුන් අතර ඇති වූ අර්බුදය නිසා විශ්වවිද්‍යාලයයෙන් නෙරපනු ලැබූ සිසුන් හා ශිෂ්‍යත්වලාභී සිසුහු කේම්බ්‍රිජ් වෙතට පැමිණ නතර වූ හ. තමන් අතරින් එක පුද්ගලයකු ගුරුවරයකු ලෙස තෝරාගෙන සාමාන්‍ය පාඨමාලා උගත් හ. තමන්ට මූලිකත්වය ගෙන කටයුතු කිරීමට කුලපතිවරයකු ද පත් කර ගත් හ.

- ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයයේ නීති රීති එලෙස ම පිලිපැද්ද හ. පාඩම් කියවීම මගින් පැහැදිලි කිරීමේ ක්‍රමයක් විය. විභාග පවත්වන ලදි.
- ක්‍රි.ව. 1231 තුන් වන හෙන්රි රජු මෙම සිසුන්ගේ වගකීම් බාර ගෙන ඔවුන්ට අවශ්‍ය නවාතැන් පහසුකම් ලබාදී රජු විසින් ම කථිකාචාර්යවරු ද පත් කරන ලදි.
- දේශන තාපසාරාමවල ත්, දේවස්ථානවල ත් පැවැත්විණි. තර්ක ශාස්ත්‍රය, සංගීතය, ගණිතය, යාන්ත්‍රික ගණිතය, නක්ෂත්‍රය වැනි පාඩම් උගන්වනු ලැබිණි. කාලයාගේ ඇවෑමෙන් ලෞකිකත්වයට බරවිණි. සිවිල් නීතිය, දේවත්වය, දේශපාලනය, හේබ්‍රව්, ග්‍රීක වැනි භාෂා භෞතික විද්‍යාව වැනි විෂය උගන්වන ලදි. 1520 දී විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලයක් අරඹන ලදි.
- ක්‍රි.ව. 1524 දී ග්‍රන්ථ මුද්‍රණය කිරීමට රජය විසින් මෙම විශ්වවිද්‍යාලයයට අවසර දෙන ලදි.
- ක්‍රි.ව. 1960 තෙක් බයිබල් මුද්‍රණය කිරීමට මෙම විශ්වවිද්‍යාලයයට අවසර තිබිණි.

**4. සලමන්කා විශ්ව විද්‍යාලය ( ස්පාඤ්ඤය )**

- මෙම විශ්වවිද්‍යාලයය ස්පාඤ්ඤ රටේ මැඩ්රිඩ් නුවරට බටහිරින් පෘතුගීසිය අසල සලමන්කා නගරයේ ඉපැරණි විශ්වවිද්‍යාලයයක් ලෙස දැකිය හැකිය.
- ක්‍රි.ව. 1218 දී ස්පාඤ්ඤයේ IX වන අල්ෆොන්සු රජ මෙය රජයේ පොදු පාසලක් ලෙස ආරම්භ කළේ ය. පසු ව 1254 දී IV වන ඇලෙක්සැන්ඩර් ශුද්ධෝත්තම පියතුමා අනෙකුත් විශ්වවිද්‍යාලය සමඟ මෙය ද විශ්වවිද්‍යාලයයක් ලෙස ප්‍රකාශයට පත් කළේ ය. III වන පර්ඩිනන්ඩ් රජු විශ්වවිද්‍යාලය අයිතිය ලබා දුන්නේ ය.
- පරිපාලනය රදලවරයා යටතේ පැවතිණි. ආරක්ෂකයන් පත් කළේ ය. පීඨාධිපතිවරුන්, කුලපතිවරුන්, විශ්ව විද්‍යාලය සිවිල් පරිපාලනයෙන් මුදා ගැනීම, මහාචාර්යවරුන්ට අවශ්‍ය වේතනය තීරණය කිරීම ආදි අයිතිවාසිකම් ලබා දෙන ලදි.
- භාෂා, කලා උගන්වන ලදි. ඒ සමඟ ලෙඩරෝග පිළිබඳ ගවේෂණයන් ද මෙම විශ්වවිද්‍යාලයය මඟින් සිදු කරන ලදි.

## 8.1.2 විශ්වවිද්‍යාලයයේ දියුණුවට කිතුදහමේ දායකත්වය

- නවීන ලෝකයේ විද්‍යාලයවල හා තාක්ෂණයේ දියුණුවට බොහෝ කිතුනු විද්‍යාඥයෝ ක්‍රියාකාරීව දායකත්වය ලබා දුන් හ. මොවුන්ගේ නිර්මාණ හා ගවේෂණ ලෝකය නවීන කිරීම සමඟ ම මිනිස් සමූහය තුළ සමූහ, ආර්ථික, ආධ්‍යාත්මික ජීවිතය ද පෝෂණය කළේ ය.

- මධ්‍යතන යුගයේ බිහි වූ විශ්ව විද්‍යාලය බොහෝ විද්‍යාගාර (පර්යේෂණාගාර) ලෙසත් තාක්ෂණ ගවේෂණ සංවර්ධන ස්ථාන ලෙසත් සොයා ගැනීම් කළ හ. මොවුන් අතුරින් තෙයියඩ් ෂර්ඩැන් පියතුමා, ඇලෙක්සැන්ඩර් ග්‍රැම් බෙල්, අයිසැක් නිවුටන්, ඇල්බට් අයින්ස්ටයින්, ඇලෙක්සැන්ඩර් ෆ්ලෙමින් වැනි අයගේ සොයා ගැනීම් ද ක්‍රියාකලාපයන් ද පිළිබඳව අපගේ අවධානය යොමු කරමු.

1. **තෙයියාඩ් ෂාර්ඩැන් පියතුමා** (1881-1955) **"Pierre Tehard De Chardin"**

- මිනිසාගේ පරිණාමය පිළිබඳ ආධ්‍යාත්මික සත්‍යය පැහැදිලි කළ චින්තකයන් අතුරින් තෙයියාඩ් ෂාර්ඩැන් පියතුමා ප්‍රධාන තැනක් උසුලයි.

- මෙතුමා ක්‍රි.ව. 1881 උපත ලැබීය. මෙතුමා නෝත්‍රතුඩැහැම්හි ජේසු නිකායික ප්‍රාථමික පාසලේ තම මූලික අධ්‍යාපනය ලබා ජේසු නිකායයට එක්වී ක්‍රි. ව. 1911 දී පූජාත්වරය ලැබී ය.

- පාෂාණවල තැන්පත් දෑ පිළිබඳව ද , මානව විද්‍යාව පිළිබඳ ව ද උගත් මෙතුමා මිනිසාගේ මුල් කාලීන ස්වරූපය පිළිබඳ ගවේෂකයකු ලෙස චීනය, අප්‍රිකාව, වැනි රටවලට ගොස් කැණීම් කටයුතු වල යෙදෙන ගවේෂකයන්ට සහයෝගය ලබා දුන්නේ ය.

- ඉතා ම වැදගත් මානව විද්‍යාත්මක සොයාගැනීම් අතුරින් එකක් වූ සිනන්ත්‍රොපෝස් පේකින්නෙන්සිස් (Sinanthropas Pekinnensis ) නමැති පීකිං මානවයාගේ හිස්කබල සොයාගැනීමේ ගවේෂණයේ යෙදුණේ ය.

- පෘථිවියේ සැකැස්ම පිළිබඳ ව ද වැළලී ඇති පුරාණ සතුන්ගේ, පැළෑටිවල (ඉතිරි කොටස්) ශේෂ පිළිබඳ ව ගවේෂණය කර මෙතුමා ඩාවින්ගේ පරිණාමවාදය පිළිගෙන එයට දේව ධාර්මික පැහැදිලි කිරීමක් කළේ ය.

- මිනිස් පරිණාමය පිළිබඳ ව ආධ්‍යාත්මික සත්‍යතාව පැහැදිලි කිරිම සඳහා ග්‍රන්ථයක් සම්පාදනය කළේ ය. මෙම ග්‍රන්ථය තුළ ෂාර්ඩැන්ගේ සත්‍යය දැකිය හැකිය.

- මෙතුමා ජාතික විද්‍යා පර්යේෂණායතනයේ අධ්‍යක්ෂක වශයෙන් පත් කරනු ලැබීය ප්‍රංශයේ විද්‍යායතනයේ සාමාජිකත්වය ලැබීම මෙතුමා ලද ගෞරවයකි "ෂාර්ඩැන් පිය දර්ශනය".

- මිනිස් සංහතියේ පරිණාමයට විශේෂ සැලැස්මක් හා අරමුණක් ඇත. එම පරිණාමයට ජීවය ලබා දෙනුයේ මහත් බලයකිනි. එම බලය "අපගේ ප්‍රේමයකි " මෙම ආදරයට මුළු විශ්වය තුළ ඇති සැම බලයක් ම එක් කිරීමේ හැකියාව ඇත.

- මිනිසා තමන් සමඟ ද මිනිසා ලෝකය සමඟ ද මිනිසා ව දේව බලය සමඟ ද යා කරන බලය එය වේ. මෙය පරිණාමයේ උච්චස්ථානය යි. මෙය ඔමේගා අදියර ලෙස හැඳින්වී ය.

2. **ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල්** (1847-1922)

- ස්කොට්ලන්තයේ එඩින්බරෝ නගරයේ ක්‍රි.ව.1847 උපත ලද මෙතුමා ලන්ඩන් විශ්වවිද්‍යාලයයේ උසස් අධ්‍යාපනය ලැබී ය.

- මානව හිතවාදියකු වූ මෙතුමා ශ්‍රව්‍ය දෘශ්‍ය ආබාධිත සිසුන්ට භාවිත කළ හැකි ආකාරයේ බොහෝ උපකරණ සොයා ගත්තේ ය. මෙම උපකරණ භාවිතයත්, එම උපකරණ යොදා ගන්නා අයුරු ගුරුවරුන්ට පුහුණු කිරීමත් සඳහා විශේෂ පාසලක් ආරම්භ කිරීමෙහි ලා පුරෝගාමී ව කටයුතු කළේ ය.

- බොස්ටන් නගරයේ ශ්‍රව්‍යාබාධිත සිසුන් සඳහා බහු කාර්ය පාසලක් ඇරඹීය.

- 1876 දී මෙතුමා දුරකථනය සොයා ගෙන ප්‍රථමයෙන් මෙම උපකරණය මඟින් පණිවිඩ හුවමාරු කරන ලදි.

**ශ්‍රීමත් අයිසැක් නිව්ටන් (1643-1727)**

- එංගලන්තයේ වුල්ස්කොප් නම් ග්‍රාමයේ ක්‍රි.ව. 1643 දී උපත ලද මෙතුමා දාර්ශනිකයෙක් ද දේව ධර්මාචාර්යවරයෙක් ද භෞතික විද්‍යාඥයෙක් ද විය.

- ලෝහ වර්ග පිළිබඳ ව දැනුම ලබා ගුරුත්වාකර්ෂණය, වර්ණ හඳුනා ගැනීම, සූර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු, පරාවර්තන දූරේක්ෂයක් වැනි උපකරණ තැනීම, සාගරයේ ඇති වන වෙනස්කම්, චලනය (Motion) පිළිබඳ නියම තුනක් මෙතුමා විසින් ඉදිරිපත් කරන ලදි.

- මෙතුමා ශුද්ධ බයිබලීය විද්‍යාව ආදී විෂය පථයන් හදාරා ඒවා පිළිබඳ විවිධ ග්‍රන්ථ සම්පාදනය කළේ ය. ශු. බයිබලයේ ඇති විද්‍යාත්මක තොරතුරු ගවේෂණය කර ග්‍රන්ථ සම්පාදනයේ යෙදුණේ ය.

**ඇල්බට් අයින්ස්ටයින් (1879-1955)**

- ජර්මනියේ ජුදා කතෝලික පවුලක උපත ලද මෙතුමා නවීන භෞතික විද්‍යාවේ පියා යන විරුදාවලිය ලැබී ය.

- විදුලි බලය, කාන්දම් බලය, ගුරුත්වාකර්ෂණ බලය ආදි ශක්ති එක ම මූලයකින් නිකුත් වන බව සාපේක්ෂතාවාදය මඟින් තහවුරු කළේ ය.

- 1947 දී භෞතික විද්‍යාව පිළිබඳ ව නොබෙල් ත්‍යාගයක් දිනී ය.

**යෝජිත ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

- අධ්‍යාපන කටයුතුවල දී ශු. සභාව කැප වීමෙන් ක්‍රියා කළ බව උදාහරණ සමඟ ඉදිරිපත් කිරීම.

- යුරෝපා ශිෂ්ටාචාරයේ උන්නතියට මීසම් පාසල්, කැතීඩ්‍රල් පාසල්, විශ්වවිද්‍යාලය ආදිය බලපෑ බව පිළිගැනීමට සැලැස්වීම.

- විශ්වවිද්‍යාලය බිහි වීමට හා වර්ධනයට දැක වූ දායකත්වය සාකච්ඡාවට බඳුන් කිරීම.

- විද්‍යාව තාක්ෂණය වැනි විෂය වර්ධනයට දායක වූවන් කිතුනුවන් බව පිළිගෙන ඔවුන් පිළිබඳ විස්තර ලැයිස්තු ගත කිරීම.

- විද්‍යාත්මක ගවේෂණ මඟින් දේව මහිමය හා ශිෂ්ටාචාරය විශිෂ්ට වූ බව දැන ගැනීමට සැලැස්වීම.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. පිල්ප්ස් යේසුදාසන් (නි.ම.නි.), **මුහුන්**, අමල උදයම්, උප්පුවෙලි, ත්‍රිකුණාමලය.

2. සමාදිලංගම් සත්‍යශීලන්, **ශිෂ්ටාචාරයට හැඳින්වීමක්**, අගිලම් මුද්‍රණාලයය, යාපනය.

3. ඇම්. ඇස්. යෙසුදාස් තංගසාමි ඇම්. ඒ. බී. ටී., **ලෝක ශුද්ධ වූ සභා ඉතිහාසය**, නංසිල් මුද්‍රණාලයය, තමිල්නාඩුව.

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | 8.0 | : | **සමාජ සංවර්ධනය සඳහා ක්‍රිස්තියානි චින්තනය, අධ්‍යාපනය හා කලාව ලබාදුන් දායකත්වය දූන ගෙන, කිතුනු වගකීම් ඉටු කරයි.** |
| **නිපුණතා මට්ටම** | 8.2 | : | නව චින්තනයට මඟ පෑදූ කිතුනු චින්තකයන් හඳුනා ගනියි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | | : | 08 |

**ඉගෙනුම් පල**

- ශුද්ධ වූ සභාවේ නව චින්තනයට මඟ පෑදූ කිතුනු චින්තකයන් පිළිබඳ කරුණු ගොනු කරයි.
- ශුද්ධ වූ අගොස්තීනු තුමා හා තෝමස් ඇක්වයිනාස් තුමා වැනි අය නව චින්තනයක උදාවට මඟ පෑදූ බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ශුද්ධ වූ සභාවේ නව චින්තනයේ වෙනසට සහය දක්වයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ක්‍රියාශීලී ව කටයුතු කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට මඟ පෙන්වීමක් :-**

## 8.2.1. ශු. අගෝස්තීනු තුමන් ගේ ජීවිතය හා නිර්මාණ

- ග්‍රීක දාර්ශනික චින්තනයේ පසුබිමෙහි යහපත් ආගමික චින්තන වර්ධනය විය. විශේෂයෙන් මධ්‍යතත යුගයේ ජුදා, කිතුනු, ඉස්ලාම් ආගමික දර්ශන සැලැකිය යුතු ප්‍රමාණයකින් දර්ශනයට 'බලපෑම්' එල්ල කළේය.
- මෙලෙස කිතුනු චින්තනය තුළ ශු. අගෝස්තීනු තුමා, ශු. ඇන්සලම් තුමා, ශු. තෝමස් ඇක්වයිනාස් තුමා සහ ශු. බොනවෙන්ජර් තුමා ආදීහු ප්‍රධාන තැනක් ගති. මොවුන් අතුරින් ශු. අගෝස්තීනු තුමා සහ ශු. තෝමස් ඇක්වයිනාස් තුමා වැනි අයගේ චින්තනයන් ක්‍රිස්තියානියේ වර්ධනයට මහත් දායකත්වයක් දක්වා ඇත.

## 8.2.1.1 හිස්පෝහි ශු. අගෝස්තීනු තුමා (354-430)

- උතුරු අප්‍රිකාවේ තගස්පත් නමැති ස්ථානයේ ක්‍රිව. 354 දී උපත ලද මෙතුමා ලතින් ශු. සභාවේ පියවරුන් අතුරින් විශිෂ්ට දේව ධර්මාචාර්වරයකු යන විරුදය ලැබී ය.
- ක්‍රි.ව. 370 දී කාතේජ් විශ්වවිද්‍යාලයයේ නීතිය උගත් මෙතුමා සිසාරොගේ "හොරේන්සියුස් "නමැති ග්‍රන්ථය හදාරා සත්‍ය ඥාන ගවේෂණයේ යෙදීමට උත්සාහ කළේ ය. මැණිකියන් වාදය පිළිබඳ ව උනන්දුවක් දැක්වී ය.
- ටික කලකට පසු ව මිලාන් නගරයේ රදගුරුතුමන් වූ ශු. අම්බ්‍රෝස් තුමන් හමු වී ශු. සභාවේ දහම් ප්‍රතිපත්ති හා ශු. බයිබලය පිළිබඳ පැහැදිලි කිරීම් හොඳින් දැනගත් අතර බෞතිස්මය ලබා ශු. සභාවට එක් විය.
- මෙම පසුබිමෙහි ප්ලේටෝගේ දර්ශනවාදී චින්තනයන්ගේ පදනමින් කිතුනු ප්‍රතිපත්ති පැහැදිලි කරගෙන මැණිකියන් වාදයත්, පෙලාජියානු වාදයත් ඩොනාටියානු වාදයත් හෙළා දැක විවිධ පැහැදිලි කිරීම් කර ඇත.
- ග්‍රන්ථ 113ක් දහම් දෙසුම් 500ක්, සන්දේශ 218ක් පමණ ලියා ශුද්ධ වූ අභිරහසේ විශ්වාසයේ සත්‍යතා ආරක්ෂා කළේ ය.

**ශු. අගෝස්තීනු තුමන්ගේ නිර්මාණ**

**i) ජීවිත වාර්තාව /ස්වයං තත්ත්වය පිළිගැනීම (Confessions of St. Augustine )**

- මෙහි දී තමන් පෙර ගෙවූ පාපි ජීවිතය, එම පාපි ජීවිතයන් මිදී තමන් පිරිසිදු ජීවිතයේ ලබාගත් දෑ පැහැදිලි කරමින් ඒ මගින් දෙවියන් වහන්සේ ගේ අරුම පුදුම ක්‍රියා කිරීම සම්බන්ධ ව තුති පුදා මෙය ලිවී ය.

**ii) දේව නගරය නැතහොත් දේව පටුන (The City of God )**

- ක්‍රි.ව. 410 දී ගොත් (වන්ඩල්) ගෝත්‍රික ප්‍රහාරය නිසා රෝම නගරය අත් පත් කරගත් අවස්ථාවේ මෙහි විනාශයට හේතුව කිතුනුවන් යයි වරද පැටවීමට ශු. අගෝස්තීනු තුමන්ගේ පිළිතුරු ලෙස මෙම ග්‍රන්ථය ගොඩනැගා ඇත.

  මෙහි දේව වරප්‍රසාද සොයා ආදරය හා සමාව දීම පදනම් කරගත් නව සමාජයක් ගොඩ නගන්නටත් සුවිශේෂය පදනම් කරගනිමින් දේව නගරය ගොඩනගන්නත් යැයි සඳහන් වෙයි.

- තව ද රෝම නගරය මිනිසුන් විසින් ගොඩනගන ලද නගරයක් මිස සුවිශේෂ වටිනාකමක් තම ජීවිත ක්‍රමය ලෙස තෝරාගත් නගරයක් නොවේ. මේ නිසා රෝමයේ සිදු වන සමාජ අයුක්තිය වංචා දූෂණ ආදිය රෝමයේ විනාශයට හේතු වේ. ඒ වෙනුවට සත්‍ය දේව නගරය යන්න සදා ජීවිත පදනම් කරගෙන කිතුනු වටිනාකම් සමග වරප්‍රසාදීය අන් අය කෙරෙහි ඇල්මක් ඇති ව ජීවත් වන විට නව දේව නගරයක් බිහි කළ හැකි ය යන සත්‍යය තහවුරු කළේ ය.

**iii) ත්‍රිත්වීක දෙවියන් වහන්සේ (De Trintate)**

ශු. සභා ඉතිහාසයේ පළමු සියවස් තුන තුළ ත්‍රිත්වීක දෙවියන් වහන්සේ පිළිබඳ ගොඩනැගුණු වේදභේද ත්‍රිත්වීක දෙවියන් වහන්සේ ගේ විවාදවලට පිළිතුරු සපයන අරමුණින් මෙම ග්‍රන්ථය ලියන ලදි.

- මෙම ග්‍රන්ථය එක ම දෙවියන් වහන්සේ පිළිබඳ ව ඉතා අගනා ගැඹුරු සංවාදයක් ආකාරයෙන් ලිය වී ඇත.
- දෙවියන් වහන්සේ දේව ධර්මය, දේව බලය, දේව අධිකාරිය, උපත ආදිය පැහැදිලි ව පෙන්වා ඇත.

**ශු. තෝමස් අක්වයිනාස් තුමා (1224-1274)**

- අක්වයිනාස් තුමා තම ප්‍රාථමික අධ්‍යාපනය මොන්ටෙ කැසිනෝහි ලබා නේපල්ස් විශ්වවිද්‍යාලයය එක් වී දර්ශනය හැදෑරීය.
- ඉතා තියුණු ඥානයකින් යුත් මෙතුමා ඇරිස්ටෝටල් ගේ දර්ශනය කෙරෙහි දැඩි ඇල්මක් දක්වන්නෙක් විය.
- මෙතුමා දොමිනිකානු තාපසයන්ගේ ජීවිත ක්‍රමයන ආකර්ෂණය එම නිකායයට බැඳී සේවය කළේ ය. පැරිස් නගරයේ මහා ඇල්බට් නැමැත්තාගේ මග පෙන්වීම සමග එතුමාගේ සහයෝගය මත පැරිස් විශ්වවිද්‍යාලයයේ ද කථිකාචාර්යවරයකු ලෙස සේවය කළේ ය. වර්තමාන ශු. සභාවේ දේව ධර්මචාර්යවරයකු ලෙස ද කතෝලික පාසල්වලත් බුද්ධිමතුන්ගේ ද ආරක්ෂකයාණන් ලෙසත් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත.

## ශු. තෝමස් අක්වයිනාස් තුමන්ගේ නිර්මාණ

ජනවන්දනා නිර්මාණ :-

- 1261-1264 තෙක් රෝමයේ VI වන උර්බාන් ශුද්ධෝත්තම පියතුමන්ගේ උපදේශකයාණන් ලෙස සේවය කළේ ය. මෙම කාල වකවනුව තුළ ක්‍රිස්තුන් වහන්සේගේ ශ්‍රී ශරීරය ශ්‍රී රුධිරයේ මංගල්‍යය (දිව්‍ය සත්ප්‍රසාද මංගල්‍යය යන) දිව්‍ය පූජාව පිළිබඳ ව යාම යැදුමත් ලිවී ය. ඒ සමඟ "ලව්ඩා සියොන්" (ජෙරුසලම, ප්‍රශංසා කරව්) පාඤ්ඤලින්ගුවා (ගයයි මගේ දිව ) "වර්බුම් සුපෙර්නුම්", "සක්‍රීස් සෝලෙම්නියස්", අරොරෝ තේ "යන දිව්‍ය සත්ප්‍රසාද ගීතත් ලිවීය.

## දේව ධාර්මික ලිපි

- නේපල්ස් විශ්වවිද්‍යාලයයේ සේවය කළ අවස්ථාවේ දොමිනිකානු නිකායයේ රෝම ප්‍රදේශය වෙනුවෙන් දේව ධාර්මික පාඩම් මාලාවක් සකස් කළේ ය.

- මෙතුමාගේ ග්‍රන්ථ අතුරින් විශිෂ්ට ගණයෙහි ලා සැලැකෙන ග්‍රන්ථ දෙකක් පිළිබඳ ව මෙහි දී සඳහන් කළ හැකිය.

**(අ ) 'සුම්මා කොන්ත්‍රා ජෙන්ටයිල්ස් ' ( Summa Contra Genatiles)**

අරාබි දර්ශනවාදීන්ට එරෙහි ව කිතුනු විශ්වාසයේ සත්‍යතාවන් පිළිබඳ ව ලියන ලදි. ස්පාඤ්ඤයේ සේවය කළ දොමිනිකානු තාපස නිකායයේ ධර්මදූතවරුන් සඳහා ලියන ලද්දකි. කිතුනුවන් නොවන ජනතාවට දෙවියන් වහන්සේ පිළිබඳ ව මෙ මඟින්පැහැදිලි කරන ලදි. මිනිස් දැනුමේ හා චින්තනයේ සහය ඇති ව මැවීම පිළිබඳ ව ද සදාතන ජීවිතය පිළිබඳ ව ද පැහැදිලි කර ඇත.

**(ආ )"සුම්මා තියලොජි " ( Summa Theologiae)**

ශතවර්ෂ ගණනාවක් දේව ධර්ම සිසුන්ගේ පෙළපොත ලෙස මෙම ග්‍රන්ථය භාවිත කරන ලදි. විශ්වාසය, දහම පිළිබඳ ශු. සභාවේ ඉගැන්වීම් කොටස් තුනක් වශයෙන් මෙහි ඇත.

1. දෙවියන් වහන්සේගේ ස්වභාවය -සියල්ල දෙවියන් වහන්සේගෙන් නික්මෙයි.

2. චින්තන හැකියාවෙන් යුත් මිනිසා අවසානයේ දෙවිඳුන් හා එක් වෙයි.

3. චින්තන හැකියාව සතු මිනිසාගේ මඟ පෙන්වන්නා ක්‍රිස්තුන් වහන්සේ ය යන විශ්වාසයේ ඉගැන්වීම් පිළිබඳ ව පැහැදිලි කර ඇත්තේ ය. මෙතුමන්ට ම අනන්‍ය වූ දේව ධාර්මික චින්තනය "ස්කොලටිසිසම්"(Scholaticism ) යයි හඳුන්වනු ලැබේ. මිනිස් දැනුම මඟින් දාර්ශනික හා දේව ධාර්මික සත්‍යතා හඳුනාගෙන ඒවා ආරක්ෂා කර පැහැදිලි කිරීමේ ක්‍රමවේදයක් "ස්කොලටිසිසම්"නම් වේ. මෙය මූලික කොටස් තුනකින් යුතු වේ.

    1. ප්‍රශ්න ඉදිරිපත් කිරීම

    2. පක්ෂ විපක්ෂ විවාද පැවැත්වීම

    3. දැනුම මඟින් පිළිගත හැකි තීරණයක් ලබා දීම.

මෙම ස්කොලටිසිසම් ක්‍රමය දේව ධාර්මික එළිදරව්ව හා ශු. සභාව විසින් උගන්වන සම්ප්‍රදායයන් සීමිත ව ගෙන ඇත.

**අදාළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම්.**

1. ශු. සභා ඉතිහාසයේ නව චින්තනයක් ඇති කළ චින්තකයන් පිළිබඳ ව විස්තර ගොනු කිරීම.

2. ශු. අගෝස්තීනු තුමන්ගේ ජීවිතය, සේවාව හා නිර්මාණ පිළිබඳ ව කරුණු සොයා ගොනු කිරීම.

3. ශු. තෝමස් අක්වයිනාස් තුමන්ගේ ජීවිතය, සේවාව හා නිර්මාණ පිළිබඳ ව කරුණු සොයා ගොනු කිරීම.

4. මෙම චින්තකයන්ගේ චින්තන ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයට කළ බලපෑම් ලැයිස්තුගත කිරීම.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. පිල්ප්ස් යේසුදාසන් (නි.ම.නි.), **මුහුන්**, අමල උදයම්, උප්පුවෙලි, ත්‍රිකුණාමලය.

2. සමාදිලංගම් සත්‍යශීලන්, **ශිෂ්ටාචාරයට හැඳන්වීමක්,** අගිලම් මුද්‍රණාලය, යාපනය.

3. ඇම්. ඇස්. යෙසුදාස් තංගසාමි ඇම්. ඒ. බි. ටි., **ලෝක ශුද්ධ වූ සභා ඉතිහාසය**, නංසිල් මුද්‍රණාලය, තමිල්නාඩුව.

**නිපුණතාව 8.0 : සමාජ සංවර්ධනය සඳහා ක්‍රිස්තියානි චින්තනය, අධ්‍යාපනය හා කලාව ලබාදුන් දායකත්වය දැන ගෙන, කිතුනු වගකීම් ඉටු කරයි.**

**නිපුණතා මට්ටම 8.3** : කලාවේ උන්නතිය සඳහා කිතුනු දායකත්වය හඳුනා ගෙන නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 20

**ඉගෙනුම් පල**

- කිතුනු සාහිත්‍යය මඟින් ගොඩනැගුණු නව චින්තනය රටා ගොනු කරයි.
- කලාවේ උන්නතිය සඳහා කිතුනු දායකත්වයක් වූ බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- කලාවේ උන්නතිය සඳහා තම නිර්මාණාත්මක දායකත්වය ලබා දෙයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ක්‍රියාශීලී ව කටයුතු කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට මඟපෙන්වීමක් :-**

## 8.3.1 කිතුනු සාහිත්‍ය ග්‍රන්ථ

- කිතුනු ශිෂ්ටචාරයේ දියුණුවට දායකත්වය දැක්වූ සාධක අතුරින් ප්‍රධාන තැනක් ගන්නේ කිතුනු සාහිත්‍ය ග්‍රන්ථ ය.
- කිතුනු සාහිත්‍ය කලාව, කිතුනු ගවේෂණ භාණ්ඩ පිළිබඳ ලේඛන ක්‍රිස්තියානි ලෞකික දැක්ම මඟින් අපට ලබා දේ ඒවා කිතුනු සත්‍යතා, උපමා, ගොතනු ලැබූ කතා, කවි, නාට්‍ය යැයි විවිධාකාරයෙන් දැකිය හැකිය.
- කිතුනුවන්ගේ ප්‍රධාන ග්‍රන්ථය වන ශු. බයිබලය සාහිත්‍ය ග්‍රන්ථයක් වුව ද, සාමාන්‍යයෙන් එය සාහිත්‍ය ග්‍රන්ථය යැයි සලකනු නොලැබේ. එහෙත් එහි සාහිත්‍ය රස සොයා බලා ප්‍රශංසා කරනු ලැබේ.
- ශු. බයිබලය පරිවර්තන සාහිත්‍යයන් ගණයෙහි ලා සැලකිය හැකිය. ඒ අනුව ශු. ජෙරොම්තුමාගේ පරිවර්තන වල්ගෙට් පිටපත වේ.
- සභා පියවරුන්ගේ කාලයේ ලියන ලද විවිධ ග්‍රන්ථ ද සාහිත්‍ය කලාවට ආධාරයක් ලෙස ගත හැකිය.
- කිංග්ස් ජේම්ස්ගේ බයිබලීය පරිවර්තනය විශිෂ්ට ඉංග්‍රීසි කාව්‍යයක් ලෙස සලකනු ලැබේ.
- ඩාන්ටේ අලිගියේරි, තෝමස් අකම්පේ, අවිලාහි තෙරේසා තුමිය, කුරුසියේ සාන්ත ජොහාන් තුමා වැනි අයගේ නිර්මාණ විශිෂ්ට ගණයේ ඒවා ය.

### 8.3.1.1 ඩාන්ටේ අලිගියේරි (Dante Alighieri)(ක්‍රි.ව. 1265-1231)

- ඉතාලියේ ෆ්ලොරන්ස් නගරයේ උපත ලැබූ මොහු ඉතාලි භාෂාවෙන් බොහෝ ග්‍රන්ථ ලිවී ය.
- මධ්‍යතන යුගය තෙක් සාහිත්‍ය ග්‍රන්ථ සියල්ල ලතින් භාෂාවෙන් ලියන ලදි. එහෙත් ඩාන්ටේ මෙම සම්ප්‍රදයය වෙනස් කරමින් සාහිත්‍යයෙයේ හි විශාල වෙනසක් කළේ ය. ඉතාලි ජාතික භාෂාවට සේවය කළ මෙතුමා "ඉතාලි භාෂාවේ පියා" ( Father of The Itaian Language)යැයි හඳුන්වනු ලැබී ය.
- දේව සුබාන්තය ( The Divine Comedy) යන මෙතුමාගේ නාට්‍ය ග්‍රන්ථය සාහිත්‍ය කෘති අතර අග්‍රගණ්‍ය සාහිත්‍ය කෘතියක් ලෙස හැඳින්වේ. මෙතුමා ලියූ සාහිත්‍ය කෘති අතුරින් ප්‍රථම සාහිත්‍ය කෘතිය මෙය වේ.

- සුප්‍රසිද්ධ වර්ජිල් නැමැති කවියා සමඟ එක් වී අපාය, ශුද්කාගිනිස්ථානය, ස්වර්ගය වැනි ස්ථාන සම්බන්ධ ව ලියා ඇත්තේ ප්‍රබන්ධ ආකාරයෙනි.

- පෙට්‍රාසෝ, බොකාසියෝ වැනි අයට මඟ පෙන්වන්නෙක් විය. මධ්‍යතන යුගයේ කිතුනු සාහිත්‍යයේ වර්ධනයට සේවය කළ ප්‍රධාන පුද්ගලයකු ලෙස මෙතුමා පිළිගැනේ.

### 8.3.1.2 තෝමස් අකම්පේ (Thomas a Kempe) (1380-1471)

- මධ්‍යතන යුගයේ සාහිත්‍ය ග්‍රන්ථ සම්පාදනය කළ අය අතුරින් තෝමස් අකම්පේ ප්‍රධාන තැනක් ගනී. මෙම කාල වකවනු වේ කිතු දහම පිරිහෙනු දැක,'කිතුනු ජීවිත මඟ' යන ග්‍රන්ථය ලිවී ය. ශු. බයිබලයට අමතර ව ඇති විශිෂ්ට ශුඃ ග්‍රන්ථය ලෙස සලකනු ලබන 'ක්‍රිස්තු අනුසාරය (The Imitation of Christ) විවිධ භාෂාවන්ට පරිවර්තනය කර ඇත. දිනපතා දිව්‍ය සත්ප්‍රසාදය ලබා, නිසි ආකාරයට ජීවත් විය යුතු ය යන පණිවිඩය පැහැදිලි ව මෙම ග්‍රන්ථය තුළ දක්වා ඇත.

- සුචේලි ශුද්ධ වූ ඇග්නස් කඳුවැටියේ තිබූ තාපසාරාමයේ වසර 70ක් පමණ තාපසාරාම නායකයාණන් ලෙස සේවය කළ මෙතුමා තාපසාරාමයෙන් පිටතට නොගියේය. " මා දිගට ම ජීවත් වන මගේ කුඩා කාමරය ඉතා අගනා ලෙස වර්ධනය වෙයි. මගේ සුමිතුරා එය යි. මගේ සැනසීම ද එය යි " යැයි පැවැසීය.

- ක්‍රිස්තුන් වහන්සේ අනුගමනය කර, තම කම නසා දෙවියන් වහන්සේ හා ඒකාබද්ධ වී, ගැලවීම ලබාගැනීම ජීවිත දර්ශනය වන බව ඔහුගේ අදහස යි.

### 8.3.1.3 අවිලාහි ශු. තෙරේසා තුමිය (Teresa of Avila) (1515-1582)

- අවිලාහි ශු. තෙරේසා තුමිය ස්පාඤ්ඤයේ අවිල්ලා නම් ස්ථානයේ විසූ ප්‍රභූ පවුලක 1515 මාර්තු 28 වන උපත ලැබුවා ය.

- මෙතුමිය කුඩා කල තම සහෝදරිය අමතා, "අපි නිවසින් පැන මොරොක්කෝවට ගොස් ප්‍රාණපරිත්‍යාගී ඔටුන් ලබා ගනිමු"යැයි පැවසුවා ය.

- ශු. තෙරේසා තුමිය විසින් කියන ලද වීරවරුන්ගේ ඉතිහාසය, එතුමිය පැවිදි දිවිය කෙරේ යොමු කළ බැවින් තම ග්‍රාමයෙන් පිට වී කාර්මෙල් කන්‍යාරාමයට එක් වූවා ය.

- එම කන්‍යාරාමවල තිබූ විනය කඩවීම් නිසා මෙතුමියට ලෞකික ජීවිතය කෙරෙහි ඇල්මක් ඇති විය.

- ශු. අගෝස්තීනු තුමා, ශු. ජෙරොම් තුමා, ශු. මහා ග්‍රෙගරි තුමා වැනි අය ලියූ ග්‍රන්ථ කියැවූ නිසා වරද වටහාගත් ඇය මුළුමනින් ම තමාව ත්‍යාග කර තාපස ජීවිතය තම අරමුණ කරගත්තා ය. විශේෂයෙන් ශු. අගෝස්තීන් තුමා ස්ව තත්ත්තවය පිළිගෙන ලියූ ග්‍රන්ථය (Confession) ග්‍රන්ථය කියවා ආධ්‍යාත්මික ජීවිතය අලුත් කර, කාර්මෙල් නිකායයේ උන්නතියට දායක වූවා ය.

- තම ආත්මික පියාණන්ගේ උපදෙස් පරිදි 'යහපත් ජීවිතයකට මඟ' යැයි තම ජීවිත කථාව ලියුවා ය.

- 'ආත්මයේ රාජධානිය' යන ග්‍රන්ථය දෙවියන් වහන්සේ හා ඒකාබද්ධ වීම මගින් අත්දකින මිහිර, කේන්ද්‍ර කොට ගනිමින් ලියුවා ය. ගැඹුරු ධ්‍යානයකට සම වැදීමේ අවශ්‍යතාව ගැන ද පැහැදිලි කර ඇත.

- කාර්මෙල් නිකායය ප්‍රතිසංස්කරණය කොට පැරණි නිතී රීති පිළිපැදීමට සැලැස්විය යුතු යැයි සැලසුම් කර, මෙතුමිය තම පැවිදි ජීවිතයේ ඉතිහාසය, යාච්ඤාමය ජීවිතය, එකමුතු යාච්ඤාව යන ග්‍රන්ථ සම්පාදනය කළා ය.

- මෙතුමිය ලියූ ග්‍රන්ථ සන්දේශය ද ස්පාඤ්ඤයේ සාහිත්‍ය ග්‍රන්ථ ලෙස පිළිගැනේ. විශේෂයෙන් අත්තිවාරම (Foundation), ඇතුළාන්ත මාළිගය (Interior Castle) වැනි සාහිත්‍ය ග්‍රන්ථ දැක්විය හැකිය.

- VI වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා මෙතුමිය 1970 වර්යේ "ශුද්ධ වූ සභාවේ ධර්මධරයා"(Doctor The of Church) ලෙස නම් කළේ ය.

### 8.3.1.4 කුරුසයේ සාන්ත ජොහාන් (John of the Cross) (1542-1591)

- කාර්මෙල් නිකායය පිහිටුවීමට සැලසුම් කළේ ය. ගැඹුරු අත්දැකීම මෙතුමා ශු. අවිලාහි තෙරේසා තුමියගෙන් ලබා ගත්තේ ය.

- මෙතුමා පහත සඳහන් ග්‍රන්ථ සම්පාදනය කර, ක්‍රිස්තියානි සාහිත්‍යයට මහත් දායකත්වයක් දැක්වූයේ ය.

    - කාර්මෙල් කඳු නැඟීම (Ascent of Mount Carmel )
    - ආත්මයේ අන්ධකාර රාත්‍රිය (The dark Night of Soul)
    - ආධ්‍යාත්මික ගීතය (Spiritual Canticle)
    - දේව ආදරයේ සජීව අභියෝගය (The living Flame of Divine Love)

- මෙහි ආත්මය හා දෙවියන් අතර ඇති සබැඳියාව ස්වර්ගයේ පියාණන්ට හා පුත්‍රයාණන්ට ඇති ආදර බැඳිම වැනි ආත්මික බැඳීමක් ලෙස විය යුතු බවත්, ඒ වෙනුවෙන් දුක් කම්කටොලුවලට මුහුණ දිය යුතු ස්වභාවයෙන් ඇති වන ආශාවන් පාලන කරගනිමින් ජීවත්විය යුතු ය යන අදහස දේව අත්දැකීමට බැහැපත්කම ඉතා අවශ්‍ය බවත් තහවුරු කරයි.

- "ශු. පැට්‍රික්" ආරක්ෂාව පිළිබඳ ලියූ, "පපුවේ පළි හ"(Breast Plate) සෙලානෝතෝමස් අවසාන තීරණය පතා ලියූ "කෝපයේ දිනය"(Dies Irae), ජෝන් විල්රන් මිනිසාගේ වැටීම, ගැලවීම ගැන ලියූ "අහිමිකරගත් සුගති උද්‍යානය (Paradise Lost), නැවත ලබාගන්නා සුගති උද්‍යානය, ජෝන් බැනියන්ගේ කිතුනු ඒකත්වය පදනම් කරගනිමින් ලියූ, "වන්දනාකරුවන්ගේ ගමන "( The Pilgrims Progress) වැනි ඒවා මෙහි දී සඳහන් කළ යුතුය. මේ සමඟ J.R.R ටොල්කියේන්, G. K.සේස් ටෙක්ඩන් ලියූ ග්‍රන්ථවල ගෙතූ කථා උදාහරණ ලෙස දැකිය හැකි ය.

## 8.3.2. කිතුනු සංගීතය (ශුද්ධ වූ සංගීතය)

කිතුනු සංගීතය යන්න ක්‍රිස්තියානි දේවස්ථානවල, සිද්ධස්ථානවල, නැතහොත් ජනතාව දෙවියන් වහන්සේට දේව වන්දනා කරන ස්ථානවල සිදු වන ජනවන්දනා පිළිවෙත්වල දී ගැයීම සඳහා සම්පාදනය කරන ලද ගීත වේ. මේවා මඟින් ජනවන්දනාව අර්ථවත් වේ. මේවා කිතුනු ජීවිතය, විශ්වාසය පිළිබඳ ඒක පුද්ගල නැතහොත් ක්‍රිස්තියානි සමාජයක විශ්වාසය ප්‍රකාශ කිරීම සඳහා ලියන ලද ඒවා වේ. එහි සම්පාදනය, ගයන ආකාරය එහි වැදගත්කම ආදිය සංස්කෘතික සමාජ වටාපිටාවට අනුව තැනින් තැන වෙනස් වේ. ක්‍රිස්තියානියේ ආරම්භයේ සිට එහි වන්දනාවන්හි පිළිවෙත්, සංගීතය ආදියට ප්‍රධාන තැනක් ලැබේ.

### 8.3.2.1 ග්‍රෙගෝරියානු සංගීතය (Plain Chant)

- ප්‍රථම වතාවට ක්‍රි.ව. 500-1000 අතර කාලය තුළ ක්‍රිස්තියානි සංගීත ක්‍රමය ආරම්භ විය. අඳුරු යුගය ලෙස හඳුන්වනු ලැබූ මෙම කාලවකවනුවේ දී ජනවන්දනා ක්‍රම පිළිවෙළක් සකසන ලදි.

- ශු. බෙනදිකාන තාපස නිකායයෙන් සකස් කර තිබු ජනවන්දනා ක්‍රම කිතු දහමට අදළ වන ආකාරයට පළමු වන ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා (ක්‍රි.ව. 590-604) සැකසීය.

- ග්‍රෙගරි තුමාගේ කාලයේ ගොඩනගන ලද සංගීතය "ග්‍රෙගෝරියානු තාල ක්‍රමය"(Gregorian Chant) යැයි ප්‍රසිද්ධ විය. මෙම සංගීත ක්‍රමය තනි තාල ක්‍රමයක් වේ. එනම් සියලු දෙනා එක් වී එක ම ස්වරයකට ( Mono Phonic) පහසු ආකාරයකට ගැහීමටත්, පැහැදිලි කර ගැනීමටත්, මිනිසා දේව ආදරය කරා ගෙන යාමටත් හැකි පහසු වෙනස්කම් කර, කිතුනු ජනවන්දනාවල ත් පිළිවෙත්වලදී උපයෝගී කරගෙන යුතු යැයි ග්‍රෙගරි ශුද්ධෝත්තම පියතුමා පවසා ඇත. මේ නිසා ග්‍රෙගෝරියන් සංගීතය ප්‍රසිද්ධ ය.

- රෝම ආගමික පිළිවෙත්වලට අදාළ සංගීත සැලැස්ම "ග්‍රෙගොරියන් (Gregorian) යැයි හැඳින්වේ.

- සාමන්‍යයෙන් දිව්‍ය පූජාවේ දී ගයන ගීත සහ දිව්‍ය සත්ප්‍රසාද වන්දනාවේ දී, ශුද්ධාත්ම මංගල්‍යවල දී, අවමංගල්‍ය පිළිවෙත්වල දී, විවාහ පිළිවෙත්වල දී, මහ සිකුරාදා, පාස්කු ඉරිදා වැනි විශේෂ ආගමික මංගල්‍යවල දී ගැයෙන ගීතිකා සඳහා යොදා ගන්නා අනුමතිය ලත් සංගීතය මෙය යි.

## 8.3.2.2. මිශ්‍ර තාල ක්‍රමය-පොලිෆොනී සංගීත ක්‍රමය ( Polyphony)

- 11 වන 12 වන සියවස්වල ග්‍රෙගෝරියානු තාල සංගීතයට වඩා වෙනස් බොහෝ සංගීත ක්‍රම බිහි විය. ඒවා මිශ්‍ර සංගීතය ඔරතෝරියානු සංගීතය, බාරොක් සංගීතය ආදිය වේ.

- මිශ්‍ර සංගීත ක්‍රමය ප්‍රංශයේ නෝත්‍රඩාම් ආසන දෙව්මැදුරේ ආරම්භ විය.

- ක්‍රි.ව.1200 වර්ෂයේ දී ගායනා කණ්ඩායමේ නායකයාණන් වන පෙරෝටින් (Perotin) නැමැත්තා සිවු හඬ තාල ක්‍රමය එක් කර මිශ්‍ර තාල ක්‍රමයක් ඇති කළේ ය. ටෙනර් (Tenor), සුප්රානෝ (Suprano), ඇල්ටෝ (Alto) බේස් (Base)

### පොලිෆොනි (Polyphony)

- පොලිෆොනි යන ග්‍රීක වචනය මඟින් මෙම සංගීතය ප්‍රචලිත විය.

- කිතුනු සංගීතයේ දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම, වන්දනා කිරීම, කරුණාව දැක්වීම, කඳුලු සැලීම වැනි මිනිස් හැඟීම් ගැබ් ව පවතිනු දැකිය හැකිය.

- මෙම සංගීත ක්‍රමය මඟින් මිහිරි ලෙස සාමාන්‍ය ජනතාවගේ සිත යාච්ඤාවට වඩා සංගීතය දෙසට හැරිණි.

- සංස්කෘතික පසුබිම අනුව මේවායේ බිහි වීම, ගීතවල රූපය එහි වැදගත්කම ආදිය ස්ථානයෙන් ස්ථානයට වෙනස් වේ. දිව්‍ය පූජාවේ දී ගයන ගීත කොටස් හයක් එක් ව පවතින ආකාරයට ගැයිය යුතු යැයි තීර්ණය කරන ලදී. වර්තමානයේ ද දිව්‍ය පූජාව අවස්ථාවේ ගැයෙන ගීත සඳහන් කළ යුතු ය.

  කීරියේ - ස්වාමිනි කරුණා.

  ග්ලොරියා - ප්‍රශංසා ගීතය

  ක්‍රේඩෝ - අභිරහස ( විශ්වාසයේ අභිරහස)

  සාන්තුස් - සුවිශුද්ධය

  බෙනඩික්තුස් - දෙවියන් වහන්සේ නාමයෙන් වඩින තැනැත්තා ආසිරි ලද්දේ ය.

  ආඤ්ඤුස් ඩේයි - ලොවේ පාප හරණ......

#### 8.3.2.3.1. **විශේෂ මිශ්‍ර තාල ක්‍රමය**

- ත්‍රිදෙන්තීනු මන්ත්‍රණ සභාවෙන් පසු බිහි වූ සංගීත ක්‍රම අතුරින් මෙය වැදගත් තැනක් උසුලයි.
- ප්‍රතිසංස්කරණය සහා පෙරළියට පෙර භාවිත කළ සංගීත ක්‍රමයට සාමාන්‍ය ජනතාවට සහභාගි විය නොහැකි ව පැවතිණි. දිව්‍ය පූජාව ඉතා දීර්ඝ යැයි සමහරු පැවසූහ. එබැවින් මෙම විශේෂ මිශ්‍ර තාල ක්‍රමය බිහි විය.
- ශුද්ධෝත්තම පිය වූ මාර්සලස් ට (Missa Papae Marcelli) මෙම මන්ත්‍රණ සභාවේ දී ප්‍රශංසා කරනු ලැබේ.
  - ඉතාලි ජාතිකයකු වූ ගියෝවන්නි පියර්තුවිජිගා ( Giovanni Pierthuviga De Plestrina) නමැත්තා මෙම සංගීතයට නව පණක් දුන්නේ ය.
  - නෙදර්ලන්ත ජාතික ඔර්ලෙන්ඩුස් ලෙස්සුස් කණ්ඩායම භක්ති අභ්‍යාසවලට මෙම මිශ්‍ර තාල ක්‍රමය භාවිත කළ හ. සංගීත භාණ්ඩ භාවිත නොකර කට හඬ පමණක් භාවිත කරමින් ගොඩ නඟන ලද තාල ක්‍රමය ඉතා විශිෂ්ට ය.

2. ඔරතෝරියනු සංගීතය
   - ජෝර්ජ් පැට්‍රික් නැමැත්තා මෙම සංගීත ක්‍රමයට මූල බීජය වැපුරුවෙකි.
   - ආගමික අදහස්වලට උචිත ආකාරයට සංගීතය සකසා ඇත. ධාන්‍ය සංගීතය ක්‍රමය ලෙස සැලකේ.
   - සංගීත උපකරණ, කටහඬ එකට එක් ව නව විශේෂ මිශ්‍ර තාල ක්‍රමයක් ඇති කළේ ය. මෙය ඔරතෝරියානු සංගීත ක්‍රමය යැයි හඳුන්වනු ලැබේ.

3. ශුද්ධ වූ සංගීතය / ගායන දිව්‍ය පූජාව
   - 19 වන සියවසේ ගායනා දිව්‍ය පූජාව, දොම්නස් ගායනා පූජා ආරම්භ කරන ලදි.
   - ලුඩ්විග්වන් බෙතෝවන් ( Ludwigvan Beethoven) නමැත්තා ගායනා පූජාවන් සම්පාදකයන් අතර පළමු තැන ගනී.
   - ප්‍රංශ ජාතිකයකු වන හෙක්ට් බර්ලරියාස්, ගාබ්‍රියෙල් බොරේ, ඉතාලි ජාතිකයකු වන කුයිසෙපේ වාස් වැනි සංගීතඥයෝ සංගීතයට විශාල සේවයක් කළ හ.

4. බරොක් සංගීතය
   - 19 වන සියවසෙන් පසු බරොක් වැනි නව සංගීත ක්‍රම ඇති විය.
   - වරක් ගැයීම දෙවරක් යැදූමට සමානය, එබැවින් මනස කලබල නොවී ධ්‍යානයට සමවැදීමට සහය වන ආකාරයට ශුද්ධ වූ සංගීතය පැවතිය යුතු ය. යන අවශ්‍යතාව හඳුනා ගත් 10 වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා දේවස්ථානයේ වන්දනාවල භාවිත කළ හැකි සංගීතයට නිති රිති පැනවීය.
   - ආර්මෝනියම, පියානෝව, වයලීනය, ගිටාරය වැනි සංගීත භාණ්ඩවල සහය ඇතිව මේවා ගයන ලදි.
   - සමහර කිතුනු සභා මෙම සංගීත උපකරණ භාවිත නොකර ගීත ගැයී ය.

### 8.3.3. කිතුනු ගොඩනැගිලි කලාව

- කිතු දහම ජුද ආගමේ ශාඛාවක් ලෙස පැවති කාලයේ ජෙරුසලම් දේව මාලිගාව ජනවන්දනාවේ කේන්ද්‍රස්ථානය විය.

- එහෙත් රෝමයේ ඇති වූ වේද භේදවලින් පසු ක්‍රි.ව. 313 දී කොන්ස්තන්තීනු අධිරාජයා විසින් කිතු දහමට නිදහස ලබාදුන් පසු ක්‍රිස්තියානි ගොඩනැගිලි කලාව ලෙස කලා අංශයක් ඇරඹුණේය.

- මෙම කාලයේ ගොඩනඟන ලද දේවස්ථාන ආකාර ගොඩනැගිලි කලාවක මිශ්‍රණයකි

  1. බැසිලිකා රෝම දේවස්ථාන සැලසුම් ක්‍රමය.
  2. බිසෙන්තියානු ක්‍රමයේ දේවස්ථාන

#### 8.3.3.1. රෝම දේවස්ථානවල සැකැස්ම (බැසිලිකා)

- රෝමවරුන්ගේ බැසිලිකාව යැයි හඳුන්වනු ලබන දේවස්ථානය ජනතාව එක් වී යාච්ඤා කරන මණ්ඩපයන්ට බෙහෙවින් සමාන වේ.

- රෝම අධිරාජ්‍යයේ බටහිර ප්‍රදේශයේ ප්‍රසිද්ධ මෙම ගොඩනැගිලි කලාවේ සැකැස්ම ක්‍රිස්තියානි කලාවේ ප්‍රධාන තැනක් ගනියි.

**බැසිලිකා දේවස්ථානය සැකැස්මේ ප්‍රධාන අංග**

- පළලට වඩා දිග වැඩි සෘජුකෝණාස්‍ර හැඩයෙන් යුත් ගොඩනැගිලි සැලැස්මක් දැකිය හැක.
- දේවස්ථානයට ඇතුලු වූ විගස දැකිය හැක්කේ අඩ කවාකාර ගුහාවක ඇති පූජාසනය වේ.
- දෙපස ඇති උස කුළුණු දේවස්ථාන වහල දරා සිටියි. මේ නිසා දේවස්ථානයේ බිම් කොටස කොටස් තුනකට බෙදී ඇත. ඉංග්‍රීසි භාෂාවෙන් එහි මැද කොටස නැව යන අර්ථය දෙන නේව් (Nave), පළලින් අඩු දෙපස කුරුළු පිහාටු යන අර්ථය දෙන අයිල් (Aisle), යනුවෙන් ද හැඳින් වේ.
- මැද ප්‍රදේශයේ වහල පළලින් අඩු ප්‍රදේශයට වඩා උසස් වේ. එම නිසා පිටතින් බලන විට දෙමහල් ගොඩනැගිල්ලක් සේ පෙනේ.
- අත්තටු ප්‍රදේශයත්, මැද ප්‍රදේශයත් අතර ඇති කණුවල යොදා ඇති ජනේල මඟින් ආලෝකය ඇතුලට ගලා ආවේ ය.
- සෘජු චතුරාශ්‍රාකාර දේවස්ථාන, කවාකාර බිත්ති සහිත කුරුසයක හැඩයෙන් දේවස්ථාන රෝම අධිරාජයේ බටහිර ප්‍රදේශයේ ගොඩනැගුණි.
- හතරවන සියවසේ රෝම නගරයේ ගොඩනඟන ලද ජොහාන් ලුතරානු, ශු. මරියා වැනි දේවස්ථාන බැසිලිකා ආකාරයෙන් ගොඩනැගුණු ප්‍රධාන දේවස්ථාන වේ. කිතුනුවන්ගේ ගණන වැඩි වූ හෙයින් මෙම ගොඩනැගිලි සැලැස්ම අවශ්‍ය විය.

### 8.3.3.2. බයිසෙන්තියානු ගොඩනැඟිලි කලාව.

- 4 වන සියවසේ රෝම අධිරාජය පහත සඳහන් ආකාරයට බෙදී ගියේ ය. බටහිර (රෝමය), නැගෙනහිර (බයිසෙන්තියානු) ලෙස ය. මේ නිසා ගොඩනැඟිලි කලාවෙන් වෙනස්කම් ඇති විය.
- නැගෙනහිර බැසිලිකාව වෙනුවට කවාකාර නැතහොත් කේන්ද්‍රික සැලැස්මක් ඇති ව දේවස්ථාන බිහි විය. මේවා බයිසෙන්තියානු කලාව යැයි හඳුන්වන ලදී.
- බයිසෙන්තියානු දේවස්ථාන සැකැස්මේ ප්‍රධාන අංග

  * ග්‍රීක කුරුසයක් ( පැති හතර ම සම) ආකාරයෙන් ගොඩනගා ඇත.

  * පැතිලි වහලට හැර අඩ කවාකාර මුහුණතක් ගොඩනගා ඇත.

  * පූර්ණ ආලෝකයකට වඩා මන්ද ආලෝකයක් උපයෝගී කර ගත් හ.

  * දේවස්ථානයේ මධ්‍යයෙහි මුළුමනින් කුලුණු හෝ බිත්ති නොමැත.

  * දුන්නක හැඩයකින් මුහුණත ද, අඩ කවාකාර වහලක් ද, ජල බිඳුවක් වැනි (Dome) වහලක් ද ගොඩනගා ඇත.

  * ශුද්ධවන්තයින්ගේ පින්තූර එල්ලා තිබුණි. දේවස්ථානයේ අභ්‍යන්තරයේ පූජාසනයක් ගොඩනගා, දේවස්ථානයේ කේන්ද්‍රගත ස්ථානයේ සිට තිරයක් එල්ලා බෙද වෙන්කර ඇත.

  උදාඃ- ජස්ටින් ආධිරාජයා කොන්ස්තන්තිනූපුරයේ නේපලයේ ගොඩනගා දේව ඥානයට කැපකළ ශු. සොෆියා දේවස්ථානය

### 8.3.3.3. රොමනේස් ගොඩනැඟිලි කලාව ඃ-

- මහ චාල්ස් (චාලිමේන්) අධිරාජ්‍යාගේ කාලයේ සුළු පුනරුදයක් ඇති වුව ද පසු ව දේශපාලන ගැටලු නිසා එය ඇණ හිටියේ ය.
- ක්‍රි.ව. 1000 වර්ෂයේ සිට ගොඩනැඟිලි කලාවේ මහත් වර්ධනයක් විය. පැරණි ගොඩනැඟිලි කලාව වෙනුවට නව ගොඩනැඟිලි කලාවක් බිහි විය.
- පැරණි සිද්ධස්ථාන, දේවස්ථාන සියල්ල පුනරුත්ථාපනය කර නව සැලැස්මක් ඇති කරන ලදි.
- උතුරු ඉතාලිය, ප්‍රංශය, පර්ගන්සි, ජර්මනිය වැනි ස්ථානවල ඇරඹුණු ගොඩනැඟිලි කලාව රෝමනෙක්ස් (Romanesque) ගොඩනැඟිලි කලාව ලෙස හඳුන්වන ලදි.

**රෝමනේස් ගොඩනැඟිලි කලාවේ විශේෂාංග ඃ-**

- රෝලයක හැඩැති දූනු ද, ඉතා විශාල බිත්ති ද ඒවා ශක්තිමත් කරන කුලුනු ද ගොඩනගා ඇත.
- එහි මුදුන් වහල ගලෙන් තනා ඇත. කවාකාර වහලයක් ද ඇති අතර එම වහලය දැරීමට ශක්තිමත් බිත්ති ගොඩනගා ඇත.
- දෙවන ශතවර්ෂයේ මෙම ගොඩනැඟිලි කලාව ප්‍රසිද්ධ විය.
- මෙම ගොඩනැඟිලි ක්‍රමයේ දේවස්ථාන ලොම්බාඩ් මධ්‍යම ප්‍රංශයේ, බටහිර ජර්මනියේ දැකිය හැකි ය.

### 8.3.3.4 - ගොතික් ගොඩනැගිලි කලාව

- 12 වන සියවස ආරම්භයේ දී උතුරු ප්‍රංශයේ මෙය ඇති විය.
- ගොතික් (Gothic) යන නම මෙම කලාව ප්‍රතික්ෂේප කිරිම වේ. එනම් බැසිලිකා බයිසෙන්තියානු කලා අංගය " උචිත නොවේ" යන්න වේ.
- යුරෝපය පුරා ම මෙම කලාව පැතිරිණි.

**ගොතික් ගොඩනැගිලි කලාවේ විශේෂාංගඃ-**

- අර්ධ කවාකාර ආරුක්කු වෙනුවට උල් වු ආරුක්කු භාවිත විය. එම නිසා බර ගතිය අඩු කර ගැනීමට හැකි විය.
- ගොඩනැගිල්ල තනන විට ගොතික් කලාකරුවන් ප්‍රමුඛස්ථානය දුන්නේ 'සැකිල්ල' හෙවත් 'මැස්ස' තනා ගැනිමේ කාර්යයට ය. පළමු ව අවශ්‍ය ප්‍රමාණයට කුලුනු තැනූ හ. ඉන් පසු වහල රැඳවීම සඳහා ඒවා මත මැදින් උල් වූ වටකුරු ආරුක්කු සවි කළ හ.
- ගොතික් දේව මාලිගාවේ අභ්‍යන්තර කොටස රෝම දේවස්ථානය බඳු කුලුනු පේළි දෙකකින් යුක්ත විය. එම නිසා මෙම දේවස්ථානවල බිම් පෙදෙස පුළුල් මැදි ශාලාවකට ද පටු තීරු දෙකකට ද බෙදු ඇත.
- උල් ආරුක්කු සහ මල් කවුළුව (Rose window) මෙම දේවස්ථානවල සුවිශේෂ ලක්‍ෂණයකි.
- වර්ණ විදූරු භාවිතා කිරීම, සමබරතාව ය රැකගැනිම සඳහා කොත් සවි කිරිම මෙන් ම කැටයම් භාවිත කිරිම ද ගොතික් කලාවේ සුවිශේෂ ලක්‍ෂණයි.

  උදඃ පැරීසියේ ඇති නෝත්‍රඩාම් (Notre Dame) ආසන දෙව් මැදුර ගත හැකිය.

### 8.3.3.5. පුනරුද සමයේ ගොඩනැගිලි කලාවේ විශේෂ ලක්‍ෂණ ඃ-

- ක්‍රි.ව. 14-16 සියවසේ දී ජනතාවගේ චින්තන පෙරළියක් ඇති විය. 15 වන සියවසේ ඉතාලිය, ෆ්ලොරන්ස් වැනි ස්ථානවල ද, උතුරු යුරෝපයේ ද ජනතාව පැරණි චින්තනය, අදහස්, ක්‍රම ආදියට මුල් තැන දූන්හ. එහි ප්‍රතිඵලයක් ලෙස බිහි වු ගොඩනැගිලි කලාව ග්‍රීක රෝම ගොඩනැගිලි කලාවට සම ව පැවතුණි.
- නියම පිළිවෙළට, ප්‍රමාණයට, ප්‍රතිශතයට මෙහිදි වැදගත්කමක් දෙන ලදි.
- බොහෝ කුලුනු ද, ඒවායේ ආරක්‍ෂාව සඳහා කුඩා හතරැස් කුලුනු ද, ත්‍රිකෝණකාර හැඩැති ආරුක්කු සම චතුරස්‍රාකාර ලින්ටර්, කවාකාර ඉහළ කොටස් ද එකට ගොනු වු වහල ද, බිත්ති ප්‍රතිමා ආදිය ද මෙකල ගොඩනැගිලි කලාවේ විශේෂාංග විය.
- පිලිපෝ ප්‍රනෙලචි නමැත්තා පුනරුද සමයේ ප්‍රථම ගොඩනැගිලි කලාකරුවෙක් යැයි අදහස් කෙරේ. 16 වන සියවසේ මෙම ගොඩනැගිලි කලාව ගොඩනැගිලි කලාව වෙනුවට ගොඩනඟන ලද කලාවක් සේ සලකනු ලැබේ.

### 8.3.3.6. බරොක් ගොඩනැඟිලි කලාව

- පුනරුද සමයේ ගොඩනැගිලි කලාව තවදුරටත් ඉදිරියට යමින් 17 වන සියවසේ රෝමය, ඉතාලිය වැනි රටවල 'බරොක්''ගොඩනැගිලි කලාව ඇති විය. බරොක් යනු " අලංකාර "යන අර්ථය ගෙන දේ.

**බරොක් ගොඩනැඟිලි කලාවේ විශේෂ ලක්‍ෂණ :-**

- මෙම කලාවට අනුව ගොඩනගන ලද දේවස්ථානවල අභ්‍යන්තර ප්‍රතිමාවලින් ද අලංකාර කර ඇත.
- අභ්‍යන්තර වහල ද චිත්‍ර මඟින් අලංකාර කර ඇත.
- දේවස්ථාන කලා මණ්ඩප ලෙස දර්ශනය විය.

  මෙහි ශු. සභාවේ ද, රජු ගේ ද, ජයග්‍රාහි, නව වචනාලංකාර, නාට්‍ය, මූර්ති, චිත්‍ර ආදිය දර්ශනය වේ.

## 8.3.4. කිතුනු මූර්ති කලාව

- කිතු දහම් ඉතිහාසයේ ප්‍රථම ශතවර්ෂ තුනේදී ම මෙම කලාව දැකිය නොහැකි වී යැයි පැවසිය හැකි ය.
- ක්‍රි.ව. 4 වන සියවසේ කිතු දහමට බලය ලැබුණු පසු ආරම්භ විය.
- මෙම ගොඩනැගිලි අලංකාරවත් කිරිමේ කලාව ආරම්භ විය. එනම් ගොඩනැගිලි කලාව එක් අංශයක් ලෙස පැවතුණි.
- විශේෂයෙන් ක්‍රිස්තුන් වහන්සේගේ හා ශුද්ධවන්තයන්ගේත් රූප, දොරවල් ආරක්‍ෂා කරන අරමුණින් අඹන ලදි.
- කොත් මුදුන් අලංකාරවත් කිරිමට දේව දූතයන්ය හා ශුද්ධාවන්තයන්ගේ රූප නෙළන ලදි.
- වැසි ජලය බැස යන පීලි ලෙස මිනිස් නොහොත් සත්ත්ව කටවල් වැනි සැකැස්මක් උපයෝගි කරගත් හ. යාච්ඤා ගෘහවල පැරණි හා නව ගිවිසුම් කථා ප්‍රකාශ වන රූප තිබිණි.

**මූර්ති කලාව ස්වාධීන වීම**

- ග්‍රීක පුනරුදයේ ප්‍රතිඵලයක් ලෙස කිතුනු මූර්ති කලාව ස්වාධීන කලාවක් ලෙස ලොව පුරා ප්‍රසිද්ධ විය. මෙය හඳුන්වා දෙන ලද්දේ මයිකල් ඇන්ජලෝ විසිනි.

### 8.3.4.1. මයිකල් ඇන්ජලෝගේ මූර්ති කලාව හා විශේෂාංග :-

- පියටා : ඉකුත් වු ජේසු ක්‍රිස්තුන් වහන්සේ තම මව විසින් උකුලේ හොවාගෙන සිටිනාකාරයේ දර්ශනයක් ඇත. මෙය පළිඟු ගලින් අඹන ලද එකකි. නරඹන්නන්ගේ සිත් ඇදගන්නා ආකාරයට තාත්ත්වික ස්වරූපයෙන් අඹා ඇත.
- ආරම්භයේ දී මැටි, මාබල් ආදියෙන් අඹන ලද ප්‍රතිමා පසු ව රන්, රිදී, තඹ වැනි ලෝහවලින් අඹන ලදි.
- දාවිත් රජුගේ ප්‍රතිමාව මොසෙස්ගේ ප්‍රතිමාව මෙතුමාගේ චිත්‍රවලට නිදසුන් ලෙස දැක්විය හැකි ය.
- එරාස් මෝස්ගේ චින්තනයේ ප්‍රතිඵලයක් ලෙස චිත්‍ර කලාවට බලපෑම් එල්ල විය.

### 8.3.4.2. ලොරෙන්සෝ බර්නිනී **(Lorenzo Bernini)** (ක්‍රි.ව. 1598-1680)

- **බරොක් සම්ප්‍රදායයෙන් ගොඩනැගුණු බර්නිනී නිර්මාණ සුප්‍රද්ධ ඒවා ය. එම නිර්මාණ පහත සඳහන් වේ.**
  - රෝමයේ ශාන්ත පීතර ( ශුඃ පේදුරු) බැසිලිකාවේ පූජාසනයට ඉහළින් ගොඩනඟන ලද ලෝකඩ උඩුවියන.
  - ශාන්ත පීතර බැසිලිකා චතුරස්‍රය වටා තනා ඇති මහ කුලුනු පේළි දෙක සහ චතුරස්‍රය
  - භාවනාවේ සාන්ත තෙරේසා යනුවෙන් හැඳින්වෙන පිළිමය. මෙම පිළිමය කලා හා ආධ්‍යාත්මික වටිනාකමකින් යුක්ත ය.
- **මූර්ති කලාකරුවන් අතර සුප්‍රසිද්ධ අය ලෙස පහත සඳහන් අය නම් කළ හැකි ය.**

ඩොනාටෙලෝ, වෙරොච්යෝ, ලියනාඩෝ ඩාවින්චි

## 8.3.5. චිත්‍ර කලාව

- කිතුනු දහම වර්ධනය වීමත් සමඟ අනිකුත් ආගමිකයන්ගෙන් විසින් ඔවුන්ට පීඩා එල්ල විය. 2 වන සියවස වන තෙක් මොවුන් දුෂ්කරතාවයට ම මුහුණ දෙන ලදි. මේ නිසා මොවුන් සොහොන් ගුහාවල දිව්‍ය සත්ප්‍රසාද මෙහෙයන් පවත්වන ලදි. කිතුනුවන්ට පමණක් වටහාගත හැකි ආකාරයේ රහසිගත කිතුනු සංකේත යොදා ගත් හ. මෙලෙස දකින ලද චිත්‍ර පසුකාලීනව ක්‍රිස්තු චිත්‍රයන් ලෙස හඳුනා ගත් හ. උමං සොහොන්වල අඳින ලද ඒවා නිසා," උමං චිත්‍ර " යැයි හඳුන්වන ලදි. මුල් කිතුනුවන් විසින් භාවිත කරන ලද සංකේත කිහිපයක් පහත දැක්වෙන ලදි.

  මාළු - ක්‍රිස්තු (IX THUS)

  පරෙවියා - ආත්මික

  මොනරා - සදාතන

  කරේ එළුවකු තබාගෙන සිටින තරුණයෙක් - යහපත් එඬේරා

  අත් ඔසවාගෙන සිටින මිනිසෙක් - යාච්ඤාවේ දී දේව වචනය සමඟ සම්බන්ධතා ඇති කර ගැනිම.

- 1931 දී රෝමයෙන් සොයා ගන්නා ලද ඩොමිටිල්ලා සොහොනෙහි බිත්තිවල අඳින ලද චිත්‍ර,මූර්ති කිහිපයක් දැකිය හැකි විය. එහි ශු. බයිබලයේ සිදුවීම් හා කථා ඇඳ තිබිණි.

උදා : - ආදම් සහ ඒව

- මෝසෙස් ගල්පරයෙන් වතුර ඒමට සැලැස්වීම
- ජෝනා මාළුවාගේ බඩේ සිට බේරීම ( ක්‍රිස්තුන් වහන්සේගේ ඉකුත් වීමටත් උත්ථානයට ත් අතර මැද කාලය)
- සිංහයාගෙන් දානියෙල් ආරක්ෂා වීම
- ක්‍රිස්තුන් වහන්සේ වහන්ස් හා ආපෝස්තුලුවරු

කිතුනුවන්ගේ සංකේතය වන කුරුසිය මෙහි දී ප්‍රතික්ෂෙප විය. ඒ වෙනුවට නැංගුරමක් උපයෝගී කර ගන්නා ලදි. මේවා මුල් කිතුනුවන් ගත කළ දුක්බර ජීවිතයේ ප්‍රතිබිම්බයක් විය.

### 8.3.5.1. මොසැයික් චිත්‍රකලාව

- බිසෙන්තියානු ගොඩනැගිලි කාලවේ එක් අංගයක් ලෙස මොසැයික් චිත්‍ර කලාව ද හඳුන්වා දෙන ලදි. මෙය වීදුරු චිත්‍ර කලාව යැයි හඳුන්වයි. මේවා කුඩා වීදුරු කැබලි වලින් නිර්මාණය කරන ලද ඒවා වේ. නිවෙස්වල ද දේවස්ථාන වල ද වහලවල සවිකර ඇති බිත්තිවල ද, පොලව ආදිය අලංකාරවත් කිරීමට ද මෙම ක්‍රමය උපයෝගී කර ගන්නා ලදි.

චිත්‍ර අලංකාරවත් ව ආලෝකවත් ව තිබිණි. එහෙත් ඒවා කුඩා කාණ්ණාඩි කැබලි වලින් නිර්මාණය කරන ලද ඒවා නිසා චිත්‍ර රූප රළු ව ම දැකිය හැකි විය. ඇඳුම්වල රැළි දැකිය හැකි විය.

- මේවායේ ආධ්‍යාත්මික ස්වභාවය හා භක්තිය දැකිය හැකි වූ අතර පිරිමින්ගේ සම්පූර්ණ ස්වභාවය දැකිය හැකි විය. චිත්‍රවල ස්වාභාවිකත්වය මෙන් ම ගම්භීර ස්වභාවයට ප්‍රථම ස්ථානය ලැබිණි.

### 8.3.5.2. අයිකොන් (Icon) චිත්‍ර කලාව :-

- මොසැයික් චිත්‍ර කලාව සමඟ ඊට සමගාමී පින්තාරු චිත්‍ර කලා ක්‍රමයක් ඇති විය. මෙය ද බින්සන්තියානු චිත්‍ර කලාවේ අංගයක් ලෙස සලකන ලදී. මෙහි පින්තූර පාට කර කුඩා ලී කැබලිවල අඳිනු ලැබ ඇත.
- ක්‍රිස්තුන් වහන්සේ, මරිය තුමී, ශුද්ධවන්තයන්ගේ රූප කුඩා ලී කැබලිවල පිටපත් කරනු ලැබිණි.
- සියලු ස්ථානවලට ගෙන යා හැකි චිත්‍ර ග්‍රීක භාෂාවේ අයිකොන් (Icon) යැයි හඳුන්වනු ලැබේ. කුඩා ලී කැබලිවල තීන්ත තවරා අඳින ලද මෙම චිත්‍රවල පසුබිම සැම විට ම රන්වන් පාට වේ.

### 8.3.5.3. වර්ණ වීදුරු කලාව

- ක්‍රි.ව 12 වන ශත වර්ෂයේ උතුරු ප්‍රංශයේ ගොතික් ක්‍රමයේ ගොඩනැගිලි කලාව බිහි වු විට එහි විශිෂ්ට අංශයක් ලෙස වර්ණ වීදුරු කලාව (Stained Glass) බිහි විය.
- විශාල ජනේල වල තිබු වීදුරු වල මෙම චිත්‍ර ඇඳ තිබුණි.
- මෙම චිත්‍ර වල විශිෂ්ට ස්වභාවය වන්නේ වීදුරුව තුළට පාට ඇතුලත් කර ඇඳ තිබීම වේ. මේවා මොසැයික් චිත්‍ර තරම් පහසු නොවේ.
- වීදුරුව තුළට පාට, සායම් ඇතුළත් කරන මෙම ක්‍රමය ගොතික් චිත්‍ර කලාකරුවන් රහසින් තබාගත් නිසා කාලයාගේ ඇවෑවෙන් එම පැරණි ක්‍රමය නැති වී ගියේය. නවීන වර්ණ වීදුරු චිත්‍ර කලාව බිහි වු නමුත් පැරණි ක්‍රමයට සමාන නොවේ.

### 8.3.5.4. ගියොට්ටෝ ඩී බොර්ඩෝනේ (Giotto di Bordone) ( ක්‍රි.ව. 1266 -1377)

- "වර්තමාන චිත්‍ර කලාවේ පියා " යැයි ගියොට්ටෝ විරුදාවලිය ලැබීය.
- ෆ්‍රෙස්කෝ ( Fresco) නමැත්තා නව බිත්තිවල සිමෙන්ති බදාම වියැළීමට පෙර චිත්‍ර ඇඳීමේ ක්‍රමය සොයා ගත්තේ ය.
- ඉතාලියේ ගොතික් ක්‍රමයේ දේවස්ථාන නොතිබිණි. එම නිසා රෝමනෙස්ක් නැමැති මධ්‍යකාලීන රෝම දේවස්ථානවල ඝන බිත්ති චිත්‍ර ඇන්දේ ය.

- මොහුගේ ෆ්‍රෙස්කො (Fresco) චිත්‍ර අතුරින් ප්‍රසිද්ධ චිත්‍රයක් ෆ්ලොරන්ස් නගරයේ ඇති ශු. ෆ්‍රැන්සිස් අසීසි දේවස්ථානයේ බිත්තිවල දැකිය හැකි ය.
- එම රූපවල පහත සඳහන් ලක්ෂණ දැකිය හැකි ය.
    - තාත්ත්වික මිනිසුන්, ගස්-කොළන් ආදියෙන් පසුබිම අලංකාරවත් කරන ලදි.
    - විවිධ වර්ණ පිහාටු ඇති පක්ෂීන් ඇඳ ස්වාභාවික රසය ඇති කර ඇත. පාදුවාහි දේවස්ථානයක ගියෙට්ටෝ විසින් ඇඳිනු ලැබ ඇති ක්‍රිස්තු චරිත කථා දර්ශන ඉතා තාත්ත්වික ව නිර්මාණය කර ඇත.

### 8.3.5.5. පුනරුද සමයේ චිත්‍ර කලාව

- ක්‍රි.ව.13 වන ශතවර්ෂයේ අවසාන කාලයේ යුරෝපයේ පුනරුද කාලය විය. මෙම කාලයේ ජීවත් වූ කලාකරුවෝ පුනරුද කාලයේ කලාකරුවන් යැයි හඳුන්වනු ලැබූ හ.
- ඉතාලියේ ෆ්ලොරන්ස් නගරය කේන්ද්‍ර කර ගනිමින් සිදු වූ හෙයින් මෙම කලාව පාරම්පරික 'ෆ්ලෝරන්ස් කලා සම්ප්‍රදය' යැයි හඳුන්වනු ලැබීය.
- මෙම කාලයේ චිත්‍ර ශිල්පී පේට්ටි, සෙල්ලි, පියාටෝ, ඩක්සියෝ, වසාරි මසක්කියෝ පුරුෂ ලිව්, මයිකල් ආන්ජලෝ හා ලියනාඩෝ ඩා වින්චි වැනි අය සඳහන් වෙති.

### (අ) ලෙයනාර්ඩෝ ඩා වින්චි ( Leonardo da Vinci)

- මෙතුමා නවීන විද්‍යා තාක්ෂණ උපකරණ සකස් කිරිමට පෙරමුණ ගත් බව පිළිගත හැකි ය. ඒ මන්දයත් මෝටර් රථ, අහස් යානා, පැරෂුට්, හෙලිකොප්ටර් වැනි දෑ සොයා ගැනීමට පෙර චිත්‍රයක් ලෙස ඇන්දේ ය. මිනිස් ශරීරයේ කොටස් නිරීක්ෂණය කොට අඳින ලද ඒවා ය.
- මොහුගේ චිත්‍ර 7000කට වැඩි ගණනක් ඇත.
- මෙතුමා ' දෙවීක පින්තාරු කරුවෙක්' ' (Divine Painter) යැයි හඳුන්වනු ලබයි. ග්‍රාබ්‍රියෙල් දූතයා මංගලම් කිමේ සිද්ධිය තාත්ත්වික ව අඳින ලද්දකි.
- 1495 දී සාන්ත මරියා කන්‍යාරාමයේ බිත්තියෙහි අඳින ලද රාත්‍රි භෝජනය චිත්‍රය වැදගත් වේ.
- ලියනාඩෝ ඩා වින්චි විසින් අඳින ලද 'මොනාලිසා' චිත්‍රය ක්‍රිස්තියානි අරමුණක් සඳහා නිර්මාණය කර නැතත්, එය ලෝ ප්‍රකට චිත්‍රයකි.

### (ආ) මයිකල් ආන්ජලෝ ( ක්‍රි.ව. 1475 - 1564)

- මොහු ලෝ ප්‍රකට මූර්ති කරුවකු මෙන් ම චිත්‍ර ශිල්පියෙක් ද කවියෙක් ද හා ගෘහනිර්මාණ ශිල්පියෙක් ද වෙයි.
- ක්‍රි.ව. 1508 සිස්ටයින් දේවස්ථානයේ (Sistine Chapel) එනම් ශුද්ධෝත්තම පිය පෞද්ගලික දේවස්ථානයේ චිත්‍ර ඉතා වැදගත් වේ. මෙහි අඳින ලද චිත්‍ර අතුරින් ලෝක මැවීම ( The Creation of Adam) අවසාන විනිශ්චය සඳහන් කළ යුතුය.
- ලෝකය මැවීමේ චිත්‍රයේ දෙවියන් වහන්ස තම අත දිගු කර ආදාම්යේ දිගු කළ අතට ප්‍රාණය දෙන දර්ශනය ඉතා තාත්ත්වික අන්දමින් ඇත.
- අවසාන විනිශ්චයේ චිත්‍රය දෙස බලන්නාගේ සිතේ කැලඹෙන ගතියක් ඇති කරන අතර එහි ඇඳ ඇති මිනිස් ඉරියවු නොසන්සුන්තාවකින් යුතු ව සිටින ආකාරයට ඇත.

**( ඇ) රෆායෙල් සන්සියෝ ( ක්‍රි.ව. 1483- 1520)**

- 1504 දී මොහු විසින් අඳින ලද කන්‍ය මරියාවගේ විවාහ දර්ශනය කන්‍යා මරියා හා ශුද්ධ වූ දරුවන් වැනි අයගේ චිත්‍ර විශිෂ්ටත්වයෙන් ඉහළ ය.
- දෙවන ජුලියස් ශුද්ධෝත්තම පියාණන්ගේ ඉල්ලීම අනුව රාජකාරි නිවසේ අඳින ලද චිත්‍ර ලෝකයේ සුප්‍රසිද්ධ ඒවා ය.
- ෆ්‍රෙස්කෝ (Frasco) යන සිමෙන්ති තවරන ලද නව බදම මත මෙම චිත්‍ර අඳින ලදී.
- ඉතාලි ජනතාව අතර ජනප්‍රිය වී ඇති මැඩෝනා ( Madona) දේව මාතාවගේ චිත්‍රයේ නිර්මාතෘවරයා වුයේ රෆායල් ය.
- රෆායෙල්ගේ චිත්‍ර අතුරින් ඉතා ආශ්චර්යවත් ප්‍රබල චිත්‍රයක් ලෙස "ආසන ගත අප ස්වාමි දූ" (Madonna of the chair) චිත්‍රය සඳහන් කළ හැකි ය.
- මොහුගේ චිත්‍රවල ඩා වින්චි හා මයිකල් ඇන්ජලෝ ආදීන්ගේ ආභාසය දැකිය හැකි ය.

**යෝජිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ක්‍රිස්තියානි ශිෂ්ටාචාරයේ වර්ධනයට බලපෑම් කළ කිතුනු සාහිත්‍ය ග්‍රන්ථ හා ඒවා නිර්මාණය කිරීමේ දී දායකත්වය ලබා දුන් ලේඛකයන් ලැයිස්තුවක් මඟින් ප්‍රකාශ කරන්න.
- ක්‍රිස්තියානි දේවස්ථානවල සැකැස්ම කාලයෙන් කාලයට ඇති වූ වෙනස්කම් අන්තර් ග්‍රහණය කර දියුණු වූ ආකාරය පැහැදිලි කරන්න.
- කිතුනු ජනවන්දනා ක්‍රමයේ ග්‍රෙගෝරියන් සංගීත ක්‍රමය ඇති කළ බලපෑම් ගවේෂණය කරන්න.
- මයිකල් ඇන්ජලෝ ලියනාඩෝ ඩාවින්චි රෆායෙල් සන්සියෝ වැනි අය ක්‍රිස්තියානි කලාවට දැක් වූ දායකත්වය අගයන්න.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. ඇම්. ඇස්. ජේසුදාස් තංගසාමි ඇම්. ඒ. බි. ටි. **ශුද්ධ වූ සභා ඉතිහාසය,** නංසිල් මුද්‍රණාලයය.
2. **අබ ගස,** අමල උදයම්, උප්පුවෙලි, ත්‍රිකුණාමලය.
3. ගරු ජේසුදාසන් (නි.ම.නි.), **මුහුන්,** අමල උදයම්, උප්පුවෙලි, ත්‍රිකුණාමලය.
4.. NihalAbeyasingha, **History of Christianity**, S.Godage& Brothers (Pvt) Ltd, Colombo - 10
5. **ක්‍රිස්තු ශිෂ්ටාචාරය**, 13 ශ්‍රේණිය, ගුරු මාර්ගෝපදේශය, 2009
6. ඥානමුත්තු පිලේන්දිරන්, **ක්‍රිස්තු ශිෂ්ටාචාරය,** කතෝලික ශිෂ්‍ය එකමුතුව, යාපනය, 2008

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | **9.0** | **:** | **ආසියාතික රටවල කිතුදහමේ ව්‍යාප්තියේ ඉතිහාසය ඉගෙනීම මඟින් සමාජීය, සංස්කෘතික හා ආගමික උන්නතිය සඳහා තම දිවි කැප කරයි.** |
| **නිපුණතා මට්ටම** | **9.1** | **:** | ආසියාතික රටවල කිතුදහමේ ආරම්භය පිළිබඳ ඉතිහාසය අවබෝධ කර ගනිමින් නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | | **:** | 12 |

**ඉගෙනුම් පල**

- ආසියාතික රටවල කිතුදහමේ ව්‍යාප්තිය පිළිබඳ කරුණු රැස් කරයි.
- ආරම්භක යුගයේ දී ම ආසියාතික රටවල කිතුදහම් ව්‍යාප්ත වූ බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- සුබාරංචියේ අන් අය වෙත රැගෙන යයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ක්‍රියාශීලී ව කටයුතු කරයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට මඟ පෙන්වීමක් :-**

- කිතු දහම ආසියානු ආගම කි. එය ආසියානු මහද්වීපයේ විශේෂයෙන් නිරිත දිග ආසියාවේ මුහුදු බඩ ප්‍රදේශවල පිහිටි පලස්තීනයේ ආරම්භ විය.
- අපොස්තුලුවරයෙකු වන තෝමස් තුමා විසින් කිතු දහම නැගෙනහිර දෙසට විශේෂයෙන් ඉන්දියාවට ගෙන යන ලදී.
- ආසියානු රටවල් අතුරින් අර්මේනියාව කිතු දහම තම රටේ ප්‍රධාන ආගමය ලෙස පිළිගත් පළමු රට යි.
- ක්‍රි.ව. 431 දී රැස් වූ එපීස මන්ත්‍රණ සභාවෙන් පසු බිහි වූ නෙස්ටෝරියානු වේද භේද කිතුනුවෝ, ක්‍රිස්තියානි ආගම ඉන්දියාව, ලංකාව, මොංගෝලියාව වැනි රටවලටත් චීනයටත් රැගෙන ගිය හ.
- පුනරුදය සමයේ කිතුදහම නැගෙනහිර රටවලට ව්‍යාප්ත කිරීමට උත්සාහ කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස 1948 දී පෘතුගීසි නැවියෙක් වූ වස්කෝද ගාමාගේ නායකත්වයෙන් ඉන්දියාවට ගිය ෆ්‍රැන්සිස්කානු නිකායට අයත් ආත්මික පියතුමා දහම් දේශනා කළේ ය. ඒ සමඟම දොමිනිකානු නිකාය, ජේසු නිකාය , අගොස්තීනු නිකාය, වැනි පැවිදි නිකායන් ධර්මදූත සේවයේ නියැලුණා හ.
- ක්‍රිස්තියානි ප්‍රතිසංස්කරණයෙන් පසු ශු. සභාවේ ඇති වූ පුනරුදයේ ප්‍රතිපලයක් ලෙස පෙරදිග රටවල් වන චීනය, කොරියාව, ජපානය, පිලිපීනය, ඉන්දියාව, ලංකාව වැනි රටවල ධර්මදූත සේවය දක්නට ලැබිණි.

**ඉන්දියාවේ ක්‍රිස්තියානි දහම් ව්‍යාප්තිය**

ඉන්දියානු ජනතාව, ජනගහනයෙන් හින්දු, මුස්ලිම්වරුන්ට අමතරව කිතුනුවෝ ද වෙති.

1. පළමු සියවසේ දී (ක්‍රි.ව. 52 දී ) අපෝස්තුලුවරයකු වන ශු. තෝමස් තුමා කිතු දහම රැගෙන ආවේ ය. තෝමස් දකුණු ඉන්දියාවේ මලබාර් මුහුද අසබඩ ඇති කිරංගනූර් ප්‍රදේශයට පැමිණියේ ය. එහි කිතුනු සභා පිහිටුවා සුවිශේෂය දේශනා කර බොහෝ ඉන්දීයයන්ගේ සිත් හරවා විශ්වාසය කළ අයට බෞතීස්මය ලබා දුන්නේ ය.
2. ක්‍රි.ව. 345 දී කානාන් රටේ තෝමස් තුමාගේ නායකත්වය යටතේ 300-400ක් පමණ පවුල් කිරංගනූර් තොටුපළට පැමිණ, එහි නගරයක් හා දේවස්ථානයක් ගොඩ නැගූ හ.

3. 9 වන සියවසේ 823 මහ සාබොරි, ස්ප්‍රිසෝ යන අය පර්සියාවේ සිට ගෙනෙනු ලැබූ හ.

4. 16 වන සියවසේ පෘතුගීසි ධර්මදූතවරයන් මඟින් ගෙනෙනු ලැබූ හ.

5. "ලොව පුරා ගොස් සුවිශේෂය දේශනා කරන්න." යන ක්‍රිස්තුන් වහන්සේගේ ඉල්ලීම පරිදි අපොස්තුලුවරුන් විවිධ රටවලට ගොස් දහම් දේශනා කර ජනතාව ක්‍රිස්තියානීන් කළ හ.

- විවිධ කාල වකවනුවල විවිධ රටවලින් පැමිණි ධර්මදූතවරු ඉන්දියාවට කිතුදහම රැගෙන ආ හ.
- ශු. තෝමස් තුමා විසින් ඉන්දියාවට ගෙන එනු ලැබූ ක්‍රිස්තියානිය, "සිරියා කිතුනුවන්" නැතහොත් "තෝමස් තුමාගේ කිතුනුවන්" යැයි හඳුන්වනු ලැබූ හ.
- ඔවුහු නැගෙනහිර සිරියා කිතුනුවන් සමඟ ජනවන්දනා ක්‍රම, ආධ්‍යාත්මික, දේව ධාර්මික විනය නීති යන ඒවායේ ඉතා සමීප සබඳතාවක් පවත්වාගෙන ගිය හ. ඔවුන් ගේ රදගුරුවරු නැගෙනහිර සිරියා සභා පියවරුන් විසින් පත් කරනු ලැබු හ.
- 16 වන සියවසේ ආරම්භයේ ඉන්දියාවට පැමිණි පෘතුගීසි කිතුනු ධර්මදූතවරු ඔවුන්ගේ අදහස්වලින් ද ජනවන්දනා ක්‍රමවල ද වෙනස හැඳින, ඔවුන් නෙස්ටොරියානු කිතුනුවන් යැයි සැක කළෝ ය.
- එබැවින් පෘතුගීසිහු තම 'පද්‍රෝ ආදෝ' අධිකාරිය යොදවා සියලු ම සිරියා කිතුනුවන් ශුද්ධෝත්තම පිය පාලනය යටතට පැමිණිය යුතු යැයි ලතින් සාම්ප්‍රදායික ජනවන්දනා ක්‍රම අනුගමනය කළ යුතු යැයි ද බල කළ හ. එහි ප්‍රතිඵලයක් ලෙස සිරියා කිතුනුවන් අතර බෙදීම් ඇති විය. ඒ මගින් බිහි වූ ශුද්ධ වූ සභා තුන වර්තමාන ඉන්දියානු කතෝලික සභාවේ සාමාජිකත්වය දරයි. ඒවා පිළිවෙළින්

    1. සීරෝ මලබාර් සභාව
    2. සීරෝ මලංකාර සභාව
    3. ලතින් සභාව

## 1. සීරෝ මලබාර් සභාව

- ශුද්ධෝත්තම පියතුමන්ගේ මග පෙන්වීම සඳහා ලතින් වන්දනා ක්‍රම පිළිගැනීම ප්‍රතික්ෂේප කළ අය එක් වී සිරියා කතෝලික සභාව ස්ථාපනය කළ හ. මොවුන් 19 වන සියවසේ අග භාගයේ සීරෝ මලබාර් සභාව යන නාමය ලබා ගත් හ.
- මෙම සභාව කතෝලික සභාව සමඟ සිටිමින් ස්වාධීන ව ක්‍රියාත්මක විය හැකි සිරියා සම්ප්‍රදායක් බවට පත් විය.
- 1992 දී නීති සම්පාදනය සම්පූර්ණ කිරීම, ශ්‍රේෂ්ඨාධිකරණ සේවාවට අයත් සියල්ල ලබා ගෙන සම්පූර්ණ සභාවක් බවට පත්විය.
- මෙහි මූලාසනය අපරදිග සභාවේ සභා පියවරුන්ගේ ක්‍රමයට සමාන ව ද සංගමයක සැලැස්මකට අනුව ද පිහිටා ඇත.
- වර්තමානයේ ඔවුන් අතර නැවතත් සිරියා වන්දනා ක්‍රම ඇතුළත් විය යුතුය යන අදහස් වර්ධනය වෙමින් පවතී.
- මෙය තෝමස් තුමන්ගේ ක්‍රිස්තියානීන්ගේ සභාවේ ස්වාධීනව ක්‍රියාත්මක වන මහ සභාවක් ලෙස පවතී.

## 2. සීරෝ මලංකාර් සභාව

- ශුද්ධෝත්තම පිය මග පෙන්වීමත් ලතින් වන්දනා ක්‍රමයේ පිළිගැනීම ප්‍රතික්ෂේප කර සිරියා කිතුනුවන්ගේ නායකත්වය යටතේ තව දුරටත් ක්‍රියාත්මක වූ "ජාකෝ බයිට්ස්" (Jacobites) සභාව යැයි හඳුන්වනු ලැබී ය.

- මොවුන් සඳහා රදගුරුවරු අන්තියෝකයේ සභා පියවරුන්ගෙන් පත් කරනු ලබති. වසර ගණනාවක් ඔවුනට රදගුරුවරයෙක් නොසිටියේ ය. එය මහත් ප්‍රශ්නයක් විය.

3. **ලතින් සභාව**

- ශුද්ධෝත්තම පිය මඟ පෙන්වීම යටතේ ලතින් ජනවන්දනා ක්‍රමය පිළිගත් අය "ලතින් කතෝලික සභාව" යැයි හඳුන්වනු ලැබූ හ.

- ඉන්දියාවේ ඇති සියලු ම සභාවන් අතුරින් වැඩි සාමාජික පිරිසක් ඇති මුළු ඉන්දියාව පුරා ම පැතිර ගොස් ඇති මහා සභාව මෙය වේ. වර්තමානයේ රැකියා ප්‍රශ්න නිසා මෙම සභාවේ සාමාජිකයෝ ඉන්දියාවේ සෑම ප්‍රදේශයකම පැතිර සිටිති.

- මෙම සභාවේ මූලික "සැකැස්ම" මීසම ලෙස හැඳින්වේ. මීසමේ නායකයා හා ආධ්‍යාත්මික මඟ පෙන්වන්නා මීසම් පාලක පියතුමා ය. මීසම් කිහිපයක් එක් වී පදවියක් ගොඩනැගේ එම පදවියේ නායකයා රදගුරුතුමා ය.

- 1988 සිට 2 වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියාණන්ගේ මඟ පෙන්වීම යටතේ ඉන්දියානු ලතින් කතෝලික සභාව සඳහා කතෝලික රදගුරු මඩුල්ලක් පත් කරන ලදි.

- මෙම සභාවේ "වන්දනා ක්‍රමය" පෙරදිග සාම්ප්‍රදායික ක්‍රමවලට අනුකූල වේ. මොවුහු වන්දනාවටත් භක්ති අභ්‍යාසයන්ටත් මංගල්‍ය වලටත් මුල් තැන ගනී.

- මොවුන්ගේ ජනවන්දනාව තුළ දිව්‍ය පූජාව ප්‍රමුඛ ස්ථානයක් ගන්නා අතර සාන්තුවර බැතිය, වන්දනා ගමන් ආදිය ප්‍රධාන තැනක් ගනි.

- 2 වන වතිකාන මන්ත්‍රණ සභාවෙන් පසු ඉන්දියානු ලතින් සභාව එහි වන්දනා ක්‍රමවල දී හා අනෙකුත් කරුණුවල දී ඉන්දියානු සංස්කෘතියට අනුව ඒවා ඉටු කිරීමට අවධානය යොමු කළේ ය. වර්තමානයේ මෙම සේවාව ඉන්දියානු දේව ධර්මයටත් පූජකවරුන් පැවිදි ජීවිත ක්‍රම ආදියටත් ධර්මදූත සේවාවටත් බලපෑම් එල්ල කොට ඇත. තව ද ඉන්දියාවේ අධ්‍යාපනය වෛද්‍ය සෞඛ්‍ය වැනි මූලික පහසුකම්වලට සභාව සහය වෙයි.

- මෙම සභාවන් තුනෙහි ම (ලතින් සභාව, සීරෝ මලබාර් සභාව, සීරෝ මලංකාර් සභාව) ආරම්භය වන්දනා ක්‍රම ආදිය දෙස බලන කල ඒවා එකිනෙකට වෙනස්, තමන් ම නිදහස් ව ක්‍රියාත්මක වී ශු.සභාවේ ඒකත්වය සුරක්ෂිත කරනු දැකිය හැකි ය.

**වෛදික සිරියා සභා**

- 16 වන සියවස ආරම්භයේ පෘතුගීසි ධර්මදූතවරුන් ඉන්දියාවට පැමිණි විට එහි සිරියා ශු. සභාව හා කිට්ටු සබඳතාවක් පවත්වාගෙන ගිය තෝමස් තුමාගේ කිතුනුවන් සිටිනු දක්නා ලදි.

- එබැවින් පෘතුගීසින් තම "පදෝ ආදෝ" බලය උපයෝගී කරගෙන ඔවුන් ශුද්ධෝත්තම පිය නායකත්වය යටතට, මඟ පෙන්වීම යටතට පැමිණෙන ලෙස කැඳවූ හ.

- බොහෝ දෙනෙක් එම කැඳවීම පිළිගත් හ. එහෙත් ඔවුන් සීරෝ මලබාර් සභිකයන් ලෙසත් සීරෝ මලංකාර් සභාව ලෙස ත් හැඳින්වූ නමුත් එම ආරාධනය පිළිගැනීම ප්‍රතික්ෂේප කළ අය එක්වී, 1653 දී මටන්සේරි නම් ස්ථානයේ තමන්ට පාලන නිදහස ඉල්ලා ඇති කළ, "කූණන් කුරුසියේ නියෝගය" යන සට්ටනයෙන් පසු, බෙදී ගොස් "වෛදික සිරියා ශු.සභාව" ඇති කළ හ.

- වසර ගණනාවක් ඔවුනට නායකයෙකු හෝ රදගුරුවරයෙක් හෝ නොසිටියේ බොහෝ පෙරදිග සභාවන්ට සහය පතා අයැදුම් කළ ද. කිසිවෙකුත් ඉදිරිපත් නොවූ හ.

- අවසානයේ සිරියා අන්තියෝකයේ සභා පියවරු සහය වූ හ. එම සභා 1912 තෙක් අන්තියෝකයේ සභා පියවරුන්ගේ ඍජු අධිකාරිත්වය යටතේ පැවතිණි.

- එහි ප්‍රතිඵලයක් ලෙස වසර ගණනාවක් විවිධ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවිම. දිගු කලක් පැවති ගැටලුවක් විය. පසු 1912 දී මෙය සභා දෙකකට බෙදී ගියේ ය. ඒවා නම්

  1. මලංකාර් සිරියා වෛදික සභාව (ජාකොබයිට්ස්වරු)
  2. මලංකාර් වෛදික

**1. මලංකාර් සිරියා වෛදික සභාව (ජාකොබයිට්ස්වරු)**

මෙම සභාව අන්තියෝකියේ සභාපියවරුන් යටතේ ක්‍රියාත්මක වේ. එහි සාමාජිකයෝ ලොව සෑම තැනක ම පැතිරී ජීවත් වෙති. වර්තමාන ඉන්දියාවේ මිලියන 1.4 ජනතාව සාමාජිකයෝ වෙති.

**2. මලංකාර් වෛදික සිරියා සභාව (පෙරදිග කතෝලිකයෝ)**

මෙම සභාව පෙරදිග කතෝලිකයන් විසින් පාලනය කරන ලදි. එහි ක්‍රියාකාරීත්වය 1934 දී නීති සභාවට අනුව ක්‍රියාත්මක වේ. ඒ අනුව මලංකාර් සිරියා කිතුනු පෙරමුණ විසින් මඟ පෙන්වනු ලැබේ. එම පෙරමුණ මඟින් තෝරා ගනු ලබන රදගුරුතුමා එහි නායකයා ලෙස සිටියි. වර්තමාන ඉන්දියාවේ මෙම ශු. සභාවේ දිස්ත්‍රික්ක දෙකක මිලියන 2.6 ක විශ්වාසකයෝ සිටිති.

**මාර්තෝමස් ශු. සභාව**

- මෙම සභාව ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණය සමඟ ඉන්දියාවට පැමිණෙයි. 1806 දී බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා ඇන්ගලිකානු පූජකවරයකුව ඉන්දියාවේ ඇති පුරාතන තෝමස් තුමාගේ දේවස්ථානය පිළිබඳ ගවේෂණය කිරීමට යැවී ය.
- කේරළාවට පැමිණී අංගිලිකානු ධර්මදූතවරුනටත් තෝමස් තුමාගේ ක්‍රිස්තියානිවරුනුත් අතර යහපත් සබඳතාවක් ඇති විය.
- මෙහි ප්‍රතිඵලයක් ලෙස දෙදෙනා ම එක් වී කෝට්ටය යම් ප්‍රදේශයේ දේවධාර්මික සෙමනේරියක් ආරම්භ කළෝ ය. එහෙත් ඇංගලිකන් ධර්මදූතවරුන් තම ප්‍රොතෙස්තන්ත භේදය පූජක සිසුන් මත පැටවීම ආරම්භ වූ විගස ම මලංකාර සභිකයෝ ඇංග්ලිකානු සභාව සමඟ තම සබඳතාව බිඳ ගත් හ. මෙය මොවුන්ගේ සභාවේ බෙදීමට හේතු විය.
- එහෙත් කුඩා කණ්ඩායමක් තම සභාව අතර, ඇංගලිකානු සභාව සමඟ මුළුමනින් ම එක් වූහ.
- තවත් විශාල කොටසක් ඔවුන්ට ප්‍රතිසංස්කරණයක් අත්‍යවශ්‍ය බව පවසා පැරණි මලංකාර් වෛදික සභාවේ තවදුරටත් සිටිය හ.
- වෙනත් කණ්ඩායමක් තම සභාවේ වන්දනාවටත්, ජීවිතයටත් මහත් ප්‍රතිසංස්කරණයක් ඇති කිරීමට පටන් ගත් හ. වසර 50ක් මුළුල්ලේ සභාව තුළ අමනාපකම් ඇති වී ඔවුහු 1886 දී මලංකාර සභාවෙන් පිට වී "මාර් තෝමස් සභාව" යැයි වෙනත් සභාවක් ස්ථාපනය කළෝ ය. අද මෙම සභාවේ මිලියනයක පමණ ජනතාවක් සාමාජිකත්වය ගෙන ඇත.
- ක්‍රි.ව. 1706 දී ජර්මන් ලතරානු සභාව මුලින් ම ඉන්දියාවට පැමිණි ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරණ සභාව වේ. ඉන්පසු 18 වන 19 වන සියවස්වල අනෙකුත් බොහෝ ප්‍රොතෙස්තන්ත සභා ඉන්දියාවට පැමිණිහ. (ඒවා නම් :- ඇංගලිකානු සභාව, මෙතොදිස්ත සභාව, බැප්ටිස්ට් සභාව, ප්‍රෙස්බෙටේරියන් සභාව, උතුරු ඉන්දියානු සභාව, දකුණු ඉන්දියානු සභාව, ගැලවීමේ හමුදාව, පෙන්තකොස්ත සභාව ආදිය යි.)

### 9.1.2. - චීනයේ කිතු දහම

- චීනයේ කිතු දහම 16 වන සියවසෙන් පසු පැතිර ගියේ ය.
- චීනයේ ධර්ම දේශනා කිරීමේ සේවයේ ප්‍රධානත්වය ගෙන කටයුතු කළේ ඉතාලියේ ජේසු නිකායික පූජකවරයකු වන මතෙඕ රිචී පියතුමා ය. එතුමා ක්‍රි.ව. 1552 දී උපත ලැබී ය.
- ක්‍රි.ව. 1583 චීනයේ ධර්මදූත සේවය කිරීමට චීන බලධාරීන්ගෙන් අනුමතිය ලබා කැන්ටන් ප්‍රදේශය අසල ජීවත් වූයේ ය.

- එහි පැරණිකම සොයා බලා සත්‍යය පැහැදිලි කර චීන ජනතාවට කොන්ෆියුසියුස් දෙවියන් ලෙස නොව, විශිෂ්ට බුද්ධිමතකු ලෙස පිළිගැන්වීමට කටයුතු කළේ ය.

- මෙතුමා චීන සංස්කෘතියට හා ශිෂ්ටාචාරයට ගරු කරන පුද්ගලයකු ලෙස දැකිය හැකි විය.

- චීන බුද්ධිමතුන්ගේ වස්ත්‍ර ඇඳ චීනයේ සිරිත් විරිත් අනුගමනය කළේ ය. චීන භාෂාව හොඳින් ඉගෙන ගෙන චීන භාෂා නිපුණයෙක් (පණ්ඩිතයෙක්) විය.

- ගණිතය, නක්ෂත්‍ර, භූමි ශාස්ත්‍රය, සංගීතය, දර්ශන ග්‍රන්ථ ආදිය චීන භාෂාවෙන් ලිවී ය.

- චීන භාෂාවෙන් "සත්‍ය දේව ගුණාංග" යන ග්‍රන්ථය ලිවී ය. එය විශිෂ්ට චීන සාහිත්‍යය ග්‍රන්ථයක් ලෙස පිළිගනු ලැබේ.

- චීන දාර්ශනිකයකු වූ කොන්ෆියුසියුස් ගේ දර්ශනය තම දහම් දෙසුමට උපයෝගී කරගෙන පුරාතන චීන සංස්කෘතියට ගරු කර, එහි සමහර ක්‍රම තම දහමේ වන්දනා ක්‍රමවලට එක් කර ගත්තේ ය.

- ලෝකය මැවීම පිළිබඳ ව චීන ජාතිකයන්ගේ පුරාණ කථා උපයෝගී කර ගනිමින් ශු.බයිබලයේ ඇති මැවීමේ කථා පැහැදිලි කළ හ.

- ක්‍රි.ව. 1610 දී 6000කට අධික චීන ජාතිකයන් කතෝලික දහම වැලඳගත් බව කියැවේ.

## 9.1.4. - පිලිපීනයේ කිතු දහම

- 1512 දී ස්පාඤ්ඤ ධීවරයන් පිලිපීනයට ඇතුළු වන විට කුඩා මින්දනාවෝ වැනි ඉස්ලාමීය ප්‍රදේශ හැර අනෙකුත් ප්‍රදේශවල ජීවත් වූ පිලිපීන සමාජ ඒකාබද්ධ වූ පාලනයෙන් තොර, නිදහස් ඉතා කුඩා ස්ව ග්‍රාම ලෙස පැවතිණි.

- ඔවුනට අනන්‍ය වූ පැරණි වන්දනා දැකිය හැකි විය. සැලසුම් කරන ලද ආගමික සම්ප්‍රදාය කිසිවක් දැකිය නොහැකි විය.

- එබැවින් ස්පාඤ්ඤ ධර්මදූතවරුන්ට කිසිදු විරෝධයක් නොපෙන්වූ බොහෝ දෙනෙකු, කතෝලිකයන් ලෙස සිත් හරවා ගැනීම ට පහසු විය. එහෙත් ස්පාඤ්ඤ ධර්මදූතයෝ මුස්ලිම්වරුන්ගේ සිත් හැරවීමේ කාර්යයෙහි ජයග්‍රහණයක් නොදැක්කෝ ය. එයට ප්‍රධාන හේතුව ස්පාඤ්ඤ රටේ ආගමික සංස්කෘතික බලපෑම වේ.

- එනම් ස්පාඤ්ඤ ධර්මදූතවරුන් ධර්මදූත කාර්යය සඳහා යොදා ගත් ක්‍රම වේදයන් මංගල්‍ය පූජකවරුන්ගේ වස්ත්‍ර, ප්‍රතිමා, යාච්ඤා, වන්දනා ආදිය මිනිසුන්ගේ සිත් ඇද ගත්තේ ය. විසිර සිටි කිතුනුවන් එකතුකර කිතුනු නගරවල පදිංචි කරවීම පහසු විය .

- නගරවල ගොඩනඟන ලද දේවස්ථානවල මනස්තාපන පිළිවෙත් ප්‍රසාද ස්නාපනය පිළිවෙත් හා අවමංගල්‍ය පිළිවෙත් ද පැවැත්විණි.

- 1898 දී ස්පාඤ්ඤවරුන්ගේ කොලනි පාලන ක්‍රමය අවසන් වූ විට මුළු රට ම ක්‍රිස්තියානි විය.

- එම කාලයේ කිතුනු පැවිද්දන්ට එරෙහි වූ කාලයක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස 20 වන සියවසේ මුල් භාගයේ පිලිපීන රට ඇමෙරිකානුවන්ගේ පාලනය යටතට පත් විය.

- මෙහි ප්‍රතිඵලයක් ලෙස සීමිත අධ්‍යාපනයක් සියල්ලන්ට ම ලබාදීමට උත්සහ කරන ලදි. ඒ සඳහා බොහෝ පාසල් ද කොලේජ් ද ගොඩනඟන ලදි. ඒ සඳහා බොහෝ ගුරුවරු ඇමෙරිකාවේ සිට කැඳවන ලදි. ඔවුන් අතුරින් බොහෝ දෙනෙක් ප්‍රොතෙස්තන්ත ආගමිකයෝ වූ හ.

- ඔවුන්ගෙන් සමහරු කතෝලික ආගමට විරුද්ධ ව අදහස් ප්‍රචාරය කර, ශිෂ්‍යයි අතර අකැමැත්ත වර්ධනය කළ හ.

- ශු. සභාවෙන් රාජ්‍යය වෙන් විය. ප්‍රජාතන්ත්‍රවාදය හා නිදහස වැනි අදහස් ප්‍රමුඛස්ථානය ගැනුණි. ආගමික නොවූ අධ්‍යාපන ක්‍රමය තුළින් විශ්වාසය හා බැඳුණු හරයන් පරිහානියට ලක් විය.

- 1912 - 1941 කාලයේ කතෝලික සභාවේ ඇති වූ භේදය නිසා ඇංග්ලිකන් සභාව ආරම්භ කරන ලදි.

- වර්තමානයේ පිලිප්පීන සභාව තුළ ජෙහෝවා සාක්ෂිකරුවන්, සෙවන්ත් ඩේ ඇඩ්වන්ටිස් වැනි විවිධ කුඩා මූලධර්මවාදී සභා දැකිය හැකිය.

- නැගෙනහිර ආසියාවේ කතෝලිකයන් බොහෝ දෙනෙකු සිටින රට පිලිපීනය වේ. එහි 90% කිතුනුවෝ ද, 5%ක් ඉස්ලාමීයයෝ ද, 5% අනෙකුත් ආගමිකයෝ ද සිටිති.

## 9.1.5. - ජපානයේ කිතු දහම

- 16 වන සියවසේ මධ්‍යතන යුගයේ එනම් පෘතුගීසින්ගේ පැමිණීම සමඟ ජපානයට ක්‍රිස්තියානිය ගෙන එන ලදි .

- එහෙත් වර්තමානයේ සමහරු ඉතිහාස සමහරුන් ක්‍රිස්තියානිය ශත වර්ෂ ගණනාවකට පෙර ම ජපානයේ තිබූ බව පවසති.

  සාධක :-

  1. නාරා නගරයේ අසල ඇති ගියොට්ටා නම් ස්ථානයේ තිබෙන විහාරයකින් සොයා ගන්නා ලද, ලේඛනයක පැරණි චීන භාෂාවෙන් ලියා වී ඇති ශු.මතෙව් තුමාන් විසින් ලියන ලද සුවිශේෂය හා කන්ද උඩ දේශනාවේ විස්තර සඳහන් වේ.

  2. බොහෝ බෞද්ධ විහාර, විනාශ කරන ලද කිතුනු දේවස්ථාන මත ගොඩනගන ලද ඒවා ය.

  3. ජපානයේ ගවේෂකයන්ගේ අදහස්වලට අනුව නෙස්ටොරියානු කිතුනු මූල ධර්මවාදී සභා 5 වන සියවසේ දී පමණ ප්‍රථම වරට කිතු දහම ජපානයට ගෙන ඇත. එම කාලයේ කිතු දහම "ආලෝකය විහිදෙන ආගමක්" යැයි හඳුන්වන ලදි.

  - ජපානයේ ප්‍රථමයෙන් කිතු දහම දේශනා කිරීමට පැමිණි ධර්මදූතවරු :- ජේසු නිකායේ ශුඃ ෆ්‍රැන්සිස්කු සේවියර්, කොස්මේ ඩි ටොරෙස්, ජොන් ෆර්නැන්ඩස් යන පූජකවරු වූ හ.
  - ජේසු නිකායික ධර්මදූතවරු නාගසාකි නගරය තම සේවයේ කේන්ද්‍රස්ථානය කොටගත් හ. ඔවුහු ඉතා ඉක්මනින් ජනතාවගේ හොඳ හිත දිනා ගනිමින් විශාල ජන පිරිසකගේ සිත් හරවා ශු. සභාවට බඳවා ගත් හ.
  - 1601 දී නාග සාකි නගරයේ සිටි සියලු ම ජනතාව කතෝලිකයෝ වූ හ. මෙම දියුණුව බොහෝ කලක් නොපැවතිණි.
  - බඩා නොවුනාසා රජුගේ පාලන සමයේ රාජ්‍යාධාර ලැබූ ජේසු නිකායේ පියවරු,රාජ්‍ය පාලන වෙනස්වීම්වලින් පසු ටොයෝටෝමි ගිඩේයෝස් රජුගේ සැකයට බඳුන් වූ හ.
  - දෛකොසොමා රජුගේ පාලනය යටතේ 1587 දී කිතුනුවන්ට විරුද්ධ ව ආගමික පීඩන ආරම්භ වී වසර 50කට අධික කාලයක් එය පැවතිණි.
  - 1597 දී 26 වන ජපන් කතෝලික ධර්මදූතවරුන් හා විශ්වාසකියන් දැඩි ලෙස දඬුවම් කරනු ලැබ නාගසකි යේ ඇති කන්දක කුරුසියේ ඇණ ගසා ප්‍රාණ පරිත්‍යාගීන් ලෙස තම ජීවිතය පූජා කළ හ.
  - 1612 දී කිතු දහම තහනම් කරන ලදි. ජේසු නිකායේ ධර්මදූතික පියවරුන් රටින් පිටුවහල් කරනු ලැබූ හ. කිතුනුවෝ ඉතා කෲර ලෙස මරනු ලැබූ හ. මෙම සිද්ධියෙන් බලපෑමට ලක් වූවෝ "සේවියර් ප්‍රාණ පරිත්‍යාගීන්" යැයි හඳුන්වනු ලැබූ හ.

- ඉතිරි කිතුනුවන් තම ආගම ප්‍රසිද්ධියේ ප්‍රතික්ෂේප කළ යුතු යැයි බලපෑම් කළ හ. මේ නිසා ඔවුන්ට සැඟවී ජීවත් විය යුතු තත්ත්වයක් ඇති විය.
- ජපානයට පැමිණෙන වෙළෙන්දන් හෝ සංචාරකයන් හෝ කුරුසියක් තම පාදයෙන් පාගා දැමීම අනිවාර්යය කරන ලද නමුත් කිතු දහම මුළුමනින් ම නැති කර දැමීමට ඔවුන්ට නොහැකි විය.
- 1861 දී ජපානයට ප්‍රොතෙස්තන්ත සභිකයන් පැමිණීමේ ප්‍රතිඵලයක් ලෙස ජපන් භාෂාවට ප්‍රොතෙස්තන්ත්‍ර බයිබලය පරිවර්තනය කරන ලදි.
- 1817 දී ජපානයේ ආගමික නිදහස හඳුන්වා දුන් පසු සියලුම ආගමිකයින් නිත්‍යානුකූල ව ජපානයේ නැවතීමටත් තම ආගම දේශනා කිරීමටත් අනුමතිය දෙන ලදී. වසර 200කට පසු කිතුනු ධර්මදූතයට නැවත එහි යා හැකි විය.
- කිතුනු දේශකයෝ නැවත නාගසාකි නගරයට ගොස් කිතුනු දේවස්ථාන ගොඩ නගා එහි ධර්මදූතවරුන් පත් කළහ.
- කිතුනු ධර්මදූතවරු අධ්‍යාපන ක්ෂේත්‍රයට මහත් දායකත්වයක් දැක්වූ හ. උසස් අධ්‍යාපන සැලස්මක් සකස් කර ක්‍රියාත්මක කළ හ. තාක්ෂණික අධ්‍යාපනය ද ලබා දුන් හ.
- මොවුන් විසින් ගොඩනගන ලද පාසල් පසු කාලීන ව ජපානයේ ඇති උසස් පාසල් ලෙස ප්‍රසිද්ධ වී ඉතා උසස් විශ්ව විද්‍යාල ලෙස ගොඩනැඟිණි.
- 1973 දී ජපානයේ බයිබල් සංගමයක් අරඹන ලදි.

### 9.1.5. - ශ්‍රී ලංකාවේ කිතු දහම

- ශ්‍රී ලංකාවේ කිතු දහම් ඉතිහාසය ප්‍රධාන කොටස් 5කට බෙදිය හැකි ය.
    1. පෘතුගීසීන් පැමිණීමට පෙර කාලය - (16 වන ශතවර්ෂයට පෙර)
    2. පෘතුගීසීන් ගේ කාලය - (1505 - 1657)
    3. ඕලන්ද සමය - (1658 - 1796)
    4. බ්‍රිතාන්‍ය සමය - (1796 - 1948)
    5. නිදහස් කාලය - (1948ට පසු)
- සාමාන්‍යයෙන් පෘතුගීසින්ගේ පැමිණීම සමඟ එනම් (16 වන ශතවර්ෂයේ සමග ශ්‍රී ලංකාවේ කිතු දහමේ ඉතිහාසය ඇරඹෙන බව පිළිගැනේ.)
- එම නිසා පෘතුගීසින්ගේ පැමිණීමට පෙර ලංකාවේ කිතු දහම නොතිබුණ බව තීරණය කළ නොහැකි ය.
- පෘතුගීසින් පැමිණීමට බොහෝ වසර ගණනාවකට පෙර ලංකාවේ කිතුනුවන් විසූ බවට සාක්ෂ්‍ය බොහෝඇත.

### 9.1.5.1. - පෘතුගීසින්ගේ පැමිණීමට පෙර ලංකාවේ කිතුනුවන් සිටි බවට ඇති සාක්ෂ්‍ය හා කැණීම්වලින් කරන ලද සොයා ගැනීම්.

ක්‍රි.ව. 6 වන සියවසේ කිතුනුවන් සිටි බවට සාක්ෂ්‍ය පවතී.

I. ඉච්චෂාප් අබිසාකිබ්, බෙන්ජමින් රෆායි වැනි විදේශික ලේඛකයෝ අනුරාධපුර යුගයේ ලංකාවේ ජුදා කිතුනුවන් සිටි බව සාක්ෂ්‍ය ඉදිරිපත් කරති.

II. ඉන්දියානු නැවියා යැයි හඳුන්වනු ලබන කොස්මස් ඉන්ඩිගෝ ෆිලිස්ඩස් නමැති ග්‍රීක වෙළෙන්දා ක්‍රි.ව. 535 දී ලියූ 'කිතුනු සභා විවරණය' යන ග්‍රන්ථයේ ලංකාවේ කිතු දහම තිබුණු බව සඳහන් කරයි. "ඉන්දියාවට එපිටින් ඇති දූපතක් වන තප්‍රබෝනයේ ද (ග්‍රීකයන් ලංකාව හැඳින්වූ නම)" පූජකයන් හා විශ්වාසකයන් සමඟ සභාවක් තිබිණි. එම දූපතේ විසූ පර්සියානු කිතුනුවන්ගේ දේවස්ථානයක් ඇති අතර පර්සියානු පූජකතුමෙකුත්, තේවාචාරීවරයෙකුත් සිටිති.

III. 5 වන සියවසේ ලියැවුණු ලංකාව පිළිබඳ ඉතිහාස තොරතුරු ලබා දෙන මහාවංශය නමැති ග්‍රන්ථයේ සිංහල රජවරුන්ගේ හමුදාවේ "මිගාර" නම් ඉන්දියානු කිතුනු සෙන්පතියකු සේවය කළ බවට සාක්ෂ්‍ය පවතී.

IV. 1912 දී සිදු පුරාවිද්‍යා කැණීම්වලින් අනුරාධපුර යුගයේ ගොඩනැඟිලි සුන්බුන් ද, අතර වූ කළු ගලෙහි කොටන ලද පර්සියානු නෙස්ටෝරියානු කුරුසිය සාක්ෂ්‍ය සහිත ව තහවුරු කරයි.

V. 1972 දී මහාචාර්ය සෙනරත් පරණවිතාන මැතිතුමාගේ ගවේෂණය පරිදි කාශ්‍යප මුගලන් යන රජවරුන්ගේ කාලයේ කිතුනු යුද්ධ භටයන් ලංකාවේ සිටි බවට පැවසේ.

VI. ක්‍රි.ව. 9 වන ශත වර්ෂයේ දී සීගිරි යුගයේ රාජ්‍ය සභාවේ කිතුනු ඇමතිවරුන් සිටි බවට සඳහන් වී ඇත.

VII. වවුනියාව පුරාවිද්‍යා පර්යේෂණගාරයේ ගලින් හිටවූ බෞතීස්ම පොකුණක් ඇත. මෙහි පාත්‍රය ගලින් නිම කරන ලද එකකි. මෙම පාත්‍රය දෙස බැලීමේ දී බොහෝ දෙනෙකු බෞතීස්ම ලබන්නට ඇතැයි තහවුරු වේ.

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | **9.0** | **:** | **ආසියාතික රටවල කිතුදහමේ ව්‍යාප්තියේ ඉතිහාසය ඉගෙනීම මඟින් සමාජීය, සංස්කෘතික හා ආගමික උන්නතිය සඳහා තම දිවි කැප කරයි.** |
| **නිපුණතා මට්ටම** | **9.2** | **:** | යුරෝපීයයන් ගේ පැමිණීමත් සමඟ ම ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ව්‍යාප්තියේ ඉතිහාසය දැනගෙන ශුද්ධ වූ සභාවේ වර්ධනයට දායක වෙයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | | **:** | 34 |

**ඉගෙනුම් පල**

- පෘතුගීසි සමයේ ශ්‍රී ලංකාව තුළ කතෝලික දහම ව්‍යාප්ත වූ ආකාරය පිළිබඳ කරුණු රැස් කරයි.
- ඕලන්ද සමයේ කතෝලික සභාව වර්ධනය කළේ ශුද්ධ වූ ජුසේවාස් තුමන් බව පිළිගනියි.
- ගොනු කර ගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ශ්‍රී ලංකාවේ ශුද්ධ වූ සභාවේ වර්ධනයට දායක වෙයි.
- කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී ක්‍රියාශීලී ව කටයුතු කරයි.

## 9.2. පෘතුගීසි කාලයේ සභාව (1505 - 1657)

### 9.2.1 පෘතුගීසින් පැමිණීමට හේතු

- පෙරදිග වෙළඳාමෙන් ලද ආදායම සියලු ම අයිතිවාසිකම් අරාබිවරුන්ගෙන් මුළුමනින් ම අත්පත් කරගෙන තමන් සතු කර ගැනීම.
- ආර්ථික වශයෙන් ලාභ ගැනීම
- කතෝලික ආගම ප්‍රචාරය කිරීම
- තම පාලනය විවිධ රටවල පැතිරවීම

### 9.2.1.1 පෘතුගීසින් ශ්‍රී ලංකාවට පැමිණීම (1505)

දේශපාලන පසුබිම

පෘතුගීසින් ලංකාවට පැමිණි විට ලංකාව කෝට්ටේ, මහ නුවර, යාපනය යනුවෙන් රාජ්‍ය තුනකට බෙදා කෝට්ටේ ප්‍රධාන රාජධානිය කර ගෙන තිබිණි.

| රාජධානිය | රජු | ප්‍රධාන නගරය |
|---|---|---|
| කෝට්ටේ (1489 - 1513) | 9 වන ධර්ම පරාක්‍රමබාහු | (ශ්‍රී ජයවර්ධනපුර) කෝට්ටේ |
| මහනුවර (1469 - 1511) | සේනා සම්මත වික්‍රමබාහු | මහනුවර |
| යාපනය ( 1478 - 1519) | පරරාජසේකරන් | නල්ලූර් |

1521 දී සිදු වූ විජයබා කොල්ලය මඟින් කෝට්ටේ රාජධානිය ප්‍රධාන කොටස් 3කට බෙදිණි. එබැවින් ශ්‍රී ලංකාව තුළ බලය පැතිර වීම පෘතුගීසින්ට පහසු විය.

| රාජධානිය | රජු |
|---|---|
| කෝට්ටේ | 7 වන බුවනෙකබාහු |
| රයිගම | රයිගම් බණ්ඩාර |
| සීතාවක | මායාදුන්නේ |

**ආගමික පසුබිම**

- ලංකාවේ දකුණු ප්‍රදේශයේ බෞද්ධ ආගම් පදනම් කරගත් සමාජයක් දැකිය හැකි විය. බෞද්ධාගම අනුගමනය කළ ජනතාව වැඩි ප්‍රමාණයක් වූහ. බෞද්ධ විහාර ග්‍රාමයේ කේන්ද්‍ර ස්ථානය විය. බෞද්ධ භික්ෂූහු සියලු ම ගෞරවයනට් පාත්‍ර වූහ.

- විහාරයන්ට අයත් බොහෝ වස්තූන් දැකිය හැකි විය. ඒවායින් බොහෝ ආදායමක් ලැබිණ. පෘතුගීසින් පැමිණි පසු විහාර විනාශ කර ඒවායින් ලැබූ ආදායම් මාර්ග නවතා දමන ලදි. මෙම තත්ත්වය ම යාපනය තුළ ද පැවතුණි.

- දෙමළ ජාතිකයෝ හින්දු ආගමිකයෝ වූ හ. මෙම කාලයේ බොහෝ හින්දු බ්‍රාහ්මණ පූජකවරු ලංකාවෙන් ඉන්දියාවට යවනු ලැබූ හ. බොහෝ හින්දු දේවස්ථානවල වන්දනාවත් වත්පිළිවෙත් ආදියත් පැවත්වීමට හින්දු පූජකවරුන් නොමැති තත්ත්වයක් දැකිය හැකි විය. මෙලෙස ස්වදේශ ආගම් ක්‍රමයෙන් බෙලහීන වන තත්ත්වයක් දැකිය හැකි විය.

- රටේ අභ්‍යන්තර ගැටලුවලින් ද මිදීම සඳහා ද තම රජකම ආරක්ෂා කරගැනීම සඳහා ද බොහෝ රජවරු හා රාජ්‍ය බලධාරීහු පෘතුගීසින්ගේ සහය පතා බුදු දහම අතහැර කතෝලික දහම වැලඳ ගත් හ. මේ නිසා බොහෝ බෞද්ධයෝ උසස් රාජ්‍ය නිලධාරීන් අනුගමනය කරමින් තම ආගම වෙනස් කර ගත් හ. පෘතුගීසින් අනෙකුත් ආගම්වල පැවැත්මට උනන්දුවක් නොදැක්වූ නිසා ස්වදේශීය ආගම් බිඳ වැටිණි.

- කඩා වැටුණු බුදු දහම නැවත ගොඩනැගීම සඳහා කොනප්පු බණ්ඩාර (දොන් ජුවාම්) කතෝලික දහම අතහැර පළමු වන විමලධර්මසූරිය යන නමින් බෞද්ධ නමක් ගෙන බුදු දහම වැලඳ ගෙන රජකම ලබා ගත්තේ ය.

- සීතාවක දෙල්ගමු විහාරයේ තිබූ දන්ත ධාතුව මහනුවර තැන්පත් කළේ ය.

- බුරුමයේ සිට භික්ෂූන් කැඳවා උපසම්පදාව පැවැත්වී ය.

- පුරාණ විහාරවල ප්‍රතිසංස්කරණ කටයුතු කර බිඳ වැටුණු බුදු දහමේ නවෝදයක් ඇති කරන ලදි.

## 9.2.1.1 පෘතුගීසී කාලයේ ධර්මදූතවරුන්

පෘතුගීසි ධර්මදූතවරුන් කළ සේවය :-

- 1505 දී දොන් ලොරෙන්සෝ ද අල්මේදා සමග ලංකාවට පැමිණි පළමු ධර්මදූතවරයා ගරු. බ්‍රේ වින්සන්ට් පියතුමා ය. මෙතුමා කොළඹ වරායේ ගොඩනගන ලද ශු. ලෝරන්ස් දේවස්ථානයේ පළමු දිව්‍ය පූජාව ඔප්පු කළේ ය.

- 1543 දී කෝට්ටේ රජ වූ බුවනෙකබාහු තම රාජධානිය තුළ කිතු දහම දේශනා කරන්නට පූජකවරුන්ව එවන ලෙස දොන් ජුවාම් රජු කළ ඉල්ලීම පරිදි පහත සඳහන් ධර්මදූතවරු පැමිණ තම සේවය ආරම්භ කළ හ.

**ෆ්‍රැන්සිස්කාන ධර්මදූතවරුන් කළ සේවය :-**

- බුවනෙකබාහු රජුගේ මරණයෙන් පසු ඔහුගේ පුත් ධර්මපාල මහ බණ්ඩාර කෝට්ටේ රජ විය. ඔහු 1556 දී ෆ්‍රැන්සිස්කාන නිකායයට අයත් ජුවන් ද විලා කොන්මේ පියතුමාගෙන් බෞතීස්මය ලබා කිතු දහම වැලඳ ගැනීම නිසා ධර්මදූත කටයුතු කිසිදු බාධාවකින් තොරව රාජධානිය පුරා ම ඉතා සූක්ෂ්මව පැතිර ගියේ ය.

- තාපසාරාම, කොලේජ්, දේවස්ථාන ගොඩනැගීමට ඉඩකඩම්, මූල්‍ය සහය රජයෙන් ලැබිණි.

- කොළඹ අනුක්‍රමයෙන් කිතුනු නගරයක් විය. බොහෝ මිසම්, නිකායයන් විසින් තාපාසාරාම ආරම්භ කරන ලදි.

- 1597 දී දොන් ජුවාම් ධර්මපාල මිය ගිය විට, කෝට්ටේ රජ්‍යයේ බොහෝ කතෝලිකයෝත්, දේවස්ථානත්, තිබූ බව පැවසේ. මේ සියල්ල ෆ්‍රැන්සිස්කන් නිකායයේ දැඩි කැපවීම හා සේවාවෙන් ලද ප්‍රතිඵල ය.

**ජේසු නිකායික සේවාව :-**

- මෙලෙස කතෝලික සභාව වර්ධනය වන විට ෆ්‍රැන්සිස්කාන නිකායට වෙනත් ධර්මදූතවරුන් සහයට කැඳවීමේ අවශ්‍යතාව ඇති විය.
- 1602 වන වර්ෂයේ දයෝ ගෝ ඩා කුන්ක පියතුමාගේ ප්‍රධානත්වයෙන් ජේසු නිකායික සභාවෙන් ධර්මදූතවරු 04 දෙනෙක් ලංකාවට පැමිණියහ. මහ ඔයට උතුරින් ඇති ප්‍රදේශය මොවුනට භාර දෙන ලදි.
- තිරුමලෙ, මඩකලපුව, යාපනය තෙක් උතුරු ප්‍රදේශය මොවුනට ලබා දෙන ලදි.
- ජේසු නිකායික පියවරුන්ට කොළඹ කොලේජයක් ගොඩනැගීමට අනුමතිය දෙන ලදි. මොවුහු තමන්ට ලබා දුන් ප්‍රදේශයේ තාපස නිකායයක් ගොඩනගා එම ප්‍රදේශයේ ජනතාවට සේවය කළ හ. සැම තාපසාරාමයක් ම අසල දේවස්ථාන ගොඩනගන ලදි.
- විශාල දේවස්ථාන තුනක් සහ කුඩා දේවස්ථාන කිහිපයකුත් රෝහල් දෙකකුත් ගොඩනගන ලදි.
- 1643 දී ජේසු නිකායික පියවරු මන්නාරමේ දේවස්ථාන අටක් ගොඩ නගා සේවය කළ හ.
- සමහරු ස්වදේශ භාෂාව ඉගෙන ගෙන ග්‍රන්ථ පරිවර්තනය කර කිතු දහමේ වර්ධනයට මහත් මෙහෙයක් කළ හ.

**දොමිනිකානු නිකායයේ සේවාව :-**

- ක්‍රි.ව. 1605 දී දොමිනිකාන නිකායයේ ධර්මදූතවරු ලංකාවට පැමිණිය හ. ඔවුනට දහම් ප්‍රචාර කටයුතු සඳහා සබරගමුව ප්‍රදේශය ලැබිණි. මෙම නිකායයට අයත් ධර්මදූතවරු කොළඹ ජපමාල මාතා දේවස්ථානය ගොඩ නැගූ හ.
- තව ද මොවුන් සඳහා වෙන් කරන ලද සබරගමුව ප්‍රදේශයේ දේවස්ථන 12ක් ද ගාල්ලේ දේවස්ථාන 2ක් ද ගොඩනගා ඉමහත් සේවාවක් කළ හ.

**අගොස්තීනු නිකායයේ සේවාව :-**

- ක්‍රි.ව. 1606 දී අගොස්තීනු නිකායික ධර්මදූතවරුන් ලංකාවට පැමිණිය හ.
- බර්තොලමේහු සම්බායෝ, ඉග්නාසියුස් කොන්ස්තන්තීනු වැනි අගොස්තීනු නිකායික පියවරු ඉමහත් සේවයක් කළෝ ය. මොවුහු අත්තනගල්ල, මාපිටිගම, වැලිවේරිය, නාරාහේන්පිට දේවස්ථාන ගොඩනැගූ හ.

## 9.2.1.3 මන්නාරම් ප්‍රාණ පරිත්‍යාගීහු

- පෘතුගීසින්ගේ කාලයේ මන්නාරම, යාපනය රාජධානියේ එක් ප්‍රදේශයක් ලෙස පැවතිණි.
- යාපනය රාජධානිය සංගිලියන් පර රාජසේකරන් රජු පාලනය කළේ ය. මන්නාරමේ ජනතාව කිතු දහම වැලඳගත් බව ආරංචි වූ විගස හින්දු පූජකයෝ කෝට්ටේ රජු මෙන් ම යාපනය රාජධානියත් පෘතුගීසින් අත්පත් කර ගනිති යි යන බියෙන්, හින්දු දේවස්ථාන විනාශ වේ යැයි ප්‍රචාරය කළෝ ය.
- තව ද මන්නාරම් කිතුනුවෝ යාපනය රාජධානිය අතහැර පෘතුගීසි රජයට සහය පල කරති යි යන ව්‍යාජ අදහස් පැතිර වූය.
- මෙම පණිවිඩය ලද සංගිලි රජ කෝප වී බිය වී යුද්ධ භටයන් එක්කර මන්නාරමට ගියේ ය. කිතුනුවන්ට කිතුදහම අතහැර හින්දු දහම වැලඳ ගැනීමට නියෝග කළේ ය. එලෙස නොපැමිණෙන්නන්ට දැඩි දඬුවම් ලබා දෙන බවත් පැවසී ය.
- මන්නාරමේ කිතුනුවෝ තම විශ්වාසයේ ස්ථිර සිටියෝ ය. එබැවින් රජු සංගිලි රජුගේ නියෝගය පරිදි ජුවාම් සි ලිසාගෝ තුමන් හා කාන්තාවන් ද දරුවන් ඇතුළු ව 700ක් පමණ දෙනා 1544 දී දෙසැම්බර් තෝට්ටවෙලි නම් ස්ථානය ඉතා කෲර ආකාරයකට මැරුවේ ය. මොවුන් අපි මන්නාරම් ප්‍රාණ පරිත්‍යාගීන් යැයි හඳුන්වමු.

- මන්නාරම කිතුනුවන් හෙළූ රුධිරය ශු. සභාවේ බීජය විය. මෙම පණිවිඩය සමඟ ධර්මපාල රජු ද විශාල ජනකායක් සමඟ කිතු දහම වැළඳ ගත්තේ ය.

### 9.2.1.4 පෘතුගීසි කාලයේ අධ්‍යාපන සේවාව

- පාසල් ගොඩනගා අධ්‍යාපනය පෘතුගීසින්ට බාර දෙන ලදි. එබැවින් පෘතුගීසි ධර්මදූතවරු ආගම ප්‍රචාරය කිරීම සඳහා අධ්‍යාපනය වැදගත් මාධ්‍යයක් කරගැනීමට කැමති වූහ.

- අධ්‍යාපන කෙෂ්ත්‍රයේ අත්දැකීම් බහුල පැවිදි නිකායයන් ලෙස ෆ්‍රැන්සිස්කන්, ජේසු නිකාය, දොමිනිකානු, අගොස්තීනු වැනි නිකායයන්හි ධර්මදූතවරුන් ගුරුවරුන් ලෙස ක්‍රියා කිරීම හේතුවෙන් අධ්‍යාපන පීඨ ආගමික දැනුමක්, මඟ පෙන්වීමක් ලබා දිනි. මෙය ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය ඉතිහාසයේ නව මඟකට ගෙන යන ලද බව පැවසිය හැකිය.

#### ෆ්‍රැන්සිස්කන් නිකායේ අධ්‍යාපන සේවාව

ෆ්‍රැන්සිස්කන් නිකායේ ධර්මදූතවරු කෝට්ටේත්, යාපනයේත් තුන් ආකාරයක පාසල් ගොඩනැගූහ.

01. කෝවිලපත්තුව පාසල්

    - මීසමකට පාසලක් යන පදනමින් ගොඩ නැගන ලදි. මෙහි දී යාච්ඤා කිරීම, දහම් දැනුම පිළිබඳ ප්‍රශ්නෝත්තර ක්‍රමය ස්වදේශ භාෂාවලින් පවත්වන ලදි.

    - පෘතුගිසී පූජකවරුන් විසින් ලිවීම,කියවීම, පෘතුගීසි ශිෂ්ටාචාරය, කතෝලික ආචාර ධර්ම, කතෝලික ගීතිකා ආදිය උගන්වන ලදි.

02 උසස් පාසල්

    - මෙහි උසස් අධ්‍යාපන ක්‍රමයක් අනුගමනය කරන ලදි. යුරෝපා අධ්‍යාපන ක්‍රමයට සමාන ව දැකිය හැකි විය.

    - මෙම විදුහලේ අධ්‍යාපන ක්‍රමය ආගමික ක්‍රමයක් වූ අතර පූජකවරුන් වීමට කැමති අය සඳහා ලබා දෙන අධ්‍යාපනයකි.

    - මේවා පෘතුගීසි භාෂාවෙන් පවත්වන ලදි. ආගමික, වෛද නීති, කියවීම, ලිවීම, ජ්‍යොතිෂ, සංගීතය, ලතින් භාෂාව සාරධර්ම උගන්වන්ට යෙදිණි.

03. රජවරුන් සඳහා වන පීඨය :-

    - පෘතුගීසින් විසින් අත් අඩංගුවට ගනු ලැබූ නැතහොත් ඔවුන් වෙත බාර වූ, නැතහොත් අධ්‍යාපනය ලැබීම සඳහා රජවරුන්ට බාර දුන් රජවරුන්, කුමාරවරුන් ආදීහු මෙහි දී ඉගෙන ගත් හ.

    - පෘතුගිසී භාෂාවෙන් මේවා ක්‍රියාත්මක විණි.

    - ලිවීම, කියවීම, ලතින්, රජවරුන් සඳහා කලාව ආදිය මෙහි දී උගන්වන ලදි.

#### ජේසු නිකායේ අධ්‍යාපන සේවාව :-

- ජේසු නිකායේ පියවරු අධ්‍යාපන ආයතන 3ක් ආරම්භ කර සේවය කළෝ ය. ඒවා ප්‍රාථමික, ද්විතියක හා උසස් ලෙස අංශ 3කින් දැකිය හැකි විය.

01. ප්‍රාථමික පාසල්

- මෙහි උදේ සවස සිංහලෙන් සහ දෙමළෙන් දහම් අධ්‍යාපනය ලබා දෙන ලදි. කට පාඩම් කිරීම, ප්‍රශ්නෝත්තර ක්‍රමය අනුගමනය කරන ලදි. පොදුවේ ජනවන්දනාවේ භාවිතා කර යාච්ඤා හා ගීතිකා උගන්වන ලදී.

- මෙම පාසලේ අකාරාදිය කියවීම, ලිවීම, ගීත, යහගුණ, සාරධර්ම, කිතුනු ප්‍රතිපත්ති ආදිය ද උගන්වන ලදි.

- ලතින් භාෂාවෙන් ජන වන්දනාව සිදු නොවන දෙමළ සිංහල භාෂාවෙන් ආගම් දේශනය පවත්වා පෘතුගීසි භාෂාවෙන් අක්ෂර ඥානයන් ලබාදෙන ලදි.

02. ද්විතියක පාසල්
- ප්‍රාථමික පාසල්වල ඉගැන්වූ ක්‍රමයට ම මෙහි දී ද ඉගැන්වීමේ කටයුතු සිදු විණි.

03. උසස් පාසල්
- උසස් පාසල්වල දේව ධර්මය උගන්වන ලදි. මෙහි වැඩිහිටි සිසුන්ට, පූජකවරුන් වීමට කැමති සිසුන් සිංහල ප්‍රභූවරුන්ගේ දරුවන්ට සහ සාමාන්‍ය පවුල්වල දරුවන්ට ඉඩ ලැබිණි.

## 9.2.1.5 පෘතුගීසි යුගයේ කලාව

- 'කලාව' යනු මිනිසා තම අභ්‍යන්තර චින්තනය, සිතිවිලි, හැඟීම් පංචේන්ද්‍රියයන් මඟින් දැකිය හැකි, ඇසිය හැකි, හැඟවිය හැකි ආකාරයට ප්‍රකාශ කිරීමට ගන්නා උත්සාහය යි.

- එයට සාහිත්‍යය, සංගීතය, නැටුම්, චිත්‍ර , මූර්ති ගොඩනැඟිලි නිර්මාණ ආදිය ඇතුළත් වේ.

- කලාව ගොඩනැඟීමෙහි ලා ආගම් ප්‍රධාන තැනක් උසුලයි. ඒ ආකාරයට කිතුනු ආගමික කලාවේ වර්ධනයට මහත් දායකත්වයක් දක්වා ඇති බව පැවසිය හැකි ය.

- බටහිර රටවල අය ලංකාවට පැමිණි හෙයින් බටහිර රටවල කලාව එළිදැක්වෙන අංශ :- 1. සාහිත්‍ය කලාව 2. චිත්‍ර කලාව 3. මූර්ති කලාව 4. ගොඩනැගිලි කලාව 5. නාට්‍ය කලාව 6. සංගීත කලාව ආදිය මෙරටට හඳුන්වා දී ඇත

### 9.2.1.5.1 පෘතුගීසි කාලයේ සාහිත්‍ය කලාව

| සාහිත්‍ය වර්ගය | ග්‍රන්ථ | කතුවරුන් |
|---|---|---|
| සිංහල කිතුනු සාහිත්‍යය | සිංහල සාහිත්‍යය Ars Chingalensis Linguae | ගරු. එමානුවෙල් කොස්තා (ජේ.නි) |
| | සිංහල සාහිත්‍ය ග්‍රන්ථය Artu E Grammatica de | ගරු. පියර්පේගු (ජේ.නි) පියතුමා |
| | ශුද්ධවන්තයන් 26 දෙනෙකුගේ ජීවන චර්යාව, දහම් අධ්‍යාපන ග්‍රන්ථ ක්‍රිස්තු තුමන්ගේ දුක් විඳීම. | ගරු.පේද්‍රෝ ෆ්‍රැන්සිස්කෝ (ජේ.නි) පියතුමා |
| | කවි, නාට්‍ය, ගීත | ෆ්‍රැන්සිස්කානු නිකායේ ධර්මදූතවරයකු වූ ගරු අන්තෝනියේ ජෙක්ෂාවෝ |
| | සුවිශේෂය, පාවුලුතුමාගේ සන්දේශ | දොන් ජෙරෝනිමෝ (අලගියවත්ත ) |
| දෙමළ කිතුනු සාහිත්‍යය | සන්නියාංගොමෙයොං අම්මනෙ | තෙල්ලිපලෙයි පේදුරු කිවියා |
| | ඥාණ පල්ලු | තෙල්ලිපලෙයි පේදුරු |

### 9.2.1.5.2 පෘතුගීසි යුගයේ චිත්‍ර මූර්ති ගොඩනැගිලි කලාව

- ගලින් නෙළන ලද පෘතුගීසි සංකේත 'ලාංඡන' කොළඹ ජනාධිපති මාළිගාවට පහළ ප්‍රදේශයේ (හේර්ඩන් වත්ත) ගොඩනගා ඇත.
- ශු. ආනා තිරය :- 1666 වර්ෂයට අයත් නවගමුව ශුද්ධ වූ ආනා දෙව් මැඳුරේ තිරයේ ඇති මෙම චිත්‍රය අද තේවත්තේ ප්‍රදර්ශනය කර ඇත.
- යාපනයේ සංකාල ප්‍රදේශයේ කැඩුණු කිතුනු දේවස්ථානයක් සොයා ගෙන ඇත.
- කිලාලි සන්තියාගෝ තුමන්ගේ දේවස්ථානයේ තෙල්ලිපලෙයි පේදුරු පාවුලු දේවස්ථානය වට්ටුක්කෝට්ටෙයි CSI කැතීඩ්‍රල් යන්න සාක්ෂ්‍ය ලෙස පවතී.

### 9.2.1.5.3 පෘතුගීසි කාලයේ වේදිකා කලාව (නාට්‍ය /නාඩගම් කලාව)

- පෘතුගීසි කාලයේ විශේෂයෙන්ම ජේසු නිකායයේ පූජකවරුන් විසින් බටහිර සම්ප්‍රදායයේ නාට්‍ය වේදිකාගත කරන ලදි.
- මධ්‍යම යුගයේ සම්පාදනය කරන ලද දහම් දැනුම නාට්‍ය, ප්‍රතිහාර්ය නාට්‍ය, විනය සාරධර්ම වැනි නාට්‍ය තමන් දත් පෘතුගීසි, ස්පාඤ්ඤ සම්ප්‍රදායයන් සමඟ මෙහි දී යොදා ගෙන ඇත.
- සාම්ප්‍රදායික කතෝලික ගැමි නැටුම් ( නාට්ටු කූත්තු) මන්නාරම යාපනය වැනි ප්‍රදේශවල ඇරැඹී පැතිර ගියේ ය. මන්නාරම නානාට්ටාන් ප්‍රදේශයට අයත් බෙන්ජමින් සෙල්වම් ලියූ "මන්නාරම් දිස්ත්‍රික්කයේ දෙමළ බුද්ධිමතුන්ගේ ඉතිහාසය" නමැති ග්‍රන්ථයේ මන්නාරම මාතෝට්ටම් ප්‍රදේශයේ ලෝරන්ස් පිල්ලෙයි ප්‍රථමයෙන් 'මුවිරාසාක්කලින් වාසාප්පු' නමැති නාට්‍ය ගායනා කර ඇති බව පවසයි. මෙය දක්ෂිණාකාරයෙන් ගයා ඇත.
- ධර්මදූතවරු තම ආගමික ඉගැන්වීම් සඳහා නාට්‍ය කලාව භාවිත කර,නාට්‍යයන් වේදිකාගත කිරීම සඳහා දේවස්ථානවලට යාබද ව නාට්‍ය වේදිකා තැනූ හ. පහත සඳහන ඒවා උදාහරණ ලෙස ගත හැකිය.

**පෘතුගීසි ධර්මදූත නාට්‍යයන් වේදිකා ගත වූ අවස්ථා :-**

| වර්ෂය | ස්ථානය | අවස්ථා | නාට්‍ය |
|---|---|---|---|
| 1604 | කොළඹ | ජේසු නිකායයට අයත් දේවස්ථානයේ මංගල්‍ය අවස්ථාවේ දී | "ගිවිසුම හා දේව මැණියෝ" |
| 1613 | කොළඹ | සාමාන්‍ය ජනතාවගෙන් බොහෝ දෙනෙක් කිතු දහම වැලඳගත් අවස්ථාවේ දී | "කිතු උපත" |
| 1617 | හලාවත | අලුතින් ඉදි කරන ලද දේවස්ථානය ආශීර්වාද කරන අවස්ථාවේ දී | "කොන්ස්ටන්ටයින් අධිරාජයාගේ සිත් හැරීම" |
| 1636 | මාතර | | ක්‍රිස්තුන් වහන්සෙගේ, ආදම්, ඒව යන ජීවන චර්යාව |

### 9.2.1.6 පෘතුගීසින්ගේ පැමිණීම ශ්‍රී ලාංකික සමාජයට එල්ල කල බලපෑම

- ජනතාව අතර වූ කුල ක්‍රමය හීන විය.
- විවාහ ලියා පදිංචි කිරීමේ නීත්‍යානුකූල ක්‍රමය ආරම්භ විය. මෙය "තෝම්බු ක්‍රමය" නම් විය.
- බටහිර වෛද්‍ය ක්‍රමය හඳුන්වා දෙන ලදි.
- ජනතාව අතර පෘතුගීසි භාෂාව ප්‍රචලිත විය. වර්තමානයේ පවා බොහෝ පෘතුගීසි වචන භාවිතයේ පවතී. උදාඃ අලවංගුව, සපත්තුව, තුවාය, ඉස්තෝප්පුව
- තව ද පෘතුගීසි ආහාර පුරුදු (පාන්, වයින්, සලාද, අච්චාරු), නම් (සිල්වා, පෙරේරා, මෙන්ඩිස්, අල්මේදා, වාස්), සංගීතය (කපිරිඤ්ඤා, බයිලා) වැනි දෑ වර්තමානයේ ජන ජීවිතයට බලපෑම් එල්ල කර ඇත.
- ඒක භාර්ය සේවනය, ඥාන බැඳීම් (ඥාන මවුපියෝ) සුරක්ෂිත කරගන්නා ලදී.
- වෘත්තී වෙනස්කම් අහෝසි කරන ලදි.

### ලන්දේසි යුගය (1658 - 1796)

### 9.2.2 ලන්දේසි යුගයේ සභාව

- මහනුවර පාලනය කළ 2වන රාජසිංහ රජතුමාව පන්නා දැමීය.
- මෙය වාසිදායක කර ගත් ලන්දේසීන් 1639 දී මඩකලපුව පෘතුගීසින්ගෙන් අයත් කර ගත් අතර පසු ව ත්‍රිකුණාමලය, මීගමුව, කොළඹ, මන්නාරම, යාපනය යන ස්ථනයන් තමන් අත්පත් කර ගන්නා ලදි
- ලන්දේසීන් කැල්වින් දහම අනුගමනය කළ අතර එය මෙරට තුළ ද ව්‍යාපත කිරීමට පෙරමුණ ගත්තේ ය.

### 9.2.2.1 ලන්දේසි ප්‍රතිසංස්කරණවාදී දහම - පිලිප් බල්දේයුස් දේවගැති තුමා

- කැල්වින් දහම ශ්‍රී ලංකාව තුළ පතළ කිරීමට ගත් උත්සාහයේ පූරෝගාමී ව කටයුතු කළේ ගරු.පිලිප් බල්දේයුස් දේවගැති තුමා ය. ගාල්ලේ ලන්දේසි යුද්ධ භටයන්ට සේවය කිරීම සඳහා 1656 දී පැමිණී මෙතුමා පසු ව යාපනයට පැමිණි ප්‍රථම කැල්වින් ධර්මදූතවරයා විය. මෙතුමා 1658 - 1665 තෙක් ශ්‍රී ලංකාවේ සේවය කළේ ය.
- කතෝලිකයන්ගේ සිත් හරවා ප්‍රතිසංස්කරණවාදී සභාවට එක් කිරීමේ කටයුතු කිරීමේ පුරෝගාමියා විය. මවුපියන් හා වැඩිහිටියන් ඉරිදා දිනවල දේවස්ථානයට ගෙන්වා ගත්තේ ය. ගුරුවරුන් ඉගැන්විය යුතු දෑ දේවගැතිවරයා කියා දුන්නේ ය. දේවගැතිවරයා විසින් දහම් දේශනා හා වන්දනා පවත්වන ලදී.
- "සුවිශේෂය දේශනා කිරීමට උචිත විශිෂ්ට මාර්ගය ජනතාවට එම භාෂාව ඉගැන්වීමට වඩා ඔවුන්ගේ භාෂාව අප ඉගෙන ගැනීම යි." යන්න ඔහුගේ අදහස ය. එබැවින් ධර්මදූත කාර්යය සඳහා අවශ්‍ය දෙමළ භාෂාව ඉගෙන ගත්තේ ය.
- ධර්ම දේශනාව සඳහා අවශ්‍ය බොහෝ ග්‍රන්ථ ස්වදේශීය භාෂාවට පරිවර්තනය කර මුද්‍රණය කර බෙදා හැරියේ ය." අපේ ආගමේ ප්‍රධාන නියෝග" යන දහම් අධ්‍යාපන ග්‍රන්ථය මේවා අතුරින් ප්‍රධාන වේ.

- දහම් ගුරුවරුන්ගේ හිඟය මඟ හරවා සෙමනේරි පාසල් ආරම්භ කර දහම් ගුරුවරුන් පුහුණු කළේ ය. දහම් පාසලට නොපැමිණෙන සිසුන් උනන්දු කරවීම සඳහා ත්‍යාග ලබා දුන්නේ ය.

- ඕලන්ද නැගෙනහිර ඉන්දියානු කොම්පැනියේ අරමුණ ලාභ ලැබීම හා අඩු වියදමකින් වැඩි ආදායමක් ළඟා කර ගැනීම යි. දහම් සේවාවේ උනන්දුවක් නොදැක්වූ මෙම කොම්පැනියටත්, දහම් සේවාවේ පෙරමුණ ගෙන කටයුතු කරන දේව ගැති තුමාත් අතර පරස්පර විරෝධි අදහස් වූ හෙයින් ගැටලු මතු විය. එබැවින් තම සේවය අත්හළ දේවගැතිවරයා නැවත මවු රට බලා ගියේ ය.

## 9.2.2.2 ඕලන්ද රෙපරමාදු සභාවේ දහම් සේවාව :-

ලන්දේසි සමයේ කතෝලික ආගම තහනම් ආගමක් විය. බොහෝ කතෝලික ධර්මදූතවරු තම මව් රටට පිටත් කර යනු ලැබූ හ. කතෝලිකයන්ට ප්‍රසිද්ධියේ හෝ රහසින් හෝ තම වන්දනාව පැවැත්විය නොහැකි තත්ත්වයක් උදා විය. බොහෝ කතෝලික දේවස්ථාන විනාශ කරන ලදි. බොහෝ කතෝලිකයෝ කැල්වින් දහම වැලඳ ගත් හ. මෙලෙස වසර 30ක් පමණ විවිධ පීඩාවන්ට මුහුණ දුන් කතෝලිකයන්ගේ විශ්වාසයට ආලෝකය දීම සඳහා ඔරතෝරියානු සභාවේ පූජකයෝ ලංකාවට පැමිණ දහම් සේවාවේ නියැළුණ හ.

### ශුද්ධ වූ ජුසේවාස් පියතුමා

- ශු. ජුසේවාස් පියතුමා 1686 දී ගෝවා රටින් ලංකාවට පැමිණියේ ය. යාපනයේ සිල්ලාලේ නම් ග්‍රාමයේ තම සේවාවේ වාසස්ථානය කරගත් මෙතුමා සෑම දිනක ම රාත්‍රියේ දිව්‍ය පූජාව ඔප්පු කර, දහම් දේශනා කර, සක්‍රමේන්තු දානය කරමින් කතෝලිකයන්ගේ ආත්මික අවශ්‍යතා උනන්දුවෙන් ඉටු කළේ ය.

- මෙතුමන්ගේ ආදර්ශවත් ජීවිතයත් එතුමන් මඟින් ප්‍රකාශ වූ කිතුනු ගුණාංගත් ජනතාවගේ සිත් ඇදගත් අතර, කතෝලික ආගම කරා ද ඇදී ගිය හ. විශේෂයෙන් එතුමාගේ ලෞකික ආශාවලින් තොර ජීවිතය, ගෞරවාන්විත ක්‍රියාකලාපය, උපවාසය, ආහාර පුරුදු, තම ආශාවන් වර්ධනය කර ගැනීම ආදිය කතෝලිකයින්ගේ ජීවිතයේ විවිධ වෙනස්කම් ද විශ්වාසය ද තහවුරු කළේ ය.

- 1690 දෙසැම්බර් 25 වන දින කිතු උපත දිව්‍ය පූජාව ස්ථාන 3ක පැවැත්වීමට සූදානම් කර, පළමු දිව්‍ය පූජාව අවසන් වී දෙවන දිව්‍ය පූජාවට යාමට සිටි අවස්ථාවේ දී ඕලන්ද හමුදාව එම ස්ථානය වැටලූ හ. ජුසේවාස් පියතුමා දේව අනුග්‍රහයෙන් බේරුණේ ය.

- පසුව යාපනයේ සිටීම අනාරක්ෂිත බව වටහාගත් එතුමා එතැනින් පිටත් ව, පුත්තලමට ගොස් වසර 2ක් පමණ සේවය කර, 1692 දී මහනුවර බලා පිටත් විය.

- මහනුවරට ඇතුළු වීමට අවසර පතා සිටි එතුමා පෘතුගීසි ඔත්තුකාරුවකු යැයි සිතා සිරගත කළ හ. පසුව දෙවන විමලධර්මසූරිය රජු ජුසේවාස් පියතුමාගේ බැහැපත් සාමකාමී ගුණය දැක, එතුමා නිදහස් කර නිදහසේ සේවය කිරීමට අවසර ලබා දුන්නේ ය.

- මහනුවර නියඟයක් ඇති වූ අවස්ථාවේ, දෙවන විමලධර්මසූරිය රජුගේ ඉල්ලීමට සවන් දී ජුසේවාස් පියතුමා ගැඹුරු විශ්වාසයකින් දෙවිඳුන්ට යාච්ඤා කර වැස්ස ලබාදීමට කටයුතු කළේ ය.

- ක්‍රි.ව. 1697 දී නුවර ඇති වූ "වසූරිය" නම් බෝවෙන රෝගයෙන් පීඩා විඳින අය සොයාගොස් පරිත්‍යාගී ව සේවය කළේ ය.

- ජුසේවාස් තුමා ස්වදේශීය ආගමටත්, සිරිත්-විරිත්වලටත් ගරු කළේ ය. සිංහල දෙමළ භාෂා හොඳින් ඉගෙන ගෙන තම ධර්මදූත කාර්යය සඳහා උපයෝගී කරගත් අතර, අනෙකුත් ධර්මදූතවරයන් ස්වදේශීය භාෂාව ඉගෙනීමට උනන්දු කළේ ය.

- දේශීය සංස්කෘතික ගුණාංග, සම්ප්‍රදායන් අතර සම්බන්ධතා ගොඩනැගීමට උනන්දු වූ මෙතුමා, දෙමළ සිංහල භාෂා හොඳින් ඉගෙන ගෙන මෙම භාෂාවලින් යැදීමටත්, දේශීය ගීත, සංගීත ආදිය උපයෝගි කර ගැනීමටත් කතෝලික ජනවන්දනා සංස්කෘතිය බිහි කළේ ය. දෙමළ භාෂාවෙන් බොහෝ යාච්ඤා පොත් ලිව්වේ ය.

- එතුමාගේ ධර්මදූත සේවය යාපනය, පුත්තලම, මහනුවර, මඩකලපුව, ත්‍රිකුණාමලය, කඳුරට, කොළඹ, කළුතර, රත්නපුරය,බේරුවල වැනි ප්‍රදේශවල පැතිර ගියේය.

- "ලංකාවේ අපෝස්තුලුවරයා" යන විරුදාවලිය ලත් මෙතුමා වසර 24ශ්‍රී ලංකාවේ සේවය කර පසු ක්‍රි.ව.1711 දී ස්වර්ගස්ථ වූයේ ය. 2015-01-16 වන දින ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන් විසින් එතුමා ශුද්ධවරයට ඔසවන ලදි.

**ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා**

- ශ්‍රී ලංකාවේ කිතුනු සාහිත්‍යය ගොඩනැගීමෙහිලා පෙරමුණ ගත් මෙතුමා ක්‍රි.ව. 1676 දී දිවාරි නම් ස්ථානයේ දී උපත ලැබී ය.

- මහා දැනුමක්ද, සංගීත ඥානයක් ද, බහු භාෂා ඉගෙනීමේ හැකියාවක් ද ඇති මෙතුමා තම උසස් අධ්‍යාපනය නිම කර පූජකවරයකු වීමට කැමැත්තක් දක්වා ඔරතෝරියානු නිකායට එක් වී 1700 දී නොවැම්බර් 2 වන දින පූජාත්වරය ලැබී ය.

- විශ්වවිද්‍යාලයයේ මහාචාර්යවරයකු ලෙස පත් කරනු ලැබූ විට විශ්වවිද්‍යාලයීය උපාධිධාරීනට උගන්වනවාට වඩා කිතු දහම නොදත් අහිංසක ජනතාවට දහම් දැනුම ලබාදීමට කැමැත්ත දැක්වූයේ ය.

- යාපනයේ මෙනෙසෙස් තුමන් හා එක් ව සේවය කර දෙමළ භාෂාව හොඳින් ඉගෙන ගත්තේ ය. නුවරු බෙත්රෝ කුස්තාන් නමැති ගුරුතුමන්ගේ මඟපෙන්වීම යටතේ සිංහල භාෂාව ඉගෙන එහි නිපුණයෙක් විය.

- තම ජීවිත කාලය තුළ සිංහල, දෙමළ, ලතින්, පෘතුගීසි, ස්පාඤ්ඤ, ඕලන්ද භාෂාව වැනි විවිධ භාෂා කථා කිරීමටත් කියවීමටත්, ලිවීමටත් දක්‍ෂතාව වර්ධනය කරගත් ජාකොමේ පියතුමා තම දැනුම හා කුසලතාව ධර්ම ප්‍රචාර සේවය හොඳින් කර ගැනීමට උදවු කර ගත්තේ ය.

- මෙතුමා, සිංහල, දෙමළ භාෂාවලින් ද සංවාදයක ආකාරයෙන් ද කාව්‍යමය ආකාරයෙන් ද උසස් සාහිත්‍ය භාෂාවෙන්ද සාමාන්‍ය ජනතාව කථා කරන භාෂාවෙන් ද ලියූ ග්‍රන්ථ කතෝලිකයෝ සහ අන්‍යාගමිකයෝ ඉතා උනන්දුවෙන් කියැවූහ.

- "ශ්‍රී ලංකාවේ සිංහල, දෙමළ කිතුදහම් සාහිත්‍යයේ පියා" වූ මෙතුමා ග්‍රන්ථ 42කට වඩා ලියා ඇත. ග්‍රන්ථ 22ක් සිංහල භාෂාවෙන් ද ග්‍රන්ථ 15ක් දෙමළ භාෂාවෙන් ද ග්‍රන්ථ 4ක් පෘතුගීසි භාෂාවෙන්ද පෘතුගීසි - දෙමළ - සිංහල භාෂාවලින් ශබ්දකෝෂ ද ලියා ඇත.

- දේශීය භාෂවෙන් උගත් මොහු ජනවන්දනාවට අවශ්‍ය ග්‍රන්ථ, ගීත ආදිය ලියා ඇත. දේවස්ථානවල ගැයෙන ගීත, සංගීතය, ප්‍රතිමාව රැගත් පෙරහැරවල්, අර්ථවත් නාට්‍යය, දුක් විඳීමේ දර්ශන ආදියෙන් කතෝලිකයන්ගේ විශ්වාසය සැම තැනක ම ප්‍රචාරය වී වර්ධනය විය. අන්‍යාගමිකයෝ ද කතෝලික දහම පිළිබඳ ව ප්‍රශංසා මුඛයෙන් කථා කළ හ.

- දේශීය භාෂාවෙන් කතෝලික සංස්කෘතියට ඇති කළ ගෞරවයත් ප්‍රශංසාවත් එතුමන්ට ම හිමි වේ.

- වසර 37ක් ලංකාවේ සේවය කළ පසු ක්‍රි.ව. 1742 ජූලි 17 වන දින මෙලොවින් සමු ගත්තේ ය.

### 9.2.2.3 ලන්දේසි යුගයේ අධ්‍යාපන සේවය :-

- පෘතුගීසින් මෙන් ම ලන්දේසීන් ගේ දහම් සේවාව පොදුවේ පාසල් පාදක කර ගනිමින් සිදු විය. "දහම් ප්‍රචාරයේ අත්තිවාරම පාසල" යන්න ඔවුන්ගේ අදහසයි.

- මොවුන්ගේ පාලන සමයේ ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ මහත් වර්ධනයක් දැකිය හැකි විය. පෘතුගීසි අධ්‍යාපන ක්‍රමය ස්වදේශිකයන් කිතුදහම හා එක් කිරීමටත්, දහම් ප්‍රචාරයටත් මාධ්‍යයක් කරගෙන ක්‍රියා කළෝය. ලන්දේසීන් ශ්‍රී ලාංකිකයන්ගේ ජීවිතයේ හා සමාජ යහපත කෙරෙහි උනන්දු වූ බැවින් එකල අධ්‍යාපනය ඒවා සමඟ බැඳී පවතිනු දැකිය හැකි විය.

- මෙම කාලයේ උසස් අධ්‍යාපනය ලබන අවස්ථාව ශිෂ්‍යයන්ට ලැබිණි. අනිවාර්ය අධ්‍යාපනය ක්‍රියාත්මක වීම. ගැහැනු පිරිමි දරුවන් පාසලට පැමිණීම අනිවාර්ය කරන ලදි. දේවගැතිවරුද දහම් ගුරුවරු ද පාසල් ගුරුවරුන් ලෙස  සේවය කළ හ.

- පෘතුගීසින්ගේ සමයේ ආගමික ආයතනවල අධ්‍යාපන ක්‍රමය පාලනය කළ ආකාරයට නොව ලන්දේසි සමයේ රාජ්‍ය පාලනය යටතේ පිළිවෙළක් ඇති හොඳින් සංවිධානය කරන ලද, අඩු වියදමකින් විශිෂ්ට අධ්‍යාපනයක් ලැබිය හැකි ක්‍රමයක් අධ්‍යාපනයෙහි ලා අනුගමනය කරන ලදි.

- රජය සියලු ම වියදම පිළිගෙන ගුරුවරු පත් කිරීම, පුහුණු කිරීම, පාලනය, පරීක්ෂකවරුන් ලවා පාසල් පරීක්ෂවරුන් කණ්ඩායම මඟින් පාලනය කිරීම කරන ලදි.

**ලන්දේසි කාලයේ පාසල් වර්ග 4ක් ක්‍රියාත්මක විය.**

1 දේවස්ථාන අනුබද්ධ පාසල්

2 සෙමනේරි පාසල් (දෙව්සත්හල්)

3 ලන්දේසි පාසල්

4 අනාථ නිවාස

### 1 දේවස්ථාන අනුබද්ධ පාසල්

- මෙම පාසල් පෘතුගීසි කාලයේ ඇති කරන ලද ඒවා ය. පසු ව ලන්දේසි පාලන සමයේ ඔවුන් විසින් පාලනය කරන ලදුව පවත්වාගෙන යන ලදි.

- රජය මඟින් පාසලේ සේවය කරන ගුරුවරුන්ට අදාළ සේවය, වේලාව, පුහුණුව, ඔවුන්ගේ වගකීම් නිතර නිතර පැහැදිලි කරන ලදි.

- මෙම පාසල්වල මුල් ගුරු ලෙස කිතුනු, වැඩිහිටි ප්‍රබල පවුලක පුද්ගලයෙක් පත් කරනු ලැබීය. මොහු තෝම්බු ක්‍රමයට ලියාපදිංචි කිරීම සිදු කළේ ය. (උපත, විවාහ බෞතීස්ම ලියාපදිංචිය) මේ නිසා සමාජයේ මොහුට ගෞරවයක් ඇති විය.

- මෙම පාසල්වල ස්වදේශීය භාෂාව උපයෝගි කරගන්නා ලදි. ඉගැන්වීමේ ක්‍රම ලෙස ප්‍රශ්නෝත්තර ක්‍රමය, කියවීම, ලිවීම යොදාගෙන කිතුනු ප්‍රතිපත්ති ආදිය උගන්වන ලදි.

- අනිවාර්ය අධ්‍යාපනය හඳුන්වාදී වයස අවු: 8-15 තෙක් වූ දරුවන් පාසලට යාම අනිවාර්යය කරන ලදි. ඉන් පසුත්  වසර 3කට 4කට පසු සතියකට දෙවරක් පාසල් යාමට අනිවාර්ය කරන ලදි.

- මෙම පාසල් ක්‍රමයේ "පරීක්ෂාව" වැදගත් තැනක් ගතී. මෙය වසරකට වරක් දැනුම් දීමකට අනුව අදාළ දින ග්‍රාමයේ නායකයා, ගුරුවරුහු, සිසුහු සැවොම පාසලට පැමිණ සිටිති. එම අවස්ථාවේ සිසුන්ගේ කියවීම, ලිවීම, ආගමික ප්‍රශ්නෝත්තර, දස පනත, විශ්වාසයේ සත්‍යතා ස්වාමිවාක් ආරාධනාව ආදිය ප්‍රශ්නෝත්තර ක්‍රමයට පවත්වා ත්‍යාග ලබා දෙන ලදි.

### 2. දෙව්සත්හල් (සෙමනේරි) පාසල්

- බටහිර අධ්‍යාපන ක්‍රමය මෙහි දී ප්‍රයෝජනයට ගන්නා ලදි. මෙම පාසල් සිසුහු පූජකවරුන් ලෙස, ලිපි කරුවන් ලෙස, භාෂා පරිවර්තකයින් ලෙස, උපදේශකයින් ලෙස පුහුණුව ලැබූ හ. උසස් පෙළ පන්තිවල ඕලන්ද (ඩච්) භාෂාව අවශ්‍යතාව අනුව ලතින් ග්‍රීක් ආදිය භාෂා කිතු දහම තර්ක ශාස්ත්‍රය වැනි විෂයක් උගන්වන ලදි. ශිෂ්‍යයෝ මෙහි සිට ඕලන්දයේ ඇති "ලේඩන්" (Leyden) විශ්වවිද්‍යාලයයට යවනු ලැබූ හ.

- දෙව්සත්හල් (සෙමනේරි) අධ්‍යාපන ක්‍රමය කොම්සම යටතේ නොතිබිණි. ආරම්භයේ මෙම පාසල් කොළඹ යාපනය හා නල්ලූර් ප්‍රදේශවල දැකිය හැකි විය. විශිෂ්ට මුල් ගුරුවරුන් නොමැති හෙයින් 1732 දී යාපනයේ පාසල් වසනු ලැබ ශිෂ්‍යයෝ කොළඹට යවනු ලැබූ හ.

- මෙහි (ඩච්) ඕලන්ද භාෂාව, සාහිත්‍ය ආදිය වැඩියෙන් උගන්වන ලදී. මෙම පාසල්වල දෙමළ, සිංහල සිසුන්ට අනුමති නීතිය යටතේ සැලසුම් කර තිබිණි.

- මෙහි අධ්‍යාපනය ලැබූ සිසුහු ස්වදේශීය පාසල්වල ගුරුවරුන් ලෙස පත් කරනු ලැබූහ. තවද මුදලියාර් ග්‍රාමයේ නායකයා යන උසස් තනතුරු ලැබූ හ.

- තව ද මෙහි පුහුණුව ලැබූ අය රාජ්‍ය තනතුරුවල පමණක් නොව නැගෙනහිර ඉන්දියාවේ ඕලන්ද සමාගමේ තනතුරු ලබාගත් හ.

### 3. ලන්දේසි පාසල්

- ලන්දේසි සමයේ ලංකාවේ ලන්දේසි පාසල් කිහිපයක් දැකිය හැකි විය.

- ලන්දේසි ළමයි මෙහි දී අධ්‍යාපනය ලැබූ හ. පූජකවරු උපදේශකවරු මෙහි දී අධ්‍යාපනය ලැබූ හ. ලිවීම, කියවීම, ගණිතය වැනි විෂය උගන්වන ලදි.

- මෙවන් පාසල් 1737න් 04ක් කොළඹ තිබිණි. ඒ සමඟ ගාල්ල මාතර යාපනය වැනි ස්ථානවලත් මෙම පාසල් දැකිය හැකි විය. මෙහි ද අධ්‍යාපනය ලැබූ ශ්‍රී ලාංකිකයෝ ඕලන්ද විශ්වවිද්‍යාලයවලට යවනු ලැබූ හ.

### 4. අනාථ නිවාසවල පාසල් :

- ඕලන්ද සමයේ 4 වන වර්ගයේ පාසලක් ලෙස අනාථ මඩම්වල පාසල් දැකිය හැකි විය. මෙහි පිරිමි ගැහැනු දෙපාර්ශ්වය ම අධ්‍යාපනය ලැබූ හ. ලිවීම, කියවීම, අංක ගණිතය,, ආගම ආදිය උගන්වන ලදි.

- ඒ සමඟ ම පිරිමි ළමයින්ට වාණිජ සහ ගැහැනු ළමයින්ට ගේදොර වැඩ ද, මැසීම, ගෙතීම වැනි දෑ ද උගන්වන ලදි. මෙම පාසල් රාජ්‍ය අනුග්‍රහයෙන් පවත්වන ලදි. සිසුහු තම පුහුණුව අවසන් කර වයස අවුː 18-20 දී එහි සිට පිටත් වූහ.

## 9.2.2.4 ලන්දේසි සමයේ කලාව :-

## 9.2.2.4.1 ලන්දේසි සමයේ කිතුනු සාහිත්‍ය :-

- ලන්දේසීන්ගේ සාහිත්‍ය ග්‍රන්ථ, වාක්‍ය ග්‍රන්ථ, ශබ්දකෝෂ ආදිය ඕලන්ද හා සිංහල භාෂාවලින් සම්පාදනය කරන ලදි.

- ශුද්ධ වූ ගීත, භක්ති ගීත, ජනවන්දනා ග්‍රන්ථ, ඕලන්ද භාෂාවෙන් සිංහල භාෂාවට පරිවර්තනය කරන ලදී.

- ක්‍රි.ව. 1738 දී පළමු මුද්‍රණ පිටපත් හිමිකම ලත් සිංහල ග්‍රන්ථය ප්‍රකාශයට පත් විණි. මෙම ග්‍රන්ථයේ ස්වාමිවාක් ආරාධනාව උදේ සවස යැදුම්, අනුභවයට පෙර හා පසු යැදුම්, විශ්වාස ලක්ෂණය, දසපණත ආදිය අඩංගු වී ඇත.

- ක්‍රි.ව. 1755 දී කොළඹ දෙව්සත්හලේ ශස්ත්‍රපති මණ්ඩලයේ ඇන්ටනි පෙරේරා, ලූවි ද සේරම් නමැත්තන් විසින් සම්පාදනය කරන ලද ගීතිකා පොත් එළි දක්වන ලදී. මේ සඳහා වන ගීතිකා සටහන් යුරෝපා ක්‍රමයට ගොඩනඟන ලදි.

- ඕලන්ද රජය කිතුනු සාහිත්‍යයට දුන් ප්‍රධාන දායකත්වය වූයේ ශුද්ධ බයිබලයේ නව ගිවිසුම මුළුමනින් පැරණි ගිවිසුමේ සමහර කොටස් ද සිංහල භාෂාවට පරිවර්තනය කිරීමයි.

- ක්‍රි.ව.1705 දී මැයි මස 09වන දින ලංකාවට පැමිණි ජාකොමේ ගොන්සාල්වේස් පියතුමා සිංහල, දෙමළ කිතුනු සාහිත්‍යයට මහත් සේවයක් කළ බව සිහි කළ යුතුය.

**ශබ්දකෝෂය**

- මිශනාරිවරු සිංහළ දෙමළ ඉගෙනීමට සහය දීම සඳහා පෘතුගීසි-දෙමළ-සිංහල ශබ්දකෝෂයක් සම්පාදනය කළෝ ය. තව ද සිංහල - පෘතුගීසි ශබ්දකෝෂයත්, පෘතුගීසි සිංහල ශබ්දකෝෂය සහ දෙමළ වචන අකාරාදියත් ලියූ හ.

## 9.2.2.4.2 චිත්‍ර කලාවඃ-

- කුරුණෑගල රිදී විහාරයේ මූලස්ථානයේ කිතුනු චිත්‍ර ඇඳ ඇති උළු, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සොයා ගෙන ඇත පහත සඳහන් කරුණු එහි දී දැකිය හැක.

- ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානය, ක්‍රිස්තුන් වහන්සේ දේවස්ථානයේ ඔප්පු කිරීම, ක්‍රිස්තුන් වහන්සේ මුහුද මත ඇවිදීම, ක්‍රිස්තුන් වහන්සේ අන්‍යාරූප විලාශ වීම,මාර්තා මරියා යන නව ගිවිසුම සිදුවීම් මෙම චිත්‍රවල දැකිය හැක. ක්‍රිස්තුන් වහන්සේ ලන්දේසීන්ගේ ඇඳුම් ඇඳ සිටිම මෙම චිත්‍රවල විශේෂාංගයකි. එතුමාගේ හිසවටා ආලෝකාරාවක් පවතී.

## 9.2.2.4.3 වේදිකා කලාවඃ-

ලන්දේසි සමයේ කතෝලික ආගම තහනම් කර තිබූ හෙයින් නාට්‍ය වේදිකා ගත කිරීමට අවස්ථා ඉතා අඩුවෙන් ලැබිණි. පෘතුගීසීන්ගේ සමයේ මෙන් ප්‍රසිද්ධියේ නොපෙන්වුව ද, රහසින් නාට්‍යයක් පෙන්වන ලදි. නාට්ටු කුත්තු (වීදි නාට්‍ය) දුක පදනම් කරගෙන ගොඩනගන ලදි. මෙම කාලයේ දුක් වේදනාවන්ට මුහුණ දී කතෝලික විශ්වාසය තහවුරු කිරීමත්, දුක වෙනුවට යහපත් උදා වන බව ඉගැන්වීමට ත්ය, ශුද්ධවන්තයන්ගේ ජීවන චර්ය ආදීය නාට්ටු කුත්තු (වීදි නාට්‍ය) මගින් එළි දක්වන ලදී. නමුත් වන්නි ප්‍රදේශයේ ධර්මදූතවරුන්ට පූර්ණ නිදහසක් තිබුණු හෙයින් මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගෙන ජුසේවාස් පියතුමා තම පූජකවරුන්ගේ සහය ඇති ව 1706 දී ගෝවා ඔරතෝරියානු නිකායයෙන් ගෙනෙන ලද ඇඳුම් ආයිත්තම් උපයෝගී කර ගනිමින් පාස්කු නාට්‍ය වේදිකා ගත කරන ලද බව ඔවුන්ගේ වාර්තාවේ සඳහන් වී ඇත.

## 9.2.2.5. ලන්දේසීන්ගේ පැමිණීම ශ්‍රී ලාංකේය සමාජයට කළ බලපෑම්ඃ-

- ස්වයං රැකියා ස්ථාන, වගා බිම් ආදිය හඳුන්වා දෙනු ලැබ ජනතාවට තම ආදායම් මාර්ග වැඩි කර ගැනීමේ අවස්ථාව ලැබිණි. වියළි ප්‍රදේශවලට ජලය ලබා දී සශ්‍රීක කරන ලදි.

- වෙළෙඳාම තුළ ඇති වූ වෙනස්කම් නිසා නගර දියුණු විය. මෙම නගර එක්කර මහා මාර්ග ගොඩනගන ලදි. කුඩා ගංගා පාලම් මගින් ද විශාල ගංගා පාරු සේවාව මගින් ද සම්බන්ධ කරන ලදි.

- මුද්‍රණ යන්ත්‍රණය ප්‍රථමයෙන් ලංකාවට හඳුන්වා දී දෙමළ සිංහල අක්ෂර කපා විවිධ ආගමික ග්‍රන්ථ හා අත් පත්‍රිකා බෙදා හරින ලදි.

- රෝම ලන්දේසි නීතිය හඳුන්වා දෙන ලදි.

- ඕලන්ද ඇඳුම්, අල්මාරි,පොට්ටනිය මේසය ලාච්චුව වැනි නිවසේ උපකරණ ද ජනතාවට පුරුදු විය. තව ද ස්වදේශීය භාෂාවන්හි ලන්දේසි වචන අදත් භාවිතා වේ.

  උදාඃ- ලාච්චුව, කන්තෝරුව,නොතාරිස්

- රෝගීන්ට උපස්ථාන කිරීම සඳහා රෝහල්වල නේවාසිකාගාර පිහිටුවා හෙදියෝ හා මේට්‍රන්වරු පුහුණු කරුනු ලැබූ හ.

- උසාවි ආරම්භ කර නීත්‍යානුකූල විමසීම් දඬුවම් ලබා දීම් ආදිය ක්‍රියාත්මක කර ඇත. මේ නිසා ජනතාවට යුක්තිය ඉටු විය.

- කෝපි,කුරුඳු, එනසාල්,කරාබු නැටි, පොල් ආදිය නිෂ්පාදන වර්ධනය වූ අතර විවීම, ඒවාට සායම් යෙදීම, ඒවා විකිණීම වැනි කටයුතු පුළුල් කර, ජනතාවට ස්වයං රැකියාවලටත්, ව්‍යාපාරවලටත් සහභාගි වීමට ඉඩ සලසන ලදී.

### 9.2.3 බ්‍රිතාන්‍ය යුගයේ සභාව (1796 - 1948)

#### බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව අත්පත්කර ගැනීම

- ඉන්දියාවේ පැවති ප්‍රංශයේ බලාධිකාරිය අවසන් කිරීමට සිතූ බ්‍රිතාන්‍යයන් නැගෙනහිර ඉන්දියානු සමාගම තම අධිකාරිය පිහිටුවීම සඳහා බෙංගාල බොක්කේ තමන්ට පහසු වරායක් අවශ්‍ය වන බව දත් හ. ශ්‍රී ලංකාවේ වරායක් ගොඩනැගීමෙන් සියලු ප්‍රශ්න විසඳෙන බව සිතූ හ. ඔවුන්ගේ සිතුවිල්ල ත්‍රිකුණාමලයේ ස්වාභාවික වරාය දක්වා පැතිර ගිය හ.

- 1762 දී පයිබස් නම් පණිවිඩ කරුවා මහනුවර රජුවෙත යවනු ලැබී ය. ලන්දේසී හා ගැටුම් ඇතිකර සිටි මහනුවරු රජු මෙම අවස්ථාව ප්‍රයෝජනයට ගෙන ලන්දේසීන්ව ශ්‍රී ලංකාවෙන් පළවා හැරීමට ඉංග්‍රීසීන්ගෙන් සහය ලබා දුන්නොත් ඔවුන් පතන ත්‍රිකුණාමලය වරයා ඔවුන්ට ලබා දෙන පැවසී ය.

- මෙම කාල වකාවානුවේදී යුරෝපයේ බිතන්‍යයින් හා ලන්දේසීන් අතර යුද්ධයක් හට ගනි. මෙම අවස්ථාව උපයෝගී කර ගෙන ත්‍රිකුණාමලය යාපනය මන්නාරම 1796 දී කොළඹ ආදී ප්‍රදේශ තම පාලනයට ගත් හ. මෙලෙස 1796 දී ශ්‍රී ලංකාවේ ලන්දේසී පාලන සමය අවසන් විය.

- ලන්දේසීන්ගේ වස්තුව සියල්ල බිතාන්‍යයින්ගේ නැගෙනහිර ඉන්දියානු සමාගම අතට පත් විය. 1802 දී සියලු මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කරගන්නා ලදී.

- වසර 300 ක් පමණ එකම නිදහස් රාජ්‍යයක් ලෙස පැවති මහනුවර රාජධානිය 1815 දී බ්‍රිතාන්‍යයන්ගේ යටතට පත් විය.

### 9.2.3.1 ආගමික නිදහස

- ඉංග්‍රීසීන් නැගෙනහිර ඉන්දියානු සමාගමෙන් අත්පත් කර ගන්නා ලද ශ්‍රී ලංකාවේ සිවිල් පාලනය ඉංග්‍රීසි හමුදාපති වන කර්නල් ජේම්ස් ස්ටුවඩ්ට බාර දෙන ලදී.

- ලංකාවේ ඔරතෝරියානු නිකායේ ශ්‍රේෂ්ඨාධිපති ගරු ඩොමිංගොස් මොන්ටෙයිරෝ තුමන් හමුදාපති තුමා හමු වී ලංකාවේ කතෝලිකයන්ගේ තත්ත්වය පිළිබඳ පැවසුවේය. 1796 දී ඉංග්‍රීසි ලන්දේසී පෘතුගීසී යන භාෂා තුනෙන් දැන්වීම් මඟින් ශ්‍රී ලංකාවේ සිටින රෝමානු කතෝලික පූජකවරුන් තම ආගමික ක්‍රමය අනුව ජනවන්දනාවට කිසිඳු බලපෑමකින් තොරව පැවැත්වීමට අනුමැතිය ලබා දී එය කිසිවකුත් වැළැක්වීමට නොයුතු බවට නියෝග කළේ ය.

- 1798 දී පැඩ්රික් නෝත් නමැත්තා ශ්‍රී ලංකීය පරිපාලනය බාර ගත්තේ ය. ඔවුන් කතෝලිකයින් තම ආගමානුකූලව බෞතිස්මය, විවාහය, මිය ගියවුන් භූමදාන කිරීම වැනි දෑ ඉටු කිරීමටත් කතෝලිකයින් සම්පූර්ණ නිදහස සහිතව ආගම ඇදහීමටත් කතෝලික පූජකවරුන් දහම් සේවයේ නියැලීමටත් අනුමැතිය ලබා දෙන ලදී.

- කතෝලිකයින් කෙරෙහි ආදරය කරුණාව දැක් වූ මෙතුමා 1801 දී කතෝලික ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පාසල් ගොඩනැගීමටත් අනුමැතිය ලබා දී ලන්දේසීන් කතෝලිකයන්ට විරුද්ධව ගෙනෙන ලද නීති, නීති සංග්‍රහයෙන් ඉවත් කළේ ය.

- 1805 දී තෝමස් මෙට්ලන්ඩ් (1805 - 1811) නව ආණ්ඩුකාරවරයා ලෙස පත් කරනු ලැබීය. එතුමා කතෝලික ආගමික නිදහස 1806-05-27 වන දින නීත්‍යානකූලව ප්‍රකාශයට පත් කළේ ය.

### 9.2.3.2 (ඉංග්‍රීසි) බ්‍රිතාන්‍ය සමයේ අධ්‍යාපන සේවය :-

- ඉංග්‍රීසී භාෂාව විශ්වීය තත්ත්වය තුළ වැදගත් භාෂාවක් ලෙස ඉංග්‍රීසින්ගේ කාලයේ දී ගණනය කරන ලදී. මෙම පසුබිම තුළ ශ්‍රී ලංකාවේ වැඩි පිරිසක් ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමට ආරම්භ කළ හ.

- 1798 දී බ්‍රිතන්‍යයින් පාසල් වල වගකීම භාරගත් අවස්ථාවේ ඒවා ඇංග්ලිකන් බැප්ටිස්ට් වෙසලියන් ඇමරිකන් මිෂන් පූජකවරුන් පිරිසකට බාර දුන් හ.

- මෙම කාලයේ තුන් ආකාරයක පාසල් ක්‍රියාත්මක විය.

1 රජයේ පාසල්
මේවා බොහෝ විට දෙමළ සිංහල භාෂාවලින් පැවැත්වුණි. මේවා ඇංග්ලිකානු සභාව වේ. පූජකවරුන් විසින් පවත්වන ලදී.

2 මිෂනාරි පාසල්:-
මේවා ප්‍රොතෙස්තන්ත මිෂනාරිවරුන් විසින් පවත්වන ලදී.

3 පිරිවෙන් පාසල්
මේවා බෞද්ධ භික්ෂූන් වහනසේලා විසින් පවත්වනු ලැබූ ඒවා ය.

- බ්‍රිතාන්‍යයන්ගේ යුගයේ දී ජාති ආගම් වැනි වෙනස්කම් නොමැතිව සියලු දෙනාම එකට එක්ව ඉගෙන්වීමට අවස්ථාව ලැබුණු අතර ස්ත්‍රීන්ගේ අධ්‍යාපන තත්ත්වය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. 1824 දී කාන්තාවන් සඳහා උඩුවිල් හි පාසලක් ප්‍රථමයෙන් ඉදිකරන ලදී. මෙය ආසියාවේ ප්‍රථමයෙන් කාන්තාවන් සඳහා අරඹන ලද නේවාසික පාසලකි.

- මෙසමයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විද්‍යාව,වෛද්‍ය අධ්‍යාපනය ලබා දීම සඳහා ප්‍රථමයෙන් මානිෂ්වායි හි වෛද්‍ය විද්‍යාලයත් ස්ථාපනය කරන ලදී.

- කිතුනු දැනුම වර්ධනය කිරීම සඳහා ගොඩනගන ලද ක්‍රිස්තියානි සභාව වෙනුවෙන් (SPCK) 1801 දී ක්‍රිස්ටියන් ඩේවිඩ් නමැත්තා ලංකාවට පැමිණ යාපනයේ තම අධ්‍යාපන සේවය ඇරඹීය. (A society for promoting Christian knowledge)

- 1812 දී ජේම්ස් සේබර් නමැත්තාගේ නායකත්වය යටතෙ බැප්ටිස් මිෂනාරිවරන්ට ශ්‍රී ලංකාවේ රෝයල් විදුහල ආරම්භ කළේ ය.

- 1815 දී යුරෝපයේ සිට ලංකාවට පැමිණි කතෝලික සභාවේ පූජකවරුන් පැවිද්දන් ස්වදේශීය සිසුන්ගේ අධ්‍යාපනය කෙරෙහි තම දායකත්වය දී ඇත.

- ශ්‍රී ලංකාවට පැමිණී ඇමරිකානු මිෂනාරිවරුන් යාපනය තම සේවා ස්ථානය ගොඩනගා ළමා අධ්‍යාපනය කෙරෙහි තම අවධානය යොමු කළේ ය. 1823 දී වට්ටුකෝට්ටෙ නගරයේ උසස් මධ්‍යම පාසලක්ද උඩුවිල් බාලික විදුහලේ තව දුරටත් උඩුපිටි කරවෙට්ටි, පේදුරු තුඩුව, වාවකච්චේරි ය යන ස්ථාන පාසල ද ගොඩනැගවේ ය. දැනුම හා හැකියාවලින් හෙබි ස්වදේශීය ගැහැණු පිරිමි ළමුන් තෝරා ගෙන තම පාසල් වල ඉගැන්වීමට පුහුණු කළ හ. මොවුන්ගේ දැඩි කැපවීම නිසා වසර 20 ක් තුළ 235ක් වැඩි විදුහල් හා පාසල් ගොඩනගා 10,000/- කට අධික සිසුනට අධ්‍යාපනය ලබා දුන් හ.

- 1826 දී ලංකාවට පැමිණි ශු. පවුලේ පැවිදිවරියන් යාපනයේ කාන්තාවන් සඳහා කතෝලික ඉංග්‍රීසි පාසලක්ද 1873 දී ශ්‍රී හෘදයේ පාසල ක් ද, 1890 දී OLR පාසලක් ද පසුව ඉලවාලෙයි සිල්ලාලෙහි පාංශයූර් පේදුරු තුඩුව මාදගල් මයිලට්ටි වැනි ස්ථානවල පාසල් ආරම්භ කළ හ.

- පෙවුගිනි රදගුරුතුමාගේ ඉල්ලීම පරිදි 184 දී ලංකාවට පැමිණි නිමල මරිය නිකායේ පැවිදිවරුන් 1850 දී ශු. පැට්‍රික් විදුහලත් 1863 දී කොලුම්බුතුරෙ, 1887 දී මග්ගොන ප්‍රදේශයේ අනාථ සිසුන් සඳහා පාසලක් ද නේවාසිකාගාරයක් ද ගොඩනගා පිරිමි ළමුන්ව රැක බලා ගත් හ. තවද මග්ගොන වෘත්තිය දැනුම ලබා දෙන පාසලක් ද රජයේ ඉල්ලීම පරිදි තරුණ වූදිතයින් යහමඟට ගෙන ඒමේ පාසැලක්ද ගොඩනගන ලදී.

- ජේසු නිකායට අයත් වූවන් මඩකලපුවේ 1873 දී (ශු. මිඛායෙල් ) මයිකල් විදුහලත් ත්‍රිකුණාමලයේ 1867 දී ශු. ජුසේතුමාගේ විදුහලත්, ගාල්ලේ දි 1895 විදුහලක් ද, රත්නපුරයේ 1898 දී ශු. ඇලෝසියස් විදුහලත් ස්ථාපනය කළෝ ය.

- යහපත් එඬේරාගේ පැවිදිවරියන් 1902 දී කොළඹ ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයකත් 1904 දී සියලු සාන්තුවරයින්ගේ විදුහලත් (පුංචි බොරැල්ලේ) 1869 දී කොටහේන දී පාසලක් ද නුවර වැල්ලවත්ත මීගමුව වැනි ස්ථානවල පාසල්ද ගොඩ නැගු හ.

- ශු. බෙනදිකානු නිකායට අයත් සහෝදරවරුන් 1865 දී කොළඹ කොටහේන ශු. බෙනඩික්ට් විදුහල ගොඩ නැගු හ.

- 1905 දී ද ලාසාල් සහෝදරුවරුන් විසින් කොළඹ මෝදර ද ලාසාල් විදුහලත් ග්‍රෑන්ඩ්පාස්හි ශු. ජුසේ මුනිදුන්ගේ පාසලකුත් ආරම්භ කළේ ය.

## 9.2.3.3 බ්‍රිතාන්‍ය සමයේ කලාව

- බ්‍රිතාන්‍ය සමයේ දෙමළ, සිංහල සාහිත්‍යයන් බොහෝමයක් බිහි විය. එමෙන් ම චිත්‍ර, මූර්ති, වේදිකා කලාව වැනි කලා අංශ වර්ධනය විය.

## 9.2.3.31 බ්‍රිතාන්‍ය සමයේ දෙමළ කිතුනු සාහිත්‍යය

- ඉංග්‍රීසීන්ගේ කාලයේ ලංකාවේ සේවය කළ ඇමරිකානු මිෂනාරිවරුන් දෙමළ සාහිත්‍ය වර්ධනයට මහත් දායකත්වයක් දැක්වූවෝ ය. මොහු 1841 දී "උදයතාරගෛ" නමැති පුවත් පත ආරම්භ කළ හ. මාසිකව මෙම පුවත් පත එළි දැක්වුණි. "අවංකකම ඇති රට උසස් වේ. පාපී රටවල් ලැජ්ජාවට පත් වේ." යන්න මෙහි තේමාව යි. කිතු දහම ප්‍රචාරය කිරීම මෙම පුවත්පතේ අරමුණ යි.

- 1876 දී " කතෝලික පාදුකාවලන්" කතෝලික ජනතාවගේ විශ්වාසය වර්ධනය කිරීම සඳහා ආරම්භ කරන ලදී. ප්‍රථමයෙන් සතිපතා පුවත්පත ලෙස එළි දැක් වූ මෙම පුවත් පත වර්තමානයේ මාසික පුවත්පතක් ලෙස එළි දැක්වේ. මෙහි පළමු කතුවරයා M.A මර්ෆි (M.A. Murphey) සහ උපකතුවරයා ලෙස ජේම්ස් මාටින් සේවය කළෝ ය.

## 9.2.3.3.2 බ්‍රිතාන්‍ය කාලයේ සිංහල කිතුනු සාහිත්‍යයන් :-

- 1866. 06. 07 "ඥානාර්ථ ප්‍රදීපය" යන සිංහල පුවත් පත එළි දක්වන ලදී. මෙහි පළමු මුද්‍රණාධිපති ජී. යුවාම් ප්‍රනාන්දු නමැත්තා ය. ගරු ජෝන් පහමුගේ (නි.ම.නි.) පියතුමන් මෙහි පළමු කතුවරයාණෝ ය. ඇතුගල්පුර බෞද්ධ පවුලක උපන් මෙතුමා දේශීය සංස්කෘතියේ පුනරුදය පතා මෙම පුවත් පත භාවිතා කළේ ය.

- 1889 දී "භක්ති ප්‍රබෝධනය" යන සිංහල සඟරාවක් නිමල මරිය නිකයේ පියවරුන් ප්‍රකාශයට පත් කළ හ.

## 9.2.3.3.3 බ්‍රිතාන්‍ය යුගයේ චිත්‍ර හා මූර්ති කලාව

- බෙසල්ලේ නවරත්න නමැත්ත පේරාදෙණියේ ඇති ගුරු පුහුණු මධ්‍යස්ථානයේ ලී කැටයම් ඇතුළත් දේවස්ථානයෙ විශිෂ්ටාකාරයකට නිම වන ලද්දකි. මෙම දේවස්ථානයේ කුළුණු වල කිතුනු සංකේත කොටා ඇත.

- පෝල් නවරත්න නමැත්තා 1939-1940 වසරවල කිතු උපත පිළිබඳ චිත්‍ර ඇඳ ඇත්තේ ය. ජුසේතුමා, මරිය තුමී හා ඥානවන්තයින් මැස්නස් පෙරදිග සාම්ප්‍රදායික ඇඳුම් ඇඳ ගත් අයද, එළු පට්ටිය වෙනුවට නා ගහ ද උපයෝගී කර ඇති බව මෙම චිත්‍රයේ දැකිය හැකි විශිෂ්ටාංග වේ.

- හෙන්රිකස් නමැත්තා මෝදර ශු. ජාකොබ්තුමන්ගේ දේවස්ථානයේ චිත්‍ර ඇන්දේ ය. මොහු විසින් අඳින ලද අන්තිම රාත්‍රී භෝජන අවස්ථාවේ ඔහුත් ගෝලයෙක් යැයි සිතා ඇද ඇත්තේ ය. මෙය පෙරදිග සාම්ප්‍රදායික කලාවට සමව දැකිය හැක.

## 9.2.3.3.4 වේදිකා කලාව

- බ්‍රිතාන්‍ය යුගයේ (නාට්ටු කුත්තු) වීදි නාට්‍ය වේදිකා ගත කිරීම වෙනුවෙන් මිෂනාරිවරන්ගෙන් දැඩි විරෝධයක් ඇති වූ නමුත් නාට්‍ය වේදිකාගත කිරීම වෙනුවෙන් සාක්ෂි පවති.

- සිංහල වීදි නාට්‍ය (නාට්ටු කුත්තු) පාරම්පරිකව බිහි වී දියුණු වීමට දෙමළ වීදි නාට්‍ය (නාට්ටු කුත්තු) හේතුවක් විය. උදාහරණයක් ලෙස එස්තාකි, යෝසබාද්, එස් නිකලා, ශුභ සවුන්දරි වැනි ඒවා සඳහන් කළ හැක. "රජතුන් කට්ටුව" නාට්‍ය ප්‍රථමයෙන් සිංහලට පරිවර්තනය කරන ලද නාට්‍යයන් ය. මෙය හලාවත ගාබ්‍රියෙල් ප්‍රනාන්දු නමැත්තා පරිවර්තනය කළේ ය.

## 9.2.3.4 ශ්‍රී ලාංකික ජනතාවගේ සංස්කෘතියට බ්‍රිතාන්‍යයන්ගේ බලපෑම.

- සාම්ප්‍රදායික ඔටුන පැළඳවීමේ ක්‍රමය වෙනස් වී පාර්ලිමේන්තු ක්‍රමය හඳුන්වාදෙන ලදී.
- පැරණි ප්‍රභු පන්තිය අහෝසි වී නව මධ්‍යම පාන්තිකයින් බිහි වූහ.
- ඉංග්‍රීසි භාෂාව මගින් බටහිර අධ්‍යාපන ක්‍රමය රටේ වේගයෙන් පැතිර ගියේ ය.
- ප්‍රවාහන සහ සන්නිවේදන ක්‍රම දියුණු විය.
- අපනයනය සඳහා ධාන්‍යයන් හඳුන්වා දෙන ලදී.

ගමනාගමන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව නිසා යුරෝපියයන් බොහෝ දෙනෙක් ලංකාවට පැමිණිය හ. මේ නිසා නිවාඩුකාලයේ නේවාසිකාගාර, රාත්‍රී සාද ශාලා ආදිය ඇති කිරීම හේතුවෙන් පෙරදිග ඇඳුම් පැළඳුම්, සිරිත් විරිත්, සුබ පැතුම්, සුබ පතන ක්‍රම ආදිය හඳුන්වා දෙන ලදී.

**නිපුණතාව 9.0 : ආසියාතික රටවල කිතුදහමේ ව්‍යාප්තියේ ඉතිහාසය ඉගෙනීම තුළින් සමාජීය, සංස්කෘතික හා ආගමික උන්නතිය සඳහා තම දිවි කැප කරයි.**

**නිපුණතා මට්ටම 9.3 :** ශ්‍රී ලාංකකේය සමාජයේ තුළ මිනිස් සංහතියේ උන්නතිය සඳහා අවශ්‍ය දෑ හඳුනාගෙන තම වගකීම් ඉටුකරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 26

**ඉගෙනුම් පල**

- යටත් විජිත සමයේ සිට අද දක්වා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන තත්ත්වය පිළිබඳ කරුණු රැස් කරයි.
- අධ්‍යාපනයේ උන්නතිය මගින් ශ්‍රී ලාංකේය සමාජය ලබාගත් ප්‍රයෝජන අගය කරයි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ශුභසාධන සේවාවල නියැළෙයි.
- තම හැකියා සමාජ උන්නතිය සඳහා යොදවයි.

**විෂය කරුණු පැහැදිලි කර ගැනීමට අත්වැලක් :-**

## 9.3.1 නිදහසට පසු කාලය

### 9.3.1.1 අධ්‍යාපන ක්‍රමයේ දියුණුව

- නිදහස් ශ්‍රී ලංකාවේ ගරු බොන්ජීන් රදගුරුතුමාගේ දැඩි මහන්සිය නිසා 1969 ගෙනෙන ලද නව අධ්‍යාපනය ක්‍රමය නිසා අධ්‍යාපන පොදු දෙපාර්තමේන්තුව ගොඩනගන ලදි.
- මේ නිසා සියළුම ආගමිකයින්ට තම සිසුන් හට ආගමික පාසල් ගොඩනගා ගැනීමට අවස්ථාව උදාවිය.
- කතෝලික සභාවත් මෙම අධ්‍යාපන ක්‍රමයක් උපයෝගී කර ගනිමින් ග්‍රාමවල හා නගරවල බොහෝ කතෝලික පාසල් හා උසස් විදුහල් සෑම පහසුකමක් සහිතව ගොඩනගන ලදි.
- මෙම විද්‍යාල රජයේ පරීක්ෂාව යටතේ කිතුනු සභාවේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක විය.
- මෙසේ කතෝලික, කිතුනු සභාවන්හි පරිපාලනය යටතේ 750 කට අධික පාසල් ක්‍රියාත්මක විය.
- කතෝලික පාසල් වල උගන්වන ගුරුවරුන්ට පුහුණුව ලබාදීම සඳහා මග්ගොන, බෝලවලාන, කොලුම්බුතුරෙ වැනි ස්ථානවල ගුරු විද්‍යාල ගොඩ නැගූ හ.

කතෝලික සභාවේ අධ්‍යාපන ආයතනවල අධීක්ෂණ යටතේ ගැහැණු පිරිමි නිකායන් ඉදිරිපත් වී වැඩ කළ හ.

ඒවානම්:

1. බෙනදිකානු නිකාය
2. නිමල මරිය නිකාය
3. ජේසු නිකාය
4. ද ලසාල් සහෝදරවරු
5. මාරිස්ට් සහෝදරවරු
6. ශුද්ධවූ පවුලේ නිකාය
7. යහපත් එඬේරා නිකාය

8. ප්‍රැන්සිස්කාන පැවිදි සොහොයුරියන්

9. දයාවේ සොහොයුරියන්

10. අපෝස්තලික කාර්මෙල් නිකාය

- ඒ සමගම ස්වදේශීය භාෂාවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ දියුණුව සඳහා මග්ගොන මාතලේ යන ස්ථාන වල ශු. ප්‍රැන්සිස්කාන නිකායේ සොහොයුරියන් යාපනයේ කොලුම්බුතුරෙල ශු. ජුසේතුමන්ගේ සහෝදරයින්, ශු. සේවියර් සහෝදරියෝ වැනි නිකායන් ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලදි.

- මෙලෙස කතෝලික සිසුන්ට දෙන ලද විශිෂ්ට අධ්‍යාපනයද කතෝලික සභාවේ තත්ත්වය උසස් කර එය ඉතා බලවන්ත ආයතනයක් කලේය.

- තවද කිතුනුවන් දහම් දැනුමෙන් පෝෂණය කිරීමත් සමාජ, ආර්ථික යහපත සඳහා උසස් පුද්ගලයින් රාජ්‍ය හා පෞද්ගලික ක්ෂේත්‍රවල උසස් තනතුරු ලබා ගැනීමට මග පෙන්වීමත් නිසා අන්‍යාගමිකයින්ට එය මහත් අභියෝගයක් විය.

## 9.3.1.2 කිතුනු අධ්‍යාපනඥයින්

- ශුද්ධවූ සභාව අධ්‍යාපන ක්‍ෂේත්‍රයට විශේෂ දායකත්වයක් දක්වා ඇත. වර්තමාන ශ්‍රී ලංකාවේ ගිනිකොන ආසියාවේ උගතුන්ගේ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස 92 ලබා ප්‍රථම ස්ථානය ලබා සිටියි. කිතුනු අධ්‍යාපනඥයින්ගේ, පැවිද්දන්ගේ දායකත්වය ඇති බව පැවසිය හැකිය.

1. අතිගරු බොන්ජින් රදගුරුතුමා (නිමනි)
2. ගරු ස්වාමි ඥාණප්‍රකාශන් පියතුමා (නිමනි)
3. ගරු පීටර් පිල්ලෙයි පියතුමා (නිමනි)
4. අතිගරු එඩ්මන් පීරිස් රදගුරුතුමා (නිමනි)
5. ගරු එච්. එස්. දාවිත් පියතුමා
6. ගරු එස්. ජී. පෙරේරා පියතුමා
7. විලියම් වික්‍රමසිංහ මහතා
8. ආර්. එස්. සේරම් මහතා

**අතිගරු බොන්ජින් රදගුරුතුමා**

**ජීවන විස්තර**

- ප්‍රංශයේ රියෝම් නගරයේ ක්‍රි.ව. 1823 දී උපත ලැබීය.
- දෙව්සත්හලට ගොස් අධ්‍යාපනය ලබා ක්‍රි.ව. 1846 දී පූජකවරය ලැබීය.
- ක්‍රි.ව. 1847 දී ඉන්දියාවේ කොයම්බුක්කූර් නගරයට පැමිණ විවිධ මීසම්වල සේවයෙහි නිරත විය.
- පසුව ලංකාවට පැමිණ නි.ම.නි. නිකායට බැඳී යාපනයේ සේවයේ නිරත විය.

**සේවාව**

- ලංකාවට පැමිණ ඔහු එවකට පැවති අධ්‍යාපන ව්‍යුහය පිළිබඳ ව සෑහීමකට පත් නොවූ අතර ඒ පිළිබඳ ව නිසි සමීක්ෂණය කළ මෙතුමා ක්‍රි.ව. 1860 දී 'ශ්‍රී ලාංකාවේ කතෝලික අධ්‍යාපන පිළිබඳ සුළු වචන කිහිපයක්' යන කෘතිය එළි දක්වන ලදී.

- මෙම පොත මුද්‍රණය කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ දරුවන්ගේ කතෝලික අධ්‍යාපන පිළිබඳ දෙමව්පියන්ගේ අවධානය වැඩි වශයෙන් යොමු වූ අතර විවිධ ජාතීන් මෙන් ම රාජ්‍ය අනුග්‍රහය යටතේ සේවය කරන මෙරටේ ආගමික පාසල් ප්‍රමුඛ ස්ථානයක් ගනී.

- එමෙන්ම රාජ්‍ය අධ්‍යාපන ක්‍රමයට විරුද්ධත්වය ප්‍රකාශකර රචනා ක්‍රමයන් අධ්‍යාපනය තුළ හඳුන්වා දීම.

- ඔහුගේ නිර්මාණශීලි  අදහස් රජය විසින් ද පිළිගන්නා අතර එම අදහස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණය සිදහා පාදක කර ගන්නා ලදී.

මෙතුමා සෙමාරියා රදගුරුතුමා සමඟ එකතු වී ආගමං අධ්‍යාපනය, සමාජ සේවා කටයුතු විවිධ අංශයන්වල විශාල සේවයක් ඉටු කරන ලදී.

සෙමාරියා රදගුරුතුමගේ ස්වර්ගස්ථයෙන් පසු ක්‍රි.ව. 1868දී යපනයේ රදගුරුතුමා ලෙස අභිෂේක කරනු ලැබීය. ක්‍රි.ව. 1869 දී  පළමුවන වතිකානු මන්ත්‍රණ සභාවට සහභාගී වූ මෙතුමා එහි දී  ලැබුණු උපදෙස් අනුව ක්‍රි.ව. 1817 දී යාපනයේ දෙව් සත්හලක් ගොඩනැගීය. ක්‍රි.ව. 1876 දී 'කතෝලික පාදුගාවලන්' නැමැති සතියේ පුවත්පත ආරම්භ කළේය.

යාපනයෙන් මාරු වීමක් ලබා කොළඹ රදගුරුන් ලෙස වැඩ බාරගත් මෙතුමා සාන්ත බර්නාඩ් දෙව්සත්හළ ආරම්භ කළ අතර ක්‍රි.ව. 1884 දී මග්ගොන කාර්මික විද්‍යාලයක් ආරම්භ කරන ලදී. ශ්‍රී ලාංකික කතෝලික සභාවේ අභිවෘද්ධිය සඳහා විවිධාකාර සේවාවල නිරත වූ මෙතුමා ක්‍රි.ව. 1892 දී ස්වර්ගස්ථ විය.

**ගරු ස්වාමී ඥාණප්‍රකාශන් පියතුමා**

**ජීවන විස්තර**

- නල්ලූර් ස්වාමි ප්‍රකාශන් පියතුමා ක්‍රි.ව. 1875 දී අගෝස්තු මස 30 වෙනි දින 'වෛත්තියලිංගම්' යන නමින් රාජසිංගම් ස්වාමිනාදන් පිල්ලෙ සහ තංගමුත්තු යන ඉන්දු දෙමව්පියන්ට දාව උපත ලැබීය.

- වෛත්තියලිංගම් කුඩා දරුවකුව සිටිය දී ඔහුගේ පියා අහිමි වූ අතර මව යාපනයේ අච්චුපිල්ලෙ ප්‍රදේශයේ තම්බිමුත්තු පිල්ලෙ නැමති කතෝලිකයකු සමඟ විවාහ වීම හෙයින් වෛත්තියලංගම් බෞතිස්ම ස්නාපනය ලැබ ඥානප්‍රකාශන් නමින් කතෝලික සභාවේ සාමාජිකත්වය ලබා ගන්නා ලදී.

- මානිපායි ප්‍රදේශයේ සිට එක්  ඉන්දු - ඉංග්‍රීසී පාසලක තම අධ්‍යාපනය ආරම්භ කළ ඥානප්‍රකාශන් පසුව තවත් විදුහලක තම අධ්‍යාපනය අවසන් කොට ලංකාවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ රාජ්‍ය නිලධාරියකු ලෙස සේවය කළේය.

- පසුව දුම්රිය සේවයෙන් සමුගත් මෙතුමා නි.ම.නි. නිකායට බැඳී පූජක පුහුණුව ලබා ක්‍රි.ව. 1990 දී පූජකවරම් ලැබීය.

**සේවාව**

- උෆර්කාවත්තුරෙ මීසමේ දී තම පූජක සේවාව ආරම්භ කළ මෙතුමා එළඹුණු වසරේ යාපනය වෙට්රිරාසන දේවස්ථානයේ සහායක පියතුමා ලෙස පත් කර යවනු ලැබූ අතර ක්‍රි.ව. 1905 දී යාපනයේ නගරයේදී නල්ලූර් මීසමට මීසම් භාර පියතුමා ලෙසට පත් කරන ලදී. එසේ සේවය කරමින් සිටිය දී 3,000කට අධික හින්දු භක්තිකයින් පිරිසක් කතෝලික ආගම වැළඳ ගන්නා ලදී.

- මෙතුමා විශිෂ්ට ගනයේ අධ්‍යාපනඥයෙකි. සංස්කෘත භාෂාව, හින්දු දර්ශනය පිළිබඳ හසළ දැනුමක් ඇත්තෙකි. යාපනයේ ඉතිහාසය පිළිබඳ කැමැත්තෙන් උගත්තෙකි.

- දමිළ භාෂාවම ඉමහත් සේ ඇළුම් කළ අතර එම භාෂාවෙන් ඓතිහාසික වටිනාකම සලකා දමිළ භාෂාව පිළිබඳ ගවේෂණ රාශියක් කළේ ය. දෙමළ භාෂාව ඉපැරණිම භාෂාව ලෙස එතුමා තහවුරු කළේය.

- මෙතුමා සිංහල සහ දමිළ භාෂාවලින් ද ග්‍රන්ථ කිහිපයක් ලියා ඇත. ඒ අතරින් යාල්පාන වෛබව මාලෙයි, යාල්පානත්තිල් ඉරුබත්අයින්දු ආණ්ඩුගල්, කතෝලික්කත්තින් වලර්ච්චි යන ග්‍රන්ථයන් ප්‍රමුඛ ස්ථානයක් ගනී.

- මේ හැර දෙමළ ශබ්දකෝෂ බොහෝමයක් ලියා ඇත.

- විවිධ භාෂා හොඳින් උගත් හෙයින් බහු භාෂා විශාරද යැයි හඳුන්වනු ලැබීය.

## ගරු පීටර් පිල්ලෙයි පියතුමා

### ජීවන විස්තර

- ගරු පීටර් පිල්ලෙයි පියතුමා 1904 හලාවත වෙන්නප්පුව නම් ග්‍රාමයේ උපත ලැබී ය. මෙතුමා ජේකබ් සහ ආනා යන අයගේ පුතෙකි. ඔවුන් යාපනයෙහි පදිංචි කරුවෝ වූහ.
- මෙතුමා සිය ප්‍රාථමික අධ්‍යාපනය 1914 කොළඹ ශාන්ත බෙනඩික් විදුහලේ ලබා ගත්තේය. 1920 කේම්බ්‍රිජ් පරීක්ෂණයෙන් සියලුම විෂයන්වලට විශිෂ්ට සම්මාන ලැබී ය. 1923 දී එස් ඒ සමත් වී කලා උපාධිධාරියෙක් විය. ඉන්පසුව එම්. ඒ. හා එම්. එස්. සී. විභාගවලින්ද සමත්විය.
- 1934 දී නිමල මරිය නිකායට එක් වී පූජකවරය ලැබී ය. 1936 රෝමයේ දේවධර්මාචාර්ය උපාධිය සමත් විය. මෙතුමා ලංකාවට සැපත් වූයේ අති විශිෂ්ට අධ්‍යාපනඥයකු ලෙසය.

### සේවය

- කොළඹ ශා පීතර විදුහලෙන් ගුරු වෘත්තිය ආරම්භ කළේ ය. 1936 දී කතෝලික සමාජ සේවා සංගමය ආරම්භ කළේ ය.
- 1940 දී කොළඹ ශා ජෝශප් විදුහලේ පස් වන විදුහල්පති ලෙස පත්විය. සුදුසුකම් සහිත උසස් පෙළ සිසුන් උසස් අධ්‍යාපනය ලැබිය යුතු බව මෙතුමාගේ අදහස විය. එහෙත් ලංකා රජයට අවශ්‍ය පහසුකම් සහිත විශ්ව විද්‍යාලයක් නොවූයෙන් අ. පො. ස. (උ. පෙළ) විභාගයෙන් වැඩි ලකුණු ලබාගත් සිසුන්ට පමණක් උසස් අධ්‍යාපනය අවස්ථාව හිමිවිය.
- එබැවින් 1954 දී ඇක්වයිනාස් උසස් අධ්‍යාපන ආයතනය කොළඹ බොරැල්ලෙහි පිහිටුවා රජයේ විශ්ව විද්‍යාල ප්‍රවේශය නොලත් සිසුනට ඇක්වයිනාස් විශ්ව විශ්ව විද්‍යාල මගින් උසස් අධ්‍යාපන ලබා දීමට මග පෑදුවේ ය. එතුමා එහි පළමු විදුහල්පති ලෙස සේවය කළේ ය.
- සියල්ලන් විසින් විශිෂ්ට අධ්‍යාපනඥයකු ලෙස පිළිගනු ලැබූ මෙතුමා කොළඹ සිටින සියලුම අධ්‍යාපනඥයින් එක් කොට ස්වේරියන්ස් (Xaverians) යැයි හඳුන්වනු ලබන අධ්‍යාපනඥයින්ගේ සංගමයක් ආරම්භ කළේ ය.
- මෙතුමා විසින් සමාජ නීතිය කේන්ද්‍ර කර ගනිමින් ග්‍රන්ථ 14 ය නොඅඩුව ලියා ඇත.
- මෙතුමා විශිෂ්ට අධ්‍යාපනඥයකු පමණක් නොව විශිෂ්ට ගොඩනැගිලි නිර්මාණ කරුවෙක් ද, සමාජ සේවකයකු ද, චින්තකයකුද විය.
- මෙතුමාගේ සේවය වෙනුවෙන් ලංකා රජය මෙතුමාගේ රුව සහිත මුද්දරයක් එළි දැක්වූයේ ය. මෙතුමා 1964 දී ස්වර්ගස්ථ විය.

## ගරු එඩ්මන් පීරිස් රදගුරුතුමා (නිමනි)

### ජීවන විස්තර

- එඩ්මන් පීරිස් රදගුරුතුමා 1887 දී හලාවත උපත ලැබී ය. ප්‍රාථමික අධ්‍යාපනය හලාවත ශා. මරියා විදුහලෙන් ලැබී ය. 1924 දී නිමල මරිය නිකායේ පූජකවරයෙකු ලෙස පත්ව 42 වන වියේදී එනම් වර්ෂ 1940 දී හලාවත ප්‍රථම රදගුරුතුමාණන් ලෙස අභිෂේක ලැබී ය. මෙතුමා ලංකාවේ ප්‍රථම රදගුරුතුමා පමණක් නොව ප්‍රථම සිංහල රදගුරුතුමාද වේ. එපමණක් නොව ලන්ඩන් විශ්ව විද්‍යාලයේ අපරදිග භාෂා පිළිබඳ විශාරදයෙක්ද විය.

**සේවාව**

- මෙතුමා ශ්‍රී ලංකාවට පමණක් ආවේනික වූ සංස්කෘතියක් ඇති කිරීමට උත්සාහ දැරී ය.
- ඔරතෝනියානු නිකායික පූජකයකු වූ ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමන් විසින් රචිත යාච්ඤා, වේද කාව්‍යයන්, කර්නාටක තාලයට ගැමි නාට්‍ය කලාව, ආදියට අනුව වෙනස් කළේ ය.
- මෙතුමා විසින් ග්‍රන්ථ 16 කුත් විවිධ රචනා 250 වැඩි ප්‍රමාණයකුත් ලියා ඇත. මෙතුමාගේ කෘති බොහොමයක් පෘතුගීසි හා ලන්දේසි භාෂාවලිවලින් පරිවර්තනය කරන ලද ඒවා වේ.
- 1960 දී මතෙව් සුවිශේෂය සිංහල භාෂාවට පරිවර්තනය කළේ ය (මෙය අද දක්වාම විශිෂ්ට පරිවර්තනයක් ලෙස පවතී).
- මෙතුමා කොළඹ විශ්ව විද්‍යාලයේ පුරා විද්‍යා උපදේශන කණ්ඩායම හා අපරදිග භාෂා කණ්ඩායම ආදියෙහි සාමාජිකයෙක් විය.
- මෙතුමා "රෝයල් ඒෂියා වීක්" සගරාවේ සාමාජිකයකු වූ අතර ලාංකීක සංස්කෘතිය පිළිබද මෙම සගරාව විසින් එළිදක්වන ලදි.
- කතෝලික සභාවේ ජනවන්දනාව පිළිබඳ උනන්දුවක් දැක්වූ මෙතුමා විවිධ ගීත සම්පාදනය කළේ ය.
- නිමල මරිය නිකාය විසින් ආරම්භ කරන ලද "භක්ති ප්‍රබෝධන" සිංහල සගරාවේ උපදේශකයකු ලෙස 1927-1930 දක්වා සේවය කලේය. මෙය ලංකාවේ එළි දක්වන ලද දිගු කාලීන සගරාවකි.
- 1960 පාසල් රජයට පවරා ගන්නා විට සිංහල භාෂාවෙන් ඉගැන්විය යුතු බව කියා සිටියේ ය.
- දෙවන වතිකාණ මන්ත්‍රණ සභාවට පෙරම ස්වදේශීය භාෂාවෙන් ජනවන්දනාව පැවැත්විය යුතු බව තහවුරු කළේ ය. මෙතුමා 1989 දී ස්වර්ගස්ත විය.

**ගරු එච්. එස්. දාවිත් පියතුමා**

**ජීවන විස්තර**

- දාවිත් පියතුමා පේදුරුතුඩුවේ තුම්බලෙයි නම් ස්ථානයේ ආබ්‍රහම් පිල්ලෙයි හා එළිසබෙත් යන අයගේ පුතකු ලෙස 1907 දී උපත ලැබී ය. මෙතුමා තම අධ්‍යාපනය යාපනයේ ශු. පැට්රික් විද්‍යාලයෙන් ලැබී ය. පාසල් කාලයේ දැනුමින් හා චින්තනයෙන් විශිෂ්ඨයෙක් විය. පූජකවරය ලැබූ මෙතුමා ශාස්ත්‍රපති උපාධිය ලබා ගත්තේ ය.
- ශා. පැට්රික් විද්‍යාලයේ ගුරුවරයෙකු ලෙස පත්ව ස්වාමි ඥාණප්‍රකාශන් පියතුමාගේ සේවයෙන් සිත් ඇඳගනු ලැබ එතුමාගේ උපදෙස් පරිදි සංස්කෘත භාෂාව හොඳින් ඉගෙන ගත්තේ ය. 1947-1952 දක්වා ඉන්දියාවට ගොස් පාළි, සංස්කෘත, දෙමළ, තෙළිගු වැනි භාෂා 35 ක පමණ නිපුණත්වය ලබා ගත්තේ ය.

**සේවය**

- 1950 දී ජර්මානු විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය වරයෙකු විය.
- නල්ලූර් ඥාණප්‍රකාශන් මියගිය පසු ඔහු ආරම්භ කළ දෙමළ වචනාරම්භ සමානත්වය යන ශබ්ද කෝෂයේ සේවය ඇරඹී ය
- දෙමළ භාෂා ගවේෂණයේ ස්වාමි ඥාණප්‍රකාශන් හා ගරු තනිනායගම් පියතුමා වැනි අය මෙන් ගවේෂණ රාශියක් කළේ ය.
- මෙතුමා ආරම්භ කළ දෙමළ සමාජය තවදුරටත් පැවැත්විය යුතුය යන අරමුණින් එතුමා සතු වූ දහස් ගණන් ග්‍රන්ථ යාපනය පුස්තකාලයට දෙන ලදි.
- 1981 යාපනයේ පුස්තකාලය ගිනිබත් කරනු ලැබූ පණිවිඩය සැලවූ සැනින් හෘදයාබාධයකින් මිය ගියේ ය. මෙතුමා විශිෂ්ට අධ්‍යාපනඥයෙක් මෙන් ම ජනතාවට ආදරය කළ විශිෂ්ට පූජකයෙකි.

- මෙතුමා ආරම්භ කළ දෙමළ සමාජය තවදුරටත් පැවැත්විය යුතුය යන අරමුණින් එතුමා සතු වූ දහස් ගණන් ග්‍රන්ථ යාපනය පුස්තකාලයට දෙන ලදී.
- 1981 යාපනයේ පුස්තකාලය ගිනිබත් කරනු ලැබූ පණිවිඩය සැලවූ සැනින් හෘදයාබාධයකින් මිය ගියේ ය. මෙතුමා විශිෂ්ට අධ්‍යාපනඥයෙක් මෙන් ම ජනතාවට ආදරය කළ විශිෂ්ට පූජකයෙකි.

## ගරු එස්. ජී. පෙරේරා පියතුමා

### ජීවන විස්තර

- ගරු සයිමන් ග්‍රෙගරි පියතුමා 1882 දී කළුතර උපත ලැබී ය. සිය ප්‍රථමික අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය ශා. ජෝශප් විදුහල හා වෙස්ලි විදුහලෙන් ලබා ගත්තේ ය. පාසල් අධ්‍යාපනය අවසන් වූ විගස රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලිපිකරුවකු ලෙස සේවය කරමින් සිටින විට අවුරුදු 23 දී ජේසු නිකායට බැදී අධ්‍යාපනය සඳහා ඉන්දියාවට ගියේ ය. 1917 පූජකවරයෙකු ලෙස පත්වූ මෙතුමා ජේසු නිකායේ ප්‍රථම ස්වදේශික පියතුමා ද විය.

### සේවය

- රෝමයේ ග්‍රෙගෝරියානු විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙස සේවය කළේ ය. ගාල්ල පදවියේ පළමු නාහිමිපාණන් ලෙස සේවය කළේ ය. එහිදී ශු. ඇලෝසියස් විදුහලේ ගුරුවරයෙකු ලෙසත් මාතර ශු. සෙබස්තියන් විදුහලේ විදුහල්පති ලෙස ත් සේවය කළේ ය.
- මෙතුමා සිංහල මෙන්ම ඉංග්‍රීසි හා වෙනත් යුරෝපීය භාෂාවන් ඉගෙන ගත්තේ ය. මෙතුමාගේ පරිවර්තන අතර පෘතුගීසි භාෂාවේ "ෆර්මා ඩි කුවෙරෝස්" (Ferma De Queros) නැමැත්තා විසින් ලියන ලද ග්‍රන්ථය ඉංග්‍රීසි භාෂාවට කළ පරිවර්තනය විශිෂ්ට ය.
- බොහෝ සිංහල ග්‍රන්ථ ඉංග්‍රීසියට පරිවර්තනය කළේ ය. මෙමගින් සිංහල කලාව, සංස්කෘතිය, ඉතිහාසය ලෝකයට දැනගැනීමේ අවස්ථාව උදා කළේ ය. මේවා අතරින් "සුභසිද්ධ වචනය" යන ග්‍රන්ථය විශිෂ්ඨ ඉංග්‍රීසි පරිවර්තනයකි.
- මෙතුමා ලියූ ග්‍රන්ථ අතරින් ලංකා ඉතිහාසය (Ceylon History) යන ඉංග්‍රීසි ග්‍රන්ථය පිළිගත් ග්‍රන්ථයක් බවට පත් විය.
- මෙතුමා ලංකාවේ සාහිත්‍යය ලියාපදිංචි ලේඛනයේ කතුවරයෙකු ලෙස ද, "රෝයල් ඒෂියාටික් සොසයිටි" (Royal Asiatic Society) සාමාජිකයෙකු ලෙස ද සේවය කළේ ය.
- මෙතුමා ලංකා සභාවට කළ සේවය උදෙසා 1983 දී ලංකා රජය මෙතුමාගේ රුව ඇතුලත් තැපැල් මුද්දරයක් එළිදැක්වූයේ ය. මෙතුමා 1950 දී ස්වර්ගස්ත විය.

## ගරු විලියම් වික්‍රමසිංහ පියතුමා

### සේවය

- මෙතුමා අධ්‍යාපනය වෙනුවෙන් විශිෂ්ට සේවාවක් කර ඇත. උසස් අධ්‍යාපනය ලබා ඉන්දියාවේ සෙරෙම්බූර් විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු ලෙස විශාල සේවයක් කළේ ය.
- ශ්‍රී ලංකාවේ පිළිමතලාව ප්‍රදේශයේ ඇති දේවධර්ම විදුහලේ කථිකාචාර්යවරයෙක් විය. පූර්ණ පෞර්ෂයකින් යුත් සිසුන් බිහි කිරීමට අධ්‍යාපනය මෙන්ම ක්‍රීඩාව ද අවශ්‍ය බව වටහාගත් මෙතුමා ඒ සඳහා වෙහෙස විය.
- විශ්‍රාම ලත් පසු ත් කේරි විදුහලේ පරිපාලන කළමනාකරණ කමිටුවේ සාමාජිකත්වය ලබා අධ්‍යාපනය වෙනුවෙන් ඉමහත් සේවාවක් කළේ ය.

**ගරු ආර්. එස්. ඩී. සේරම් පියතුමා**

**ජීවන විස්තර**

- ගරු ආර්. එස්. ඩී. සේරම් පියතුමා ගල්කිස්ස ශා. තෝමස් විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකි. 1918 එංගලන්තයට ගිය මෙතුමා ඔක්ස්පර්ඩ් විශ්ව විද්‍යාලයේ විශේෂ උපාධියක් ලබාගත් පසු පූජකවරය ලැබීය. විවිධ ප්‍රදේශවල ඇති දේවස්ථාන වල සේවය කල මෙතුමා අධ්‍යාපනය වෙනුවෙන් කල සේවාව ඉමහත්ය.

**සේවාව**

- 1925 ගල්කිස්ස ශා. තෝමස් විද්‍යාලයේ ගුරුවරයෙකු ලෙසත්, නියෝජ්‍ය විදුහල්පති ලෙසත් සේවය කළේ ය.
- නව ගොඩනැගිලි තනමින් නේවාසිකාගාර පහසුකම් ලබා දුන්නේ ය.
- විවිධ ක්‍රිඩා, පිහිනුම්, ක්‍රීඩා උත්සව, බොක්සිං ක්‍රීඩාව හා ටෙනිස් වැනි ක්‍රීඩා දියුණු කිරීමට කටයුතු කළේ ය.
- විවිධ සංගම් ආරම්භ කරමින් කථන හැකියාව දියුණු කිරීමට උනන්දු විය.
- පාසල් පරිසරය සුන්දර කරමින් සිසුන්ගේ අධ්‍යාපනය ඉතා සතුටින් කිරීමට මග සැලසුවේ ය.

## 9.3.2 පාසල් රජයට පවරා ගැනීම

- 1960 දී ගෙනෙන ලද අධ්‍යාපන ක්ෂේත්‍රයේ චක්‍ර ලේඛනයට අනුව ගොඩ නගන ලද අධ්‍යාපනය පොදු දෙපාතමේන්තුව මගින්, ක්‍රිස්තියානි සභාව, කිතුනුවන්ව දහම් දැනුමෙන් ද, යහ පැවැත්මෙන් ද සමාජ ආර්ථික යහපතින් ද උසස් පුද්ගලයින් කර, රාජ්‍යය හා පෞද්ගලික කේෂ්ත්‍ර වල උසස් තනතුරු ලබා ගැනීමට මග පෑදුවේ ය.
- ක්‍රිස්තියානි සභාවේ මෙම දියුණුව දරාගත නොහැකිවූ මහා ජාතීන්ට එය අභියෝගයක් විය.
- එකල වූ බෞද්ධ හා හින්දු පුනරුදයට හේතුවක් විය.
- 1954 දී බෞද්ධාගම දියුණු කර එය ශක්තිමත් කිරීමට බෞද්ධ කොමිසමක් පත් කළ හ. කිතුනු පාසල් උසස් තත්ත්වයකින් පැවති හෙයින් රටේ උසස් තනතුරු සියල්ල කිතුනුවන්ට හිමිවිය. එබැවින් බොහෝ බෞද්ධ සිසුන් එම පාසල්වලට යාමට තැත් කළ හ.
- බෞද්ධ කොමිසමේ උපදෙස් පරිදි 1960 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එහි දේශපාලනික ප්‍රතිපත්තියක් ලෙස පිළිගෙන, කතෝලික ක්‍රිස්තියානි පාසල් 750 ට අධික ප්‍රමාණයක් රාජසන්තක කර ගත් හ.

## 9.3.2.2 පාසල් රජයට පවරා ගැනීමෙන් සිදුවූ අහිතකර ප්‍රතිඵල

- 700 කට අධික මීසම් පාසල් හා ඒවායේ ඉඩම්, ගොඩනැගිලි, උපකරණ සියල්ල කිසිදු අලාභයක් නොගෙවා රාජසන්තක කරන ලදි.
- කිතුනු සිසුන්ට ක්‍රිස්තියානි පසුබිමක අධ්‍යාපනය ලැබීමේ අයිතිය ප්‍රතික්ෂේප විය.
- ගුරු විදුහල් රාජ සන්තක කළ හ.
- පෞද්ගලික පාසල් 40 ක් මූලාධාර නොමැති හෙයින් රජයට පවරන ලදි. බොහෝ පාසල් කිසිදු ආගමකින් තොරව, ආගමික පසුබිමක් නොමැති පාසල් ලෙස දැකිය හැකිවිය.
- කිතුනු සභාවට සිය ජනතාවව ආගමානුකූලව ගොඩනැගීමේ අයිතිය ප්‍රතික්ෂේප විය.
- තම ආගමික ගුරුවරුන් පත් කිරීමේ අයිතිය අහෝසි විය.
- පාසල්වල දහම් අධ්‍යාපනයට ලබාදුන් ප්‍රමුඛතාවය අඩුවිය.

### 9.3.2.2 පාසල් රජයට පවරා ගැනීමෙන් සිදුවූ යහපත

- දෙමාපියන් තම දරුවන්ගේ දහම් අධ්‍යාපනය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වන්නට පටන් ගත් හ.
- ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානයක් පිහිටුවා ගන්නා ලදි.
- සෑම පදවියකම ධර්මෝපදේශ මධ්‍යස්ථාන පිහිටුවා සුදුසුකම් ඇති අය තෝරා ඔවුන්ට දහම් ගුරු පුහුණුව ලබා දී ඔවුන්ගේ සහය ඇතිව මහත් සේවාවක් කරණ ලදි.
- මීසම් මට්ටමින් දහම් පාසල් ආරම්භ විය.
- බයිබල් පන්ති, සම්මන්ත්‍රණ, ක්‍රියාකාරකම් වැනි ඉගැන්වීමේ ක්‍රම යොදා ගනිමින් දහම් අධ්‍යාපනය ලබාදෙන ලදි.
- ජායාරූප, චිත්‍ර පටි,ප්‍රදර්ශන වැනිදෑ බහුල ලෙස යොදා ගන්නා ලදි.
- නව පෙළපොත් ලියා ප්‍රකාශයට පත් කරණ ලදි.
- මීසම්භාර පියතුමා, මව්පියන්, සිසුන් ආදී අය අතර කිට්ටු සබඳතාවයක් ඇතිවිය. ගිහියන් සේවාවන් පිළිබඳ හැඟීමකින් ක්‍රියා කළ හ.

### 9.3.3 ලංකා සමාජයේ සමාජ සේවා

- කිතුනු ප්‍රේමය පෙරදැරි කරගත් සමාජයක පොදු යහපත උදෙසා සේවය කිරීමත් සමාජ යහපත වෙනුවෙන් දායකත්වය දැක්වීමත් කිතුනු වගකීම වේ.
- සමාජ යහපත යනු භෞතික අභිවෘද්ධිය පමණක් ප්‍රධාන තැනක් නොගනියි. පූර්ණ පෞරුෂයකින් හෙබි පුද්ගලයකු ලෙස සමාජයේ ජීවත්වීමට අවශ්‍ය අංග සංවිධානය කරදීම වේ.
- දේව ස්වරූපයට මවනු ලැබූ මිනිසාගේ ගෞරවය ඉහළ නැංවීමට උදව් වීමයි.
- ලංකා ඉතිහාසයේ විශේෂයෙන් වර්තමානයේ මෙම දැක්මට අනුව ක්‍රිස්තියානි ප්‍රේමය මූලික කොටගත් ජාති, ආගම්, කුලභේද තුරන් කර සමාජ යහපත වෙනුවෙන් ද මිනිසාගේ සංවර්ධනය වෙනුවෙන් ද එක් සභාවක් ලෙස විවිධ පෙරමුණු, සංගම් ලෙස තනිවම කිතුනුවන් යෙදී සිටිති.

මිනිසා ආත්මය පමණක් නොව ශරීරයට හිමිකම් කියන්නෙකි. එබැවින් ආත්මික අවශ්‍යතාවය මෙන්ම ලෞකීක අවශ්‍යතාවයන් ද පවතී. මිනිස්කමට ගෞරවයක් ලබාදෙන ආකාරයේ ජීවිතයක් ගෙන යාමට අවශ්‍ය පහසුකම් පිළිබඳ සලකා බලා ක්‍රියා කළ හ.

- ආරම්භයේ සිටම ශු. සභාව මිනිස් අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා දයා සේවාවේ නිරතවීමේ සේවාවන් කළ බව දැකිය හැකි විය.

වර්තමාන ශු. සභාවේ මීසම් හා කිතුනු දේවස්ථාන මට්ටමින් ද පැවිදි නිකායන් පූජකවරුන්, රදගුරුවරුන් වැනි අයගේ සහය ඇතිව මෙවන් බොහෝ දයාවේ ක්‍රියා ක්‍රියාත්මක වේ.

මෙවැනි ආයතන ලෙස :

1. කරිටාස් ලංකා (SEDEC)

2. ශු. වින්සෙන්ති පාවුලා දයා සේවාව (SVP)

3. ක්‍රිස්තියානි තරුණ සංගමය (YMCA)

4. ක්‍රිස්තියානි තරුණ කාන්තා සංගමය (YWCA)

**කරිටාස් ලංකා සෙඩෙක් (SEDCE)**

- මෑත ඉතිහාසයේ අපේ රටේ දයාවේ ක්‍රියාවන් හා සමාජ සංවර්ධන සුභසාධක ක්‍රියා යනාදිය දෙස බැලීමේදී ශ්‍රී ලංකා රදගුරු සම්මේලනය යටතේ ක්‍රියාත්මක වන කරිටාස් ලංකා ආයතනය ප්‍රධාන තැනක් ගනී.
- 1968 ආරම්භ කරනු ලැබූ සියලුම පදවිවල විවිධ සමාජීය සුභ සාධන සේවා කරයි.
- විශේෂයෙන් මිනිසාගේ මූලික අයිතිවාසිකම් සුරැකීම, සමාජ අවශ්‍යතා සම්පූර්ණ කිරීම, මිනිස් සංවර්ධනය, නීතිගරුක සමාජයක් ගොඩ නැගීම සදහා සැලසුම් ක්‍රියාත්මක කිරීම තුළින් දයකත්වය දක්වයි.

**ශා. වින්සෙන්ති පාවුලූ දයා සේවාව**

- ජාත්‍යන්තර මට්මමින් ක්‍රියාත්මක වන මෙම දයා සේවාව ලංකාවේ විවිධ පදවි වල ස්ථාපනය වී ඇත. මධ්‍යම සභාව පෙරමුණු කරගත් මීසම් මට්ටමින් ක්‍රියාත්මක වේ.
- දේවස්ථාන මට්ටමින් ගිහියන්ගේ සහභාගීත්වයෙන් කැපවීමට කැමැත්ත දක්වන්නන්ගේ සංගමය ඇතිව දයාවේ ක්‍රියාවල නිරත වනු දැක්විය හැක.

**ක්‍රිස්තියානි තරුණ සංගමය (YMCA)**

- විවිධ කිතුනු සභා සාමාජිකයින් එක් වී ගොඩනගා ඇති ජාතික ක්‍රිස්තියානි සංගම් සමග එක්වී සමාජ සේවාවේ හා දයා සේවාවේ නිරත වන ආයතනයකි.

**ක්‍රිස්තියානි තරුණ කාන්තා සංගමය (YWCA)**

- විවිධ සමාජ සේවාවන්හි  දයාවේ සේවාවන්හි නිරතව ඇති විවිධ කිතුනු සභාවන්හි සාමාජිකයින් ජාතික ක්‍රිස්තියානි සංගමය හා එක් වී ක්‍රියාත්මක වන ආයතනයකි.

### 9.3.3.1 වෛද්‍ය සේවාව

- මුල් කාලයේ සිටම පැවති සේවාවකි.
- ග්‍රීන් රෝහල ලංකාවට පැමිණි ඇමරිකානු මිෂනාරිවරු ආගමික ක්ෂේත්‍රයේ ත්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ත් පමණක් නොව වෛද්‍ය ක්ෂේත්‍රයේත් සේවාව කළ හ.
- ඒ අනුව 1820 දී පණ්ඩතිරිප්පුවේ ඔවුන්ගේ පළමු රෝහල ස්ථාපනය කළහ. 1847 ඇමරිකාවෙන් පැමිණි වෛද්‍ය සේවය ඇරඹී ය.
- ආගම් භේදයකින් තොරව බොහෝ දෙනෙක් ග්‍රීන් වෛද්‍යවරයා වෙත පැමිණීමට පටන් ගත් හ.
- 1840 ඔහු මානිපායි හි ගොඩනගන ලද රෝහල ඇමරිකා මිෂන්හි මධ්‍යස්ථානය ලෙස පවසයි. ඒ අසල වෛද්‍ය විශ්ව විද්‍යාලයක් ද අරඹන ලදි. එය ලංකාවේ අරඹන ලද ප්‍රථම වෛද්‍ය විශ්ව විද්‍යාලය වේ. මෙය වර්තමානයේත් ග්‍රීන් අනුස්මරණ රෝහල නම් වේ.

### 9.3.4 මානව අයිතිවාසකම් සේවාව

- සමාජයක දියුණුව සහ සංවර්ධනය එම සමාජය සුරකින, ගොඩනගන සාමය හා සහජීවනය මත රදා පවතින නමුත් වර්තමාන යුගයේ මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය, උදුරා ගැනීම වැනි මනුෂ්‍යාත්වයට පටහැනි සිද්ධීන් සිදුවීම කිසිවෙකුටත් ප්‍රතික්ෂේප කළ නොහැක්කකි.
- මෙය පදනම් කරගෙන ලංකාවේ ශු. සභාව මෙයට දැඩි විරෝධතාවක් දක්වා සාමය හා සමානත්වය සියලුම ජාතීන්ට උපදෙස් දී විවිධ ජාති, සමාජ කණ්ඩායම් වලට සමාන අයිතිවාසිකම් හා යුක්තිය වෙනුවෙන් හඬ නැගූ අවස්ථා බොහොමයකි.

- 1983 දී සිදුවූ ජාතිවාදි කෝලහාලයෙන් පසු සාමයට අභියෝගයක් වූ කරුණු පිළිබඳ ව 1984 දී ශ්‍රී ලංකා කතෝලික රදගුරු සම්මේලනය ශ්‍රී ලංකාවේ ජනතාව නැවත ගොඩනැගීම කරා යන ප්‍රකාශනය ඉදිරිපත් කළේ ය.

- ශ්‍රී ලාංකීක සභාවේ කුරුණෑගල රදගුරු ලක්ෂ්මන් වික්‍රමසිංහ 1983 ජුලි මාසයේ සිදුවූ ඛේදවාචකය පිළිබඳ අධ්‍යයනය කර, ඇසට ඇස දතට දත යන ජාතිවාදී පළිගැනීම කෙරෙහි අප යොමු වී ඇති බව අවධාරණය කළේ ය.

- වසර 30 ක් මුළුල්ලේ සිදු වූ යුද්ධය දිනෙන් දින සිදුවන දූෂිත ක්‍රියාවලට දැඩි විරෝධය පා සාකච්ඡාව තුළින් සාමකාමී විසඳුමක් ගෙනෙන ලෙස අවධාරණය කරමින් ශු. සභාවේ යෝජනා, උපදෙස් අඩංගු ඉල්ලීමක් ඉදිරිපත් කරන ලදි.

- තවද යුධ සමයේ කරන ලද මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනයට විරුද්ධව විශේෂයෙන් අයුක්ති සහගත ලෙස අත් අඩංගුවට ගැනීම් වලට විරුද්ධව හඬ නැගීය.

- වෘත්තීය අයිතිවාසිකම් වෙනුවන් කරන වර්ජනයන් නිසා රැකියා අහිමිවුවන්ගේ රැකියා නැවත ලබාදීමත් කටයුතු කළේ ය.

- නිදහස් වෙළඳ කලාපයේ රැකියාවේ නිර්වස්ත්‍රව වුවන්ගේ වැදගත්කම පිළිබඳ සභාව විසින් පැහැදිලි කර වෘත්තීකයින්ගේ අයිතිවාසිකම් සඳහා පෙරමුණ ගෙන ක්‍රියා කළේ ය.

- මෙම කාලවකවානුවේදී කිතුනු ප්‍රේමය මුල්කර ගෙන තම සහෝදර ජනතාවගේ සුභසිද්ධිය සඳහාත් සේවාව සඳහන් තම පණ පවා දිවි පිදීමට සූදානම් වූ මිනිස් අයිතිවාසිකම් සුරැකීමටත් සමාජ සුභසිද්ධිය සඳහාත් කැපවීමෙන් ක්‍රියාකල සමහර පැවිද්දන් පිළිබඳ අවධානය යොමු කරමු.

## ගරු ලියෝ නානායක්කාර රදගුරුතුමා (1917-1982) ශු. සිල්වෙස්ටර් නිකාය (OSB)

### ජීවන විස්තර

- නුවර හා බදුල්ල පදවි වල රදගුරුවරයෙකු ලෙස සේවය කළ මෙතුමා තරුණ පූජකයකු ලෙස ශා. අන්තෝනි විදුහලේ සේවය කළ අවස්ථවේ සිසුන් හා තරුණයින්ගේ විවිධ අවශ්‍යතා පිළිබඳව අත්දැකීම් ලැබ සිටියේ ය.

- දෙවන වතිකාණ මන්ත්‍රණ සභාවට සහභාගි වීමේ අවස්ථාව ලැබූ මෙතුමා එහි ප්‍රතිපත්ති වලට අනුව තම ජීවිත අරමුණු හා ප්‍රතිපත්ති වෙනස් කරගෙන ජනතාව වෙනුවෙන් තම ගමන ඇරඹීය.

### සමාජ සේවාව

- පූජක සේවය කඳුරට පරිසරයට හා සංස්කෘතියට උචිත ආකාරයට 1970 දී ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න හා හෘද ස්පන්දනය හඳුනාගත් පූජක පරම්පරාවක් ඇති කළ යුතුයැයි බදුල්ල පදවියේ පූජක පුහුණුව ලබාදීමට කටයුතු කළේ ය.

- ජාති, ආගම්, කුල භේදවලින් තොර සියල්ලන්ටම යහපත් එඩේරකුව සිටි සිංහල දෙමළ ජාතීන් අතර අවබෝධය ගොඩනැංවීම සඳහා වතුකම්කරුවන් සම්බන්ධ සේවාව හා සබැඳි ගැටළු අවබෝධය෴ වෘත්තීමය අභියෝග මධ්‍යයේ ඔවුනට සහය විය.

- තරුණයින්ගේ සුභසිද්ධිය තකා වතු කම්කරුවන් පුබුදුවා ආගමික සහජීවනයක් ඇති කිරීමට, මිනිස් අයිතිවාසිකම් සුරැකීමට, අඩු පහසුකම් ඇතිව ජීවත්වන්නන්ට අධ්‍යාපන, සෞඛ්‍යය පහසුකම් ආදිය ලබාදීමට වෙහෙසවීම වැනි විවිධ අංශ කෙරේ උනන්දු විය. 1982 මෙතුමා ස්වර්ගස්ථ විය.

## ගරු ලක්ෂ්මන් වික්‍රමසිංහ රදගුරුතුමා (1927-1983)

### ජීවන විස්තර

- මෙරට මිනිස් අයිතිවාසිකම් හා යුක්තිය වෙනුවෙන් නොබියව හඬ නැගුවෙකි.
- ලංකාවේ ඇන්ගිලිකන් සභාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රදගුරුවරයෙකු ලෙස 1962 දී පත් කරනු ලැබ 1983 දී ස්වර්ගස්ථ වනතුරු ජනතාවට යහපත් එඩේරෙකු ලෙස සේවය කලේය. සමාජයේ විවිධ තරාතිරම් විවිධ ජීවන තත්වයන්හි සිටි සියලුදෙනා සමග සබඳතා ගොඩනැගූ මෙතුමා සියලු ආගමිකයින් සමඟ අවබෝධයෙන් යුතුව සාකච්ඡා කරමින් ජීවත් වූහ.

### සමාජ සේවය

- සමාජ ප්‍රශ්න වලට ගැටළු සහගත අවස්ථාවලදීත් පීඩනයට ලක්වූවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් හඬ නැගීය.
- 1980 ජුලි වර්ජකයින්ගේ රැකියාවන් නැවත ලබාදීමට කටයුතු කිරීම ඔවුන්ගේ රැස්වීම විරෝධතා ආදියට සහභාගි වී විවිධ සංගම් දේශපාලන පක්ෂ හා ආගමික නායකයින් සමග එක් වී පොදු අරමුණු වෙනුවෙන් ක්‍රියා කලේය. තවද ගොවීන් අත්දුටු පීඩා වෙනුවෙන්ද හඬක් නැගීය.
- 1983 ජුලි ජාතිවාදී ප්‍රශ්න නිසා පීඩාවට පත් වූ දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් පැහැදිලි ස්ථාවරයක සිට යුක්තිය ඉල්ලා හඬ නැගීය.
- පීඩාවට පත්වූවන් පෞද්ගලිකව මුණ ගැසී සහය විය.
- දේව රාජ්‍යයේ වටිනාකම් සමාජය තුළ ගොඩනැගීමට සහය වූ ධර්මදූත කාර්යය සඳහා සත්‍යය කිතුනු සාක්ෂිකරුවෙකු ලෙස ක්‍රියා කලේය. මෙතුමා 1983 වර්ෂයේ ස්වර්ගස්ථ විය.

## ගරු මයිකල් රුද්‍රිගු පියතුමා (නිමනි)

### ජීවන විස්තර

- 1927 දෙහිවලදී උපත ලැබීය. 1954 නිමල මරිය නිකායේ පූජකවරයෙකු ලෙස පූජාත්වරය ලැබූ මෙතුමා පරිනත පූජකයකු ලෙස සමාජ සේවාවෙහිද ආගම් අතර වූ සංවාදයන්හිද නියැලෙමින් සිය කලය කැප කලේය. බෞද්ධ ආගම පිළිබඳව හසල දැනුමක් වූ අතර පාළි භාෂාව පිළිබඳ විශාරදයෙක්ද විය.

### සමාජ සේවාව

- 1981 දී වෙල්ලස්ස ප්‍රදේශයේ බුත්තල නම් ග්‍රාමයේ සුබ සෙත් ගෙදර පැල්පත් වාසී බෞද්ධ කතෝලික ජනතාව සමග සංවාදයේ යෙදෙමින් ඉතා අගනා සේවයක් කලේය.
- දිළින්දන් සමග දිළින්දෙක් ලෙස ජීවත් වී ඔවුන්ගේ සමාජ, ආර්ථික, අධ්‍යාපන තත්වය ඉහළ නැංවීමේ උත්සාහයක යෙදුනේය.
- ස්වභාවික සම්පත් සුරක්ෂා කර ගැනීමට මඟ පෙන්වනු ලැබීය.
- පාසල අතහැර ගිය සිසුන් නැවත පාසලට යෑමට ඉඩ සැලසීය. ඔවුනට ඉංග්‍රීසි පන්ති සකස්කර පුස්තකාලයක්ද ආරම්භ කලේය.
- ගොවිතැන සඳහා ස්වාභාවික පොහොර නිපදවා ගැනීමට ඉගැන්වීය.
- ප්‍රදේශයේ ජනතාව පීඩා විඳින දිළිදුකම, සෞඛ්‍යය, අධ්‍යාපන ගැටළු, සුරාකෑම්, ආදී අක්‍රමිකතා ඉදිරියේ දිවැසිවරයෙකු මෙන් හඬ නැගීය.
- ජනතාව අතරම සිට ඔවුන්ට කරන ලද උදව් උපකාර නිසා එතුමාණන්ට විරුද්ධවාදීද බහුල විය. 1987 නොවැම්බර් 10 වන දින උදෑසන දිව්‍ය පූජාව පවත්වමින් සිටියදී සාහසිකයකුගේ වෙඩි පහරකට ලක්වී ස්වර්ගස්ථ විය.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. ජෙරාඩ්. ඩී. රොසයිරෝ, නි.ම.නි, **විශ්ව සභා අභිවෘද්ධිය**, ක්‍රිස්තු දායකත්වය, අමදි වේලි, කොළඹ 2010.

2. ජෙරාඩ්. ඩී. රොසයිරෝ, නි.ම.නි, **ආසියාවේ කිතුනු සභාව**, සුවිශේෂ සේවා, නම්වාල් මුද්‍රණාලය, චෙන්නායි, 2014.

නිපුනතාව 10.0 : නව ශිෂ්ටාචාරයක් බිහි කිරීමේ කිතුනු සේවාවට සහභාගි වෙයි.

නිපුනතා මට්ටම 10.1 : ශුද්ධ වූ සභාවේ සමාජ සංවර්ධනය පිළිබඳ ඉගැන්වීම් හදාරා නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 20

ඉගෙනුම් ඵල :-

- ශුද්ධ වූ සභාවේ සමාජය සංවර්ධනය පිළිබඳ කරුණු ගොනු කරයි.
- ආසියානු රදගුරු සම්මේලනයේ සමාජීය චින්තනය පිළිගනියි.
- පවුලේ එකිනෙකාගේ යුතුකම් හා වගකීම්, සමාජයේ එකිනෙකාගේ යුතුකම් හා වගකීම් පිළිබඳ ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- මිනිස් වටිනාකම් පිළිබඳ සභා ඉගැන්වීම් තම ජීවිතයට අදාල කර ගනියි.
- මිනිස්කම සුරකින ක්‍රියාවල අන් අය හා එක් ව කටයුතු කරයි.

**විෂය අන්තර්ගතය සඳහා මඟ පෙන්වීම**

## 10.1.1 - ශු. සභාවේ සාමාජ ඉගැන්වීම් පිළිබද හැඳින්වීම

- ශු. සභාවේ ගුණාංග සහ එයට බාරදුන් සේවය ආගමානුකුලය.

- නමුත් ශු.සභාවටත් සමාජයටත් සෘජු සබදතාවක් ඇති නිසා, ශු.සභාව සමාජයේ දියුණුව සඳහා සමාජ වෙනස්වීම් වලටත් දායකත්වය ලබා දිය හැකි වගකීමක් ඇත.

- " උදයෙහි අහස රතු හා අඳුරු ව තිබෙන නිසා අද කුණාටු ඇති දවසක් වන්නේ ය කියා ද ඔබ දන්නහුය. ඔබ අහස බලා කාලගුණය තීරණය කරන්න දන්නහු ය. එහෙත්, තත්කාලීන ලකුණු විමසා දැනගන්න ඔබට නුපුළුවන " (මතෙව් 16:3) යැයි ජේසුස් වහන්සේ දෙස බලා ප්‍රශ්න කලේය. මේ මගින් කාලයේ සලකුණු මගින් දෙවියන් වහන්සේගේ ක්‍රියා, දෙවියන් වහන්සේට උචිත හා දෙවියන් වහන්සේට විරුද්ධ ක්‍රියා අප දැනගත යුතුය යන්න ජේසුස් වහන්සේගේ කැමැත්තය.

- මුල් යුගයේ කිතුනුවන්ගේ ජීවිතයේ දිළින්දන්, වැන්දඹුවන්, වැඩිහිටියන්, රෝගීන් රැක බලා ගත්හ. අපෝස්තුලුවරුන්ගේ ඉගැන්වීම් එකළ සමාජ අවශ්‍යතාවයන්ට, සමාජ ප්‍රශ්න වලට වැදගත් කමක් දෙන ලදී.

- උදාහරණයක් ලෙස කොරින්ති කිතුනු සමාජයේ අසමගිය, දිළින්දන් පිළිබද නොසැලකිල්ල, අයහපත් චර්යා පිළිබද පාවුලු තුමාගේ ඉගැන්වීම්, පිලමන් තුමාට වහලුන් කෙසේ බලා ගත යුතු යැයි පාවුලු තුමන්ගේ ලිවූ ඒව යැයි ශු. සභාවේ සමාජීය ඉගැන්වීම් ආධාර වේ.

- ක්‍රිස්තුන් වහන්සේගේ සේවය ක්‍රියාත්මක කිරීම සඳහා කාලයේ සලකුණු සොයා බැලීමට සුවිශේෂයේ අලෝකයෙන් ඒවායේ අදහස සෑම කාල වකවානුවකදීම පැහැදිලි කර දීම ශු. සභාවේ වගකීම වේ. (වර්තමාන ලෝකයේ ශු. සභාව අංක 04)

- කාලයේ සලකුණු හදුනාගෙන ශු. සභාවේ සමාජ ඉගැන්වීම ලියූ තැනැත්තා 13 වන ලියෝ ශු. පියතුමන් වෙයි. එතුමා වෙහෙසෙන මිනිස්සු යන ප්‍රකාශනය 1891 දී ලියුවේය. ශු.සභාවේ සමාජීය ඉගැන්වීම් ඇරඹී වසර 125 කට අධික වේ.

### 10.1.1.2 ශු. සභාවේ සමාජ ඉගැන්වීම් පිළිබඳ වැදගත් ලියවිලි.

1.) වෙහෙසෙන මිනිස්සු (Revum Novarum) 12 වන ලියෝ 1891.

2.) (QuadragesimoAnno) 11 වන පියුස් 1931

3.) (Mater et Magistra) 23 වන ජොහාන් 1961.

4.) (Pacem in Terries) 23 වන ජොහාන් 1963.

5.) (Populoram Proqressio) 6 වන පාවුලු 1975.

6.) (Laborem Exercens) 2 වන ජුවාම් පාවුලු 1981.

7.) (Evangeli Nuntiandi) 6 වන පාවුලු 1975.

8.) (Redemptor Hominem) 2 වන ජුවාම් පාවුලු 1979.

9.) (Solicitudo Rei Socialis) 2 වන ජුවාම් පාවුලු 1997.

10.) පූජක පුහුණුවේ ශු. සභාවේ සමාජ ඉගැන්වීම් කතෝලික අධ්‍යාපන සංසදය 1988

11.) (Centesimus Annus) 2 වන ජුවාම් පාවුලු 1991.

12.) (Deus. Caritcus Est) 16 වන බෙනඩික් 2005.

### 10.1.1.3 සමාජ ඉගැන්වීම් සාරාංශ

- 19 වන සියවසේ යුරෝපා රටවල කාර්මික විප්ලවයේ ප්‍රතිපලයක් ලෙස කම්කරුවන් බලපෑමට ලක්වූහ. කම්කරුවන් නිෂ්පාදන යන්ත්‍ර ලෙස සළකනු ලැබූහ. ඔවුන්ගේ මනුෂ්‍යත්වයට, මූලික අයිතිවාසිකම් වලට ගරු නොකලහ. ඔවුන්ගේ මූලික අවශ්‍යතා ඉටු කරනු නොලැබූහ. මෙයට විරෝධතා දැක්වූ සමාජවාදයන් මිනිසාව විශාල කණ්ඩායමක සාමාජිකයෙක් ලෙස පිළිගත්තේය. කම්කරුවන්ගේ මෙම තත්ත්වය කාලයේ සලකුණක් ලෙස ගත් 13 වන් ලියෝ ශු. පියතුමා වෙහෙසෙන මිනිස්සු යන ප්‍රකාශනය 1891 දී ලිවීය.

- 1920 යුරෝපා ඇමෙරිකානු රටවල ආර්ථිකයේ පහත වැටීම නිසා රැකියා අවස්ථා නැතිවිය. මෙම ප්‍රශ්නය තුලින් සමාජ ආර්ථික පදනම් සෙළවීමට හැකිවිය. මෙවන් තත්ත්වයක් ඇතිවීමට සහය වූ ධනවාදය විමර්ශනයට ලක් කර (Quadragesimo Anno) යන ප්‍රකාශනය 11 වන පියුස් ශු. පියතුමා 1931 දී ලිවීය.

- 2 වන ලෝක යුද්ධයෙන් පසු ලෝකයේ රටවල් සමාජ ආර්ථික ප්‍රශ්න ජාත්‍යන්තර ප්‍රශ්න ලෙස අදහස් කළ හ. විශේෂයෙන් දියුණු වෙමින් පවතින රටවල ප්‍රශ්න දියුණු රටවල අවදානයට යොමු විය. ධනවත් රටවල්, දිළිඳු රටවල් අතර ඇති සමානාත්ම නොවන තත්ත්වය යන ගැටලුව දැකිය හැකි විය. මෙම අවස්ථාවේ (Mater et Magistra) යන ප්‍රකාශනය 23 වන ජුවාම් ශු. පියතුමා 1961 දී ලිවීය. මෙම ප්‍රකාශනය ප්‍රථම වරට කෘෂි කර්මය පිළිබඳ ගැටලු ජාත්‍යන්තර ගැටලු බවට පත්විය. ආර්ථික වර්ධනය යනු වර්ධනයේ ප්‍රථිඵලය නිවැරදිව යුක්ති සහගතව බෙදා ගැනීම තුල පවතී යැයි මෙම ප්‍රකාශනයේ තහවුරු කර ඇත. දියුණු රටවල් දියුණු වෙමින් පවතින රටවල දියුණුවට සහය විය යුතු යැයි බල කෙරේ. තවද ආර්ථික වර්ධනය සමාජ වර්ධනය සමග එක්ව යා යුතුය. ආර්ථික වර්ධනය සියලු ජනතාවගේ දියුණුවත් තහවුරු කල යුතු බව ප්‍රකාශනයේ ගෙන හැර දක්වා ඇත.

- රැකියාව මිනිසාට ඇති නමුදු මිනිසා රැකියාව වෙනුවෙන් නැත යන තේමාව මුල් කර ගනිමින් (Laborem Exercens) යන ප්‍රකාශනය 2 වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා 1981 දී ලියුවේය. මූලධනයට වඩා වෙහෙසීම ප්‍රධාන තැනක් ගනී. මූලධනය වෙහෙසවීමට උදව් විය යුතුය. මූලධනය වැඩි කිරීමට වෙහෙසිය යුතු යැයි සිතීම වැරදිය. භාණ්ඩ වලට වඩා පුද්ගලයින් මූලික වන්නෝය. වෙහෙසීම තුලින් මිනිස් බව සශ්‍රීක කල යුතුය වැනි අදහස් මෙම ප්‍රකාශනයේ ගැබ්වී ඇත.

- 1987 දී දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා (SolicitudoRei Socialis) නමැති ප්‍රකාශනය ලිවීය. දියුණුව හුදු ආර්ථික අංගයක් ලෙස නොබැලිය යුතුය. දියුණුව දෙස ධාර්මිකව බැලිය යුතුය. දියුණුවේ ධර්මය, අධ්‍යාත්මය, සංස්කෘතිය යන අංග පවතී. දියුණුව පසුබැමට ලක්වී ඇති තත්වයේ ජනතාවගේ සියලුම අයිතිවාසිකම් පිළිගත යුතුය. දියුණුව මිනිසාගේ එකමුතුවට පදනම විය යුතුය වැනි අදහස් මෙම ප්‍රකාශනය තුල වැදගත් ඒවා වේ.

- 1991 දෙවන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා (Centesimos Annus) නමැති ප්‍රකාශනය වෙහෙසෙන මිනිස්සු ප්‍රකාශනයේ සියවස සැමරීම නිමිත්තෙන් ලියුවේය. කම්කරුවන්ගේ අයිතිවාසිකම් සුරැකීම මිනිස් සමාජ පරිසරය පිළිබඳව අවධානය යොමු කිරීම, සුවිශේෂයේ සමාජ පණිවිඩ, සමාජ නීති, සාම ක්‍රියාවලියේ පදනම විය යුතුය වැනි අදහස් මෙම ප්‍රකාශනයේ ගැබ් වේ.

- ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා 2015 වසරේ (Laudato Si) ප්‍රකාශනයේ ස්වාභාවික පරිසරය සුරැකීමේ අවශ්‍යතාව පිළිබඳ අවදානය යොමු කරයි.

### 10.1.2.2 දෙවන වතිකාන ජගත් මන්ත්‍රණ සභා ප්‍රකාශනය :- වර්තමාන ලෝකයේ ශු.සභාව (Gaudium te Spes)

- 2 වන වතිකාන ජගත් මන්ත්‍රණ සභාව (1962-1965) 23 වන ජුවාම් ශුද්ධෝත්තම පියාණන් විසින් රැස්කරන ලදී. ශු. සභාව විශ්වය සමග සබඳතා පවත්වන, විශ්වීය ජනතාවගේ ප්‍රශ්න වලදී ක්‍රියාත්මක වන සභාවක් විය යුතුය යන්න ශුද්ධෝත්තම පියතුමන්ගේ අරමුණ වේ. මේ අනුව වර්තමාන ලෝකයේ ශු. සභාව යන දහම් සේවා ප්‍රතිපත්ති පැහැදිලි කිරීම සමාජ ජීවිතය පිළිබඳ ශු. සභාවේ නව ක්‍රමය හඳුන්වා දෙයි. එනම් විශ්වීය සමාජයේ සියලුම අංග එක්කර කථා කිරීමත් ඔවුන් හා සංවාදයේ යෙදීමත් සහයෝගය දැක්වීමක් එහි ක්‍රමය වේ.

- මෙම ව්‍යවස්ථාව තුළින් ශු. සභාවේ සමාජ ඉගැන්වීම් පිළිබඳ නව දැක්මකින් ඉදිරිපත් කෙරේ. මිනිස් අත්දැකීම් කේන්ද්‍ර කර ගනිමින්, සමාජ ප්‍රශ්න ගවේෂණය කර වැදගත් දහමක් ඉගැන්වේ. මිනිස් ලෝකය පහත්කොට සැලැස්ම හෝ මිනිස් ජනයා විනාශය කරා ගමන් කරන්නේය යැයි සිතීම හෝ මෙම ව්‍යවස්ථාවේ අරමුණ නොවේ. ඒ වෙනුවට මෙම ප්‍රකාශනයේ හැදින්වීම (අංක : 1-10) මඟින් ලෝකයේ තත්ත්වය මනාව පැහැදිලි කරයි. ලෝකයේ තත්ත්වය හා සිදුවීම් කාලයේ සලකුණු ලෙස සංගමය බාර ගනියි.

- තවද, එහි ක්‍රමයේ නව දේව ධාර්මික දැක්මක් පවතී. එනම් මෙම ව්‍යවස්ථාව ක්‍රිස්තුන් වහන්සේ කේන්ද්‍ර කර ගනිමින් ප්‍රශ්න වලට පිළිතුරු සෙවීමට උත්සාහ දරයි. ශු. සභාව මිනිස් ලෝකය තම නායකත්වයන් හා මග පෙන්වන්නා වන ජේසුස් වහන්සේ අනුගමනය කිරීමටත් සේවය කිරීමටත් උත්සාහ දරයි. ලෝකය නවතාවයකට පත් කරන ශුද්ධාත්මයාණන්ගේ හැකියාව නිසා ක්‍රියාත්මක වන ශු. සභාව කාලයේ සළකුණු ගැඹුරින් වටහාගෙන සුවිශේෂය හෝ මිනිස් ව්‍යවස්ථාව උපදෙස් දෙති (අංක 3-4)

- **මෙම ව්‍යස්ථාව කොටස් දෙකකින් යුක්ත වේ.**

  (අ) පළමු කොටසින් මිනිසාගේ උතුම්කම පැහැදිලි කරයි.

  (ආ) දෙවන කොටසින් කඩිනම් ප්‍රශ්න කිහිපයක් පිළිබඳ සාකච්ඡා කෙරේ

  ඒවා නම් :-

    - පවුල-විවාහය
    - මිනිස් ශිෂ්ටාචාරය (සාරධර්ම)
    - සමාජ, අර්ථික දේශපාලන ජීවිතය.
    - ලෝක සාමය හා ඊට විරුද්ධ යුද්ධ ය.

## 10.1.2.1 මිනිසාගේ උතුම්කම හා (අංක 12-22)

**මිනිසාගේ උතුම්කම දැක්වෙන අංග හා එලිදරව්ව පිළිබඳ**

- මෙම ව්‍යවස්ථාවේ මිනිසාගේ උතුම් කම දැක්වෙන අංග හා එළිදරව්ව පිළිබඳ පැහැදිලි කෙරේ

ඒවා නම්:-

1) සියලු මිනිසුන් දේව ස්වරූපය හා ස්වභාවය ඇති ව මවනු ලැබුවෝය.
2) මේ නිසා දේවියන් වහන්සේ ලබාදෙන නිදහස ඔවුන් උපතින් ලද උරුමයයි.
3) ඔවුන් දැනුම හා ධාර්මික හැඟීම් ඇත්තවුන් වන්නාහ.
4) සැම දෙයක්ම ගැඹුරින් විමර්ශනය කිරිමේ උද්යෝගය ඔවුන් තුල පවතී.
5) ඔවුන් හට හෘද සාකෂියට අනුව යහපත - අයහපත තෝරා ගැනීමේ හැකියාව ඇති අය වෙති.

**මෙම ව්‍යවස්ථාව කොටස් දෙකකින් යුක්ත වේ.**

**මිනිස් උතුම්කමේ ගුණාංග හා ප්‍රතිපල**

- මිනිස් උතුම්කමේ ස්වභාවය පැහැදිලි කෙරේ. උතුම්කම ඇතිව මවනු ලැබූ මිනිසාට තනි පුද්ගලයකු ලෙස ගොඩනැගිම දියුණු විය නොහැකිය. මිනිසා මුහුදේ පාවෙන තනි දූපතක් නොවේ. උතුම්කම ඇතිව මවනු ලැබුවෝය.

සමාජයක් ලෙස ජීවත්වීම වැදගත් ගුණාංගයකි සමාජ ගුණාංග වලින් ඔවුන්ගේ සම තත්වයෙන් ජීවත්වීමේ ගුණාංගය නිසා පහත සඳහන් කරුණු සුරක්ෂිත කර ගත යුතු යැයි සංගමය පැහැදිලි කරයි.

1. මිනිස් සමභාවයෙන් මිනිසාගේ මූලික අයිතිවාසිකම් බිහිවීම නිසා ඒවා සුරක්ෂිත කරගත යුතුය.
2. ලිංගය, ජාතිය, වර්ණය, සමාජ තත්වය, භාෂාව, ආගම ආදී හේතු වශයෙන් පෙන්වන ඕනෑම බෙදීමක් මුළුමනින්ම ප්‍රතික්ෂේප කළ යුක්තකි.

### 10.1.2.2. පවුල් ජීවිතය (අංක 47-52)

- වර්තමාන ලෝකයේ විවාහය - පවුල කෙබඳු දැයි මන්ත්‍රණ සභාව සිතීය. සංගමය විසින් විවාහය, පවුලේ මූලික සම්බන්ධතාවය ලෙස බලා එය ආදරයේ සමාජයක් යැයි නිර්වචනය කළේය. එහි ඇති මානුෂිකතාවය, පෞරුෂය වෛවාහික ප්‍රේමය නොපිරිහෙළා පවතින බව පිළිගත්තේය. ඒ නිසා විවාහය නොහොත් පවුල පිළිබඳ දේව ධාර්මික හා දාර්ශනික බව, අවබෝධයක්, ළංවීමේ ක්‍රමයක් බිහි විය. පහත සඳහන් වන්නේ ඉන් කිහිපයකි.
- වෛවාහික ප්‍රේමය තුලින් ගොඩනැගෙන කිට්ටු සබඳතාවයක් ඇති සමාජය පවුලක් වේ. එය මැවීමේ කාර්යෙහිදී දෙවියන් වහන්සේ විසින්ම ස්ථාපනය කරන ලදී.
- වෛවාහික ප්‍රේමය ගැඹුරුය. නොපසුබටව ක්‍රියාත්මක වීමක් තුළින් පවුලක් ගොඩ නැගුණි.
- දේව සැලැස්මට අනුව සමාජයේ ඉදිරියෙන්ම දිගු කලක් පවතින සංවිධානය පවුලය. පවුල සමාජයේ මූලික ඒකකය වේ.
- මිනිස් ගුණාංග පොහොනි කරන මුල් පාසල පවුලයි.
- මිනිස් ජීවිතය පරම්පරාවෙන් පරම්පරාවට ලබාදෙන ආරක්ෂාව වගකීම දෙවියන් වහන්සේ විවාහය තුලින් පවුලට ලබාදී ඇත.
- විවාහ වූවන් විවාහ ජීවිතය තුළ විශ්වාසවන්තව ජීවත් වීම තුලින් ජේසුස් වහන්සේගේ ජීවිතය, දුක් විඳීම, මරණය හා උත්ථානය මඟින් ප්‍රකාශ කරන ලද දේව ආදරයට සාක්ෂි දරයි.

- විවාහය පවුලේ උතුම්කම ආරක්ෂා කර වර්ධනය කිරීමට සංගමය වැදගත් කමක් දී පහත සඳහන් කරුණු වැදගත් අරමුණු ලෙස ඉදිරිපත් කරයි.

    1. විවාහය පවුලේ ශුද්ධත්වය රැකදීම.
    2. වෛවාහික ප්‍රේමයට කිසිඳු කැළලක් නොවී වෙන් නොවී ජීවත්වීම.
    3. වෛවාහික ප්‍රේමය සම භාවයෙන්ම දරුවන් බිහිකර ඔවුන් හදා වඩා ගැනීම සඳහා සකසා ඇත.
    4. වෛවාහික ප්‍රේමය තුළ මිනිස් ජීවිතයට ගරු කිරීම් හා ජීවිතය ආරක්ෂා කිරීමේ වගකීම ඇත.
    5. විවාහය හා පවුල සුරක්ෂිත කොට දියුණු කිරීම සැමගේ වගකීම වේ.

### 10.1.2.3. ශිෂ්ටාචාරය (අංක 54-62)

- ශිෂ්ටාචාරය යනු මිනිසාගේ සාමාන්‍ය දැනුම සාරධර්ම වලින්ද ඔවුන්ගේ සමාජ සම භාවයෙන්ම පියවරෙන් පියවර බිහිවන එකක් යැයි මන්ත්‍රණ සභාව නිර්වචනය කරයි. සාරධර්ම පිලිබඳ මන්ත්‍රණ සභාවේ දැක්ම අනුව පහත සඳහන් පරිදි වේ.
- ශිෂ්ටාචාර ඇති කර එය වර්ධනය කළේ මනුෂ්‍යයා වන බැවින් ශිෂ්ඨාචාර වලට පිටුපා යෑමේ සම භාවය ඔහු සතු නොවේ.
- ශිෂ්ටාචාර දියුණු වීම සඳහා යුක්ති සහගත නිදහසක්ද, සම හිමිකම් සහිතව ක්‍රියා කිරීමේ අවස්ථාවද අවශ්‍ය ය.
- මෙම සම භාවය ආරක්ෂා කිරීමේදී පොදු යහපත සීමාවට ගැනීම් ඒක පුද්ගල, ස්වයං අයිතිවාසිකම් සමාජ අයිතිවාසිකම් වලට බල නොපාන අයුරින් ක්‍රියාත්මක විය යුතුය.
- ශිෂ්ට සම්පන්න ජීවිතය දියුණු කිරීමට උචිත පරිසරයක්, සහයක් බලධාරීන් විසින් උදා කර දිය යුතුය.
- ශිෂ්ටාචාරය තමන්ටම අනන්‍ය වූ අරමුණින් ඉපිද, දේශපාලන ආර්ථික, ආක්‍රමණයට වහල් නොවී සිටීමට වග බලාගත යුතුය.
- ශිෂ්ටාචාරය යන්න මිනිසාගේ පූර්ණ පෞරුෂයටත් සමාජයේ යහපතටත්, මිනිස් සමාජයේ සියල්ලන්ගේම යහපතට සේවය කරන්නන් විය යුතුය.
- ඒ සඳහා මිනිස් හදවත් සකස් කළ යුතුය.
- ගැළවීමේ සුභාරංචියටත්, මිනිස් ශිෂ්ටාචාරයටත් අතර බොහෝ සබඳතා පවතී. මෙයට හේතුව වන්නේ විවිධ ක්‍රම වලින් තමන් වහන්සේව ලොවට එළිදරව් කළ දෙවියන් වහන්සේ විවිධ කාල වල පවතින ශිෂ්ටාචාරයන් තුලින් ඒ පිළිබඳව කතා කළ සේක.
- ශු. සභාව හා ශිෂ්ටාචාරය අතර ඉතා කිට්ටු සබඳතාවයක් පවතී. මන්දයත් ඉතිහාසයේ විවිධ අවස්ථාවලදී ශු. සභාව විවිධ ශිෂ්ටාචාර මූලයන් උපයෝගී කරගෙන ක්‍රියාත්මක වී ඇත.
- ශිෂ්ටාචාරය පිළිබඳව දැනුම මුලින්ම ලබාදී පෝෂණය කර වර්ධනය කරන මවක් මෙන් ප්‍රථමයෙන් ක්‍රියාත්මක වන්නේ පවුලයි.
- පූර්ණ මිනිස් ශිෂ්ටාචාරය සඳහා වන අධ්‍යාපන ක්‍රමය වර්ධනය කර උනන්දු කළ යුතුය.
- ප්‍රදේශවල ස්වාභාවයට අනුව නූතන ජනතාවට උචිත නව කලාව ශු. සභාව පිළිගත යුතුය

- කිතුණු ජනතාව තමන් හා ජීවත් වන අන්‍යාගමිකයන් සමග සුහදව සහජීවනයෙන් යුතුව ජීවත් විය යුතුයි. ශිෂ්ටාචාරය තුලින් ඔවුන්ගේ චින්තනය, හැඟීම් ආදිය වටහා ගැනීමට වෙහෙස විය යුතුය.

- නව දර්ශනය, ප්‍රතිපත්ති, නවීන ගවේෂණ ආදීන් ලබාදී ඇති දැනුම කිතුනු ධර්මය හා ඉගැන්වීම් සමඟ සම්බන්ධ කිරීමට විශ්වාසකයින් වෙර දැරිය යුතුය.

- මෙලෙස මිනිස් ශිෂ්ටාචාරය කිතු දහම සමඟ එක් කිරීමට මඟ සැලසිය යුතුය.

### 10.1.2.4. සාමය හා සහජීවනය (අංක 77-78)

මන්ත්‍රණ සභාව පහත සඳහන් අවබෝධයන් සමඟ සාමය හා සහජීවනය පිළිබඳව කතා කරයි.

- යුද්ධය නිසා දැඩි පීඩාවක් ඇති වී ඇත. මනුෂ්‍යත්වයක් සහිත ලෝකයක් ගොඩනැගීම මිනිස් සංහතියේ කාර්යය යි. සාමය සමගිය පිලිබඳ අවබෝධය දියුණු වෙමින් පවතී. මෙවන් පරිසරයක සැවොම නව ජීවයක් ලැබූ හදවතකින් තමන්ව සැබෑ සාමය සඳහා කැප කළ යුතුය.

- යුද්ධයකින් පසු මිනිස් සංහතිය තුළ ගොඩනැගී ඇති මෙම ඇල්ම හා බලාපොරොත්තුව, සාමය ඇති කරන්නෝ භාග්‍යවන්තයෝය, මක්නිසාදයත් ඔවුන් දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යැයි කියනු ලබයි, (මතෙව් 5 : 9) යන සුවිශේෂය තුළින් ආලෝකය ලබයි.

### සාමයේ ස්වාභාවය

- සාමය යනු යුද්ධය සිදුනොවන තත්ත්වයක් පමණක් නොව, එකිනෙකාට විරුද්ධ වන බලයක් අතර සම තත්ත්වයන් ඇති කිරීමද සාමය නොවේ. සාමය ඒකාධිපති රාජ්‍යයක් තුලින් බිහි නොවේ. සාමය යනු, යුක්තිය තුලින් ඇතිවන්නක්. (යෙසායා 32:17)

- සාමය ආදරයේ බීජයකි. ආදරය යුක්තිය තුලින් ලබාදිය නොහැකි ඉන් ඔබ්බට ගිය තත්ත්වයකි.

- මිනිස් සමාජයට පදනම සකස් කළ දෙවියන් වහන්සේ එම සමාජය සතුවිය යුතු යම් පිළිවෙලක් පිළිබඳව ද උපදෙස් දුන් සේක. මෙම පිළිවෙලෙ හි මේරූ ඵලය ලෙස සාමය ලැබේ.

- මෙම පිළිවෙළ යුක්තිය යැයිද සම්පූර්ණත්වය සොයා යන මිනිසුන් විසින් ක්‍රියාත්මක කළ යුත්තකි.

- මිනිස් සංහතියේ පොදු යහපත මුල්කර ගැනීම තුලින් පමණක් සාමය ඇති කරන්නෝ තිර සාමය මඟින් බව දැන ගත හැකිය.

- එබැවින් සාමය යනු ස්ථිර වශයෙන්ම ලබාගත් එකක් ලෙස කිසිවිටකත් නොපවතී.

### සාමය - සහජීවනය පවතින මාර්ග

- මිනිස් හදවත් ශක්තිමත් නොවන එකක් ලෙස ද, පාපය නිසා වේදනාවට පත්වී ඇති නිසා එක එක්කෙනා තම තමන්ගේ හැඟීම් චර්යා ආදිය පාලනය කරගත යුතුය.
- යුක්ති සහගත පාලකයින් සැලකිලිමත්ව සිටිය යුතුය.
- ඒක පුද්ගල යහපත සුරැකිය යුතුය.
- මිනිසා තමාගේ වරප්‍රසාද සම්පත් මැවීමේ හැකියාව සහිත හැකියාවක් ද තමන් තුළට විශ්වාසයෙන් යුතුව බෙදාගත යුතුය.
- අසල්වැසියන් හා ඔවුන්ගේ සම භාවය ස්ථිර මනසකින් ගරු කිරීම සහෝදර ප්‍රේමය කැමැත්තෙන් ආරක්ෂා කර ගැනීම සාමය ගොඩනැගීමට උචිත මාර්ගයන් ය.

- කිතුනුවන්, ප්‍රේමයේ පදනමින් සත්‍ය පවසා, (එපීස 4:15) සත්‍ය වශයෙන්ම සාමයේ මඟ යන මිනිසුන් හා එක්වී සාමය පැතීමටත් එය ඇති කිරීමත් කළ යුතුය.

- උදුරා ගනු ලැබූ අයිතිවාසිකම් නැවත ඇති කිරීම සඳහා ක්‍රියාත්මක වන විට ත්‍රස්තවාදී ක්‍රියා හෙලා දැක, දුර්වල තත්වයේ පසුවන්නන්ට ලබාදිය හැකි සුරක්ෂිත මාර්ගය භාවිතා කළ යුතුය.

- සමාජයේ අයිතිවාසිකම්, වගකීම්, ප්‍රශ්න වලට මැදි නොකර වගබලා ගත යුතුය.

## 10.1.3 ආසියානු රදගුරු සම්මේලනයේ බිහිවීම

- ආසියානු රදගුරු සම්මේලනය ඇති කිරීමට 1970 6 වන පාවුළු ශුද්ධෝත්තම පියතුමාව මුණ ගැසීමට පිලිපීන රටේ මැනිලා නගරයට එක් වූ ආසියානු රදගුරුවරුන් අතර ඇති වූ සංවාදය හේතුවක් විය.

- ආසියානු රදගුරුවරුන්ගේ එක්වීමේ දී තම එඬේරික සේවයේ අත්දැකීම් බෙදාගත් හ. තම පදවියේ ජනතාවගේ පොදු සමාජ, දේශපාලන, ආර්ථික, ආගමික ගැටලු පිළිබද සාකච්ඡා කළ හ. ජනතාවගේ පොදු යහපත සදහා ක්‍රියාත්මක විය යුතු අවශ්‍යතාවය පිළිබඳ සාකච්ඡා කළ හ.

- ආසියානු ජනතාව විවිධ ජාති, ආගම්, සංස්කෘති වලට අයත් වුවත් වුවද ඔවුන් ආසියානුවන් වුහ. ආසියානු සාමාජයේ, ධර්මයේ, සංස්කෘතියේ සාරධර්ම පොදු ස්වභාවයක් ඇති හෙයින් ඒවාට සත්‍ය සවභාවයක් ඇති හෙයින් ඒවාට සත්‍ය සවභාවයෙන් ඒවා මුල් කරගෙන එඬේරික සේවාව ඉදිරියට ගෙන යා හැකි යැයි සිතුහ.

- ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ දේව රාජ්‍යයේ ඉලක්කය ළගා කර ගැනිමට ආසියාවේ ජේසුස් වහන්සේ අනුගමනය කළ එඬේරික සේවයේ ප්‍රතිඵල සියලුම ජනතාව වෙත ළගා විමට මාර්ග සැලැස්විමේ අවශ්‍යතාවය ඉදිරි පත් කළහ.

- මෙය ස්ව කැමැත්තෙන් සාමුහිකව, එකිනෙකාගේ සහය ඇතිව ක්‍රියා කිරීමට සංවිධානයක් ඇති කළ යුතුය යන්න අවබෝධ කර ගත් හ.

- 1971 දි හොංකොං රටේ එක් වු අවස්ථාවේ දී සංවිධානයක් ඇති කිරීම සඳහා වන සීමා පිළිබද සාකච්ඡා කළහ. 1972 දි 6 වන පාවුලු ශුද්ධෝත්තම පිය ආශිර්වාදය සමඟ ආසියානු රදගුරු සම්මේලනය ආරම්භ විය.

- ආසියානු රදගුරු සම්මේලනයේ දකුනු ආසියානු (ඉන්දියාව, ලංකාව, පාකිස්ථානය, බංගලාදේශය) ගිනිකොණ ආසියානු (ඉන්දුනිසියාව, ලාඔස්, කාම්බෝජය, මැලේසියාව, සිංගප්පුරුව, බෲනේ, මියන්මාරය, පිලිප්පිනය, තායිලන්තය, වියට්නාමය) නැගෙනහිර ආසියානු (ජපානය, දකුනු කොරියාව, තයිවානය) වැනි රටවල රදගුරු සම්මේලනය පුර්ණ සාමාජිකත්වය ලබා ඇත.

- තවද රටවල් 11ක රදගුරු සම්මේලන (හෝංකොං,කිරිකිස්ථානය, මැකෝ, මොංගෝලියාව, නේපාලය, සිබෝරිය, තජිකිස්ථානය, ඩේක්වෙනිස්මානය, උස්බෙස්කිස්ථානය, නැගෙනහිර තිමෝරය) සහය සාමාජිකත්වය ලබා ඇත.

**සමාජ දැක්ම**

- ආසියානු සමාජවල පොදු යහපත වෙනුවෙන් ද, සමාජ උන්නතිය සඳහා ද ස්ව කැමැත්තෙන් හා සාමුහික වගකිමෙන් ක්‍රියාත්මක වීම ආසියානු රදගුරු සම්මේලනයේ අරමුණයි.

- මෙම අරමුණ ඉටුකර ගැනිමට විවිධ ආගමිකයින්, සංස්කෘතිවලට අයත් වුවන්ගේ සහයෝගය සහ ඔවුන්ගේ කැමැත්ත ඇතිව ක්‍රියාත්මක වීමට ආසියානු රදගුරු මණ්ඩලය උත්සාහ කරයි.

- සමාජ යහපත උදෙසා වන සේවයේ දී ආසියාවේ දිළිදුන්ට ප්‍රථම ස්ථානය ලැබේ. 1971 දි සිදු වු පළමු රැස්වීමේදීත්, 1990 දි සිදු වු පස්වන පොදු රැස්වීමේදීත් ආසියාවේ දිළිඳුන්ගේ විවිධත්වය පිළිබද සාකච්ඡා කරනු ලැබ දිළිඳුන්ට සේවය කිරිම රදගුරු වරුන්ගේ මූලික කැපවීම බව ප්‍රකාශ කළහ.

- දිළිඳුන්ට පූර්ණ යහපත් ජීවිතයක් ලබා දීමට ආසියානු රදගුරු සම්මේලනය.

  සොරා එන්නේ සොරකම් කරන්නටත්, මරන්නටත්, විනාශ කරන්නටත් පමණකි. මා පැමිණියේ ඔවුන් හට ජීවනය ලැබෙන පිණිස ය. සපුරා ම එය ලැබෙන පිණිස ය. (ජොහාන් 10 : 10) යන ජේසුස් වහන්සේ ගේ ප්‍රකාශය තම එඬේරික සේවයේ මූලික ප්‍රකාශය කරගෙන ඇත.

- "සමාජ සේවය සඳහා ආසියානු රදගුරු සංවිධානය "(Bishop's Institute of social Action) මගින් 1974 දී පළමු දිළින්දන් සඳහා වු පූර්ණ ජීවන සේවා පිළිබද සැලකිලිමත් වෙයි.

- මෙම පළමු සංවිධානය වාර්ෂිකව ආසියානු රදගුරුවරුන් අදාළ සමාජ පරිසරයකට කැඳවා ඔවුන්ට පවතින සමාජ ප්‍රශ්න පිළිබඳ පිබිදීමක් ඇති කරනු ලැබේ.

- ඔවුන් ලබ ගත් සමාජ පිබිදීම සුවිශේෂයේ ආලෝකයෙන් සිතිමට ඉඩ සලසා තම එඬේරික සේවා සැලැස්ම සකසා ගැනිමට මඟ පෙන්වයි.

- ආසියානු රදගුරු සම්මේලනයේ ආසියානු දිළිදුන් පිළිබද ගණනය මෙයයි. ආසියානු ජනතාවගෙන් බොහෝමයක් දෙනා දිළින්දන් වෙති. ආසියානු සම්ප්‍රදාය, සංස්කෘතිය, මිනිස් වටිනාකම්, ආගම්වල අධ්‍යාත්මික දැක්ම ආදිය නිසා ආසියානු ජනතාව "දිළිඳුන්" නොවෙති. ඔවුන් සම්පත් බොහෝමයක් සතු වූවන් ය. නමුත් පහත සඳහන් හේතු නිසා ඔවුන් දිළින්දන් ලෙස සිටිති.

  1) ඔවුන්ගේ යහපත් ජිවිතයකට අවශ්‍ය ස්වභාවික සම්පත් භාවිතා කිරිමේ අවස්ථාව උදුරා ගැනිම.

  2) ඔවුන්ගේ දිනපතා මූලික අවශ්‍යතා සම්පුර්ණ කළ යුතු පාරිභෝජන භාණ්ඩ ලබා ගැනීමේ අවස්ථාව උදුරා ගැනීම.

  3) මේ නිසා ජනතාව මුලීකව සුරාකනු ලබති. කොන් කරනු ලබති.

  4) ඔවුන් ආයතන ගත කර ආර්ථික, සාමාජීය, දේශපාලන අයුක්තියේ සංවිධානය තුල ජිවත් වෙති.

  5) ආසියාවේ දැකිය හැකි වු ආගමික මූල ධර්මවාදින් ඔවුන් කරන පෙරළි, ත්‍රස්තවාදි ක්‍රියා නිසා ආසියාවේ දිළිඳුන් ඇති වීමට හේතු වි ඇත.

**ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියා කාරකම්**

1) ශුද්ධවු සභාවේ සමාජ ඉගැන්වීම් මගින් ඔවුන් ලද සමාජ පිබිදීම කණ්ඩායම් ලෙස බෙදා ගනිති.

2) මිනිස් උතුම්කම වර්තමාන පරිසරය තුළ සුරකිනු ලැබේද? විනාශ කරනු ලැබේද? යැයි සාකච්ඡා කරයි.

3) මේ අනුව තම සාමාජ සේවය සඳහා සැලැස්මක් ඉදිරිපත් කරයි.

4) යුද්ධයෙන් පසු තම තමන්ගේ පරිසරයේ පවුල්වල තත්ත්වය පිළිබඳ තොරතුරු රැස් කරයි.

5) ආසියානු දැක්ම අනුව දිළිඳුන්ගේ බිහි වීමට හේතු සොයා දිළිදුන්ගේ ජීවිත ගොඩනැගිමට ඔවුන්ගේ සහභාගීත්වය ප්‍රකාශ කරයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. වි. පවුල් ලියෝන්, දෙවන වතිකාන ලිපි ලේඛන, තේඩල් මුද්‍රණාලය, තිරුච්රාපල්ලි, 2001.

2. ඇස්. ටි. සෙල්වරාසු, නව ලොවක් බිහි කිරීමටඃ ශුද්ධ වූ සභාවේ සමාජ සිතිවිලි, වෛගරෛ මුද්‍රණාලය, තින්ඩුකල්, 2006

3. පිල්ප්ස් යේසුදාසන් (නි.ම.නි.), අද ලොවේ ශුද්ධ වූ සභාව, ක්‍රිස්තියානි ධර්මය. (අ.පො.ස. උසස් පෙළ)

4. ඒ. අලංගාරම්. ආසියා ජනතාවගේ ක්‍රිස්තුන් වහන්සේ, නම්වාල්වු අරුට්කඩල් මුද්‍රණාලය, චෙන්නායි, 2008.

5. ජෙරාඩ්. ටි. රොසයිරෝ. (නි.ම.නි.), අසියානු ශුද්ධ වූ සභාව හා සුවිශේෂය ප්‍රකාශ කිරීමේ සේවාව, නම්වාල්වු මුද්‍රණාලය, චෙන්නායි, 2014.

6. ජෙරාඩ්. ටි. රොසයිරෝ. (නි.ම.නි.), මිනිස් සමාජය දියුණු කිරීම හා ක්‍රිස්තියානි සහයෝගය,(නි.ම.නි.) මුද්‍රණාලය, කොළඹ, 2010.

7. Geraird de Rosairo OMI, Church in Asia and Mission Inter Gentes : A study based on FABC Documents, CSR Press, Co

| | | | |
|---|---|---|---|
| **නිපුණතාව** | 10.0 | : | **නව ශිෂ්ටාචාරයක් බිහි කිරීමේ කිතුනු සේවාවට සහභාගි වෙයි.** |
| **නිපුණතා මට්ටම** | 10.2 | : | කිතුනු ආයතනවල සමාජ ඉගැන්වීම් හා මඟපෙන්වීම් හදාරා නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල නියැළෙයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | | : | 14 |

**ඉගෙනුම් පල**

- කිතුනු සභා සම්මේලනයේ ආරම්භය හා සමාජීය අරමුණු පිළිබඳ කරුණු රැස් කරයි.
- කිතුනු සභා සම්මේලනය සමාජ සංවර්ධනය සඳහා ක්‍රියා කරන බව පිළිගනියි.
- ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- කිතුනු සභා සම්මේලනයේ සමාජීය අදහස් ආදර්ශ කර ගනිමින් ජීවත් වීමට උත්සාහ දරයි.
- අන් අය හා සහයෝගයෙන් ක්‍රියා කරයි.

## 10.2.1 ලෝක කිතුනු සභා සම්මේලනය (WCC) ආරම්භය සමාජ දැක්ම

### 10.2.1 (අ) ලෝක කිතුනු සභා සම්මේලනයේ (WCC) ආරම්භය.

- 19 වන සියවසේ බටහිර රටවල විවිධ කිතුනු සභා වලින්ද, විවිධ මිෂනාරිවරුන් විසින් ද (Missionary Movements) අනෙකුත් රටවල් සඳහා ධර්ම ප්‍රචාර සේවය අති විශාල ලෙස සිදුවුණි.

- 1810 බැප්ටිස් සභාවේ නිර්මාතෘ විලියම් හෙන්රි නැමැත්තා මෙලෙස විවිධ රටවල සේවය කරන මිෂනාරි වරුන්ව (Missionaries) එක් කර ලෝක මහ සමුළුවක් පැවැත් වීමට වෙර දැරීය.

- එම අවස්ථාවේ අත්පත් කරගත නොහැකි වු එම උත්සහය වසර 100කට පසු එංගලන්තයේ එඩින්බර්ග් නම් ස්ථානයේ 1910 දි රැස් වු ප්‍රථම ලෝක මිෂනාරි සමුළුව (World Missoinary Conference) මඟින් ඉටුවිය.

- 1920 දී අපරදිග වෛදික සභාවේ ක්‍රිස්තියානියේ ඒකත්වය භාරව සිටි ප්‍රධාන පූජකයාණන් වන (Ecumenical Patriarch of the Eastern Orthodox Church) කොන්ස්තන්තිනෝපලයේ ජර්මනුස් V නැමැත්තා "ලෝකයේ දැකිය හැකි ක්‍රිස්තුන් වහන්සේගේ ශු.සභාව සියල්ලන්ටම" යන ලිපිනය ලියු ලිපියක් ලිවීය. වෙන් වී සිටින කිතුනුවන් එක් වී ක්‍රියාත්මක විමට එම ලිපිය පෙන්වා දි ශු. සභාවල සංවිධානයක් (League of Churches) ආරම්භ කිරිමට යෝජනා කළේය.

- 1937 දී ලෝක ශු. සභා නායකයින් "ලෝක කිතුනු, සභා සම්මේලනය" (World Council of Churches) ඇරඹීමට එකඟතාවය පල කළ හ. WCC ඇරඹීම සඳහා එවකට ක්‍රියාත්මක වෙමින් පැවති ඇමරිකාවේ ක්‍රියාත්මක වු "විශ්වාස හා පිළිවෙළ සඳහා වන පෙරමුණ." (Faith and Order Movement) ස්විඩනයේ ක්‍රියාත්මක වු ලුතරානු සභාවට අයත් "ජීවිතය හා සේවය සඳහා වන පෙරමුණ" (Life and Work Movement) වැනි සංවිධාන දෙකම ඒකාබද්ධ කරන ලදි. නමුත් එකල ආරම්භ කරන ලද දෙවන ලෝක මහා සංග්‍රාමයේ ප්‍රතිඵලයක් ලෙස WCC ඇරඹීම කල් දමන ලදි.

- යුද්ධය අවසන් වූ පසු 1948 අගෝස්තු 23 වන දින ලෝක කිතුනු සභා සම්මේලනය (WCC) නෙදර්ලන්තයේ ඇම්ස්ටර්ඩෑම් නම් ස්ථානයේ ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ දෙවියන් වහන්සේ ලෙසත් ගැළවුම්කරුවාණන් ලෙසත් පිළිගන්නා කිතුනු සභාවන්ගේ එකමුතුව ලෙස ආරම්භ විය. මෙම සභාවන්හි එකමුතුකමට ඉහත සඳහන් කළ විශ්වාසය සහ පිළිවෙළ සඳහා වන පෙරමුණ, තවද ජීවිතය සහ සේවය සඳහා වන පෙරමුණ යනාදිය ඒකාබද්ධ කිරීමේ උත්සවයට සහභාගීවීම සඳහා කිතුණු සභා 147ක නියෝජිතයින් ඇම්ස්ටර්ඩෑම් නගරයට එක් වූහ.

- මේ සමගම මෙම එකමුතුව ශක්තිමත් කිරීම සඳහා 1950 ලුසර්න් නැමති ස්ථානයේ එක් වූ දෙවන සම්මේලනයේ දී "ශු. සභාවේ ස්වභාවය" පිළිබඳව ප්‍රධාන ගවේෂණයක් කරන ලදි. ඉන් අනතුරුව පැවති සම්මේලන වල 1961 දී ජාත්‍යන්තර මිෂනාරි සංගමය (International Missionary Council), 1971 කිතුනු අධ්‍යාපනය සඳහා ලෝක සංවිධානය (World Council of Christian Education) වැනි සංවිධාන පිළිවෙළින් එක් විය.

- ක්‍රිස්තියානි අධ්‍යාපනය සඳහා වන ලෝක සංවිධානය 18 වන සියවසේ ආරම්භ කරන ලද නිවාඩු දින පාසල් සංගමයේ දියුණුව බව මෙහිදි සඳහන් කළ යුතු ය.

- WCC එක සභාවක් නොවේ. සභාව නියෝජනය කරන ආයතනයකුත් නොවේ. ඒ වෙනුවට වෙනස් වෙනස් කිතුනු සභාවන්හි එකමුතුව සඳහාත්, නවීකරණය කිරීම සඳහාත් එක් වී එකිනෙකා අවබෝධයෙන් ක්‍රියාත්මක වීමට අවස්ථාව ලබා දෙන සංවිධානයකි.

- විවිධ හේතු ඉදිරිපත් කර, ඉතිහාසයට අනුව බෙදී සිටින කිතුණු සභාවන් අතර එකමුතුකම හා අවබෝධය වර්ධනය කිරීමට ඇති වූ, ශු. සභාවේ ඒකත්වය වෙනුවෙන් වන සංවිධානයෙන් WCC බිහි වූ බව ඉහත ඉගෙන ගත්තෙමු.

- මෙලෙස පියවරෙන් පියවර වර්ධනය වූ WCC හි සමාජිකත්වය දරන ප්‍රධාන සභාවන් වූයේ වෛදික සභාවන්, ඇංග්ලිකන් සභා සමාජය, සමහර බැප්ටිස් සභා, බොහෝ ලූතරානු, මෙතෝදිස්ත, ප්‍රස්බෙටේරියන් වැනි ප්‍රොතෙස්තන්ත්‍ර සභා අනෙකුත් ප්‍රතිසංස්කරණ සභා, සමහර පෙන්තකොස්ත සභා ඇතුළු සමහර කතෝලික සභා WCC හි සමාජිකත්වය දැරීමට කැමැත්තක් නොදක්වන සභා එක් වී ලෝක එවැන්ජලික් සංවිධානය ( World Evangelical Alliance) යන සංවිධානය ආරම්භ කරන ලදි.

- 1948 ආරම්භ කළ සම්මන්ත්‍රණයෙන් පසු සෑම වසර 7 කට හෝ අටකට පසු එක් වතාවක් පොදු සම්මේලනය පැවැත්වේ. පොදු රැස්වීම් අතරතුර මෙම සම්මේලනයේ ක්‍රියාකරකම් ඉදිරියට ගෙනයාමට විවිධ ක්‍රියාකාරී කණ්ඩායම් ගොඩනගන ලදි. ආරම්භයේ සිට 2017 දක්වා WCC විසින් රැස්වීම් මාලා 10 ක් පවත්වන ලදී.

1. ඇම්ස්ටර්ඩම් (නෙදර්ලන්තය) - 1948 අගෝස්තු 22- සැප්තැම්බර් 04
2. එවාන්ස්ඩස් (ඉල්නොයිස්) - 1954 අගෝස්තු 15-31
3. නව දිල්ලිය (ඉන්දියාව) -1961 දෙසැම්බර් 05 - නොවැම්බර් 19
4. උප්සලා (ස්විඩනය) -1968 ජුලි 04 - 20
5. නයිරෝබි (කෙන්යා) - 1975 - නොවැම්බර් 23 - දෙසැම්බර් 10
6. වන්කුවර් (කැනඩා) - 1983 - ජුලි 24 - අගොස්තු 10
7. කැන්බරා (ඔස්ට්‍රේලියාව) - 1991 පෙබරවාරි 07-21

8. කරාරේ (සිම්බාබේ) - 1998 දෙසැම්බර් 03-14

9. බොර්ඩෝ අලික්රේ (බ්‍රසීලිය) - 2006 පෙබරවාරි 14- 23

10. පූසාන් (දකුණු කොරියාව) -2013 ඔක්තොම්බර් 30-නොවැම්බර් 08

- WCC යේ කිතුනු ඒකත්ව සේවය, එකිනෙකාට ඉතා සමීප ව කෙරෙන ප්‍රධාන මාර්ග දෙකකින් ඉදිරියට ගෙනයනු ලැබේ. මෙම මාර්ග දෙක විශ්වාසයේ ක්‍රමානුකූල බව සහ ජීවිතය හා සේවය සඳහා වන කණ්ඩායම් නියෝජනය කරයි. WCC මෙම සේවාවන් විවිධ කොමිසම් සභා මගින් ඉදිරියට ගෙනයන ලදි. ඒවායින් සමහරක් පහත සඳහන් පරිදි වේ.

☆ තරුණයින් සඳහා කොමිසම් සභාව (අවුරුදු 18-30)
(Echos - Commission on Youth)

☆ සේවය සහ සංවර්ධනය සඳහා වන සභාවන්හි කොමිසම
(Commission of the Churches on Diakonia and Development)

☆ දේව ධර්ම අධ්‍යාපනය සහ සාමතිකත් ව වර්ධනය සඳහා වන කොමිසම
(Commission on Education and Ecumenical Formation )

☆ ජත්‍යාන්තර ක්‍රියාකාරකම් සඳහා වන සභාවන්හි කොමිසම
(Commission of the Churches on International Affairs)

☆ ලෝක ධර්මදානය සහ ධර්මදූත සේවය සඳහා වන කොමිසම
(Commission on World Mission and Evangelism)

☆ විශ්වාසයේ හා ක්‍රමවත් බව සඳහා වන කොමිසම
(Faith and Order Commission)

☆ ප්‍රචණ්ඩබය තුරන් කිරිම සඳහා වන
(Reference Group on the Decade to Overcom Violence)

☆ WCC - රෝමානු කතෝලික (වතිකාන) සභාවේ සම්බන්ධිකරවන ක්‍රියාකාරී කණ්ඩායම
(Joint Working Group WCC - Roman Catholic Church (Vatican) )

☆ අන්තර් ආගමික සංහිදියාව සම්බන්ධ කණ්ඩායම
(Reference Group on Inter - Religious Relations)

☆ WCC යේ වෛදික සභාවේ දායකත්වය සඳහා වන විශේෂ කණ්ඩායම
(Special Commission on Orthodox Participation in the WCC)

### 10.2.1. (ආ) ලෝක කිතුනු සභා සම්මේලනයේ (WCC) සාමාජීය දැක්ම

### 10.2.1. (ආ) 1. ආගමික ප්‍රචණ්ඩත්වයට එරෙහිව සමාජ සාමය සඳහා වන ප්‍රයත්නය

- ආගම පදනම් කරගෙන ලෝකයේ විවිධ ප්‍රදේශ වල කාලයෙන් කාලයට ප්‍රචණ්ඩත්වය ඇවිලී මහ විනාශයන් ඇතිවන තත්වයන් දැකිය හැක.

- ආගම් වල නාමයෙන් ඇති කරන මෙම මහා විනාශය වර්තමානයේ ඇති වූවාක් නොවන බව ඉතිහාසය පිළිබඳ ගවේෂණයේ දී දැන ගත්තෙමු. උදාහරණයක් ලෙස ක්‍රිස්තියානි හා ඉස්ලාම් දහමේ මුල් යුගයේ දියුණුව කලබලකාරී පරිසරයක් තුළ ඇතිවිය. මෙලෙස ප්‍රචණ්ඩත්වය අත හැර සමාජය තුළ යුක්තිය හා සාමය ඇති කර මිනිස් උතුම්කම ශක්තිමත් කිරිම WCC ප්‍රධාන සාමාජීයීය අරමුණ වේ.

- ආගම් අතර සංහිඳියාව, සාමය, ලෝකයේ රටවල් අතර මෙන් ම සමාජයත් අතර අන්‍යෝන්‍ය අවබෝධය, සාමය ආදිය දියුණු කරයි යන මූලික අදහස සමඟ WCC තමන්ගේ මෙම සමාජ දැක්ම සම්බන්ධව ක්‍රියාත්මක වෙයි.

- විවිධ ආගම් අතර සබැඳියාව, හා අසමගිය නිතර නිතර ඇති වූ බව ඉතිහාසය තුළ තමා දුටු සත්‍යයකි.

- ආගම් අතර අසමගිය ප්‍රධාන අංශ දෙකකින් දැකිය හැක. එකක් තම තමන්ගේ ආගමික ඉගැන්වීම් අනුව අනෙකුත් ආගම් වල උපදෙස් සලකා බලා, එම ආගම් ප්‍රතික්ෂේප කිරීම නැතහොත් පීඩා කිරීම වැනි ක්‍රියාකාරකම් නිසා ඇතිවන අසමගිය සහ සමාජ දේශපාලන හා ආර්ථික හේතු ඉදිරිපත් කර ආගම් අතර ඇතිවන බෙදීම්.

- මෙවන් ආගමික බෙදීම් වර්තමාන ලෝකයේ සමහර රටවල ඒ ඒ අවස්ථාවේ දී ඇති වේ. නමුත් එයට සහයෝගය ලබා නොදුන් ආකාරයට ආගම් අතර, නායකත්වය ක්‍රියාත්මක වී ආගමික ඉගැන්වීම් ඉදිරිපත් කරයි.

- විවිධ ක්‍රිස්තියානි ආගමික කොටස් අතර අවබෝධය ඇති කිරීමට සභාව ඉදිරිපත් වූ ආකාරයට, අනෙකුත් ආගම් සම්බන්ධව ක්‍රිස්තියානි සභාවන් යහපත් මානසිකත්වයකින් ක්‍රියාත්මක විය යුතුයි, යන්න පිළිබඳව අවධානයෙන් සිටියි.

- මෙම වැයම අන්තර් ආගමික සංවාදය, යැයි හඳුන්වනු ලැබේ. ආගම් අතර සංහිඳියාව යන්න ගැඹුරු අරුතක් ගෙනදෙයි. මෙය සාකච්ඡාවක් පමණක් නොව සාකච්ඡාව සමඟ අවබෝධය මෙන්ම එක් ආගමක් අනෙක් ආගමට ගරු කර ජීවත් වීමේ තත්ත්වය හැකි අවස්ථාවලදී එක් වී ක්‍රියාත්මක වීමේ ස්වභාවය සඳහන් කෙරේ.

- 20 වන සියවස ආරම්භයේ සිට WCC අන්තර් ආගමික සංවාදය පිළිබඳ චින්තනය WCC සමාජිකත්වය දරන ශු. සභාව අතර බෙදා ගැනේ. අන්‍යාගමිකයින් සම්බන්ධ කෙබඳු හැසිරීමක් ( Christian response to people of other faiths) කිතුනුවන් අතර තිබිය යුතු ද යන්න පිළිබඳ පෙරදිග ප්‍රොතෙස්තන්ත මිෂනරි සංගම් (Western Protestant Missionary Movements ) නැවත සිතීමේ ප්‍රතිඵලයක් ලෙස අන්තර් ආගමික සංවාදය නමැති අදහස් බිහිවිය.

- WCC යේ අන්තර් ආගමික සංවාදයේ ස්වභාවයන් අනෙකුත් පුරාණත්වයටත් වර්තමානයේ ලියැවෙන විවිධ ග්‍රන්ථ සාක්ෂි දෙයි. උදාහරණ ලෙස පහත ග්‍රන්ථ සඳහන් කළ හැක.

☆ 1991 වෙස්ලි ආරියරාජා විසින් ප්‍රකාශයට පත්කරන ලද "හින්දු ආගමිකයින් හා කිතුනුවන්" සියවස් ගණනාවක් ප්‍රොතෙස්තන්ත ඒකත්ව චින්තනය.

☆ 2000 වසරේ ජුටා ස්පර්පර් ලියූ කිතුනුවන් හා ඉස්ලාමියයන් ලෝක කිතුනු සභා සම්මේලනයේ බහු ආගමික සංවාද ක්‍රියාකාරකම්

☆ ෂේන් හෙන්රික් ෆ්රාංගර් 1994 ලියූ "බහු ආගමික සංවාදය පිළිබඳ සාකච්ඡාව" 1967-1979 ලෝක කිතුනු සභා සම්මේලනයත් බහු ආගමික තත්ත්වයේ හඬ

☆ විවිධ දේශපාලනික, ආර්ථික, සමාජ හේතූන් ඉදිරිපත් කර, මහත් යුද්ධයක් දක්වා ගොස් බෙදීම හා මහා විනාශයක් ලෝකය මුහුණු දෙන තත්ත්වය වෙනස් කර සැලසුම් කිරීම තුළ ආගම් වල දායකත්වය දැනගත හැකි විය.

☆ ඊට වඩා ආගම් වල නාමයෙන් යුද්ධය හා ප්‍රචණ්ඩත්වය වැඩිවීම නවතාලීමේ අවශ්‍යතාවය ද ඇති වී ඇත. තවද දේශපාලනික, ආර්ථික, සමාජ හේතූන්, ආගම් වැරදි ලෙස උපයෝගිකරගෙන තම වැරදි අරමුණු ඉටු කර ගැනීමට උත්සහ කිරීම නිසා ඇතිවන විනාශය නවතාලීම අවශ්‍ය වේ.

☆ සමාජ උන්නතිය සඳහා දැක්වූ උනන්දුව නිසා, ක්‍රිස්තියානීන් අතර අන්තර් ආගමික සංවාදය ආරම්භ කිරීමටත් අන්තර් ආගමික සහජීවනය ඇති කිරීමටත් මඟ පෑදුණි.

**අන්තර් ආගමික සහජීවනය සඳහා WCC යේ ඉගැන්වීම් :**

☆ අන්‍යාගමිකයින් තම ආගමට තර්ජනයක් ලෙස නොසලකාද අනවශ්‍ය බියක් ඇති කර නොගෙන තම අසල්වැසියෙක් ලෙස බැලිය යුතු ය.

☆ ඉතිහාසය තුළ ඇතිවූ ආගම් අතර වැරදි හැඟීම්, සැක ආදීය ඉවත් කර, අන්තර් ආගමිකයින් සමඟ සහයෝගයෙන් සමාජ උන්නතිය සඳහා ක්‍රියාත්මක වීමට ඉදිරිපත් වීම.

**අන්තර් ආගමික සංහිඳියාව සඳහා WCC යේ ක්‍රියාකාරකම්**

☆ WCC යේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ පොදු සම්මේලන වලට අනෙකුත් ආගමික නායකයන්ව ද නරඹන්නන් ලෙස ආරාධනා කිරීම.

☆ ලෝක කිතුනු සභා සම්මේලනයේ බොස්සේ නගරයේ සභාවන් හි ඒකාබද්ධ අධ්‍යාපන මධ්‍යස්ථානයේ (World Council of Churches Ecumenical Institute in Bossey) වාර්ෂික පවත්වනු ලබන පාඨමාලා

☆ ජෙනීවා විශ්ව විද්‍යාලය මඟින් ලබාදෙනු ලබන උසස් අධ්‍යාපනය සඳහා සහතික පත්‍රය (Certificate of Advanced Studies (CAS)) මෙම පාඨමාලාවේ සමහර ක්‍රියාකාරකම්, පාඨමාලාව සඳහා වන ප්‍රධාන අදහස් ධර්මානුකූල ප්‍රකාශ බෙදාහැරීම, දේශන, රැකියා ස්ථාන, අධ්‍යාත්මික ක්ෂේත්‍ර චාරිකා ආදිය

☆ WCC යේ, "ආගම් අතර සාකච්ඡාව හා සහයෝගය" යන සංවිධානය ඉස්ලාමීයයන්ගේ හා ජුදයින්ගේ ආගම් අතර සහජීවනය දක්වෙන සංවිධාන සමඟ එක් වී මෙම පාඨමාලාව පවත්වනු ලැබේ.

☆ මෙම සති හය ඇතුළත පූර්ණකාලීනව පාඨමාලාව හදාරන්නන් වයස අවුරුදු 20-35 ත් අතර විය යුතුය, තම තමන්ගේ ආගම් පිළිබඳ හොඳ දැනුමක් ඇති අය ලෙසද, ආගම පිළිබඳ දැඩි ලැදියාවක් ද ඇති අය විය යුතුය. මෙම පාඨමාලාවෙන් පසු ජනතාවගේ චින්තනයේ යහමඟ ගෙන යන හැකියාවක් ඇති අයද විය යුතුයි.

☆ 2016 වර්ෂය සඳහා පාඨමාලාව - දේව විශ්වාසයක් ඇති ජනතාව යන ආකාරයට, අප මුහුණ දෙන දිනෙන් දින වර්ධනය වන ප්‍රචණ්ඩත්වය, අදහස් නොගැලපීම් වැනි අභියෝගවලට මුහුණ දී ඒවා ඉදිරියට ගෙන ගොස්, අනෙකුත් සමාජ වලට අයත් අයට ගරුකර ඔවුන් හා එක්ව ක්‍රියා කිරීම යන්න පදනම් කර ගනිමින් අනෙකුත් සමාජයන් හා එක්ව වගකීම් සහිත සමාජයක් ගොඩනැගිය යුත්තේ කෙසේ ද යන්න මූලිකවම ගවේෂණය කළ හ. මෙම පාඨමාලාවේ තරුණ කිතුනුවන් 30 දෙනෙක් ද ඉස්ලාමීය, ජුදා තරුණයින් ලෝකයේ විවිධ රටවලින් සහභාගී වූහ.

☆ සම්මන්ත්‍රණ මඟින් ආගම් අතර විශ්වාසය හා අවබෝධය වැඩිදියුණු කිරීමට අවස්ථාවක් ඇති කරනු ලැබේ. සමහර සම්මන්ත්‍රණ WCC පමණක් සංවිධානය නොකර, අන්‍යාගාමික ආයතන හා එක්ව සංවිධානය නොකර, අන්‍යාගමික ආයතන හා එක්ව සංවිධානය කිරීම තුළින් විශිෂ්ට ප්‍රයෝජනයක් ලබා ඇත. 2016 අගෝස්තු 18 වනදා සිට 22 වනදා දක්වා අල් අසාර් ඊජිප්තු ඉස්ලාමීය මධ්‍යස්ථානය (ආගමික ස්ථාන හා විශ්ව විද්‍යාල) සමඟ WCC එක් වි සම්මන්ත්‍රණයක් ඊජිප්තුවේ කයිරෝ නගරයේ පැවැත් වූහ.

☆ වර්තමාන ලෝකයේ මැද පෙරදිග රටවල පමණක් නොව, යුරෝපය, ආසියාව, උතුරු ඇමරිකාව ආදී ප්‍රදේශ වල ද ආගම් පදනම් කර ගනිමින් සිදුවන නොසන්සුන්කාරී තත්ත්වය, ප්‍රචණ්ඩ ක්‍රියා ආදිය නිසා තරුණයින් බොහෝ බලපෑම් වලට ලක් වී සිටියි.

- මෙම බලපෑම මග හැරවීමටත්, ඒවායින් තරුණයින් බේරා ගැනීම සඳහා මඟක් සෙවීමටත්, ආගම් අතර අවබෝධය ඇති කිරීමටත් මෙම සම්මන්ත්‍රණය බෙහෙවින් සහය විය. එහි දී ගවේෂණ කළ මූලික කරුණු,

- ☆ ආගම, ආධ්‍යාත්මය හා දේශපාලනය
- ☆ පුරවැසිභාවය (ආගම, ජාතිය, ජාතික සළකුණු)
- ☆ ආගමික ඉගැන්වීම් සහ ප්‍රචන්ඩත්වය
- ☆ තරුණයින් හා ආගමික ත්‍රස්තවාදය (religious extremism)
- ☆ සාමය ඇති කිරිම සඳහා ආගම් වල භූමිකාව
- ☆ සමාජ නීති සහ සාමය ගොඩනැගීමෙහිලා තරුණයින්ගේ දායකත්වය
- ☆ ඉස්ලාමීය සහ ක්‍රිස්තියානි ආගමික උගතුන්, දේශපාලනමය විශාරදයින්ගේ සාකච්ඡා වලට සහභාගී වූ තරුණයින්ගේ අත්දැකීම් බෙදාගැනීමටත් මෙම සම්මන්ත්‍රණය ප්‍රධාන තැනක් ගෙන තිබුණි.

**මධ්‍යම ක්‍රියාකාරී - කමිටුව සඳහා වන සම්මන්ත්‍රණ :**

- ගවේෂණ ආරම්භය සඳහා ප්‍රථමයෙන් නැගුණ ප්‍රශ්න වන්නේ ආගම් මඟින් නිතර නිතර ප්‍රචණ්ඩත්වය ඇති කරන ආකාරයේ කරුණු මොනවාද? පටු ආගමික අදහස් නිසා ඇතිවන ප්‍රචන්ඩත්වය ආගමික ලැදියාවන් ඇති අයට විරුද්ධ ප්‍රචණ්ඩත්වය හෝ ආගමික සංවිධාන අතර ඇතිවන ප්‍රචන්ඩත්වය, වැනි අවස්ථාවල ආගම හා ප්‍රචන්ඩත්වය අතර ඇතිවන මෙම භයානක සම්බන්ධය කෙලෙස හඳුනා ගෙන එය වලකාලීමට අවශ්‍ය පියවර ගත හැකිද? මෙම ප්‍රශ්න වලට පිළිතුරු සෙවීමේ අදිටනින් WCC යේ ක්‍රියාකාරී සමාජිකත්වයේ ගවේෂණය සඳහා 2016 ජුනි 26 වන දින නොර්වේ රටේ සම්මන්ත්‍රණයක් පැවැත්වුණි.
- මෙම සම්මන්ත්‍රණයේ තේමාව "ආගමඃ යුද්ධය සඳහා නැතහොත් සාමය සඳහා WCCයේ ප්‍රතිපත්ති සංධානයට මඟ? " පෙන්වන අරමුණින් ආගම සහ ප්‍රචණ්ඩත්ව සහයෝගය දක්වන දේශපාලන, ආගමික සහ දේව ධාර්මික හේතූන් වැනි දෑ පිළිබඳ මෙම සම්මන්ත්‍රණයේ දී සොයා බැලුහ.

**ආගම හා ප්‍රචණ්ඩත්වය අතරේ ඇති සම්බන්ධය සොයා බලන ලද මෙම සම්මන්ත්‍රණයේ දි ඉදිරිපත් වු කරුණු**

- WCC තම යුක්තිය හා සාමය වෙනුවෙන් යන ගමනේ දී, ක්‍රිස්තියානි සහා එක් වි නිවැරදි සැලැස්මක් ඇතිව ක්‍රියා කළ යුතු ය.
- ඉතිහාසයමය ගවේෂණය මඟින් ආගම හා ප්‍රචණ්ඩත්වය අතර පවතින සම්බන්ධතාවය නව සබඳතාවයක් නොවන බවත් පැහැදිලි වේ. නමුත් ප්‍රචණ්ඩත්වය වර්තමානයේ ඉතා උග්‍රව පවතී ආගමික මූලධර්මවාදය ලෝකය විවිධ ප්‍රධාන ස්ථාන වල ඉතා බරපතල බලපෑම් ඇති කරන ආකාරයට වෙනස් වී ඇති බව දැනගත හැකි විය.
- දෙවියන් වහන්සේගේ නාමයෙන් කෙරෙන මෙම ප්‍රචණ්ඩ ක්‍රියා දෙවියන් වහන්සේගේ කැමැත්ත හෝ ඔවුන්වහන්සේගේ ක්‍රියාවක් හෝ නොවේ. නමුත් එම සාපය අපට හිමි වී තිබේ. එබැවින් දෙවියන් වහන්සේ හැඳින ඔවුන් වහන්සේ වෙනුවෙන් සේවය කරන අප මෙම මාර්ගය වලක්වාලීමට ක්‍රියාකළ යුතුය.
- ක්‍රිස්තියානීය ප්‍රචණ්ඩත්ව පරිසරය හා බිහි වී දියුණු වු බව අප මතක තබා ගත යුතු අතර වර්තමානයේ බොහෝ ජත්‍යාන්තර සංවිධාන හා එක්සත් ජාතීන්ගේ සංගමයත් ප්‍රචණ්ඩත්වය සඳහා පිළිතුරක් සෙවීමට ආගමික නායකයන් අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා වු ප්‍රධාන අරමුණ පිළිබඳ ගැටුමේ අවසානයේ ඔවුන්ගේ අත්දැකිම් හා දියුණුව නොව, ඒ වෙනුවට බොහෝ අවස්ථාවල ලෝකය විනාශය කරා රැගෙන යන ප්‍රචණ්ඩත්වය ආගම තම ආවරණය ලෙස යොදා ගැනීම වේ.
- මධ්‍යම අප්‍රිකාවේ රුවන්ඩා නැමැති නගරයේ ක්‍රිස්තියානීන්ගේ අධික ලෙස ප්‍රචණ්ඩත්වයේ නියැලුණු අවස්ථා ඉතිහාසයෙන් හැඳින, ශු. සභාවත් ඒවා අනුගමනය නොකර, ගැටුම් අත හැරීමටත්, සබඳතාවේ බැමි ගොඩනැගිමටත් තම හැකියාව හා බලය යොදාගත යුතුය.

- සුළු ජාතින් කොන් කිරිම, පීඩා කිරිම ආදියට විරුද්ධවී ආගමික නිදහසට සහය දැක්විය යුතුය. ආගමේ නාමයෙන් ජනතාව කොන්කර තැබීම, පීඩා කිරිම, ප්‍රචණ්ඩත්වය ඇති කිරිම වැන්න කිසිම විටෙක දේව අභිමතය නොවේ.

## 10.2.1 (ආ) 2 අප්‍රිකාවේ ඒඩ්ස් රෝගය වලක්වාලීමේ ජත්‍යාන්තර ප්‍රචාරය

- WCC දැනට ඉදිරියට ගෙනයන සමාජ සේවාවන් අතුරින් අප්‍රිකාවේ ඒඩ්ස් රෝගය වලක්වාලීම සඳහාත් ඒඩ්ස් රෝගීන්ට සහය දැක්වීමටත් ජත්‍යාන්තර වශයෙන් ඉදිරියට ගෙන යන ප්‍රචාරන සේවාවන් ඉතා වැදගත්වේ.

## 10.2.1 (ආ) 3 පවුල, සමාජ ආදියෙන් ප්‍රචණ්ඩත්වයට විරුද්ධව පිබිදවීම

- ප්‍රචණ්ඩත්වයට එරෙහි දස අවුරුද්ද

- පවුලත් සමාජයත් දිනෙන් දින වර්ධනය වෙමින් පවතින ප්‍රචණ්ඩත්වය සීමා කිරිම සඳහා පිබිදීමක් ඇති කිරිම සඳහා වසර 10ක් තුළ ප්‍රකාශ කළ විවිධ සේවාවන් පවති.

### 10.2.1. (ආ)4 පරිසරය සම්බන්ධ උනන්දුව

- යුක්තිය, සාමය, මැවීම සඳහා වු කොමිසම මඟින් WCC විනාශය◻ දූෂණය වැනි පරිසරයට ඇතිවන බලපෑම් පිළිබඳ ජනතාව දැනුවත් කිරිම, පරිසරය සුරැකීමට ජනතාවට මඟ පෙන්වීමටත් ලෝකයේ විවිධ රටවල් උනන්දු වෙමින් පවති.

- යුක්තිය, සාමය, මැවීම වැනි මෙම කරුණු අතර දැකිය හැකි සම්බන්ධතාවය විමර්ශනය කිරිම, සාමයේ සංස්කෘතියක් ඇති කිරිම, තරුණයින්, කාන්තාවන්, රටේ ආදී වාසීන්, ජාති, භාෂා අනුව කොන්කරනු ලබන ජනතාව හඳුනා ගෙන ඔවුන්ගේ දියුණුව සඳහා ක්‍රියාත්මත වීම යන ප්‍රතිපත්තිය සමඟ මෙම කොමිසම ක්‍රියාත්මක වේ.

- ගෝලීයකරණය, ආර්ථිකය, පරිසරය, ආදිවාසීන්, සාමය, අංගවිකලයින්, ජාතිවාදය, කාන්තාවන්, තරුණයින් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරයි.

- මාධ්‍යයන් සඳහා වන ලිඛිත නිර්මාණ ප්‍රචණ්ඩත්වය හා විරෝධය ඇති නොකරන සාමය ඇති කරන ආකාරයට ලියවිය යුතුය යන සිතුවිල්ල ඇති කරන "සාම මාධ්‍ය ලේඛන" (Peace Journalism) හ. WCC සහභාගිවන අතර ඒ සඳහා මහත් දායකත්වයක් දක්වයි.

## 10.2.1 (ආ)5 සංක්‍රමණය හා සමාජ නීතිය

- ජනතා සංක්‍රමණය යන්න මිනිස් ඉතිහාසයේ නිතර සිදුවන කටයුත්තකි. නමුත් වර්තමාන ජාත්‍යන්තර ලෝකයේ එන නව ආර්ථික, දේශපාලන, සංස්කෘතික ගැටලු ඇති කරයි.

- ව්‍යාපාරයක් ලෙස අයුක්ති සහගත ආකාරයට ජනතාව සංක්‍රමණය ඇති වීම වැනි නව ක්‍රම අනුගමනය කිරිමට ආරම්භ කර ඇත.

- සරණාගතයින් ලෙස ජනතාව සංක්‍රමණය වීමේ තත්ත්වයක් වර්තමාන ලෝකයේ වැඩිවෙමින් පවතී මෙම තත්ත්වය යටතේ සංක්‍රමණය යන්න කෙරෙහි ශු. සභාවේ අවධානය යොමු වී ඇත.

- එක්සත් රාජ්‍යය තුළට මෙවන් වැරදි ක්‍රමවලට සිදුවන සංක්‍රමණයන් එම රටේ 52% ක ප්‍රතිශතයක් විරුද්ධ වන බව එක්සත් රාජ්‍යය තවදුරටත් යුරෝපා හවුලේ සිටිය යුතු ද/ නැද්ද යන්න දැනගැනීමට පවත්වනු ලැබූ ඡන්දය තුළින් දැනගත හැකි විය.

- මෙවන් සංක්‍රමණයන් තුළින් දේශයට ජාතියට හා සංස්කෘතියට බලපෑම් ඇතිවන අතර, ක්‍රමානුකූල නොවන ආකාරයට සංක්‍රමණය වන ජන ජීවිත වලට ද මේ මගින් හානි සිදුවේ.

- ඉහත සඳහන් තත්ත්වය නිසා සරණාගතයින්ගේ සංක්‍රමණය ආනිවාර්යය සංක්‍රමණය ආදිය WCC යෙහි අවධානයට යොමු වී ඇත. අනිවාර්ය සංක්‍රමණය සම්බන්ධ WCC ය ලෝකයේ රටවලට ලිපි මඟින් නව අදහස් දක්වා ඇත.

- 2016 වසරේ ජුනි මස දිනැති ලිපියකින් එවන් සංක්‍රමණ හා සම්බන්ධ ජාත්‍යන්තර නීතිය, සරණාගතයින්ගේ නීතිය, මානව හිමිකම්, වෙනත් රටක පදිංචිය පාන්නන් ගේ හිමිකම් ආදියට ගරුකර ලෝකයේ රටවල් ක්‍රියාත්මක විය යුතුයැයි ඉල්ලීමක් කර ඇත. එලෙස සංක්‍රමණය වන්නට කිතුනු සභාවන් තම සේවය ලබා දිය යුතු යැයි ද WCC යෙහි පවසා ඇත.

- WCC මෙහි වාර්තාවේ මෙලෙස විශාල ජනකායක් බාරගන්නා රටවල සමාජ වල, සභාවන් වල, ඇතිවන බිය, අස්ථාවර ස්වභාවය ආදිය පිළිබඳ WCC ය වටහාගෙන ඇති බවද සඳහන් කර ඇත.

- තවද එම බිය, සැකය යනාදිය මාධ්‍යයෙහි සියලුදෙනා තුළ දැකිය හැකි දෙවියන් වහන්සේ විසින් දෙන ලද මිනිස් ගුණාංග වලට ගරුකළ යුතු බවත් යන එන මං නැති අය, අනාථයින් සුරැකීමේ සභාවේ වගකීමත්, අන්‍යයන්ට සැලකීම පිළිබඳව ජේසුස් වහන්සේගේ දේශනා මතක් කරවමින් සභාවෙන් මෙම ඉල්ලීම කර ඇත.

## 10.2.1 (ආ) 6. රටක් නැති අය (පුරවැසිභාවය අහිමිවුවන්)

- කිසිම රටක නීතියෙන් තම පුරවැසියන් ලෙස පිළිනොගන්නා අය පුරවැසියන් නොවන බව පිළිගැනීමයි. ලෝක මෙවන් පුරවැසිභාවයක් නොමැති පුද්ගලයින් මිලියන 10 ක් පමණ සිටින බව 2016 වසරේ සංගණන වාර්තා අනුව පැහැදිලි වේ. ලෝකයේ මෙලෙස රටක් නොමැති සරණාගතයින්ගේ ප්‍රමාණය වැඩිවෙමින් පවතී

- පුරවැසිභාවය නොමැත යන්න ජාත්‍යන්තර නීතියට පටහැනිය. 1954,1961 වැනි වර්ෂවල අත්සන් තබන ලද ජාත්‍යන්තර ගිවිසුමට අනුව ලොව බිහිවූ සැමට රටක පුරවැසිභාවය ආනිවාර්යයෙන් තිබිය යුතු ය.

- පුරවැසිභාවය නොමැති අය ජාත්‍යන්තර මානව හිමිකම උල්ලංඝණය වුවන් වෙති. එවන් ජනතාවක් බිහිවීමට ප්‍රධාන හේතුව ජනතාව සරණාගතයින් ලෙස විවිධ රටවලට යාම වේ.

- අයුක්ති සහගත ජාතික නීති බොහෝ රටවල තම මවගේ පුරවැසිභාවය දරුවන්ට ලැබීම වලක්වාලයි. පියාගේ පුරවැසිභාවය දරුවාට තහවුරු කරදීමට නොහැකි වූ විට නැතහොත් ඉදිරිපත් නොවූ විට ඉපදුණු දරුවා පුරවැසිභාවය නොමැති තත්ත්වයට පත් වේ.

- ජාතියක් වශයෙන් ද ජනතාව පුරවැසිභාවයින් තොර කිරිමේ තත්ත්වයක් සමහර රටවල දැක්විය හැකි ය.

- දේශ සීමා ගැටුම් හේතුවෙන් නැවත බෙදීමේ දී එක් රාත්‍රියක දී ජනතාව රටක් නොමැති අය වූහ. මෙවැනි තත්ත්වයක 1991 දී සෝවියට් රටවල බෙදීම නිසා තනි තනි රටවල් විය. රටක් නොමැති තත්ත්වය යනු ලිපි ලේඛන වල කෙනෙකුගේ පදිංචිය පිළිබඳ ලියාපදිංචියක් නැති බවට වඩා රටක අන් අය භුක්ති විඳින විවිධ අයිතාවාසිකම් හා ප්‍රතිලාභ නොලැබෙන තත්වයකින් වීසිම වේ. එබැවින් WCC මානව අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා රටක් නොමැති අය පිළිබඳව ක්‍රියාත්මක වේ.

- පුරවැසිභාවය නොමැති තත්ත්වය 2024 දී නැති කළ යුතුයි යන බලාපොරොත්තුවෙන් එක්සත් ජාතීන්ගේ සංගමය (UNCHR) සමඟ සම්බන්ධ වී WCC ක්‍රියා කරයි. ඒ වෙනුවෙන් සියලුම උපත් නිසි පරිදි ලියාපදිචි කළ යුතුය. අයුක්ති සහගත පුරවැසිභාවය හා සම්බන්ධ නීතී වෙනස් විය යුතුය. පුරවැසිභාවය සම්බන්ධ ජාත්‍යන්තර නීති සැම රටකම අනුගමනය කළ යුතුය යන්න WCC පවසයි ඒ සමඟ ශු. සභාවේ නායකයන්, සමාජ නායකයින්ගේ නියෝජිතයින් පුරවැසිභාවය නොමැති අය සම්බන්ධව ක්‍රියා කිරිමට ප්‍රාදේශිය පුහුණු කඳවුරු පවත්වයි.

- 2015 වසරේ බේරූට් හි මෙවන් කඳවුරක් පවත්වන ලදී. රටේ හිමිකම පිළිබඳ ජනතාවට අධ්‍යාපනය ලබාදීමෙහිලා WCC ය සහභාගි වී ඇත.

- මවගේ පුරවැසිභාවය දරුවනට මාරු කිරිම වලක්වන රටවල් 27 සම්බන්ධව WCC ය ක්‍රියා කරයි. ක්‍රිස්තියානී දැක්මට අනුව, මිනිසාගේ උතුම්කම වෙනුවෙන් ද දේව කැමැත්ත ඉටුකිරිමේ අරමුණින් ද පුරවැසිභාවය නොමැති අය සම්බන්ධව WCC 2010 වර්ෂයේ ක්‍රියාත්මක වීමට ඇරඹි, 2012 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ සංගමය(UNCHR) සමඟ එක් වී සේවය කරන බවයි.

### 10.2.1 (අ) 7 ජාතිවාදය තුරන් කිරීම.

- WCC දසවර්ෂ ගණනාවක් පුරා ජාතිවාදය තුරන් කිරීමට අවශ්‍ය පියවර ගත් නමුදු තවදුරටත් නව ආකාරවලින් ජාතිවාදය හිස ඔසවන බැවින් ජාතිවාදී ප්‍රචණ්ඩත්වය ලොව පුරා හිස ඔසවමින් ඇත.
- නූතනයේ එක්සත් ඇමරිකාවේ වර්ධනය වී ඇති ජාතීවාදී මිනීමැරුම් වලට විරුද්ධව WCC වාර්තා එළි දක්වා එය වලක්වාලීමට ශු. සභාවටත්, සමාජයටත් පසුගිය වසර කිහිපයක් මුළුල්ලේ පීඩනයක් දෙමින් සිටියි.

### 10.2.2 (අ) ආසියානු ක්‍රිස්තියානී සම්මේලනයේ බිහිවීම.

- ආසියානු ක්‍රිස්තියානි සම්මේලනය යනු ආසියාවේ පවතින දේශිය කිතුනු සභා සම්මේලන 115 හා ශු. සභාවේ බෙදුනු සභා 100 කට අධික සභාවන් හා එක් වූ එකාබද්ධ ආයතනයකි.
- මෙම සභා සම්මේලනයන් හි ශු. සභාවන්ද දයාවේ සේවා නායකත්වය, සංවර්ධනය, සභා සහජීවනය, සමාජ යුක්තිය සම්බන්ධ විෂයන් හි එක් වී ක්‍රියාකරයි.
- සභාවත්, ජාතික කිතුනු සභා සම්මේලනයේ ආදියේ නියෝජිතයින් එක් වී 1957 වර්ෂයේ ඉන්දුනිසියාවේ ප්‍රාබට් නැමැති ස්ථානයේ රැස් වූ රැස්වීමක දී "නැගෙනහිර ආසියානු ක්‍රිස්තියානි සම්මේලනය" ස්ථාපනය කිරිමට තීරණය කළහ.
- එම තීරණයට අනුව එම වර්ෂයේ ම මැලේසියාවේ ක්වාලාලාම්පූර් නැමැති ස්ථානයේ නැගෙනහිර ආසියානු ක්‍රිස්තියානි සම්මේලනයේ පළමු සම්මේලනය රැස් කරන ලදී. "එකට එක්ව සාක්ෂි දැරීම" යන්න එම පළමු රැස්වීමේ තේමාව විය.1973 දී සිංගප්පූරුවේ රැස්වූ 5 වන සමුළුවේදී එය ආසියානු කිතුණු සභා සම්මේලනය යැයි නම වෙනස් කර තවදුරටත් විශාල කළහ.
- 1957 දී ආරම්භ කල මෙම සංවිධානය ලෝකයේ පළමු ක්‍රිස්තියානි සභාවන් හි ඒකත්වය සඳහා වන ප්‍රාදේශිය සංවිධානය යයි ද ප්‍රසංශාව ලබා ඇත.
- නවසීලන්තය, ඕස්ට්‍රේලියාව, බංගලාදේශය, හොංකොං, චීනය, ඉන්දියාව, ඉන්දුනීසියාව, ඉරානය, ජපානය, කොරියාව, ලාඕසය, මැලේසියාව, මියන්මාරය, පාකිස්ථානය, පිලිපීන දූපත්, ශ්‍රී ලංකාව, තායිවානය, තායිලන්තය, නැගෙනහිර ටිමෝරය, වැනි රටවල සභාවනුත්, ජාතික ක්‍රීස්තියානි සභා සම්මේලනයත් ආසියානු ක්‍රිස්තියානු සභාවේ සාමාජිකත්වය දරයි.
- ආසියානු සභා, සභාවන්හි ජාතික සංගම් ආදිය සමග එක් වී ලෝක කිතුනු සභා සම්මේලනය ප්‍රතිපත්ති වලට අනුව ක්‍රියා කිරීමේ අරමුණ ගෙන ඇත.
- ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනය සඳහා වූ මෙම සේවය ආසියානු සභාවේ දේව සැලැස්ම වේ සභාවන් එක්වී ආසියාවේ දේව සේවයේ යෙදිය යුතුය යන විශ්වාසය ඇතිව ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනය ක්‍රියාත්මක වෙයි.
- ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනයේ සමාජිකත්වය ලබන සභාවන් හා සංවිධාන දෙවි දහම මූලීක කර ගනිමින් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේට දෙවි මහෝත්මයාණන් ලෙස ප්‍රකාශ කර, ඒ සමඟ පිතා පුත්‍රයා ශුද්ධාත්මයාණන් යන ත්‍රිත්වක දේවෝත්මයාණන්ගේ කැමැත්ත ඉටු කරන්නන් විය යුතුය.
- ආසියානු ක්‍රිස්තියානි සම්මේලනයේ ආරම්භයේ සිට මේ දක්වා සම්මේලන 10 කට වඩා ප්‍රමාණයක් නොයකුත් සේවා යටතේ පවත්වන ලදි.

- ආසියානු රට වල කිතුනුවන් සුළු ජාතියක් ලෙස දැකිය හැකි වුවත් සෑම රැස්වීම් මාලාවකම විමර්ශණය කරන ලද විෂයයන් ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනයේ ආසියානු මහද්වීපය පිළිබඳ පොදු අරමුණ, ජනතාවගේ සමාජ තත්ත්වය පිළිබඳ උනන්දුව, ආසියානු අන්තර් ආගමික පරිසරය පිළිබඳ වැදගත්කම් ප්‍රකාශ කෙරේ.

- සුවිශේෂය තුළ දෙනු ලබන 'පරිපූර්ණ ජීවිතය' යන පොරොන්දු ක්‍රිස්තියානීන්ට පමණක් නොව, ආසියාවේ සියළු ජනතාවටත් විශේෂයෙන් ආසියාවේ කොන්කරනු ලැබූවන්, ප්‍රතික්ෂේප කරනු ලැබූවන් ආදීනට අයත් බව ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනයේ චින්තනයන් මෑත වසර වල මඟ පෙන්වා දී ඇත. මෙය අරමුණු කර ගනිමින් ගෝලීයකරණය වීම මධ්‍යයේ කඩිනමින් කාර්මිකකරණය වෙමින් පවතින ආසියාව එහි ප්‍රතිඵලයක් ලෙස පැමිණෙන සමාජ ආර්ථික අයුක්තිය පිළිබඳ ව ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනයේ සාකච්ඡා කෙරිණි.

ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනයේ මෑත සේවාවන් කිහිපයක්

- ආසියානු සභා, ක්‍රිසතියානි සමාජ අතර සබඳතාව ශක්තිමත් කර දීම
- සභාවෙත් සමාජයේත් ඇති වී ඇති බෙදීම් නැමති තුවාල (පැල්ලම්) සුව කිරීම
- ශු. සභාවේ ඒකත්වය සඳහා වන ක්‍රියාකාරකම් උනන්දු කරවීම
- ශු. සභාවේ ඒකත්ව ක්‍රීයාකාරකම් වල රෝමාණු කතෝලික සභාව සහ එවන්ජලිස්ත සභාවත් ඇතුලත් කර ආසියානු සභාවේ සහජීවන ක්‍රියාකාරකම් සැලසුම් කර ආසියාවේ අභියෝග වලට මුහුණ දීමට ලෝකය තුල ආසියාවේ ස්ථානය ස්ථිර කිරීම.

ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනයේ සේවාවන් පහත සඳහන් ප්‍රධාන අංශ වලට අයත් වේ

- විශ්වාසය (Faith)
- ධර්මදූත සේවය හා ඒකත්වය (Mission & Unity)
- ශු. සභාවේ සාමජිකත්වය (Ecumenical Formation)
- ලිංගික යුක්තිය හා තරුණ ප්‍රවර්ධනය (Gender Justice& Youth Empowerment)
- යුක්තිය (Justice)
- ජාත්‍යන්තර සබඳතා(International Affairs)
- සංවර්ධනය හා සේවාව( Development & Service)

ආසියාවේ වෙසෙන මිලියන 55ක කිතුනුවන් නියෝජනය කරන රටවල් 17 ක් දැකිය හැකි සභාවන් 95 ක් ද ජාතික ක්‍රිස්තියානි සංගම් 16 ක් ද ආසියානු ක්‍රිස්තියානි සංගමයේ සමාජිකත්වය ලබා ඇත.

## 10.2.2 (ආ) ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනයේ සමාජ අරමුණු

- ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනයේ වැඩ සටහන් පරිපාලනයේ පහසුව තකා ප්‍රධාන කොටස් තුනකට බෙදා ඇත.
  1. සභාවේ ඒකත්වය, ලිංගික යුක්තිය, තරුණ ප්‍රවර්ධනය
  2. විශ්වාසය, ධර්මදූත සේවය, ඒකත්වය
  3. යුක්තිය, ජාත්‍යන්තර ක්‍රියාකාරකම්, සේවාව

- මෙම අංශ වලට ඇතුලත් නොවූ, විශිෂ්ට වැඩසටහනක් ලෙස (HIV/AIDS) එඩ්ස් රෝගය පිළිබඳව අවධානය යොමු කෙරිණි.

- ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනය තුළින්, වැඩසටහන් අංශ ද විශිෂ්ට වැඩසටහන් අංශ ද, එහි සමාජය පිළිබඳ උනන්දුව ප්‍රකාශ වේ.

- මෑත කාලයේ ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනයෙහි අරමුණු පදනම් කර ගනිමින් පැවැත් වූ ගවේෂණ, සම්මන්ත්‍රණ, පුබුදුවීමේ රැස්වීම්, ප්‍රකාශ කරන ලද ග්‍රන්ථ රාශියකි.

**පරිසර නීතිය**

- ආසියානු සභාවල වගකීම යන මාතෘකාව යටතේ සාකච්ඡාවක් 2012 වසරේදී ඉන්දුනිසියාවේ පැවැත්වූහ. මෙම විමර්ශන සාකච්ඡාවේදී පරිසරය, අර්ථිකය යන වගකීම් පිළිබඳව සොයා බලන ලදී.

- ලෝකයේ වැඩි වශයෙන් පාරසරික බියවැද්දීම්, බලපෑම් වැඩිපුර මුහුණදෙන රටවල් ආසියාවේ වැඩි වශයෙන් දැකිය හැකි හෙයින් මෙම ගවේෂණ සාකච්ඡාව ආසියාවට ඉතා ප්‍රයෝජනවත් විය.

- සුනාමි, ගංවතුර, සුළි සුලං, දීර්ඝ කාලීන නියගය වැනි විශාල ස්භාවික ආපදා වැඩි වශයෙන් මෙම ප්‍රදේශ වල සිදුවන ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනය පරිසරය පිළිබඳ අවධානය යොමු කිරිමට පටන් ගැනිණි.

- හරිත නිවාස(Green House) බළපෑම නිසා වියළි කළාප වල උෂ්ණත්වය වැඩිවීම, වැඩි වර්ෂාපතනය, පිළිවලක් නොමැතිව වැසි වැසීම, ලෝක මුහුදු මට්ටම වඩිවීම වැනි කරුණු නිසා ආසියානු මහද්වීපයේ දිළිඳුන් ප්‍රතික්ෂේප කරනු ලැබුවත්, අඩු පහසුකම් සහිත වුවත් වැඩි වශයෙන් බලපෑමට ලක්ව සිටිති.

- මෙලෙස ස්වභාවික විපතට පත්වී සිටින මෙම ජනතාවගේ ශ්‍රමය සංවර්ධිත රටවල් විසින් සූරාකනු ලැබේ.

- ප්‍රමාණවත් ආකාරයට පරිසර නීතිය නොමැතිකමින් ආසියානු ජනතාව ශ්‍රමය සූරාගැනීමට ලක්වීම තවත් හේතුවකී.

- එබැවින් ලෝක ජනතාව සැවෝම එක් වී, ස්වභාවිකත්වය හා පරිසරයත් ආරක්ෂා කිරීමට ඉදිරිපත් විය යුතු බව ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනය බල කරයි.

ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනයේ පාරිසරික ප්‍රතිපත්ති අනුගමනය කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් ඉදිරිපත් කර ඇත.

1. පරිසරය සම්බන්ධ ප්‍රශ්ණ වලට ප්‍රතිඵල පිළිබඳ දැනුම ශු. සභාව තම ජනතාවට ලබාදීම.
2. පරිසරය පිළිබඳ සැළකිල්ල සමඟ ක්‍රියාකාරකම් සඳහා පළමු පියවර ශු.සභාවේ ජීවිතය තුළින්, ධර්මදූත සේවා තුළින් ක්‍රියාත්මක කිරීම.
3. පරිසර විනාශය වැඩිවන නිසා හරිත සභාව නමැති ප්‍රතිපත්තිය දියුණු කිරීම.
4. 'පරිසර ප්‍රතිසංස්කරණය සභාව', සමාජ ජීවිතය ආරම්භ කිරීම.
5. කැළෑ එළිකිරීම, විශාල ජලාශ ගොඩනැගීම, විදුලි බලාගාර තැනීම, පොළව පතුලේ ඇති සම්පත් ගොඩගැනීම වැනි මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදුවන පරිසර විනාශය නවතාලීම.
6. ආසියාවේ ආර්ථිකය සීමා කිරිම සඳහා ක්‍රියාත්මක වන බහු ජාතික සමාගම් හි මූලධනය යෙදවීමට එරෙහි වීම.
7. දේශිය සම්පත් උචිතාකාරව ප්‍රයෝජනයට ගැනීමට උනන්දු කරවීම.
8. 'පරිසර නීතිය' ස්ථාවර කිරීම මගින් පූර්ණ මැවීම සුරැකීම ට කිතුනු සහභාගිත්වය අනිවාර්යය කිරීම.

**මානව අයිතිවාසිකම්:**

- ආසියාවේ රටවල විවිධාකාරයෙන් උල්ලංඝණය වන මානව අයිතිවාසිකම් පිළිබඳ ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනයේ අවධානය යොමුවිය.

- විදේශීය රැකියා අවස්ථා ලබා ගත් අයගේ අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම පිළිබඳව ක්‍රියාත්මක වන ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනය 2012 දී අරාබි රටවල සේවය කරන විදේශිකයන්ගේ හිමිකම් පිළිබඳ සාකාච්ඡා කිරීම සඳහා ඉන්දියාවේ සම්මන්ත්‍රණය සූදානම් කෙරෙණි. ඒ සඳහා රැකියා අවස්ථා ලබා දෙන රටවල නියෝජිතයන් ,මානව අයිතිවාසිකම් පිළිබඳ කටයුතු කරන ධර්මදූතිකයින්, යුරෝපා රටවල නියෝජිතයින්, විදේශ සේවකයින්ගේ නියෝජිතයින් ඇතුළු 30 සහභාගි වූහ.

- ලෝකයේ මිලියන 80 ක් පමණ වූ විදේශ සේවකයින් සිටින බව වර්තමාන සංගණන වලින් දැනගත හැකිවිය.

- 2010 වර්ෂයේ දී තම රටවල් අත්හැර වීදේශිය රටවල පදිංචි වී සේවය කරන සරණාගතයින් ඇතුළත්ව මිලියන 105.4 දෙනෙකු යැයි සංගණනය මගින් හඳුනාගත ඇත.

- වර්තමාන ලෝකයේ මෙලෙස සංක්‍රමණය වීම වැලැක්විය නොහැක්කක් වී ඇත.

- විදේශ රැකියා සඳහා සේවකයන්ව යවන රටවල් හා ඔවුන්ව භාර ගන්නා රටවල් එම සේවකයින් මගින් ලාභ ලබයි.

- වර්තමානයේ මෙය වැලැක්විය නොහැක.

- මෙම තත්ත්වය යටතේ එම සේවකයින් මුහුණදෙන මානව අයිතිවාසිකම් උල්ලංඝණය පිළිබඳව අප ගණන් නොගෙන සිටිය නොහැක. එබැවින් ආසියානු ක්‍රිස්තියානි සභා සම්මේලනය මෙම සේවකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ කතිකා කරමින් ක්‍රියා කරයි.

**එම සම්මන්ත්‍රණයේදී ඉදිරිපත් කළ යෝජනා:**

1. 1990 වසරේදී සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම් සුරැකීම සඳහා ජාත්‍යන්තර සංවිධානයේ යෝජනා රටවල් පිළිගෙන අත්සන් තැබීමට පෙළඹවීම.
2. ජාතික මානව හිමිකම් පිළිබඳ සංවිධානය මගින් යෝජනා ඉදිරිපත් කිරීම.
3. මානව අයිතිවාසිකම් සම්බන්ධව අවශ්‍ය ප්‍රචාරණ කටයුතු කිරීමට ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන, නීතිමය සහය ක්‍රමවේද, රාජ්‍ය නොවන සංවිධාන, ආගමික ආයතන, වෘත්තිය සමිති සහ සිවිල් සංවිධාන අදිය සමග ආසියානු ක්‍රිස්තියානි සංගමය එක්වී ක්‍රියා කිරීම.
4. විදේශි රැකියා සඳහා වෘත්තිකයන් පිටත් විමේදී දැනුවත් කිරීම හා පුහුණුව ලබා දීම, භාෂා, නීති සංවිධාන, රීති, වෘත්තිය පුහුණුව
5. සේවකයින් රටින් පිටවීමට පෙර ඔවුන්ට අවශ්‍ය නීතිමය උපදෙස් ලබාදීම, ඔවුන්ට හිමිකම් පිළිබඳ පැහැදිලි කිරීම.
6. විදේශ රැකියා සඳහා පිටත්ව යන සේවකයින් සිටින සභා නායකයින්ට අවශ්‍ය පුහුණුව ලබාදීම. විදේශ රැකියා සඳහා පිටත්ව යන සේවකයින්ගේ අවශ්‍යතා පිළිබඳ අරාබි රටවල සභාවේ ජනතාව ද පැහැදිලි කිරීම.

**ආර්ථිකය**

- ලෝක ආර්ථික සැකැස්මේ ඇතිවන අයුක්තිය පිළිබඳ සොයා බලා එය ප්‍රකාශ කර, ජනතාව හට අවබෝධයක් ආසියාව තුළ ඇත් කිරීමට ආසියානු ක්‍රිස්තියානි සංගමය දායකත්වය ලබා දෙයි.

- කෙනෙකුට යුක්ති සහගත ලෙස අයත් වන වස්තුව නැතහොත් අධිකාරි බලයට වඩා බලයක් හෝ වස්තුවක් ලබා ගැනීමට තැත් කිරීම කැදිරකමක් වන බව ආසියානු ක්‍රිස්තියානි සංගමය පැහැදිලි කරයි.

- ධනවාදී කෑදරකම තුළ පවතින රටවල්, බහු ජාතික සමාගම් ආදියේ බැම්මෙන් දිළිඳු රටවල ජනතාව මුදා ගැනීම සඳහා වන දැනුම හා උපදෙස් ඉදිරිපත් කරයි.

නිපුණතාව 10.0 : **නව ශිෂ්ටාචාරයක් බිහි කිරීමේ කිතුනු සේවාවට සහභාගි වෙයි.**

**නිපුණතා මට්ටම** 10.3 : විවිධ කිතුනු සභා අතර (Ecumenism) සාමාජිකත්වය මෙන් ම විවිධ ආගම් අතර සංවාදය ප්‍රගුණ කරයි. (Inter – Religious Dialogue)

**කාලච්ඡේද සංඛ්‍යාව** : 16

**ඉගෙනුම් පල**

- කිතුනු සභාවන්, මෙන් ම විවිධ ආගමික බැතිමතුන් අතර සුහදතාව ඇති කිරීමේ මාර්ගය පිළිබඳ කරුණු ගොනු කරයි.
- කිතුනු සභා සහ වෙනත් ආගමික බැතිමතුන් අතර සුහදතාවෙන් ජීවත් විය යුතු බව පිළිගනියි.
- කිතුනු එකමුතුව ඇති කළ හැකි ආකාරය නිර්මාණයකින් ඉදිරිපත් කරයි.
- කිතුනු සභා හා වෙනත් ආගමික බැතිමතුන් අතර සමගිය නැංවීමට කටයුතු කරයි.
- අන්‍යාගමිකයන්ගේ යහපත් ක්‍රියාවලට සහයෝගය දක්වයි.

**විෂය අන්තර්ගතය**

## 10.3.1. කිතුනු සභා අතර සාමාජිකත්වය හා අන්තර් ආගමික සංවාදය (Ecumenicl and Interreligious Dialogue)

- නව සංස්කෘතියක් ගොඩනැගිමේ කාර්යයෙහි කිතු දහම යෙදී ඇත. විවිධ මාර්ගවලින් වර්ධනය වෙමින් පැමිණෙන වර්තමාන මිනිස් ලෝකයේ විවිධ සංස්කෘතීන්, විවිධ ආගම් ආදිය ක්‍රිස්තුභක්තිකයා ගරු කරයි. ඒවායේ දැකිය හැකි යහපත් දේ සත්‍ය දේ අදිය කිතු දහම පිළි ගනියි. මේ මඟින් ඒවායේ දැකිය හැකි වෙනස්කම් මධ්‍යයෙහි ඒවා සමග සංහිඳියාවකින් යුතුව ජීවත් වීමට උත්සහ දරයි. එවන් සංහිඳියාවෙන් යුතු ජීවිතය මගින් නව ශිෂ්ටාචාරයක් බිහි කිරිමට උත්සහ දරයි.

- මෙම උත්සාහයේදී ප්‍රථමයෙන් සියලු ක්‍රිස්තියානී සභා සමග සමගිය වර්ධනය කර, නිරන්තර ක්‍රියාකාරකම් වල යෙදෙයි. ඒ සමග විවිධ ආගම් සියල්ලන්ගේම පොදු කේන්ද්‍රය වන දෙවියන් වහන්සේ වෙත යාමේ මාර්ගය ආදිය පිළිගෙන එම සභා හා සංවාදයේ යෙදී සහයෝගයෙන් කටයුතු කිරීමට උත්සහ දරයි.

- මෙම කටයුත්තේ යෙදෙන ලෝක කිතුනු සභා සම්මේලනයේ (WCC) හා දෙවන ජගත් වතිකාන මන්ත්‍රණ සභාවේ කිතුනු ඒකත්වය සඳහා වන ඉගැන්වීම හා උත්සාහයන් මෙම නිපුනතා මට්ටමේ විෂය අන්තර්ගත වේ. ඒ සමග බහු ආගමික සංවාදය පිළිබඳ දෙවන ජගත් වතිකාන මන්ත්‍රණ සභා ඉගැන්වීම් ද ආසියානු රදගුරු සම්මේලනයේ ඉගැන්වී ද ඇතුළත් වේ.

### 10.3.1.1 ලෝක කිතුනු සභා සම්මේලනයේ කිතුනු ඒකත්වය සඳහා වන ඉගැන්වීම් සහ වැයම

- කිතුනුවන් අතර බෙදීම් අතිවූ කාලයේ සිට ඒකත්වය සඳහා දරන ලද වැයම් බෝහෝයක් මෙම ඒකත්වය සඳහා වන වැයමට ලෝක කිතුනු සභා සම්මේලනයේ ද ක්‍රිස්තියානි ඒකත්ව වැයමට තම දායකත්වය දක්වයි.

- ක්‍රිස්තියානි ඒකත්වය පිළිබඳ උනන්දු කරවීමේ සේවයේ 1990 වසරේ දී "ලෝක කිතුනු සභා සම්මේලනයෙ හි පොදු අවබෝධය හා දැක්ම" යන තේමා යටතේ ලෝක කිතුනු සංගමය ගවේෂණයක් කළේය. ක්‍රිස්තියානි ඒකත්වය පිළිබඳ පහත සඳහන් අදහස් මෙම ගවේෂණය යටතේ ප්‍රකාශ කරන ලදි. ක්‍රිස්තියානි ඒකත්වය සඳහා වන වැයමට වඩා පුළුල් ව පැවති ලෝක කිතුනු සංගමය එම ඒකත්වය සංවිධානයේ ප්‍රධාන උපකරණයක් ලෙස ක්‍රියාත්මක වේ.

- ලෝක කිතුනු සංගමය හි පොදු අවබෝධය හා දැක්ම යන ගවේෂණ වාර්තාව ආධාර කර ගනිමින් ලෝක කිතුනු සංගමය සභාවේ ඒකත්වය උනන්දු කරවීමේ සේවයේ දිගටම ක්‍රියාකරයි. එවන් සේවයන් පිළිබඳ අපගේ අවධානය මෙහිදී යොමු කරමු.

- වෛදික සභාවන්(Orthodox Churches)ලෝක කිතුනු සංගමයට සම්බන්ධ වන්නේ කෙසේද යන්න සොයා බැලිමට විශිෂ්ට කණ්ඩායමක් නියමකර ක්‍රියාත්මක වීම තුළින් එම වෑයම සාර්ථක විය.

- 2002 වර්ෂයේ ලෝක කිතුනු සංගමයේ විවධ සභා අතර තිරණ ගැනිමේ දී ඡන්දය ලබා දෙන ආකාරය (Parliamentary Procedure) වෙනුවට ඒකමතික තීරණයට පැමිණිමේ ක්‍රමය (Consensus Decision Making Procedure)උනන්දු කළේය.

- සභාවන්හි ඒකත්වය උනන්දු කරවීම සඳහා 21 වන ශතවර්ෂය ආරම්භයේ දීම ජාත්‍යන්තර සම්මේලන දෙකක් පැවැත්වීය.

- 21 වන ශතවර්ෂයේ ශුද්ධ වූ සභාවේ ඒකත්වය යන තේමාව යටතේ රැස් වූ සමුළුව තුළ ශු. සභාවේ ඒකත්වය පිළිබඳ සංවිධානය නැවත සකස් කිරීම පිළිබඳ සොයා බැලීය.

- තවත් සමුළුවක් "21 වන සියවසේ ශු. සභා ඒකත්වය අඛණ්ඩව පවත්වාගෙන යන ක්‍රියාකාරින්" යන තේමාව යටතේ එක්වී ශු. සභාවේ ඒකත්වය සඳහා වන වර්තමාන අභියෝග පිළිබඳව සොයා බැලූ හ. මෙම සමුළුවේ ලෝක කිතුනු සංගමය ප්‍රාදේශිය සභා එක්ව සංවිධාන(Regional Ecumenical Organizations), ජාතික ක්‍රිස්තියානි සංගම්, ලෝක කිතුනු සංවිධාන සභාවන් (අතර තරුණ සංවිධානය (Ecumenical Youth Movements), ක්‍රිස්තියානි ඒකත්වය වර්ධනය කිරීම සඳහා වන රෝමානු කතෝලික සංවිධානය(The Pontifical Council for Promoting Christian Unity), ශු. සභාව වැනි සියලුම කිතුනු සංවිධාන වලට උපදෙස් ලබා දෙයි.)

- 2013 දී පැවැත්වූලෝක කිතුනු සංගමයේ පොදු මහ මණ්ඩල රැස්වීමේදී මෙම උපදෙස් පිළිබඳ සාකච්ඡා කරන ලදි.

### 10.3.1.2 දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ කිතුනු ඒකත්වය සඳහා වන ඉගැන්වීම් සහ වෑයම

- ක්‍රිස්තුන් වහන්සේ විසින් අරම්භ කරන ලද සභාවේ අති විශිෂ්ට ගුණාංගය ඒකත්වයයි. නමුත් සභාව පෙරදිග, අපරදිග සභාව ලෙසත් ඇංග්ලිකානු, මෙතෝදිස්ත, බැප්ටිස්ට්, ප්‍රස්බෙටේරියන් යැයි විවිධ කිතුනු සභා ලෙස බෙදී සිටිනු දැකිය හැක.

- ආගමික ඉගැන්වීම්, වන්දනා ක්‍රම, සක්‍රමේන්තු, පරිපාලන සැකැස්ම, ධර්මදූත සේවා ක්‍රියාකාරකම් ආදියේ එම සභා අතර එකිනෙක වෙනස් ව පවතින ආකාරය මෙම බෙදීමට හේතු වේ.

**ශු. සභාවේ බෙදීම් කාලයෙන් කාලයට ඇතිවූවකි.**

- අපෝස්තලික යුගයේ ඇතිවිය. (1 කොරි 1:10-11)

- ක්‍රි. ව. 3 වන ශතවර්ෂයේ බිහිවූ ඒරියන්, නෙස්ටෝරියානු වැනි භේදභේද නිසා සභාව තුළ බෙදීම් ඇතිවිය.

- ක්‍රි. ව. 11 වන සියවසේ ත්‍රිත්වික ඉගැන්වීම පිළිබඳ ඇති වූ අදහස් වල නොගැලපීම නිසා කතෝලික සභාව පෙරදිග-අපරදිග සභා ලෙස වෙන්විය. මෙම බෙදීම අද දක්වා දැකිය හැක.

- ක්‍රි. ව. 16 වන සියවසේ සිදුවූ ආගමික ප්‍රතිසංස්කරණයෙන් පසු මාටින් ලූතර්, කැල්වන්, ස්විංග්ලි ආදීන්ගේ නායකත්වය යටතේ සභාවන් බිහිවිය

- ක්‍රි. ව. 18 වන සියවසේ 8 වන හෙන්රි රජ තම සොහොයුරාගේ බිරිඳ නැවත විවාහ කරගැනීමේ ක්‍රියාවලියේ දී ශුද්ධෝත්තම පියතුමන් හා අදහස් නොගැළපුන හෙයින් එංගලන්ත( අංග්ලිකානු) සභාව බිහිවිය.

- ශු. සභාවේ මෙම බෙදුණු තත්ත්වයෙන් සියල්ලටම වඩා ශු. සභාව ස්ථාපනය කළ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අරමුණට එය පටහැනි විය. ( ජොහාන් 10:16,17:1.)

- මෙම බෙදුණු තත්ත්වය කිතුනු විශ්වාසකයින් අතර තරගකාරී මානසිකත්වයක් වර්ධනය කර ගැටලුකාරී තත්ත්වයක් ඇති කර ඇත. ශු. සභාවේ ධර්මදානීය සේවයට මෙය බාධාවක් වී ඇත. සුවිශේෂය ම උනන්දුවෙන් සවන් දී අනුගමනය කිරීමට බධාවක් පවතියි.

## කිතුනු ඒකත්වයට හේතු :

1. කිතුනු විශ්වාසයට පදනම වී ඇත්තේ දෙවියන් වහන්සේ, ක්‍රිස්තුන් වහන්සේ මඟින් කරන ලද හෙළිදරව්වයි. (එපීස 1 : 1)

2. ක්‍රිස්තුන් වහන්සේ මඟින් ලබාදෙනු ලබන ගැලවීමේ ජීවිතය සියලු දෙනා සොයන ජීවිතය වේ. (ගලාති 2:20 - 1 පේදුරු 2:21)

3. සියලු කිතුනුවන්ට ප්‍රථම වරප්‍රසාද හා නවතාවය ලබා දෙන්නේ ශුද්ධාත්තමයාණන් විසිනි. ශුද්ධාත්තමයාණන්ගේ වරප්‍රසාද තුළ අපි දෙවියන් වහන්සේ "දෙවි පියාණන්" ලෙස ආමන්ත්‍රණය කරමු. (රෝම 8 : 23)

4. සියලුම කිතුනුවන් ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරහසේ සහභාගී වී, දැක්ම අනුව ස්ථිර වී, නව ජීවිතයක් කරා ගමන් කරයි. (පිලිප්පි 3:10 - එපිස 11:2)

5. කොරින්ති සභාවේ ඇති වුන බෙදීම් වලදී, ශු. පාවුළු තුමා ක්‍රිස්තුන් වහන්සේගේ නාමයෙන් ලබාගත් බෞතිස්මය (1 කොරි 10: 11) ක්‍රිස්තුන් වහන්සේගේ භෝජන සංග්‍රහයත් (1 කොරි 16: 26) ඔවුන්ට සිහිකර ඒකත්වය තහවුරු කරයි. බෞතිස්මය හා දිව්‍ය සත්ප්‍රාසාදය සියලුම කිතුනු සභාවන් පිළිගන්නා සක්‍රමේන්තු වේ.

## ක්‍රිස්තියානි ඒකත්වය සඳහා වන වෑයම

- අපෝස්තලික යුගයේ සිට 18 වන සියවස දක්වා ඇති වූ බෙදීම් වලින් පසු ඒකත්වය සඳහා වෑයම් කරන ලදී. නමුත් ආගමික ඉගැන්වීම්, වන්දනා ක්‍රම, වරප්‍රසාද, පාලන සැකැස්ම, ධර්මදූත ක්‍රියාකාරකම් යනාදියේ සභාව එකිනෙකට වෙනස් වේ.

- අන්ගේලියානු සභාවට අයත් පාවුළු වොට්සන් 1908 'කිතුනු ඒකත්වය' සතියක් ඇරඹීය. 1914 දී 15 වන බෙන්ඩික්ට් ශුද්ධෝත්තම පියතුමා 'කිතුනු ඒකත්වය' සතිය ලොව පුරා පැතිරවිය.

- 1948 ලෝක ශු. සභා සම්මේලනය ආරම්භ කරන ලදී. විශ්වාසයේ ඒකත්වය, බෞතීස්ම, දිව්‍ය සත්ප්‍රාසාදය, කිතුනු ජීවිතය පිළිබඳ හා එහි ප්‍රකාශන මඟින් ක්‍රිස්තියානි ඒකත්වය සඳහා පොළඹවයි.

- කතෝලික සභාවන් විශ්වසයේ ප්‍රතිපත්තිය පිළිබඳ සංවාදය තවදුරටත් පවත්වයි. ලෝක ශු. සභාවල සම්මේලනයන්, රෝමානු (1949 කිතුනු ඒකත්වය පිළිබඳ චක්‍ර ලේඛනය රෝමයේ කතෝලික සභාව මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.)

- 1963 දී 23 වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමාගේ නායකත්වය යටතේ එක්වූ දෙවන ජගත් වතිකාන මන්ත්‍රණ සභාව කිතුනු ඒකත්වය පිළිබඳ විශ්ව ලේඛනයක් ප්‍රකාශයට පත් විය.

- 1974 දකුණු ඉන්දියානු සභාවන් ඒකාබද්ධ විය.

- 1965 දී 6 වන පාවුළු ශුද්ධෝත්තම පියතුමන් කිතුනු බෙදීම වෙනුවෙන් සියලුම සභාවන්ගෙන් සමාව ඉල්ලුවේය. අපරදිග ධර්මදූත පියාණන්, වන අතනාකොර් හමුවී සාකච්ඡා කළේය. 2 වන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියාණන් 16 වන බෙනඩික් ශුද්ධෝත්තම පියාණන් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියාණන් යන අය විසින් 2 වන ජගත් වතිකාන මන්ත්‍රණ සභා ඉගැන්වීම් වලට අනුව ක්‍රිස්තියානි ඒකත්වය සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

- සියලුම ක්‍රිස්තියානි සභාවන්ට පොදු ශු. බයිබලයක් පරිවර්තනය කරන ලදී.

**ක්‍රිස්තියානි ඒකත්වය සඳහා දෙවන ජගත් වතිකාන කතිකාවේ ඉගැන්වීම්:**

මෙම විශ්ව ලේඛනය හරහා කිතුණු ඒකත්වය පිලිබඳ විශිෂ්ඨ කරුණු 3ක් ඉදිරිපත් කරයි.

1. සියලුම කිතුණු සභා වල කිතුණුවන් කෙරෙහි ආදරය හා ගෞරව කිරීමට පොළඹවයි. භේදකාරී සභාවන් ලෙස අදහස් කළ අනෙකුත් සභාවන් "ක්‍රිස්තියානි සභාවන්" යැයි පිළිගනු ලැබේ. දෙවියන් වහන්සේ තුළ මොවුන් සහෝදරයෝ යැයි හඳුන්වනු ලබයි. (ගණන් 3)
2. ක්‍රිස්තුන් වහන්සේ සියල්ලන්ගේම ඒකත්වයේ කේන්ද්‍රයයි. (ගණන් 2) ක්‍රිස්තුන් වහන්සේගේ ආත්මයාණෝ සියලුම සභාවන්හි ක්‍රියාත්මක වන සේක. (ගණන් 4) යන්න තහවුරු කරයි.
3. කිතුනු භේදයට දෙපාර්ශවයම වගකීව යුතුය යන්න ප්‍රසිද්ධියේ පිළිගනු ලැබේ. (ගණන් 3)

- 1974 දකුණු ඉන්දියානු සභාවන් එක්ව තිබුණි. කෙටියෙන් කියතොත් මෙම ප්‍රකාශනය කිතුණුවන් එකිනෙකා කෙරෙහි ඇති මානසිකත්වයේ වෙනස ඇති කිරීමට උත්සහ දරයි. අඛණ්ඩ ප්‍රතිසංස්කරණයක් සෑම සභාවකම ඇති කිරීමට සියලුම සභා කැඳවනු ලබයි.

### 10.3.1.3. අන්තර් ආගමික සංවාදය

**දෙවන ජගත් වතිකාන කතිකාවේ ඉගැන්වීම්:**

**ශ්‍රී ලංකාව තුළ ආගම් :**

- ශ්‍රී ලංකාව වර්ග කි.මී. 65,610 ක් පමණ වූ රටකි. මෙහි ජීවත් වන ජනතාවගෙන් 69.1% බෞද්ධ 7.6%, ඉස්ලාම් 7.1%, හින්දු සහ 6.2% කිතුණුවන්, 10% කිසිම ආගමකට අයත් නොවූවන් වූහ.

- ශ්‍රී ලංකාව නිදහස ලැබූ පසු අද දක්වා සිදුව ඇති ස්වාභාවික විපත්, ජාතිවාදී කෝලහාල, සංක්‍රමණය වැනි සිදුවීම් වල බලපෑම බහුවිධ බලපෑම් මධ්‍යයෙහි පහත් මට්ටමේ ජනතාවගේ ජීවිත ඔවුනොවුන්ගේ විශ්වාසයන් දිනපතා ජීවත් කරවයි.

- විශේෂයෙන් වර්තමාන යථාර්තවාදී පරිසරය තුළ අපගේ ජනතාවගේ ජීවිත ප්‍රශ්න බහුවිධ ආකාරයෙන් පැමිණෙයි. නමුත් එක්තරා දේව විශ්වාසයක් මෙම බහු ආගමික ජනතාවද ඇදගත් බව පමණක් සත්‍යයකි.

- මෙම ජනතාව අතර දැකිය හැකි, පවත්නා දේව විශ්වාසය ඔවුන් ලබා ගැනීමට උත්සහ කරන සාමාන්‍ය ජීවිතය, ඔවුන් දුරින් දකින පූර්ණ ජීවිතයට, ඔවුන් සමඟ ගමන් කරන බහු ආගමික එකඟතාවය ඉතා වැදගත් වේ.

- ආගම්වල මූලික අරමුණ, ඔවුන් ආගමික විශ්වාසයේ ආලෝකයෙන් ජනතාව පූර්ණ ජීවිතයක්ද ඒකත්වයේ ජීවිතයක්ද ලැබීමට ඔවුන්ට මඟ පෙන්වීම වේ. මෙම අරමුණින් පිට ගිය කිසිම ආගමක් ජනතාව ආගමක් ලෙස හෝ වර්තමාන යතාර්ථයට උචිත දහමක් ලෙස හෝ පැවසිය නොහැකිය. මන්දයත් තම තමන්ට අනන්‍ය වූ දැක්මක් හා මූලික ස්වභාවය නැති කරගත් පසු එය අර්ථ ශූන්‍ය වේ.

- එබැවින් තම පරිසරය තුළ සැකසුණු ආගම් වල, පටු අදහස් ආත්මාර්ථකාමීත්වය අධිකාරිත්වය වැනි කරුණු අත් හැරිය යුතුය.

- දෙවන වතිකානු මන්ත්‍රණ සභාව, ආසියානු රදගුරු සම්මේලනය ආදියෙහි ඉගැන්වීම් වල පදනමින් ජනතාවගේ ජීවන තත්ත්වයන් උසස් කිරීමට, අන්තර් ආගමික සහජීවනයේ අවශ්‍යතාවය උගත යුතුය.

**ශු. සභාවේ ඉතිහාසයේ**

- ශු.සභාවේ ඉතිහාසය තුළ මුල් කිතුණු සභාව ක්‍රිස්තුන් වහන්සේ සාක්ෂි දැරීම අරමුණ කරගෙන සිටියහ. ක්‍රිස්තියානිය රෝම අධිරාජ්‍යයේ ආගම වූ විට කොන්ස්තන්තීනු රජ විසින් ශු. සභාව සංවිධානයක් බවට පත් කර, ශු. සභාවේ සුවිශේෂය දේශනා කිරීමේ සේවය පටු අරමුණක් සහිතව ඉදිරියට ගෙන යන ලදී.

- ශු. සභාව තුළම ගැලවීම ඇති බව ශු. සභාවේ අරමුණ විය. නමුත් සභා පියවරු විශේෂයෙන් ජස්ටින්, ජෙරෝම්, අගෝස්තිනු වැනි සභා පියවරුන් අන්‍යාගම් පිලිබඳ ඍජු ආගමික දැක්මක් ඇතිව සිටිය හ.

- වසර 200ක යුද්ධය තුලින්ද ක්‍රිස්තියානිය රාජ්‍ය ආගමක් කළද ශු. සභාවේ අන්තර් ආගමික බැඳීම හීන විය. නමුත් කුසාහි නිකලස් වැනි අය ඉස්ලාම් ආගමිකයින් සමඟ සබඳතා පැවැත්වූහ.

- ආගමික ප්‍රතිසංස්කරණ යුගයේ ශු. සභාව තමන්ව ආරක්ෂා කරන, තහවුරු කරන අරමුණින් ක්‍රිස්තුන් වහන්සේ නොදත් අය කෙබඳු ගැලවීමක් ලබයිද යන්න පැහැදිලි කිරීමට උත්සහ දැරීය.

- 9 වන බෙනඩික්ට් ශුද්ධෝත්තම පියතුමා සියලුම ආගම් සමාන යන අදහස තහවුරු කළේය. මෙම දිගු ඓතිහාසික ගමනේ දෙවන වතිකානු සම්මේලනයේ ඉගැන්වීම්, අන්‍යාගම් පිලිබඳ ශු සභාවේ දැක්මට අනුව ඒවා සමඟ ඇති සබඳතාවෙහිද නව වෙනසක් ඇති විය.

**දෙවන ජගත් වතිකාන සම්මේලනයේ ඉගැන්වීම්:**

ශුද්ධෝත්තම පෙළඹවීම ලබා සම්මේලනයේ අන්තර් ආගමික සබඳතා පිලිබඳ ඉගැන්වීම් සම්මේලනයේ පහත සඳහන් ප්‍රකාශන වල දැකිය හැක.

1. ශුද්ධ වූ සභාව පිළිබඳ ධර්ම ව්‍යවස්ථාව
2. සභාවේ ධර්මදූත සේවාවන් පිළිබද නියෝග
3. සභාව හා අන්‍යාගමිකකරණයක් පිලිබඳ නියෝග
4. නූතන ලෝකයේ ශුද්ධ සභාව පිලිබඳ උපදේශාත්මක ව්‍යවස්ථාව

1. ශුද්ධ වූ සභාව පිළිබඳ ධර්ම ව්‍යවස්ථාවේ පහත සඳහන් ඉගැන්වීම් දැකිය හැක.

   - සුවිශේෂය තවමත් පිළිනොගත අය සහ දේව ජනතාව සමඟ විවිධාකාරයෙන් සබඳතා පවත්වන්නන් යැයි ගෙනහැර දක්වයි.
   - මැවුම්කරුවාණන්ව පිළිගන්නා ජනතාවද සදාතනික ජීවිත සැලැස්මට ඇතුළත් වෙති. මන්දයත් සියල්ලන්ටම (ක්‍රියා 17:25 -28) (1 තිමෝති 2:4)
   - හෘද සාක්ෂියේ හඬ තුලින් ඇසෙන දේව කැමැත්ත හඳුනාගෙන වරප්‍රසාදයේ පෙළඹවීම තුළින් එම ජීවිතය ගත කිරීමට උත්සහ කළහොත් සදාතන ජීවිතය ලබයි යන විශ්වාසය පැහැදිලි කරයි. (අංක 16)

2. "සභාවේ ධර්මදූත සේවාව" යන නියෝගයේ පහත සඳහන් අදහස් දැකිය හැකිය.

   1) එම ශිෂ්ටාචාරයේ සිතිවිලි වලටත්, ස්වභාවයටත් උචිත ආකාරයේ ක්‍රිස්තියානි ජීවිතය අදහා ගැනීම.
   2) ස්වාධීන සම්ප්‍රදායන්ද ඒවා සමඟ ඒ ඒ ජනතාව සමඟ ස්වාධීන ගුණාංග සමඟ සුවිශේෂයේ ආලෝකයෙන් පැහැදීමක් ලබා පොදු එකමුතුකම පිළිගැනේ.
   3) මෙලෙස ශිෂ්ටාචාරයේ අංශයන් පිළිගනු ලැබ විවිධත්වය තුළ ඒකත්වය ආරක්ෂා කළ යුතුය, යන්නට සම්මේලනය තුලින් වැදගත්කමක් ලබා දෙනු ලැබේ. (අංක 2)
   4) තවද ධර්මදූතයින් ජනතාවගේ ඉතිහාසය, සමාජ සංවිධාන, සිරිත් විරිත් යනාදිය තවදුරටත් පැහැදිලිව දැන ගනියි. එම ජනතාව දෙවියන් වහන්සේ ලෝකය සහ මිනිසා පිලිබඳ තම ශුද්ධ වූ සම්ප්‍රදායයන්හි පදනමින් ගොඩනැගී ඇති අදහස් සහ ඔවුන්ගේ ධාර්මික සැකැස්ම ආගමික නීතිරීති ආදිය ධර්මදූතයින් දැන ගනියි. (අංක 26)

- මෙහි කිතු දහමට අයත් නොවන අය කෙරෙහි දැකිය හැකි සිරිත් විරිත් සම්ප්‍රදායන් දේව ධාර්මික දැක්ම මූලික කරුණු ආදිය තුලින් ප්‍රකාශ වන සත්‍යය, උසස්කම ලස්සන ආදී සියල්ලම අවංක වූ ගරුසරු ප්‍රශංසා කර යහපත් දේ පිළිගන්නා උසස් මානසිකත්වයක් ක්‍රිස්තියානීන් අතර තිබිය යුතුය යැයි පැවසේ.

3. සභාව හා අන්‍යාගමිකකරණය පිලිබඳ ප්‍රකාශනය

- ගැලවීමේ කාර්යයෙහි පූර්ණත්වය කරා ගමන් කරන ශු. සභාව අන්තර් ආගමික සංවාදය පරිත්‍යාගශීලි ජීවිතය වර්ධනය කර, එකම ජන සමූහයක් ලෙස ක්‍රියාත්මක වීමේ අවශ්‍යතාවය ඇති කරයි.

- තවද වතිකාන සම්මේලන ප්‍රකාශන වල ගැබ්ව ඇති කේන්ද්‍රීය පුවතට මෙම ව්‍යවස්ථාව සම්බන්ධතාවයක් දක්වයි. (ශුග සභාවේ අංක 16,17,27 එළිදරව්ව අංක 14,16,17 වර්තමාන ලෝකයේ ශු. සභාව අංක 2,4,7,21 - 24,26,28,36,38)

**4. නූතන ලෝකයේ ශුග සභාව පිලිබඳ උපදේශාත්මක ව්‍යවස්ථාව**

- මිනිසා ජීවත් වන සමාජ එහි සමාජ, ආර්ථික, දේශපාලන සහ සංස්කෘතික තත්ත්වයන් සමඟ එක්ව සොයා බලයි.

- එවන් විමර්ශනයට සුවිශේෂයෙන් මිනිස් අත්දැකීමක් අවශ්‍යයි පවසයි. (අංක 46)

- ලෝකය නවතාවයට පත් කිරීමේ හැකියාව නිසා ක්‍රියාත්මක වන අප (අංක 4,11,22) කාලයේ සලකුණු හොඳින් හඳුනාගෙන සුවිශේෂය සහ මිනිස් අත්දැකීමේ ආලෝකය තුළ ඒවා අවබෝධ කරගෙන ක්‍රියාත්මක වීමට කැඳවනු ලබමු යැයි පැහැදිලි කෙරේ.

- සියලුම මිනිසුන් සමාන වෙති යන සත්‍යයත් මිනිස් ඉතිහාසය සමඟ සිදුවන ගමනත් යන සත්‍යය ගෙනහැර දක්වති.

- සංස්කෘතීන්හි අන්තර්ගතයන් වන ආගම් පවත්වාගෙන යාම සඳහා සංස්කෘතියට ගරු කර, සුරක්ෂිත කරගත යුතුය යන්න පහදයි.

- තවද බේරාගත යුතු අය මිනිසුන් නවතාවයකට පත්කළ යුත්තේ මිනිස් සමාජය තුළයි. මන්දයත් සියල්ලටම කේන්ද්‍රය වන්නේ මිනිසුන් වෙති. (අංක 3) යන ඉගැන්වීම් නිසා කිතුණු සමාජය, ශු. සභාව ජන ජීවිතය තුලට රැගෙන යයි.

- ජන ජීවිතයේ ආගමික සංහිඳියාව නිසා ජනතාවගේ පූර්ණ ජීවිතය සඳහා මාර්ගයක් සංවාදය තුලින් සොයා ගැනීමට කැඳවයි.

සාරාංශයක් ලෙස බහු ආගමික සංවාදය සඳහා වන වතිකාන සම්මේලනයේ ඉගැන්වීම් පහත සඳහන් පරිදි වේ.

i) සෑම කෙනෙකුගේම ආගමික නිදහසට ගරු කළ යුතුය. එනම් ඔවුන්ගේ ආගමික විශ්වාසය පිලිගැනීමෙහිලා ඔවුන්ගේ හෘද සාක්ෂියට ගරු කළ යුතුය.

ii) නමුත් ක්‍රිස්තුන් වහන්සේ අන් අයට ප්‍රකාශ කිරීමටත්, ක්‍රිස්තුන් වහන්සේ තුළ කිතුණුවන් වන අප තබා ඇති විශ්වාසයේ ජීවිතය අන් අය සමග බෙදා ගැනීමත් අපගේ වගකීම වේ.

iii) අන්‍යාගමිකයින් කෙරෙහි අප සතුව ඇති ගෞරවය, සංවාදය, සාරධර්ම ආදිය ශු. සභාව තුලින් බිහිවී ඇත.

iv) අන් ආගම්වල දැකිය හැකි වරප්‍රසාද දැකීමටත්, ඒවා සුරැකීමටත් තම සේවය ලෙස සලකා ඇත.

- මිනිස් සමාජයේ ඒකත්වය කරා සියලු දෙනා යන මෙම ගමනේ ශුද්ධාත්තමයාණන් පිළිවෙලක් කරයි. එබැවින් දෙවියන් වහන්සේ මුළු ලෝකයේම ගැලවීමේ සැලැස්ම අප පිළිගෙන විවෘත මනසකින් අධ්‍යාත්මික වන්දනා ගමනක යෙදීමට කැඳවනු ලබමු. කෙටියෙන් පැවසුවහොත් දේව විශ්වාසය ඇති සියල්ලෝ එකම ශුද්ධාත්තමයාණන් තුළ සම්බන්ධ කරනු ලැබූවන් ලෙස ඒකත්වයේ අත් දැක්ම ලබන්නෙමු.

**ආසියානු රදගුරු සමුළුවේ ඉගැන්වීම්**

ආසියානු රදගුරු සමුළුවේ බහු ආගමික සංවාදය පිලිබඳ ඉගැන්වීම් කෙටියෙන් ආසියානු ශු. සභාව නැමැති ආසියානු රදගුරු සමුළුවේ අවසානය ධර්මදූත ප්‍රකාශනයේ දැකිය හැක.

- දේව ප්‍රකාශය සිදුවූ භූමිය වන ආසියාවේ දෙවියන් වහන්සේ අඛණ්ඩ වැඩ සිටීම හා ක්‍රියාකාරිත්වය විවිධ මාර්ග වලින් පවත්වාගෙන යනු ලැබේ.

- බෞද්ධ, හින්දු, ඉස්ලාම් ආගමික සම්ප්‍රදායන්හි දැකිය හැකි සත්‍යය හා ශුද්ධවන්තකම, සියලුම ජනතාව ආලෝකමත් කරන ආලෝකය. එම එකම සත්‍යයේ ආලෝකය නිසා ශු. සභාව ඒවා සතුටින් පිළිගන්නා විට සුවිශේෂය ප්‍රකාශ කරන වගකීම අඩු නොවීය.

- අන්‍යාගමිකයින් පිලිබඳ විවෘත මනසකින්, ඔවුන්ට සවන් දීමේ මනස ඔවුන්ගේ වෙනස්වීම් වලට මධ්‍යයෙහි ඔවුන්ට ගරුකර අවබෝධ කර ගැනීමේ ගුණය ඇති පරිසරයේ බහු ආගමික සංවාදයේ සබඳතා වර්ධනය වේ.

- මෙම සංවාදය සබඳතා වල සහයෝගය සහ වර්ධනය ආදිය කරා රැගෙන යා යුතුය.

**අදාළ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාකාරකම්**

- තම පරිසරයේ සිටින අන්‍යාගමිකයින් සමඟ තමන්ට ඇති අත්දැකීම්, ඔවුන් තුළ දැකිය හැකි යහපත් ගුණාංග පිලිබඳ සාකච්ඡා කරයි.
- තම පරිසර තුළ වෙනත් ආගමිකයන් සමඟ සංහිඳියාවෙන් දිවි ගෙවන්නන්ට බාධාවක් ලෙසද අභියෝගයක් ලෙසද ඇති දෑ ලැයිස්තුගත කරයි.
- අන්‍යාගමිකයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ඇති අවස්ථාව පිළිබඳව පවසයි.
- අන්තර් ආගමික සංවාදය සඳහා අවශ්‍ය දෑ ගොනු කරයි.
- ක්‍රිස්තියානි සභාවන් සමඟ සංහිඳියාව ඇති කරන මාර්ග පිලිබඳ සාකච්ඡා කර දන්වයි.
- ක්‍රිස්තියානි ඒකත්වයට තම සමාජයේ දැකිය හැකි බාධා අභියෝග ලැයිස්තුගත කරයි.
- ක්‍රිස්තියානි ඒකත්වයට දායකත්වය ලබාදුන් අයව සඳහන් කර, ඔවුන්ගේ දායකත්වය පිලිබඳ සාකච්ඡා කරයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


1. දෙවන ජුවම් පාවුළු, ආසියානු ශුද්ධ වූ සභාව, **රදගුරු මණ්ඩලයේ අවසන් දූත ලිපිය**, මදුරෛ ආනන්ද් (දමිළ පරිවර්ථනය), නම්වාල්වු මුද්‍රණාලය, චෙන්නායි, 2000.

2. ජෙරාඩ්. ටි. රොසයිරෝ. (නි.ම.නි.), **මිනිස් සමාජය දියුණු කිරීම හා ක්‍රිස්තියානි සහයෝගය**,(නි.ම.නි.) මුද්‍රණාලය, කොළඹ, 2010. පිටු අංකය 40 -54

3. ජෙරාඩ්. ටි. රොසයිරෝ. (නි.ම.නි.), **අසියානු ශුද්ධ වූ සභාව හා සුවිශේෂය ප්‍රකාශ කිරීමේ සේවාව**, නම්වාල්වු මුද්‍රණාලය, චෙන්නායි, 2014.

4. වි. පවුල් ලියෝන්, ක්‍රිස්තියානි එකමුතුව, මූලධර්මයන්, **දෙවන වතිකාන ලිපි ලේඛන**, සාන්ත පාවුළු දේවධර්මාචාර්ය විදුහල, තිරුචිරා පල්ලි, 2001.

5. Francine Cardman, **''One Treasure Only:** Vatican II and The Ecumenical nature of the Church'' *Vatican II: The Unfinished agenda, A Look to the Future*, Lucien Richard, OMI,(ed), Paulist Press, New York, 1987,pp. 174 - 189